203 වන කාණ්ඩය - 2 වන කලාපය
தொகுதி 203 - இல. 2
**Volume 203 - No. 2**

2011 ඔක්තෝබර් 18 වන අඟහරුවාදා
2011 ஒக்ரோபர் 18,செவ்வாய்க்கிழமை
**Tuesday, 18th October, 2011**

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශය:**
මහජන ආරක්ෂක ප්‍රකාශනය

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**ශෝක ප්‍රකාශය:**
ගරු එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා
ගරු එච්.ජී.පී. නෙල්සන් මහතා
ගරු මර්වින් ජේ. කුරේ මහතා

**විසර්ජන පනත් කෙටුම්පත, 2012:**
පළමුවන වර කියවන ලදී

**රාජ්‍ය ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය (සංශෝධන) පනත් කෙටුම්පත:**
පළමුවන වර කියවන ලදී

**පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:**
මිනුවන්ගොඩ සිංහ පදනම (සංස්ථාගත කිරීමේ) – [ගරු ජෝශප් මයිකල් පෙරේරා මහතා]- පළමුවන වර කියවන ලදී

**වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනත් කෙටුම්පත:**
දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී

---

# பிரதான உள்ளடக்கம்

**சனாதிபதியிடமிருந்து வந்த செய்தி:**
பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**அனுதாபத் தீர்மானம் :**
மாண்புமிகு என். டென்சில் பெர்னான்டோ
மாண்புமிகு எச்.ஜி.பீ. நெல்சன்
மாண்புமிகு மேர்வின் ஜே. குறே

**ஒதுக்கீட்டுச் சட்டமூலம், 2012:**
முதன்முறை மதிப்பிடப்பட்டது

**பாதுகாப்புச் சேவைகள் ஏவல் மற்றும் பணியாட்தொகுதி கல்லூரி (திருத்தம்) சட்டமூலம்:**
முதன்முறை மதிப்பிடப்பட்டது

**தனி உறுப்பினர் சட்டமூலங்கள்:**
மினுவாங்கொட சிங்க மன்றம் (கூட்டிணைத்தல்) – [மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா]– முதன்முறை மதிப்பிடப்பட்டது

**கரையோரம் பேணல் (திருத்தம்) சட்டமூலம்:**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு, திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

---

# PRINCIPAL CONTENTS

MESSAGE FROM THE PRESIDENT:
Public Security Proclamation

ORAL ANSWERS TO QUESTIONS

VOTE OF CONDOLENCE:
Hon. N. Denzil Fernando
Hon. H.G.P Nelson
Hon. Mervyn J. Cooray

APPROPRIATION BILL, 2012
Read the First time

DEFENCE SERVICES COMMAND AND STAFF COLLEGE (AMENDMENT) BILL:
Read the First time

PRIVATE MEMBERS' BILLS:
Minuwangoda Sinha Foundation (Incorporation) - [The Hon. M. Joseph Michael Perera] - Read the First time

COAST CONSERVATION (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed as amended

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

***2011 ඔක්තෝබර් 18 වන අඟහරුවාදා***
*2011 ஒக்ரோபர் 18, செவ்வாய்க்கிழமை*
*Tuesday,18th October, 2011*

***අ. භා. 1.00ට පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා [ගරු චමල් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.***
*பாராளுமன்றம் பி. ப. 1.00 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.*
*The Parliament met at 1.00 p.m.,* MR. SPEAKER [THE HON. CHAMAL RAJAPAKSA] *in the Chair.*

## ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශය
## சனாதிபதியிடமிருந்து வந்த செய்தி
## MESSAGE FROM THE PRESIDENT

### මහජන ආරක්ෂක ප්‍රකාශනය
### பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்
### PUBLIC SECURITY PROCLAMATION

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

පහත දැක්වෙන සන්දේශය අතිගරු ජනාධිපතිතුමාගෙන් මා වෙත ලැබී තිබෙනවා.

**"ශ්‍රී ලංකා ජනාධිපති**
இலங்கை சனாதிபதி
President of Sri Lanka

අංකය : එම්ඕඩී/එල්ඊජී/එල්ජ්/ජීඒ/308
2011 ඔක්තෝබර් මස 06 වන දින
කොළඹ දී ය.

ගරු කථානායකතුමනි,

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 12 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රකාශනයෙන් මා විසින් ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදාවල සියලුම සාමාජිකයින් දිවයිනේ සියලුම පරිපාලන දිස්ත්‍රික්ක තුළ සක්‍රිය සේවය සඳහා කැඳවන ලදී.

ඉහත කී ප්‍රකාශනය නිකුත් කිරීමට හේතුව ත්‍රස්තවාදය සහ යම් මහජන කැළඹීමක් වැළැක්වීම සහ මැඩ පැවැත්වීම පිණිස බව පාර්ලිමේන්තුව වෙත දැනුම් දෙනු ලැබේ.

මහින්ද රාජපක්ෂ"

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

(i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සහ 2004 අංක 11 දරන මුදල් පනතේ 22 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 26 වැනි වගන්තිය යටතේ, ජනාධිපතිතුමා විසින් පනවන ලදුව, 2011 අගෝස්තු 04 දිනැති අංක 1717/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය;

(ii) 2007 වර්ෂය සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව; සහ

(iii) 2009 වර්ෂය සඳහා පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව. - [ගරු දි.මු. ජයරත්න මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

2010 වර්ෂය සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධනය සාරාංශගත වාර්තාව.- [රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகால மைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මම 2009 වර්ෂය සඳහා ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව කෘෂිකර්ම කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

(i) (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 237 වැනි වගන්තිය සමඟ කිය විය යුතු 141 වැනි, 143 වැනි, 144 වැනි, 168 වැනි සහ 190 වැනි වගන්ති යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 අගෝස්තු 03 දිනැති අංක 1717/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග; සහ

(ii) (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 237 වැනි වගන්තිය සමඟ කිය විය යුතු, එම පනතේ 19 සහ 157අ වගන්ති යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 අගෝස්තු 09 දිනැති අංක 1718/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග. - [ගරු කුමාර වෙල්ගම මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මම 2009 වර්ෂය සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව විදුලිබල හා බලශක්ති කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා (ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමා)**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன - கமநல சேவைகள், வனசீவராசிகள் அமைச்சர்)
(The Hon. S.M. Chandrasena - Minister of Agrarian Services and Wildlife)
ගරු කථානායකතුමනි, 2010 වර්ෂය සඳහා සීමාසහිත ලංකා පොහොර සමාගමේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව ගොවිජන සේවා හා වනජීවී කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු වාසුදේව නානායක්කාර මහතා (ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - தேசிய மொழிகள், சமூக ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Vasudeva Nanayakkara - Minister of National Languages and Social Integration)
ගරු කථානායකතුමනි, රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන්, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2007 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2010 වර්ෂය සඳහා ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ්හි වාර්ෂික වාර්තාව.

මෙම වාර්තා රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට ඉදිරිපත් කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## උපදේශක කාරක සභා වාර්තා
## ஆலோசனைக் குழு அறிக்கைகள்
## CONSULTATIVE COMMITTEE REPORTS

**ගරු කුමාර වෙල්ගම මහතා (ප්‍රවාහන අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார வெல்கம - போக்குவரத்து அமைச்சர்)
(The Hon. Kumara Welgama - Minister of Transport)
ගරු කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම 2008 අප්‍රේල් 01 සිට 2009 මාර්තු 31 දක්වා මාන්තායි සෝල්ට් ලිමිටඩ් වාර්ෂික වාර්තාව සහ ගිණුම් සම්බන්ධයෙන් කර්මාන්ත හා වාණිජ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම 2008 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් සම්බන්ධයෙන් රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා - පැමිණ නැත.

**ගරු ටී. බී. ඒකනායක මහතා (සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க - கலாசார, கலை அலுவல்கள் அமைச்சர்)
(The Hon. T.B. Ekanayake - Minister of Culture and the Arts)
ගරු කථානායකතුමනි, මම හොරොම්බාව, ඉහළගම, ඇටම්පොළ හි පදිංචි ඩබ්ලිව්.එම්. ප්‍රියන්ත වාසල මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු නවීන් දිසානායක මහතා - පැමිණ නැත.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා (විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரஞ்ஜித் சியம்பலாபிட்டிய - தொலைத் தொடர்புகள், தகவல் தொழில்நுட்பவியல் அமைச்சர்)
(The Hon. Ranjith Siyambalapitiya - Minister of Telecommunication and Information Technology)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) අනුරාධපුර, බුද්ධගයා මාවත, යුගල නිවාස නො. 39 දරන ස්ථානයේ පදිංචි බී. එම්. මල්ලිකා බස්නායක මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) ගනේමුල්ල, පහළ යාගොඩ අංක 301/5 දරන ස්ථානයේ පදිංචි හෙන්රිගේ කමලාවතී මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, මම කොළඹ 09, මාලිගාකන්ද, ජලාශ පටුමග, අංක 87/16 දරන ස්ථානයේ පදිංචි පීරිස් විමලදාස මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**ගරු ලසන්ත අලගියවන්න මහතා (ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லசந்த அலகியவன்ன - நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொதுவசதிகள் பிரதி அமைச்சர்)
(The Hon. Lasantha Alagiyawanna - Deputy Minister of Construction, Engineering Services, Housing and Common Amenities)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) ගම්පහ, මොරගොඩ, අංක 30 දරන ස්ථානයේ පදිංචි ආර්.එස්.කේ. සෙනවිරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) වතුපිටිවල, ගොවිජනපදය, අංක 186/ඩී දරන ස්ථානයේ පදිංචි එන්.ඒ. පෙරේරා මහතාගෙන් ලැබුණු පෙත්සම.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා - පැමිණ නැත.

ගරු විජිත හේරත් මහතා - පැමිණ නැත.

ගරු කබීර් හාෂීම් මහතා - පැමිණ නැත.

ගරු දිළුම් අමුණුගම මහතා - පැමිණ නැත.

ගරු සනත් ජයසූරිය මහතා - පැමිණ නැත.

**ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා**
(மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva)
ගරු කථානායකතුමනි, මම පන්නිපිටිය, බ්‍රාහ්මනගම, වික්‍රමගේ මාවත, අංක 32/ඒ./4 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.එම්.සී.ජී. ඉන්ද්‍රජිත් මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මනුෂ නානායක්කාර මහතා - පැමිණ නැත.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, මම පාදුක්ක, කොටිගම්ගොඩ, අංක 49 දරන ස්ථානයේ පදිංචි ජේ.එම්.පී.ඩී. ජයසිංහ මෙනෙවියගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 2-0756/'10-(3), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

### 2010 එක්සත් ජාතීන්ගේ සමුළුව : නියෝජිත කණ්ඩායම
### 2010 ஐக்கிய நாடுகள் மாநாடு : கலந்துகொண்டோர்
### UNITED NATIONS CONFERENCE 2010 : DELEGATION

0842/'10

3. **ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) 2010 එක්සත් ජාතීන්ගේ සමුළුව සඳහා සහභාගි වූ ජනාධිපතිවරයා ඇතුළු කණ්ඩායමේ සිටි සාමාජිකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සමුළුව සඳහා එක් රටකට ලැබෙන නිල අවසර පත්‍ර සංඛ්‍යාව කොපමණද;

(iii) එම කණ්ඩායම නවාතැන් ගත් ස්ථානයේ නම කුමක්ද;

(iv) එම සංචාරය වෙනුවෙන් වියදම් වූ මුළු මුදල කොපමණද;

(v) එම වියදම දරනු ලබන අය කවුරුන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) එම සමුළුවට එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික අනෙකුත් රටවල්වලින් ඉදිරිපත් කළ නියෝජිත සංඛ්‍යාව එක් එක් රට අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද; යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්,ඒ මන්ද?

வெளிநாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2010, ஐக்கிய நாடுகள் மாநாட்டில் கலந்துகொண்ட சனாதிபதி உள்ளிட்ட குழுவில் உள்ளடங்கிய அங்கத்தவர் எண்ணிக்கை யாதென்பதையும்,

[ගරු දයාසිරි ජයසේකර මහතා]

(ii) மேற்படி மாநாட்டுக்காக ஒரு நாட்டுக்குக் கிடைக்கின்ற உத்தியோகபூர்வ அனுமதிப்பத்திரங்களின் எண்ணிக்கை யாதென்பதையும்,

(iii) மேற்படிகுழு தங்கியிருந்த இடத்தின் பெயர் யாதென்பதையும்,

(iv) மேற்படி பயணத்துக்கு செலவான மொத்தப் பணத்தொகை யாதென்பதையும்,

(v) இச்செலவைப் பொறுப்பேற்பது யாரென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) மேற்படி மாநாட்டுக்கு, ஐக்கிய நாடுகள் அமைப்பில் அங்கத்துவம் வகிக்கும் ஏனைய நாடுகளிலிருந்து அனுப்பப்பட்ட பிரதிநிதிகளின் எண்ணிக்கை, ஒவ்வொரு நாட்டுக்கும் ஏற்ப வெவ்வேறாக யாது என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of External Affairs:

(a) Will he state-

(i) the number of members of the delegation, including the President, that attended the United Nations Conference in year 2010;

(ii) the number of official passes issued per country for the purpose of attending the aforesaid conference ;

(iii) the name of the place where the aforesaid delegation stayed ;

(iv) the total amount of money spent on the aforesaid tour ; and

(v) the names of the persons who will bear the aforesaid expenditure?

(b) Will he inform this House separately the number of representatives who attended the aforesaid conference from each of the member countries of the United Nations Organization?

(c) If not, why?

**ගරු (මහාචාර්ය) ජී.එල්.පීරිස් මහතා (විදේශ කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ. எல். பீரிஸ் - வெளிநாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. (Prof.) G.L. Peiris - Minister of External Affairs)
Sir, the Answer is as follows :

(a) (i) The number of members of the delegation that attended the UN General Assembly in 2010, including His Excellency the President, officials from the Ministry of External Affairs and the Permanent Mission of Sri Lanka in New York was thirty.

(ii) All delegates were issued with passes by the United Nations to permit entry into the UN premises to attend the conference.

ගරු කථානායකතුමනි, එහෙම සීමාවක් නැහැ. කණ්ඩායමේ සාමාජිකයන්ගේ සංඛ්‍යාව අනුව passes ලබා ගන්න පුළුවන්. ඒ අභිමතය අපට භාර දීලා තිබෙනවා. මා මේ ගරු සභාව දැනුවත් කරන්න කැමැතියි, මේ රජය එක්සත් ජාතීන්ගේ සංවිධානය තුළ ගෙන ගොස් තිබෙන ක්‍රියා පටිපාටිය නිසා අද අපේ රට සම්පූර්ණයෙන් ආරක්ෂා වුණු බව. අපි කවුරුත් දන්නවා, ජිනීවාහි -

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමා මේ ප්‍රශ්නවලට උත්තර දීලා ඉවර වෙලා, -

**ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
මට අයිතියක් තිබෙනවා, මා කැමැති විධියට මේ ප්‍රශ්නයට උත්තර දෙන්න. මා පිළිතුර දෙනවා. මට කැමැති විධියට පිළිතුර ඉදිරිපත් කිරීමේ අභිමතය මා සතු වනවා.

ගරු කථානායකතුමනි, ජිනීවා නගරයේ මානව හිමිකම් මණ්ඩලය තුළ මේ රට සැහෙන අභියෝගයකට ලක් වුණා. අපට පුළුවන් වුණා, අපේ රට ආරක්ෂා කර ගන්න. ප්‍රබල රටවල් කිහිපයක් එකතු වෙලා මේ රට කොන් කිරීමට දැඩි උත්සාහයක් දැරුවා. ඒ පිළිබඳව කවුරුත් දන්නවා. ඒ තත්ත්වය ඉස්මතු වුණු අවස්ථාවේදී ඒ යෝජනාව ඉදිරිපත් කරන්න උත්සාහ දැරූ රටේ විදේශ ඇමතිතුමා මාව හම්බ වුණා, එතුමාගේ ඉල්ලීම අනුව.

මාව හම්බ වෙලා එතුමා කිව්වා, එතුමන්ලා ඉදිරිපත් කරන්න අදහස් කරපු යෝජනාව ඒ අවස්ථාවේදී ඉදිරිපත් කරන්නේ නැහැ කියා. ඒ කියන්නේ ඒ අයට අවශ්‍ය ඡන්ද සංඛ්‍යාව තිබුණේ නැහැ. අපට අවශ්‍ය ඡන්ද සංඛ්‍යාව තිබුණා. ගරු කථානායකතුමනි, ඒවා ඉබේම සිදු වන දේවල් නොවෙයි. මහන්සි වෙලා, වැඩ කරලා, වියදම් කරලා ලබා ගත යුතු ප්‍රතිඵල. අතිගරු ජනාධිපතිතුමා පෞද්ගලිකවම රටවල් 25ක පමණ නියෝජිතයන් හමු වුණා. [බාධා කිරීමක්] නැහැ, නැහැ. ඒ පසුබිම මේ ගරු සභාවට දැනුම් දීමට මට අයිතියක් තිබෙනවා. මේ ගරු සභාවේ මන්ත්‍රීවරුන්ට ඒක දැන ගැනීමටත් අයිතියක් තිබෙනවා. [බාධා කිරීමක්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම අහලා තිබෙන්නේ වෙන එකක්.

**ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
ගරු කථානායකතුමනි, ඒ විධියේ තත්ත්වයකට තමයි අපට මුහුණ දෙන්නට සිදු වුණේ. ඒ සම්බන්ධයෙන් සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීමට අප සමත් වුණා.

(a) (iii) The Waldorf Astoria and the Double Tree Metropolitan hotel.

(iv) SLRs. 49,545,424.35

(v) The Ministry of External Affairs.

There are no individuals who will bear the aforesaid expenditure. The expenditure will, of course, be borne by the Ministry of External Affairs.

(b) Yes. The list of the delegation of all UN Member countries participating at the 65th UNGA as published by the Protocol and Liaison Department of the UN, is attached as Annex "A".

With regard to Annex "A", Mr. Speaker, that is a thick book which I am **tabling*** on this occasion. That contains details relating to the representatives of different countries, the numbers of representatives - all of that information is contained in that booklet.

(c) Does not arise.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමාගෙන් මා අතුරු ප්‍රශ්නයක් අහන්නට කැමැතියි. මේ සංචාරය වෙනුවෙන් 30 දෙනෙක් සඳහා වියදම් වූ මුදල රුපියල් ලක්ෂ 490ක්. ඒ කියන්නේ රුපියල් කෝටි 5කට අධික මුදලක් වියදම් වෙලා තිබෙනවා කියන එකයි. මීට අමතරව නිව්යෝර්ක් නුවර තිබෙන ශ්‍රී ලංකා තානාපති කාර්යාලයත් ලංකාවේ මුදලින් තවත් රුපියල් කොච්චර ප්‍රමාණයක් වියදම් කරන්න -වෙනත් වියදමක් දරන්න- කටයුතු කළා ද කියා මා ඔබතුමාගෙන් අහන්නට කැමැතියි. [බාධා කිරීම්] ගරු ඇමතිතුමාට කථා කරන්න දෙන්න. පොඩ්ඩක් ඉන්න කෑ ගහන්නේ නැතිව.

**ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)

ගරු කථානායකතුමනි, අප කවුරුත් දන්නවා රාජ්‍ය නායකයෙක් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ රැස්වීමකට සම්බන්ධ වන අවස්ථාවකදී ආරක්ෂක නිලධාරීන් යොදවන බව. හැමෝටම ඉන්නවා. ඒ කටයුතු නිකම් කරන්න බැහැ, ඒවාට මුදල් වියදම් වෙනවා. ඒ සම්බන්ධ තොරතුරු රහසිගතයි. අපට ඒවා කිසිසේත් ඉදිරිපත් කරන්නට බැහැ. ගරු කථානායකතුමනි, යුරෝපයේ පොලිසිය -Europol- වාර්තාවක් ඉදිරිපත් කර තිබෙනවා. එල්ටීටීඊ සංවිධානය යුදමය වශයෙන් අපේ රට තුළ පරාජයකට පත් වෙලා තිබෙනවා. එහෙත් ඒ අය ජාත්‍යන්තර තලයේ විශාල වැඩ පිළිවෙළක් තවම ගෙන යනවා. පැරිස් උසාවියත් 21 දෙනෙක් බන්ධනාගාර ගත කර තිබෙනවා.

ඒ තත්ත්වය තුළ අතිගරු ජනාධිපතිතුමාට අනිවාර්යයෙන්ම ආරක්ෂාවක් අවශ්‍යයි. මම හිතන්නේ නැහැ, මේ රටේ කිසිම පුරවැසියෙක් ඒක වැරැදියි කියාවිය කියලා. ඒ පිළිබඳ තොරතුරු අපට අනාවරණය කරන්න බැහැ. එහෙම අනාවරණය කිරීම වැරැදි දෙයක්. ඒකෙන් ලොකු අවදානමක් ඇති වෙනවා. ඒ නිසා ආරක්ෂක කරුණු පිළිබඳ තොරතුරු මම ඉදිරිපත් කරන්නේ නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, ආරක්ෂක තොරතුරු මම ඇහුවේ නැහැ. මෙම මුදලට අමතරව තවත් මුදලක් නිව්යෝර්ක් තානාපති කාර්යාලයෙන් වියදම් කරලා තිබෙනවාද කියලායි මම ඇහුවේ. ආරක්ෂක කටයුතු පිළිබඳ කිසිම කථාවක් මම ඇහුවේ නැහැ.

**ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)

ආරක්ෂක නිලධාරීන් සම්බන්ධයෙන් නිව්යෝර්ක් නගරයේ තානාපති කාර්යාලයට වියදම් දරන්නට සිද්ධ වෙනවා. නැත්නම් කවුද ඒ වියදම් දරන්නේ?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඒ මුදල කොච්චරද කියන එකයි මම අහන්නේ.

**ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)

ආරක්ෂක විධිවිධාන පිළිබඳ කිසිම තොරතුරක් මට ඉදිරිපත් කිරීමට හැකියාවක් නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, ආරක්ෂකයෝ කීයක් හිටියාද, කවුද හිටියේ කියලා මම ඇහුවේ නැහැ. ලංකාවේ විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් වියදම් කළ රුපියල් කෝටි 5ට අමතරව නිව්යෝර්ක් තානාපති කාර්යාලයෙන් මොනවා හරි වියදමක් දරලා තිබෙනවාද කියලායි මම ඇහුවේ. ඒක වියදම් කළේ ආරක්ෂාවටද, ආරක්ෂාවට නොවෙයිද කියලා මම ඇහුවේ නැහැ.

**ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)

තානාපති කාර්යාලයෙන් වියදමක් දරලා නැහැ. ආරක්ෂක කටයුතු සඳහා වියදම් දරලා තිබෙනවා. ඒවා නීත්‍යානුකූල වියදම්; ඒ වාගේම සාධාරණ වියදම්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මම දැන් ඇහුවේ එම මුදල කීයද කියලායි. [බාධා කිරීම්] මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මේකයි. ගරු කථානායකතුමනි, එම සංචාරය සඳහා 30 දෙනෙකුට වඩා වැඩි පිරිසක් සහභාගි වෙලා තිබෙනවා. ආරක්ෂක හේතූන් මත ඉතිරි කට්ටියගේ නම් කියන්න බැරි එකයි තිබෙන ප්‍රශ්නය. ගියේ කවුද, පෙරේරාද, සිල්වාද කියලා අපට වැඩක් නැහැ. නමුත් එම 30 දෙනාට අමතරව තව කී දෙනෙක් සිටියාද, එම ගණන 133ක් දක්වා වැඩි වෙලා තිබුණාද කියන එකයි දෙවැනි අතුරු ප්‍රශ්නය විධියට මම අහන්නේ.

**ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)

ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නය අහලා තිබෙන්නේ delegation එක පිළිබඳවයි; the number of members in the delegation ගැනයි. මම ඉදිරිපත් කළේ delegation එකේ සාමාජිකයන්ගේ සංඛ්‍යාවයි. මේ ප්‍රශ්නයේ ක්ෂේත්‍රයට, මේකේ පරිමාණයට ඇතුළත් වන්නේ delegation එක සම්බන්ධවයි; Delegation එකේ සිටියේ තිස් දෙනයි. Delegation එක ගැන තමයි මේ ප්‍රශ්නය අසා තිබෙන්නේ. Delegation එකේ ඉඳලා තිබෙන්නේ තිස් දෙනයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, delegation එක කියලා කියන්නේ මෙහෙමයි. මේ අය VIP lounge එකෙන් යනවා. ඒ රටට ගිහින් delegation එකක් විධියට සහභාගි වෙනවා. අදාළ නීත්‍යානුකූල කටයුතුවලට සම්බන්ධ වන්නේ තිස් දෙනෙක් වන්නට පුළුවන්. ඔබතුමාත් බොහොම පැහැදිලිව දන්නවා, delegation එකක් කියලා කිව්වාම ඇමතිවරුන්ගේ ආරක්ෂක අංශයත් delegation

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු දයාසිරි ජයසේකර මහතා]

එකට අයිතියි කියලා. [බාධා කිරීම්] ඔවුන්ටත් වෙනම pass එකක් දෙනවා. මම ඇහුවේ ඒ delegation එකට කී දෙනෙක් සිටියාද කියලායි. [බාධා කිරීම්] තිස් දෙනෙකු ගියාය කියන එක-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ඇමතිතුමා සභාවේ සිටිනවා. අනෙක් සියලුම දෙනා නිශ්ශබ්ද වෙන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පොඩ්ඩක් ඉන්න කෝ. ගරු ඇමතිතුමා පිළිතුරු දෙයි. තවත් ඇමතිවරු පිළිතුරු දෙන්න හදන්න එපා. තව අධීක්ෂණ මන්ත්‍රී කෙනෙකුත් නැඟිටලා ඉන්නවා. [බාධා කිරීම්] වෙඩි කන්න වෙයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ඇමතිතුමා පිළිතුරු දෙන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
වෙඩි කන්න ලෑස්ති වෙන්න. ඔය කියන්නේ කට්ටිය. එතුමා අධීක්ෂණ මන්ත්‍රී කියලායි කියන්නේ. අධීක්ෂණ නොවෙයිලු ඒ ගමන. ඒ ගමන පැනලා දෙනවා. ඇමතිවරයෙක් ඉන්නවා උත්තර දෙන්න. [බාධා කිරීම්] අමාත්‍යාංශයේ කරන වැඩේ මෙතැනටත් ඇවිල්ලා කරන්න හදනවා.

**ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
ගරු කථානායකතුමනි, මන්ත්‍රීතුමා delegation එක සම්බන්ධයෙන් කළ ඒ ප්‍රකාශය සම්පූර්ණයෙන් වැරදියි. ආරක්ෂක නිලධාරින් delegation එකට අයත් වන්නේ නැහැ. මම ඉදිරිපත් කළ පොතේ තිබෙන්නේ සෑම රටම නියෝජනය කළ delegations ගැනයි. ඒ delegationsවලට ආරක්ෂක නිලධාරින්ගේ නම් කිසිසේත්ම ඇතුළත් වෙලා නැහැ. කිසිම රටක සම්ප්‍රදාය අනුව ආරක්ෂක නිලධාරින් delegation එකේ අන්තර්ගත කොටසක් හැටියට සලකන්නේ නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)]
හොඳයි. ඒ ගරු ඇමතිතුමා පිළිතුර දුන්නා. ගරු මන්ත්‍රීතුමා, තුන්වෙනි අතුරු ප්‍රශ්නය අහන්න. [බාධා කිරීම්] ගරු මන්ත්‍රීතුමන්ලා නිශ්ශබ්ද වෙලා සිටියොත් හොඳයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, තුන්වෙනි අතුරු ප්‍රශ්නය ලෙස ඔබතුමාගෙන් අහන්නේ මෙයයි. මේ විෂය සම්බන්ධයෙන් ඔබතුමා බොහොම දක්ෂ ලෙස උත්තර දෙනවා.

දැන් ලියම් ෆොක්ස් ආරක්ෂක ලේකම්තුමා ඉල්ලා අස්වීමේ ලිපිය දීලා තිබෙනවා. එතුමා දහඅට වතාවක් ලංකාවට ඇවිල්ලා තිබෙනවා. ඒ සඳහා ඔබතුමාට පෙර හිටපු විදේශ කටයුතු අමාත්‍ය රෝහිත බෝගොල්ලාගම මැතිතුමා ආරාධනා කරලා, සල්ලි ගෙවලා තිබෙනවා කියලා පාර්ලිමේන්තුවේ හෙළිදරව් කරලා තිබෙනවා. ගරු විදේශ කටයුතු ඇමතිතුමනි, ලියම් ෆොක්ස් මේ රටට ඒම සඳහා ලංකාවේ සල්ලි කොච්චර ගෙවලා තිබෙනවාද කියලා කරුණාකරලා මේ ගරු සභාවට කියන්න.

**ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
ගරු කථානායකතුමනි, එය කිසිසේත්ම මේ ප්‍රශ්නයට අදාළ වන්නේනැහැ. කිසිසේත්ම මේ ගැන අතුරු ප්‍රශ්නයක් අහන්න අයිතියක් නැහැ.

## 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් වැය කළ මුදල : පරිසර අමාත්‍යාංශය
## 2011 `தேசத்துக்கு மகுடம்' கண்காட்சிச் செலவினம் : சுற்றாடல் அமைச்சு
## MONEY SPENT ON DEYATA KIRULA EXHIBITION 2011: MINISTRY OF ENVIRONMENT

1245/’11

4. **ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
පරිසර අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2) :

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් පරිසර අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මඟින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසු ගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

சுற்றாடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2011 `தேசத்துக்கு மகுடம்' கண்காட்சிக்காக சுற்றாடல் அமைச்சு செலவிட்டுள்ள மொத்தப் பணத்தொகை எவ்வளவு என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) அமைச்சின் ஒவ்வொரு நிறுவனம் மற்றும் திணைக்களத்தினால் மேற்படி கண்காட்சிக்காக மேற்கொள்ளப்பட்ட செலவு தனித்தனியே எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி திணைக்களங்கள் மற்றும் நிறுவனங்களி னால் ஆற்றப்பட்ட பணிகள் யாவை என்பதையும்;

(iii) மேற்படி ஒவ்வொரு பணிக்காகவும் செலவிடப்பட்ட பணத்தொகை எவ்வளவு என்பதையும்

அவர் தனித்தனியாக குறிப்பிடுவாரா?

(இ) கடந்த வரவு செலவுத் திட்டத்தில் மேற்படி செலவினத் துக்காக அமைச்சின் எந்த செலவுத் தலைப்பின்கீழ் நிதி ஒதுக்கப்பட்டிருந்தது என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Environment:

(a) Will he state the total amount of money spent by the Ministry of Environment on the "Deyata Kirula" exhibition in 2011?

(b) Will he state-

(i) separately, the expenditure borne by each institution and department of the Ministry on that exhibition;

(ii) the functions carried out by those institutions and departments; and

(iii) separately, the amount of money spent on each of those functions?

(iv) Will he state the Head of Expenditure of the Ministry out of which funds were allocated from the last Budget for the above-mentioned expenses?

(c) If not, why?

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா - சுற்றாடல் அமைச்சர்)
(The Hon. Anura Priyadharshana Yapa - Minister of Environment)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් පරිසර අමාත්‍යාංශය වැය කළ මුළු මුදල රු. 1,703,940.50ක් වේ.

(ආ) (i) එම ප්‍රදර්ශනය සඳහා අමාත්‍යාංශයේ එක් එක් ආයතන හා දෙපාර්තමේන්තු මඟින් කරන ලද වියදම් පහත සඳහන් පරිදි වේ.

| | | | |
|---|---|---|---|
| වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | - | රු. | 412,410.00 |
| මධ්‍යම පරිසර අධිකාරිය | - | රු. | 76,477,397.00 |
| භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය | - | රු. | 1,119,960.83 |
| සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය | - | රු. | 379,790.00 |
| රාජ්‍ය දැව සංස්ථාව | - | රු. | 2,793,686.00 |
| ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය | - | රු. | 1,862,977.00 |
| මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය | - | රු. | 805,076.80 |

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් පහත සඳහන් වේ.

**වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව**

- මහජනතාව දැනුවත් කිරීම.
- ප්‍රදර්ශනයට සහභාගී වූ ජනතාවට දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන, පත්‍රිකා හා පෝස්ටර් විකිණීම.
- ප්‍රදර්ශනයට සහභාගී වූ ජනතාවට වනජ පැළ වර්ග විකිණීම.
- ප්‍රදර්ශන භූමිය තුළ භූමි අලංකරණය සඳහා විශාල ප්‍රමාණයක් පැළ ලබා දීම.

**මධ්‍යම පරිසර අධිකාරිය**

- දැනුවත් කිරීමේ හා ප්‍රවර්ධන කටයුතු
- කසළ කළමනාකරණය
- ප්‍රදර්ශන කුටි

**භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය**

- වැල්ලවාය, බඩල්කුඹුර, සියඹලාණ්ඩුව, බිබිල, මොනරාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි ගංගා ඉවුරු පුනරුත්ථාපන හා පැළ සිටුවීමේ වැඩසටහන් 07ක් පැවැත්වීම.
- පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. - සියඹලාණ්ඩුව කොට්ඨාස අධ්‍යාපන කාර්යාල බල ප්‍රදේශයේ පාසල් 32ක් නියෝජනය වන පරිදි මධ්‍යස්ථාන 12කදී 2011.01.17 දින සිට 2011.01.22 දින දක්වා සම්මන්ත්‍රණ පැවැත්වීම.
- එක් පාසලක් සඳහා ඛනිජ සාම්පල එකතුවක්, ශ්‍රී ලංකාවේ ඛනිජ සම්පත් සිතියමක්, අත් පත්‍රිකා සහ පොත් ලබා දීම.
- ඛණිජ හා පාෂාණ පිළිබඳ ප්‍රායෝගික වැඩසටහන් පැවැත්වීම.
- 8 - 11 වසර සිසුන් සඳහා විෂය නිර්දේශයට අදාළව ඇති ඛනිජ හා පාෂාණ සහ ඒවායේ ප්‍රයෝජන, භාවිත කරනු ලබන කර්මාන්ත පිළිබඳව සවිස්තරාත්මකව දේශන පැවැත්වීම.
- ප්‍රදර්ශන භූමියේ පැවැති ප්‍රදර්ශන කුටියේ දී ශ්‍රී ලංකාවේ කාර්මික ඛනිජ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන, ඛනිජ ලබා ගන්නා ආකාරය, විද්‍යාගාර තුළ ඒවා විශ්ලේෂණය කරන ආකාරය, ඛනිජ ගවේෂණය හා අපනයන කිරීම, ඛනිජ වර්ග භූ විද්‍යාත්මක සමීක්ෂණ සිදු කරන ආකාරය හා ආසියා පැසිපික් කලාපය තුළ සිදුවන භූ කම්පන නිරීක්ෂණය කරන ආකාරය පිළිබිඹු වන අයුරින් ප්‍රදර්ශන කටයුතු සිදු කිරීම.

**සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය**

- ප්‍රදර්ශනයේ දී ආකෘති හා පෝස්ටර් යොදා ගනිමින් මහජනතාව දැනුවත් කිරීම.
- ප්‍රදර්ශනයට සාමගාමීව මොණරාගල දිස්ත්‍රික්කයේ පාසල් 23ක දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

**රාජ්‍ය දැව සංස්ථාව**

- දැව යොදා අළෙවි කුටියක් නිර්මාණය කර අළෙවි ප්‍රවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

[ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා]

- අළෙවිය සඳහා ඇති ගෘහ භාණ්ඩ ප්‍රදර්ශනයක් පැවැත්වීම.
- දැව සංස්ථාවේ කාර්යභාරය පිළිබිඹු කෙරෙන ප්‍රදර්ශනයක් පැවැත්වීම. (දැව පරිරක්ෂණය, දැව පදම් කිරීම, දැව ඉරුම්හල්, දැව හඳුනා ගැනීම ආදිය පිළිබඳව)

**ජාතික මැණික් හා ස්වරණාභරණ අධිකාරිය**

- ප්‍රදර්ශන භූමියේ පිහිටි ප්‍රදර්ශන කුටිය මඟින් මහජනතාව දැනුවත් කිරීම.
- ප්‍රදර්ශනයට සමගාමීව පාසල් 11ක සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්ම කිරීම.
- ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මැදිහත්ව සංවිධානය කළ ජංගම සේවා කටයුතුවලදී සක්‍රිය දායකත්වයක් ලබා දීම.

**මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය**

- බුත්තල සමූපකාර සංගමයට අයත් ගොඩනැඟිල්ලක ස්ථිර පුහුණු මධ්‍යස්ථානයක් ආරම්භ කරන ලද අතර එමඟින් මැණික් කැපීමේ හා ඔප දැමීමේ පාඨමාලාවක් සහ ස්වර්ණාභරණ නිෂ්පාදන පාඨමාලාවක් පැවැත්වීමට කටයුතු කර ඇත. එක් පාඨමාලාවකදී සිසුන් 15දෙනෙකු පුහුණු කිරීමේ පහසුකම් සලසා ඇත.
- ප්‍රදර්ශන භූමිය තුළ ප්‍රදර්ශන කුටියක් පැවැත්වීම මඟින් එම ප්‍රදේශයේ මැණික් කර්මාන්තය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම. එහිදී තාක්ෂණික හා වෙළඳ පොළ සම්බන්ධයෙන් කාර්මාන්තයේ ප්‍රගමනයට ඉවහල් වන දැනුම බෙදා දීම හා නවක නිර්මාණශීලී කණ්ඩායම් කර්මාන්තය සඳහා යොමු කිරීම සිදු කරන ලදී.

(iii) එක් එක් කාර්ය වෙනුවෙන් එම ආයතන වැය කරන ලද මුදල් පහත සඳහන් පරිදි වේ.

**වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව**

- ප්‍රදර්ශන කුටිය යොදා ගනිමින් මහජනතාව දැනුවත් කිරීම. - රු. 265,810.00
- ප්‍රදර්ශනයට සහභාගි වූ ජනතාවට දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන, පත්‍රිකා හා පෝස්ටර් විකිණීම හා වනජ පැළ විකිණීම සහ මෙහෙයුම් කටයුතු- රු. 146,600.00

**මධ්‍යම පරිසර අධිකාරිය**

- දැනුවත් කිරීමේ හා ප්‍රවර්ධන කටයුතු - රු. 4,562,337.00
- කැළි කසළ සහ මල අපද්‍රව්‍ය කළමනාකරණය - රු. 66,356,031..00
- ප්‍රදර්ශන කුටි ඉදි කිරීම (පාරිසරික නිවහන, සනීපාරක්ෂක කසළ රඳවනයක ආකෘතිය, කොම්පෝස්ට් අංගනයක ආකෘතිය, සේවා ස්ථානයක පිරිපහදු පද්ධතියක ආකෘතිය, පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීමේ කුටි සහ භූමි අලංකරණය) - රු. 4,471,775.00
- මෙහෙයුම් කටයුතු - රු. 1,087,254.00

**භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය**

- ප්‍රදර්ශන කුටිය සඳහා - රු. 400,000.00
- පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩටසහන්- රු. 75,000.00
- ප්‍රදර්ශන භාණ්ඩ සපයා ගැනීම, අත් පත්‍රිකා මුද්‍රණය, අන්තර්ජාල පහසුකම්, පුනරුත්ථාපන වැඩසටහන්, නවාතැන් හා වෙනත් - රු. 400,000.00
- වීඩියෝ ඉදිරිපත් කිරීම - රු. 43,629.00
- මෙහෙයුම් කටයුතු - රු. 201,331.83

**සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය**

- ප්‍රදර්ශනයේ දී ආකෘති හා පෝස්ටර් නිර්මාණය - රු. 76,500.00
- ප්‍රදර්ශනයට සාමගාමීව මොණරාගල දිස්ත්‍රික්කයේ පාසල් 23ක් දැනුවත් කිරීම - රු. 98,290.00
- ප්‍රදර්ශන කුටිය සඳහා - රු. 1,50,000.00
- මෙහෙයුම් කටයුතු - රු. 55,000.00

**රාජ්‍ය දැව සංස්ථාව**

- අළෙවි ප්‍රවර්ධන කුටිය සඳහා - රු. 2,081,975.00
- මෙහෙයුම් කටයුතු - රු. 711,711.00

**ජාතික මැණික් හා ස්වරණාභරණ අධිකාරිය**

- ප්‍රදර්ශන කුටිය සඳහා - රු. 489,325.00
- බැනර්, පෝස්ටර්ස්, අත්පත්‍රිකා සඳහා - රු. 367,950.00
- භාණ්ඩ ප්‍රවාහනය, මිලදී ගැනීම්, අලුත්වැඩියා සහ එහා මෙහා ගෙන යාමේ රක්ෂණ - රු. 483,302.00
- මෙහෙයුම් කටයුතු - රු. 522,400.00

**මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය**

- ප්‍රදර්ශන කුටිය සඳහා - රු. 283,059.50
- පුහුණු මධ්‍යස්ථානය ස්ථාපනය කිරීම සඳහා - රු. 522,017.30

(ඇ) අමාත්‍යාංශය විසින් පහත සඳහන් වැය ශීර්ෂ යටතේ වියදම් සිදු කරන ලදී.

160-02-03-19-2105 (II)

පවිත්‍ර නගර (පියකරු පුරවර) - රු. 1,440,348.50

160-02-03-32-2401(II)

වායු සම්පත් කළමනාකරණ කේන්ද්‍රය ශක්තිමත් කර වාහනවල වායු විමෝචන පරීක්ෂාව ක්‍රියාවට නැංවීමේ වැඩසටහන හා ශ්‍රී ලංකාවේ ගෘහස්ථ වායු තත්ත්ව කළමනාකරණය (දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා) - රු. 158,269.00

160-02-03-47-2401 (II)

දේශගුණ විපර්යාස මහලේකම් කාර්යාලය පිහිටුවීම සහ දේශගුණ විපර්යාසය යටතේ පර්යේෂණ අධ්‍යයනය (දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා) - රු. 105,323.00

(ඈ) පැන නොනඟී.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මේකයි. ගරු ඇමතිතුමා අමාත්‍යාංශයේ මුළු වියදම හැටියට මුලින්ම උත්තරයේ කිව්වේ රුපියල් දාහත් ලක්ෂ ගණනක්. එක් මිලියන හත් ලක්ෂ කියලා කිව්වේ. හැබැයි, මට ඇහුණ හැටි වැරදිද දන්නේ නැහැ. මධ්‍යම පරිසර අධිකාරිය වියදම් කළ ප්‍රමාණය රුපියල් මිලියන 76ක් වාගේ ප්‍රමාණයක් කිව්වා.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
ඔව්.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
එතකොට ගරු ඇමතිතුමනි, මධ්‍යම පරිසර අධිකාරිය හා අනෙකුත් ආයතන ඔක්කෝගේම එකතුව-

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
අපේ පරිසර අමාත්‍යාංශයෙන් වියදම් කළේ එක ගණනක්. අපි යටතේ තිබෙන ආයතන වියදම් කළ ගණන තමයි මම කොටස් වශයෙන් පෙන්වූයේ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඒක තමයි. ඒ ඔක්කෝම එකතුව ඔබතුමාට කියන්න පුළුවන්ද?

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
එකතුව නම් ලොකු ගණනක්. මට එක පාරටම ගණන් හදලා කියන්න බැහැ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
හොඳයි. බොහොම ස්තුතියි.

## දෙමදොය ග්‍රාමීය ජල ව්‍යාපෘතිය : කඩිනම් කිරීම
### தெமதொய கிராமிய நீர் வழங்கல் கருத்திட்டம் : துரிதப்படுத்தல்
### DEMADOYA RURAL WATER PROJECT : EXPEDITION

1298/'11

5. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මාතලේ දිස්ත්‍රික්කයේ, පල්ලෙපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, දෙමදොය ග්‍රාමීය ජල ව්‍යාපෘතියේ ඉදි කිරීම් කටයුතු අතරමග නවතා දමා ඇති බවත්;

(ii) එම ජල ව්‍යාපෘතිය නවතා දැමීම නිසා ප්‍රදේශයේ පවුල් දෙදහසක් පමණ උග්‍ර පානීය ජල ප්‍රශ්නයකට මුහුණ පා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ග්‍රාමීය ජල ව්‍යාපෘතිය සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

(ii) ජල ව්‍යාපෘතියේ වැඩ කටයුතු කඩිනමින් ආරම්භ කර ප්‍රදේශයේ ජනතාවගේ ජල අවශ්‍යතා ඉටු කිරීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நீர் வழங்கல், வடிகாலமைப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மாத்தளை மாவட்டத்தில் பல்லெபொல பிரதேச செயலாளர் பிரிவுக்குட்பட்ட தெமதொய கிராமிய நீர் வழங்கல் கருத்திட்டத்தின் நிர்மாணப் பணிகள் இடைநிறுத்தப்பட்டுள்ளதென்பதையும்;

(ii) மேற்படி நீர் வழங்கல் கருத்திட்டம் நிறுத்தப்பட்டதால் இப்பிரதேசத்தில் சுமார் இரண்டாயிரம் குடும்பங்கள் தீவிர குடிநீர் பிரச்சினைக்கு முகம் கொடுத்துள்ளன என்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி கிராமிய நீர் வழங்கல் கருத்திட்டத்துக்காக ஒதுக்கப்பட்ட நிதி எவ்வளவென்பதையும்;

(ii) நீர் வழங்கல் கருத்திட்டத்தின் பணிகளை விரைவாக ஆரம்பித்து இப்பிரதேச மக்களின் நீர் தேவையை நிறைவேற்றுவதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்

[ගරු බුද්ධික පතිරණ මහතා]

(iii) ஆமெனின் , மேற்படி பணிகளை ஆரம்பிக்கும் திகதி யாதென்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Water Supply and Drainage :

(a) Is he aware that-

(i) the construction work of the Demadoya Rural Water Project which comes under the Pallepola Divisional Secretary's Division in the Matale District has been stopped half way; and

(ii) about 2,000 families in the area have faced an acute drinking water problem as a result of stopping the aforesaid water project?

(b) Will he inform this House-

(i) the amount of money that has been allocated for the aforesaid rural water project;

(ii) whether steps will be taken to commence the work of the aforesaid water project expeditiously and fulfil the water requirements of the people of the area; and

(iii) if so, the date on which the work of the water project will be started?

(c) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ඒ ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

මෙය ග්‍රාමීය ජල ව්‍යාපෘතියක් නොවේ. නාවුල ජල සම්පාදන ක්‍රමයෙන් ලබා දෙනු ලබන නළ ජල දිගුවක් පමණි.

(ii) පවුල් 2,000කට උග්‍ර පානීය ජල ප්‍රශ්නයක් ඇති බව පිළිගත නොහැක.

(දෙමදොය ග්‍රාම නිලධාරි වසමේ පවුල් 250ක් පමණක් පදිංචිව ඇත. මණ්ඩලීය ජල දිගුව මඟින් ජල පහසුකම් ඉල්ලා ඇති පවුල් 100කට පමණ ජලය ලබා දීමට සැලසුම් කොට වැඩ කටයුතු ආරම්භ කර ඇත.)

(ආ) (i) රුපියල් ලක්ෂ 07කි.

(පල්ලේපොළ ප්‍රාදේශීය සභාවට අයත් මාර්ගයක කානු කැපීම සඳහා අවශ්‍ය මාර්ග අනුමැතිය ලබා ගෙන කානු කැපීම හා වැසීම ශ්‍රමදාන පදනමින් ප්‍රදේශවාසීන් විසින් සිදු කරවා ගැනීමට එබ්බාවෙල විහාරයේ විහාරාධිපති නාහිමියන් මූලිකත්වය ගෙන කටයුතු කරන අතර, ඒ අනුව කිලෝමීටර් 2ක් නළ එළීමට නියමිතය.)

(ii) ඔව්.

(iii) ප්‍රදේශවාසීන් විසින් එකඟ වී ඇති පරිදි, අදාළ මාර්ගයේ කානු කපා නිම කොට මණ්ඩලය වෙත දැනුම් දුන් පසු සතියක් තුළ නළ එළා ජල පහසුකම් ලබා දීමට හැකියාව ඇත. ඒ සඳහා කටයුතු කරමින් සිටී.

(ඇ) පැන නොනඟී.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමා සඳහන් කරපු ආකාරයට ප්‍රදේශවාසීන්ගේ මැදිහත්වීමේ ප්‍රමාදයකුත් මේ තුළ තිබෙන බව පෙනෙනවා. ප්‍රදේශවාසීන් සමඟ එකතු වෙලා, ඒ පිළිබඳව සාකච්ඡා කරලා, පොදු එකඟතාවකින් ඒ ව්‍යාපෘතිය කඩිනම් කරන්න.

අහවල් දවස වන කොට ඒ අය කානු ටික කපලා දුන්නොත් අපි නළ එළන්නම් කියන විධියට නොවෙයි. ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමා සඳහන් කරපු ආකාරයට ඒ ගමේ ඉන්නේ පවුල් දෙසීයයි. නමුත් අවට ගම්මාන කීපයකුත් තිබෙනවා. ඒ අවට ගම්මානවලටත් මේ දිගුවෙන් අතුරු සහන ලැබෙන නිසා, ගමේ අයත් එක්ක සාකච්ඡා කරලා ඒකාබද්ධ ක්‍රියාදාමයකට -කඩිනමින් ඒ කානු කපන ව්‍යාපෘතියකට- යන්න බැරිද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කරන කාරණාව සඳහා අපි,- [බාධා කිරීමක්] ඔබතුමා පාර්ලිමේන්තුවෙන් අයින් කරන්න ඉස්සෙල්ලා අපි නළ එළන්න පොරොන්දු වනවා.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
එහෙම අයින් කරන්නේ නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඉදිරි සති දෙක-තුන ඇතුළත මේ කටයුතු නිමවනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මේක ප්‍රජා ජල ව්‍යාපෘතියක් නොවෙයි. ඒක ඇත්ත. නමුත් සාමාන්‍ය ජල ව්‍යාපෘතිවලත්, ප්‍රජා ජල ව්‍යාපෘතිවලත් -මේ දෙකේම - ජලයේ ප්‍රමිතිය පිළිබඳව යම් යම් ගැටලු සහගත තත්ත්වයන් නිතර වාර්තා වෙනවා කියලා ඔබතුමාත් දන්නවා ඇති. ඒ පිළිබඳව සොයා බැලීමේ ස්ථාවර වැඩ පිළිවෙළක් ප්‍රාදේශීය ජල සම්පාදන මණ්ඩල හරහා වේගවත්ව ක්‍රියාවට නැඟීමේ හැකියාවක් තිබෙනවාද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මාස තුනකට වරක් ජලය පරීක්ෂාවට ලක් කළ යුතුයි කියලා ජල සම්පාදන මණ්ඩලය නියම කරලා තිබෙනවා. ඒ ලැබෙන වාර්තා අනුව ජල සම්පාදන මණ්ඩලයේ නිර්දේශය ලැබෙනවා. එවැනි තත්ත්ව පාලනයක් තිබෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ප්‍රජා ජල ව්‍යාපෘතියේ තත්ත්වය කොහොමද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ප්‍රජා ජල ව්‍යාපෘතිවලටත් ඒ නියමය කර තිබෙනවා ගරු මන්ත්‍රීතුමනි. නමුත් හදිසියේ ඇති වන ප්‍රශ්න තිබෙනවා. වෙනත් තැනකින් හදිසියේ අපවිත්‍ර ජලය ගලා ඒමක් ඇති වන අවස්ථා තිබෙනවා. ඒවාට වහා මැදිහත්වීම සෞඛ්‍ය නිලධාරින් හා ජල සම්පාදන මණ්ඩලයේ කාර්ය භාරයක්. එය එලෙස ඉටු කරනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ අවසාන අතුරු ප්‍රශ්නය. මේ ප්‍රදේශය කේන්ද්‍රව තිබෙනවා නාලන්දා ජලාශය. දැනටත් මේ අයගේ තිබෙන ලොකු අදෝනාවක් තමයි, "අපේ ප්‍රදේශයේ ජලය වෙනත් ප්‍රදේශවලට ගෙන යනවා, ජලාශය ළඟ ඉඳලත් අපට වතුර නැහැ" කියන එක. නමුත් මේ ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන කොට එයට විසඳුමක් ලැබෙයි. දැන් ගරු ඇමතිතුමා සහතිකයකුත් දුන්නා එය ඉටු කරන කාල වකවානුවත් එක්ක. මා දන්නේ නැහැ, එතුමා කියපු ආකාරයට ඒක කොච්චර කාලයකින්ද සිදු වෙන්නේ කියලා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

සිදු වෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ඒ එක්කම තුන්වන අතුරු ප්‍රශ්නය විධියට ගරු ඇමතිතුමාගෙන් මා අහන්නේ මෙයයි. මේ වාගේ ස්ථාන ඕනෑ තරම් රට පුරා තිබෙනවා, ගරු කථානායකතුමනි. තමන්ගේ ප්‍රදේශයේ ජලාශයක් තිබෙනවා, නමුත් ඒ ජලය වෙනත් ප්‍රදේශවලට ගෙන යනවා කියලා ඒ ජනතාවගේ ලොකු අදෝනාවක් තිබෙනවා. එවැනි ප්‍රදේශ හඳුනා ගෙන, ඒ ප්‍රදේශවල ජනතාවට ජලය ලබා දීමේ වැඩ විශේෂ පිළිවෙළක අවශ්‍යතාව රටේ තිබෙනවා කියලා මා හිතනවා. නැත්නම් ඒ අයට බරපතළ අසාධාරණයක් සිදු වනවා. ඒ අසාධාරණය බොහෝ ප්‍රදේශවල තිබෙනවා. එවැනි ප්‍රදේශ ඉලක්ක කරලා විශේෂ අවධානයක් යොමු කරන්න පුළුවන්ද ගරු ඇමතිතුමනි?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ඒක ඉතාම වැදගත් හා සත්‍ය කාරණාවක්. ජලය ලබා ගන්නා තැනින්ම ගමට ජලය දෙන්න බැරි අවස්ථා තිබෙන නිසා තමයි ජලය ලබා ගෙන, පවිත්‍ර කිරීම සඳහා පවිත්‍රාගාර වෙත ගෙන යන්නේ. පවිත්‍රාගාරය තිබෙන්නේ ඒ ගම ළඟ නොවෙයි. ඒ ගැටලුව තමයි තිබෙන්නේ. එහෙම නැත්නම් අපවිත්‍ර ජලය එවෙලේම, එතැනදීම ගමට දෙන්න පුළුවන්. නමුත් එහෙම කරන්න බැරි නිසා, කිලෝමීටර් ගණනාවක් දුරට ඒ ජලය ගෙනැල්ලා, පවිත්‍ර කරලා තමයි යළිත් නළ මාර්ගයෙන් බෙදා හැරීම් කටයුතු කරන්නේ. ජලය නොලැබෙන, මෙවැනි අතර මඟ ගම්මානවලට ජලය ලබා දීම සඳහා අපි නව වැඩ පිළිවෙළක් ආරම්භ කරලා තිබෙනවා. ආර්ථික සංවර්ධන ඇමතිතුමා සමඟත් අපි මේ කාරණය ගැන සාකච්ඡා කළා, පසු ගිය දිස්ත්‍රික් සංවර්ධන කටයුතුවලදී. මට්ටමින් එසේ අඩු පාඩු තිබෙන තැන්වලට නළ මාර්ගයෙන් ජලය ලබා දීම සඳහා අපේ අවධානය යොමු කරනවා.

## 2006 පළාත් පාලන මැතිවරණය : විස්තර
## உள்ளூராட்சித் தேர்தல் - 2006 : விபரம்
## LOCAL GOVERNMENT ELECTIONS - 2006 : DETAILS

0475/'10

6. **ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (4) :

(අ) (i) 2006 වර්ෂයේ පළාත් පාලන මැතිවරණය පවත්වන ලද දිනය කවරේද;

(ii) එක්සත් ජාතික පක්ෂය විසින් සහ ජනතා විමුක්ති පෙරමුණ විසින් ජයග්‍රහණය කරන ලද පළාත් පාලන ආයතන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) නිල කාලය නිමවීමට පෙර අත්හිටුවන ලද හෝ විසුරුවා හරින ලද පළාත් පාලන ආයතන සංඛ්‍යාව කොපමණද;

(iv) එසේ විසුරුවා හරින ලද පළාත් පාලන ආයතන කවරේද;

(v) ඒවා අත් හිටුවන ලද හෝ විසුරුවා හරින ලද දිනයන් සහ එසේ කිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (ii) හි සඳහන් සභා අතරින් නගරාධිපතිවරුන් ධුරයෙන් ඉවත් කරන ලද, ඔවුන්ගේ තනතුරු අත්හිටුවන ලද හෝ ඔවුන් තනතුරෙන් පහ කරන ලද, එසේත් නැති නම්, ඔවුන් විමර්ශනයට භාජන කරන ලද පළාත් පාලන ආයතනවල නම් කවරේද;

(ii) එම සිදුවීම්වලට අදාළ දිනයන් සහ එබඳු ක්‍රියාමාර්ග ගැනීමට හේතු කවරේද;

(iii) මේ වන විට ඔවුන් සම්බන්ධයෙන් එළැඹී ඇති නිගමන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

உள்ளூராட்சி, மாகாணசபைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2006ஆம் ஆண்டின் உள்ளூராட்சித் தேர்தல் நடத்தப்பட்ட திகதியையும்;

(ii) ஐ.தே.க. மற்றும் ம.வி.மு. ஆகிய கட்சிகள் வெற்றி பெற்ற சபைகளின் எண்ணிக்கையை வெவ்வேறாகவும்;

(iii) உரிய காலத்திற்கு முன்னரே இடைநிறுத்தப்பட்ட அல்லது கலைக்கப்பட்ட சபைகளின் எண்ணிக்கையையும்;

(iv) அச்சபைகளின் பெயர்களையும்;

(v) இடைநிறுத்தப்பட்ட அல்லது கலைக்கப்பட்ட திகதிகள், மற்றும் அதற்கான காரணங்களையும்

அவர் இச்சபைக்குத் தெரிவிப்பாரா?

(ஆ) (i) நகர பிதாக்கள் அகற்றப்பட்ட, இடைநிறுத்தப்பட்ட, பதவி நீக்கப்பட்ட அல்லது விசாரணை தொடரப்படும் (ii)இல் குறிப்பிட்ட சபைகளின் பெயர்களையும்;

[ගරු රවි කරුණානායක මහතා]

(ii) அவ்வாறு நடவடிக்கை எடுக்கப்பட்ட திகதிகளையும் அவற்றுக்கான காரணங்களையும்;

(iii) தற்போது அவர்கள் தொடர்பாக எடுக்கப்பட்ட முடிவுகளையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Local Government and Provincial Councils:

(a) Will he inform this House -

(i) the date on which the Local Government Election was held in 2006;

(ii) the number of Councils won by UNP and JVP separately;

(iii) the number of Councils which were suspended or dissolved before the due time;

(iv) the names of those Councils; and

(v) the dates of suspension or dissolution and the reasons to do so?

(b) Will he state-

(i) the names of the councils as (a) (ii) where the Mayors have been removed, suspended, sacked or investigations are been proceeded;

(ii) the relevant dates and the reasons as to why such actions have been taken; and

(iii) the conclusions arrived on them as at this moment?

(c) If not ,why?

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා (පළාත් පාලන හා පළාත් සභා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க - உள்ளூராட்சி, மாகாண சபைகள் பிரதி அமைச்சர்)
(The Hon. Indika Bandaranayake - Deputy Minister of Local Government and Provincial Councils)

ගරු කථානායකතුමනි, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් මා පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 2006.03.30 සහ 2006.05.20 යන දිනවලදී.

(ii) එක්සත් ජාතික පක්ෂය - 40

ජනතා විමුක්ති පෙරමුණ - 01

(iii) 05කි.

(iv) (1) කොළඹ මහ නගර සභාව.

(2) පානදුර නගර සභාව

(3) නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව

(4) උඩපළාත ප්‍රාදේශීය සභාව

(5) තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව

(v) ඇමුණුම **සභාගත*** කරමි.

(ආ) (i) මහනුවර මහ නගර සභාව

(ii) අත්හිටවූ දිනය - 2010.02.10

ඉවත් කළ දිනය - 2010.08.23

අදක්ෂතාවය හා නොමනා පාලනය හේතුවෙනි.

(iii) ධුරයෙන් ඉවත් කිරීම.

(ඇ) පැන නොනඟී.

***සභාමේසය මත තබන ලද ඇමුණුම:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
*Annex tabled:*

ඇමුණුම 1

(1) කොළඹ මහ නගර සභාව

අත්හිටවූ දිනය - 2008.10.29

විසිරවූ දිනය - 2010.06.23

බස්නාහිර පළාතේ 1991 අංක 04 දරන පළාත් පාලන ආයතන වල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2වන වගන්තිය යටතේ වැරදි ක්‍රියා සිදු කර ඇති බවට කරුණු අනාවරණය වූයෙන් තවදුරටත් පරීක්ෂා කර වාර්තා කිරීමට යටත්ව ඉහත කී ප්‍රඥප්තියේ විධිවිධාන අනුව කොළඹ මහ නගර සභාවේ කටයුතු අත්හිටුවන ලදී.

එම ප්‍රඥප්තියේ 2වන වගන්තිය යටතේ පත් කරන ලද විශ්‍රාමලත් අභියාචනාධිකරණ විනිසුරුවරුන් දෙපළකගෙන් සැදුම්ලත් පරීක්ෂණ කොමිෂන් සභාවක් විසින් ඉදිරිපත් කරන ලද වාර්තා අනුව විසුරුවා හැර ඇත.

(2) පානදුර නගර සභාව

විසිරවූ දිනය - 2008.01.18

බස්නාහිර පළාතේ 1991 අංක 04 දරන පළාත් පාලන ආයතන වල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2වන වගන්තිය යටතට ගැනෙන වැරදි ක්‍රියා සිදු කර ඇති බවට විශ්‍රාමික මහාධිකරණ විනිසුරුවරයෙකුගෙන් සැදුම්ලත් ඒක පුද්ගල පරීක්ෂණ කොමිෂන් සභාවේ නිගමනය අනුව.

(3) නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව

විසිරවූ දිනය - 2005.05.02

වයඹ පළාත් සභාවේ 1990 අංක 1 දරණ වයඹ පළාත් පාලන ආයතන පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලතල පිළිබඳව ප්‍රඥප්තියේ 2(1) වගන්තිය යටතට ගැනෙන වැරදි සිදු කිරීම නිසාය.

4. උඩපළාත ප්‍රාදේශීය සභාව

අත්හිටවූ දිනය - 2008.08.26

විසිරවූ දිනය - 2010.01.22

ප්‍රාදේශීය සභාවෙහි අකාර්යක්ෂමතාව හා නොමනා පාලනය හේතුවෙන් 1990 අංක 07 දරන පළාත් පාලන ආයතන වල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2(1) වගන්තිය යටතේ විසුරුවා හැර ඇත.

5. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව

විසිරවූ දිනය - 2010.02.01

1639/4 දරණ අති විශේෂ ගැසට් නිවේදනය අනුව මූල්‍ය අක්‍රමිකතා සහ අවිධිමත් කළමනාකරණය හේතුවෙන් තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව විසුරුවා හැර ඇත.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, කලක් ගියාට පසුව හෝ එම ප්‍රශ්නයට උත්තර දීම සම්බන්ධව ඔබතුමාට මගේ ස්තුතිය පළ කරනවා. ඒ වාගේම කොළඹ මහ නගර සභාවේ ජීවත් වන ජනතාවට ස්තුති කරන ගමන් කොළඹ මහ නගර සභාවට විශේෂ

කොමසාරිස් කෙනකු පත් කරලා දිනපු මුසම්මිල් නගරාධිපතිට බලය ලබා දෙන්න කටයුතු කරන්නේ නැත්තේ ඇයි කියන එක මා මේ අවස්ථාවේදී අහනවා. එතුමා දිනලා තවමත් වැඩ කටයුතු භාර ගන්න බැරි තත්ත්වයක් තමයි ඇති වෙලා තිබෙන්නේ. "ගැසට් කරලා නැහැ"යි කියනවා. මේ සම්බන්ධයෙන් වහාම නීතිය ක්‍රියාත්මක කරන්න පුළුවන්ද?

මේ කියන මොහොතේ පිටකොටුවේ පොලීසිය පදික වෙළෙන්දන් එළවන්න පටන් ගෙන තිබෙනවා. ඒ ගොල්ලෝ එළියට ගිහින් නැවත ඇතුළට ඇවිත් තිබෙනවා. යුද හමුදාව ඇවිත් ඒක පාලනය කරන්න හදනවා. මේ තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ හරියාකාර පාලනයක් ගෙන යන්න බැරි නිසයි.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා ඉන්නවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, ඔබතුමා මෙතැන ඉන්නකොට වෙනත් අය පනින්න ඕනෑ නැහැ නේ. ඔබතුමා මෙතැන ඉන්නවා. ඔබතුමාට බාධා කරනවා. [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා මෙතැන ඉන්නවා. තමුන්නාන්සේ පොඩ්ඩක් ඉන්න. ගරු නියෝජ්‍ය ඇමතිතුමා පිළිතුරක් දෙයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මේගොල්ලන් නිකම් බොරුවට ඔබතුමාට බාධා කරනවා.

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)
ගරු කථානායකතුමනි, අපට ඒ පිළිබඳව තොරතුරු ලැබිලා නැහැ. මේ මන්ත්‍රීතුමා ඒ පිළිබඳව තොරතුරු ලබා දෙනවා නම් අපට ඒ පිළිබඳව අවශ්‍ය කටයුතු කරන්න පුළුවන්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපේ මුසම්මිල් මැතිතුමා ඊයේ නායකතුමා ඉදිරිපිට දිවුරුම් දුන්නා. අපි මහ නගර සභාවට යන්න හැදුවා. "නැහැ, තවම අවසර නැහැ." කියලා කියනවා. විශේෂ කොමසාරිස් කෙනෙක් පත් කර තිබෙන නිසා ප්‍රශ්නයක් තිබෙනවාලු. ඒක හරි අසාධාරණයි. ඡන්දයක් නොවෙයි යුද්ධයක් තිබුණේ.

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)
ගරු කථානායකතුමනි, අපි ජනමතයට බොහොම හිස නමනවා. ජනතාව කොළඹ මහ නගර සභාව පමණක් එක්සත් ජාතික පක්ෂයට භාර දී තිබෙනවා. අපි එතුමන්ලාට නීත්‍යානුකූලව ඒ වගකීම පවරන්න කටයුතු කරනවා. ඒ පිළිබඳව කිසිම ගැටලුවක් නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අදම කරනවාද? [බාධා කිරීමක්]

දෙවන එක, බණ්ඩාරවෙල නගර සභාව. ඒක අතිවිශිෂ්ට මට්ටමට ජයග්‍රහණය කරලා එතැන චමින්ද කියලා තරුණ නගරාධිපති කෙනෙක් ඉන්නවා. නමුත් එතුමාගේ කටයුතුවලට බාධා කිරීමේ වැඩ පිළිවෙළක් ගෙන යනවා.

එතැන හිටපු නගරාධිපති නලීන් සූරියගේ මහතාගේ දූෂණ වහන්න කටයුතු කරගෙන යන ගමන් බණ්ඩාරවෙල නගර සභාවේ අනවශ්‍ය ලෙස ප්‍රශ්න ඇති කර ගෙන යනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, දේශපාලන මට්ටමින් මේ වාගේ කුහක විධියට කටයුතු කර ගෙන යන්නේ ඇයි? ඊට වැඩිය පට්ටපල් හොරු අද ඉන්නකොට-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ප්‍රශ්නයට අදාළව අතුරු ප්‍රශ්න අහන්න. වෙනත් ඒවා ගැන කථා කරන්න යන්න එපා. එතකොට ඇවිළෙනවානේ.

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)
ගරු කථානායකතුමනි, එම අතුරු ප්‍රශ්නය මේකට අදාළ ප්‍රශ්නයක් නොවෙයි. එතුමා විස්තර දෙනවා නම් අපට ඒ පිළිබඳව කටයුතු කරන්න පුළුවන්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ කියන්නේ ඒ සම්බන්ධයෙන් මොනවත් කරන්න තිබෙනවාද? [බාධා කිරීම්]

මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මේකයි. කරුණාකර කියන්න, මේ අමාත්‍යාංශය ආරක්ෂක අමාත්‍යාංශයට භාර දීලා තිබෙනවාද කියා. පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයට සම්බන්ධ, නාගරික සංවර්ධන අධිකාරියට සම්බන්ධ ඔක්කෝම දැන් ආරක්ෂක අමාත්‍යාංශයට පවරා ගෙන තිබෙනවාද නැද්ද කියා දැන ගන්න කැමැතියි. මොකද, මේ විෂයය පද්ධතිය දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ භාර දීලා තිබෙන විෂයයක්. මේක නැවත මධ්‍යම ආණ්ඩුවට බලහත්කාරයෙන් අරගෙන තිබෙනවාද, නැද්ද කියන එක මා දැන ගන්න කැමැතියි.

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)
ගරු කථානායකතුමනි, එහෙම අරගෙන නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ?

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)
නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එහෙනම් මේ පත්තරවල කියලා තිබෙන්නේ අසත්‍ය ප්‍රචාරද?

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)
පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය අරගෙන නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, කරුණාකර එහෙනම් නිවැරදි කිරීමක් කරන්න අවශ්‍යයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ සම්බන්ධයෙන් සොයා බලා කටයුතු කරන්න.

## උද්ධමනය පාලනය : පියවර
## பணவீக்கக் கட்டுப்பாடு: நடவடிக்கை
## CONTROL OF INFLATION : MEASURES TAKEN

1023/'10

7. **ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3) :

(අ) ශ්‍රී ලංකාවේ උද්ධමනය ගණනය කිරීමට යොදා ගන්නා වත්මන් ක්‍රමවේදය සෑහීමකට පත්විය හැකි මට්ටමක පවතින්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උද්ධමනය පාලනය කිරීමට වර්තමානයේ රජය විසින් ගනු ලබන පියවර කවරේද;

(ii) එම පියවර මඟින් ප්‍රමාණවත් අන්දමින් උද්ධමනය පාලනය වන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්,ඒ මන්ද?

நிதி, திட்டமிடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) இலங்கையில் பணவீக்கத்தைக் கணிப்பிடுவதற்காகத் தற்போது பயன்படுத்தப்படுகின்ற முறைமை திருப்தியடையக்கூடிய மட்டத்தில் உள்ளதா என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) பணவீக்கத்தைக் கட்டுப்படுத்துவதற்காகத் தற்போதைய அரசாங்கம் மேற்கொண்டுள்ள நடவடிக்கைகள் எவை என்பதையும்,

(ii) மேற்படி நடவடிக்கைகள்மூலம் போதியளவில் பணவீக்கம் கட்டுப்படுத்தப்படுகின்றதா என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Planning :

(a) Will he state whether the current system adopted in Sri Lanka to calculate inflation is satisfactory ?

(b) Will he state -

(i) the measures that are currently being taken by the government to control inflation ; and

(ii) whether those measures control the inflation substantially ?

(c) If not, why ?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා (මුදල් හා ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன - நிதி, திட்டமிடல் பிரதி அமைச்சர்)
(The Hon. Gitanjana Gunawardena - Deputy Minister of Finance and Planning)
ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) ඔව්.

2006/07 කුටුම්භ ආදායම් සහ වියදම් සමීක්ෂණය මඟින් හෙළි වූ කරුණුවලින් පෙන්නුම් කරන ආකාරයට, මහජනතාවගේ පාරිභෝගික රටාවන්වල වෙනස්වීම පිළිබිඹු කිරීමට, කොළඹ පාරිභෝගික මිල දර්ශකය 2011 ජුනි මාසයේදී පදනම් වසර 2006/07 සඳහා සංශෝධනය කරන ලදී. මේ අනුව උද්ධමනය ගණනය කිරීම සඳහා වර්තමානයේ වඩාත් නියෝජනාත්මක මිල දර්ශකයක් භාවිතා කෙරේ.

(ආ) (i) දේශීය හා විදේශීය භාණ්ඩ සැපයුම් අංශයෙහි ඇති වන වෙනස්කම් අනුව දේශීය වෙළෙඳ පොළේ භාණ්ඩ මිල ගණන් නිතර උච්චාවචනය වීම වළකා උද්ධමනය පාලනය කිරීමේ අරමුණින් රජය විසින් අවශ්‍ය පරිදි ඇතැම් තෝරා ගත් අත්‍යවශ්‍ය භාණ්ඩ මත පවත්නා බදු සඳහා ගැළපීම් සිදු කරනු ලැබේ. එමෙන්ම අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ සාධාරණ මිලකට ලබා දී වෙළෙඳ පොළ මිල ස්ථායී කිරීමට ලක් සතොස, සමුපකාර සමිති යනාදිය උපයෝගී කර ගෙන පාරිභෝගික භාණ්ඩ බෙදා හැරීම සැපයීම සිදු කරයි.

මේ අතර, පවතින රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය මඟින් අය වැය හිඟය අඩු කර ඇති අතර, ඒ අනුව අය වැය හිඟය පියවීම සඳහා දේශීය බැංකු අංශයෙන් ණය ලබා ගැනීමට ඇති අවශ්‍යතාව අඩු වී ඇත. එයින් උද්ධමනය කෙරෙහි ඉල්ලුම් අංශයෙන්ඇති විය හැකි පීඩනය අඩු වී ඇත.

(ii) ඔව්.

වාර්ෂික ලක්ෂ්‍යාමය පදනම අනුව සලකන විට උද්ධමනය 2009, 2010 සහ 2011වසරේ මේ දක්වා තනි ඉලක්කමක මට්ටමේ පවත්වා ගැනීමට හැකි වී ඇත. 2011 සැප්තැම්බර් මස උද්ධමනය සියයට 6.4ක් විය. උද්ධමනයේ වාර්ෂික සාමාන්‍ය අගය ද සැප්තැම්බර් මස සියයට 7.2ක් විය.

(ඇ) පැන නොනඟී.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි,අපේ ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් මට අතුරු ප්‍රශ්න තුනක් අහන්න තිබෙනවා. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙකයි. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමා කථා

කළා, තනි ඉලක්කම් උද්ධමනයක් පිළිබඳව. නමුත් යථාර්ථවාදීව උද්ධමනය ගණනය කිරීමේදී පරිභෝජනය සඳහා වියදම් කෙරෙන සියලුම භාණ්ඩ හා සේවාවන් අයත් වන්නට ඕනෑ. නමුත් ශ්‍රී ලංකාවේ මෙය සිදු වන්නේ නැහැ. කොළඹ පාරිභෝගික මිල දර්ශකයට අයත් භාණ්ඩ පැසෙන් මධ්‍යසාර වර්ග, දුම් කොළ සහ මත්පැන් ඉවත් කර තිබෙනවා. ඇත්ත වශයෙන්ම මෙය උද්ධමනය ගණනය කිරීමේ ජාත්‍යන්තර නිර්ණායකයන්ට පටහැනියි. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, මා ඔබතුමාගෙන් අහන්න කැමැතියි, ශ්‍රී ලංකාවේ උද්ධමනය ගණනය කිරීමේදී සිදු වන මේ අඩු පාඩුව නිවැරදි කරන්නට කටයුතු කරන්නේ කවදාද කියා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

ගරු කථානායකතුමනි, උද්ධමනය ගණනය කිරීම පාරිභෝගික මිල දර්ශකය මත සිදු කරනවා. ඒ අනුව පාරිභෝගික මිල දර්ශකයේ-[බාධා කිරීමක්] රෙදි පිළි, පාවහන්, නිවාස, ජලය, විදුලිය, ගෑස් සහ අනෙකුත් ඉන්ධන, ඒ වාගේම ගෘහ උපකරණ හා නිවාස නඩත්තුව, සෞඛ්‍ය, ගමනාගමනය, සන්නිවේදනය, විනෝදාංශ සහ සංස්කෘතික කටයුතු, අධ්‍යාපන සහ අනෙකුත් සේවා භාණ්ඩ වශයෙන් තමයි මේ ගණනය සිදු කර තිබෙන්නේ.

2002 වසර 100 වශයෙනුත්, 2006 වසර 100 වශයෙනුත් ගත් කල කොළඹ පාරිභෝගික මිල දර්ශකයත්, නව කොළඹ පාරිභෝගික මිල දර්ශකයත් අතර ඉතා සුළු වෙනසක් තමයි එම දර්ශක දෙකේ ගමන ප්‍රස්තාරයකට නැඟූ කළ පිළිබිඹු කරන්නේ. මා කැමැතියි, එය ඔබතුමාට ඉදිරිපත් කරන්න. ඒ තුළ ඔබතුමා අහන මත් ද්‍රව්‍ය සහ -

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මත් ද්‍රව්‍ය නොවෙයි. දුම් කොළ සහ මත්පැන්.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

සමස්තයක් හැටියට දුම් කොළ සහ මත්පැන් පිළිබඳව ගත්තොත් මා ඔබතුමාට කියන්න කැමැතියි, ඒ සමස්තයේ සියයට 2ක් පමණක්, ඒ කියන්නේ සියයට 7.2කින් සියයට දශම 144ක නියෝජනයක් තමයි එයින් ඇති වන්නේ කියලා. නමුත් ඒ පාරිභෝගික රටාවන් අද වෙනස් වෙලා තිබෙනවා. ඒ අනුව ගන්න sample එක තුළින් මෙම නියෝජනය පිළිබිඹු කිරීමෙන් විශාල බලපෑමක් නැති බව තමයි පැහැදිලි කරන්නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මට සමා වන්න. පළමුවන අතුරු ප්‍රශ්නය වශයෙන් මා ඇසුවේ, ජාත්‍යන්තර ක්‍රමයට අනුව උද්ධමනය ගණනය කිරීමේදී මේ මත්පැන්, දුම් කොළ සහ මද්‍යසාර වර්ග ඉවත් කිරීම යථාර්ථවාදි නොවන බවයි. ඒ කියන්නේ ජාත්‍යන්තර නිර්ණායකයන්ට පටහැනියි කියන එකයි. මා ඔබතුමාගෙන් අහපු පළමුවන ප්‍රශ්නය තමයි, මේ වරද, මේ ගණනය කිරීමේ අඩු පාඩුව නිවැරදි කරන්නේ කවදාද කියලා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

මා හිතන හැටියට මේ නිවැරදි කිරීම තමයි, 2002 දීත්, 2007 දීත්, 2011 දීත් කළේ. අපේ උද්ධමනය පිළිබඳ අද ඔබතුමා කරන ආකාරයෙන් ප්‍රශ්න කිරීමක් ජාත්‍යන්තරය මෙතෙක් කරලා නැහැ. ඔබතුමා ඒ ප්‍රශ්න කිරීම කරනවා නම්, පළමුවෙන්ම ජාත්‍යන්තර මූල්‍ය ආයතන, ජාත්‍යන්තර වශයෙන් මේ සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරන ලෝක බැංකු වාර්තාව මේ සම්බන්ධයෙන් ප්‍රශ්න කළ යුතුයි. එවැනි ප්‍රශ්න කිරීමක් අද කරලා නැහැ. එම නිසා ඔබතුමා මේ කරුණු, සාධක සැලකිල්ලට ගෙන නැවත වරක් ප්‍රශ්නයට යොමු විය යුතුයි කියන ටිකයි ඔබතුමාට කියන්නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මේකයි. 1952 මිල දර්ශකය පාදක කර ගෙන වැඩි වන ජීවන වියදම් ඒකකයකට රුපියල් 2ක් වැඩි කළා. 2002 මිල දර්ශකය පාදක කර ගෙන 2008 වෙනස් කරපු කොළඹ පාරිභෝගික මිල දර්ශකයට අනුව වැඩි වන ජීවන වියදම් ඒකකයකට රුපියල් 68ක් ලබා දීමට තීරණය කරලා තිබෙනවා.

මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, 2009, 2010 පාදක කරගෙන 2011 දී වෙනස් කරපු කොළඹ පාරිභෝගික මිල දර්ශකයට අනුව වැඩි වන ඒකකයට කොපමණ ජීවන වියදම් දීමනාවක් ලබා දෙන්නට ඔබතුමන්ලා කටයුතු කරනවාද කියා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

ගරු මන්ත්‍රීතුමනි, මා හිතන්නේ ඒක වෙනම ඇසිය යුතු ප්‍රශ්නයක් කියලායි. ඔබතුමාගේ ඒ ප්‍රශ්නයේ පළමුවන කොටසට පිළිතුරු වශයෙන් මම කියන්න කැමැතියි, රටේ උද්ධමන වේගය මැනීම සඳහා වඩාත් නියෝජනාත්මක දර්ශකයක් පැවැත්වීමේ දැඩි අවශ්‍යතාව හඳුනා ගෙන ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් 2002 වසරේ සිදු කරන ලද කුටුම්බ ආදායම් වියදම් සමීක්ෂණය මත පදනම් වූ බර තැබීම සහිත නව කොළඹ පාරිභෝගික මිල දර්ශකය 2007 වසරේ නොවැම්බර් මාසයේ හඳුන්වා දුන් බව. අවුරුදු පහකට ඉස්සෙල්ලායි ඒ. එම පාරිභෝගික මිල දර්ශකය කොළඹ නගර සීමාවේ ජීවත් වෙන, වැඩ කරන පන්තියේ කුටුම්බ 455ක නියැදියක් මත පදනම් වූවක්. 1952 ඉඳලා ආවේ කොළඹ නගර සීමාවේ, වරාය අවට ජීවත්වන කුටුම්බ 455ක ප්‍රමාණය පදනම් කරගෙනයි. කොළඹ දිස්ත්‍රික්කයේ විහිදෙන, ඊට වඩා නියෝජනාත්මක කුටුම්බ 1300ක පදනම මත තමයි අද මේ පාරිභෝගික මිල දර්ශකය ගණනය කර තිබෙන්නේ. ඒ නිසා එය වඩාත් නියෝජනාත්මකයි. නගරාසන්නව, කොළඹ නගරයට පමණක් සීමා නොවුණු, කොළඹ දිස්ත්‍රික්කය තුළ ව්‍යාප්ත වුණු ජනතාවගෙන් එම නියෝජනය ලබා ගෙන තිබෙනවා. එම නිසා ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව නව කොළඹ පාරිභෝගික මිල දර්ශකය ගැන වඩාත් විශ්වාසයක් තබනවා.

ගරු මන්ත්‍රීතුමා අහපු අනික් ප්‍රශ්නය ගැන කියනවා නම් ඒ විෂය භාරව ඉන්නේ අපේ කම්කරු අමාත්‍යතුමායි. මීට කලිනුත් මේ පිළිබඳ ප්‍රශ්නයකට උත්තර දී තිබෙනවා. ඒ නිසා එතුමාට ඒ ප්‍රශ්නය යොමු කරනවා නම් එය වඩා වැදගත් වෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ඒ කියන්නේ ජීවන වියදම් දීමනාව භාරව ඉන්නේ කම්කරු ඇමතිතුමාද? මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය නොවෙයිද?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

ජීවන වියදම් දීමනාව නොවෙයි. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කතා කළේ පඩි වැඩි වීම් සහ ඒ අදාළ ගනුදෙනුව පිළිබඳවයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon.  Sajith Premadasa)

නැහැ, නැහැ. මම කතා කළේ ජීවන වියදම් දීමනාව පිළිබඳවයි.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

ජීවන වියදම් දීමනාව නොවෙයි. ඒක ඉදිරියේදී අය වැය ලේඛනය ඉදිරිපත් කරනකොට නැවතත් ලබා ගන්න පුළුවන්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon.  Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා ආර්ථිකය මෙහෙයවන ආයතනයක ප්‍රධානියෙක් හැටියට-

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

නියෝජ්‍ය ඇමති.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon.  Sajith Premadasa)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා හොඳාකාරවම දන්නවා, උද්ධමන වර්ග ගණනාවක් තිබෙන බව. පිරිවැය උද්ධමනය කියා එකක් තිබෙනවා; ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනය කියා එකක් තිබෙනවා; වැටුප් දහර උද්ධමනය කියා තව එකක් තිබෙනවා; ආර්ථිකයේ ව්‍යුහාත්මක අංශයේ දුර්වලතා මත පදනම් වුණු උද්ධමනය කියා තවත් එකක් තිබෙනවා. ඇත්ත වශයෙන්ම උද්ධමනය ගණනය කිරීම යථාර්ථවාදී නොවන ආකාරයට ක්‍රියාත්මක වීම තුළින් අපේ රටේ ගණනය නොකෙරෙන, සැඟවුණු උද්ධමනයක් ඇති වෙලා තිබෙනවා. මම මේ සඳහන් කරපු ඒ උද්ධමන ප්‍රශ්නවලට ආණ්ඩුව ගන්නා වූ යථාර්ථවාදී ක්‍රියා මාර්ගය මොකක්ද කියා මම අහනවා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කී පරිදි උද්ධමනයට විවිධාකාරයේ බලපෑම් ඇති වෙනවා. නමුත් ප්‍රධාන වශයෙන් ඇති වෙන්නේ මිල උච්චාවචනයේ බලපෑමයි. මිල වැඩි වෙන එකේ වෙනස තමයි උද්ධමනය හැටියට අපි හඳුන්වන්නේ. ඒ නිසා ලෝකය පිළිගත්ත උද්ධමනය හැටියට කවුරුත් අර්ථ නිරූපණය කරන්නේ ඒ පිළිබඳවයි. ඒ නිසායි මිල දර්ශකය මත පදනම් කර ගත් උද්ධමනය අප ප්‍රකාශ කරන්නේ සහ මූල්‍ය සැපයුම සහ අනිකුත් දෑ ඊට ප්‍රතිචාරය දක්වන්නට කටයුතු කර තිබෙන්නේ.

ඒ අනුව ඔබතුමාගේ දැන ගැනීමට 2000 සිට 2011 දක්වා වර්ෂවල උද්ධමනයේ උච්චාවචනය අපට පෙන්වන්නට පුළුවන්. ඒ විස්තරය සඳහන් ලැයිස්තුව මා **සභාගත*** කරනවා. එහි වැඩිම ප්‍රතිශතයක් සඳහන් වුණේ 2008 වසරේ යි. එය සියයට 22.6 ක්. ඒ වාගේම නැඟීමක් තිබුණා, 2002 වසරේ සියයට 9.6ක්. දැන් උද්ධමනය අපට පාලනය කර ගන්නට පුළුවන් වෙලා තිබෙනවා, සියයට 7.2කට. එය එක ඉලක්කමකට ගෙනැවිත් තිබෙනවා. එය තවදුරටත් පාලනය කර ගන්නට අප බලාපොරොත්තු වෙනවා. ස්තූතියි.

***සභාමේසය මත තබන ලද ලේඛනය:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட ஆவணம் :*
** document tabled:*

**COLOMBO CONSUMERS' PRICE**

| Year | Month | Annual Inflation |
|---|---|---|
| | | |
| | February | 9.1% |
| | March | 8.9% |
| | April | 8.9% |
| | May | 9.2% |
| | June | 10.1% |
| | July | 10.3% |
| | August | 10.3% |
| | September | 10.2% |
| | October | 10.3% |
| | November | 10.0% |
| | December | 9.4% |
| 1999 | January | 8.6% |
| | February | 8.0% |
| | March | 7.4% |
| | April | 7.2% |
| | May | 6.8% |
| | June | 5.9% |
| | July | 5.2% |
| | August | 5.0% |
| | September | 5.0% |
| | October | 4.8% |
| | November | 4.7% |
| | December | 4.7% |
| 2000 | January | 4.4% |
| | February | 4.1% |
| | March | 4.1% |
| | April | 3.8% |
| | May | 3.4% |
| | June | 3.7% |
| | July | 4.4% |
| | August | 4.8% |
| | September | 5.1% |
| | October | 5.3% |
| | November | 5.6% |
| | December | 6.2% |
| 2001 | January | 7.5% |
| | February | 8.7% |
| | March | 9.5% |
| | April | 10.3% |
| | May | 11.5% |
| | June | 12.2% |
| | July | 12.4% |
| | August | 12.6% |
| | September | 13.1% |
| | October | 13.6% |
| | November | 14.2% |
| | December | 14.2% |
| 2002 | January | 13.5% |
| | February | 12.8% |
| | March | 12.7% |
| | April | 12.2% |
| | May | 11.7% |
| | June | 11.4% |
| | July | 11.1% |
| | August | 11.0% |
| | September | 10.4% |
| | October | 9.9% |
| | November | 9.5% |
| | December | 9.6% |
| 2003 | January | 10.0% |
| | February | 10.2% |
| | March | 9.9% |
| | April | 9.9% |
| | May | 9.5% |
| | June | 9.0% |

**COLOMBO CONSUMERS' PRICE**

| Year | Month | Annual Inflation |
|---|---|---|
| | | |
| | July | 8.3% |
| | August | 7.8% |
| | September | 7.6% |
| | October | 7.2% |
| | November | 6.8% |
| | December | 6.3% |
| 2004 | January | 5.2% |
| | February | 4.4% |
| | March | 3.9% |
| | April | 3.7% |
| | May | 3.7% |
| | June | 3.9% |
| | July | 4.3% |
| | August | 4.9% |
| | September | 5.4% |
| | October | 6.1% |
| | November | 6.8% |
| | December | 7.6% |
| 2005 | January | 8.8% |
| | February | 10.1% |
| | March | 11.1% |
| | April | 11.9% |
| | May | 12.4% |
| | June | 12.6% |
| | July | 12.7% |
| | August | 12.8% |
| | September | 12.7% |
| | October | 12.5% |
| | November | 12.1% |
| | December | 11.6% |
| 2006 | January | 11.1% |
| | February | 10.3% |
| | March | 9.6% |
| | April | 9.2% |
| | May | 9.4% |
| | June | 10.1% |
| | July | 10.4% |
| | August | 10.8% |
| | September | 11.2% |
| | October | 11.8% |
| | November | 12.7% |
| | December | 13.7% |
| 2007 | January | 14.8% |
| | February | 15.8% |
| | March | 16.8% |
| | April | 17.4% |
| | May | 17.4% |
| | June | 17.0% |
| | July | 17.2% |
| | August | 17.3% |
| | September | 17.5% |
| | October | 17.7% |
| | November | 17.7% |
| | December | 17.5% |
| 2008 | January | 17.6% |
| | February | 18.1% |
| | March | 18.8% |
| | April | 20.0% |
| **(BASE YEAR 2002=100)** | | |
| | | |
| 2008 | May | 19.8% |
| | June | 21.0% |

**COLOMBO CONSUMERS' PRICE**

| Year | Month | Annual Inflation |
|---|---|---|
| | | |
| | July | 21.9% |
| | August | 22.6% |
| | September | 23.2% |
| | October | 23.4% |
| | November | 23.0% |
| | December | 22.6% |
| 2009 | January | 21.6% |
| | February | 20.3% |
| | March | 18.6% |
| | April | 16.7% |
| | May | 14.7% |
| | June | 12.5% |
| | July | 10.4% |
| | August | 8.5% |
| | September | 6.6% |
| | October | 5.2% |
| | November | 4.1% |
| | December | 3.4% |
| 2010 | January | 3.1% |
| | February | 3.1% |
| | March | 3.2% |
| | April | 3.4% |
| | May | 3.6% |
| | June | 3.9% |
| | July | 4.2% |
| | August | 4.5% |
| | September | 5.0% |
| | October | 5.4% |
| | November | 5.8% |
| | December | 5.9% |
| 2011 | January | 6.0% |
| | February | 6.1% |
| | March | 6.2% |
| | April | 6.6% |
| | May | 6.9% |
| **(BASE YEAR 2006/07=100)** | | |
| | | |
| 2011 | June | 6.7% |
| | July | 7.0% |
| | August | 7.1% |
| | September | 7.2% |

## ගොඩවෙලලන්ද මාර්ගය : පාලමේ ඉදිකිරීම්

### பல்லேபொல மன்னவத்த சந்தி- கொடவெலலந்த வீதி : பால நிர்மாணம்

### PALLEPOLA MANNAWATTA JUNCTION-GODAWELALANDA ROAD : CONSTRUCTION OF BRIDGE

1299/'11

8. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මීට වර්ෂ පහකට පමණ පෙර ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇති මාතලේ දිස්ත්‍රික්කයේ, පල්ලෙපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පල්ලෙපොළ මන්නවත්ත හන්දියේ සිට ගොඩවෙලලන්ද දක්වා මාර්ගයේ ඇති පාලමේ ඉදිකිරීම් කටයුතු මේ දක්වා අවසන් වී නොමැති බවත්;

[ගරු බුද්ධික පතිරණ මහතා]

(ii) එම හේතුවෙන් ජනතාව මහත් දුෂ්කරතාවකට මුහුණපාන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාලමේ ඉදිකිරීම් කටයුතු සඳහා වෙන් කර ඇති මුළු මුදල කොපමණද;

(ii) මුදල් වෙන්කර තිබියදීත් ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පාලමේ ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කිරීමට කඩිනමින් කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

உள்ளூராட்சி, மாகாண சபைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இற்றைக்கு சுமார் ஐந்து வருடங்களுக்கு முன்னர் நிர்மாணிப்புப் பணிகள் ஆரம்பிக்கப்பட்டுள்ள மாத்தளை மாவட்டத்தின் பல்லேபொல பிரதேச செயலாளர் பிரிவின் பல்லேபொல மன்னவத்த சந்தியிலிருந்து கொடவெலலந்த வரையான வீதியில் உள்ள பாலத்தின் நிர்மாணிப்புப் பணிகள் இதுவரை நிறைவு செய்யப்படவில்லை என்பதையும்;

(ii) இதன் காரணமாக மக்கள் பெரும் அசௌகரி யங்களை எதிர்நோக்கியுள்ளார்கள் என்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி பாலத்தின் நிர்மாணிப்புப் பணிக்காக ஒதுக்கப்பட்டுள்ள மொத்தப் பணத்தொகை எவ்வளவு என்பதையும்;

(ii) நிதி ஒதுக்கப்பட்டுள்ள போதிலும், நிர்மாணிப்புப் பணிகள் தாமதமடைவதற்கான காரணங்கள் யாவை என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) பாலத்தின் நிர்மாணிப்புப் பணிகளை மீள ஆரம்பிக்க துரிதமாக நடவடிக்கை மேற்கொள்வாரா என்பதையும்;

(ii) அவ்வாறாயின், அத்திகதி யாது என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Local Government and Provincial Councils:

(a) Is he aware that-

(i) the construction activities of the bridge along the road from the Mannawatta Junction to Godawelalanda, Pallepola in the Pallepola Divisional Secretary's Division of the Matale District which commenced about five years ago have still not been completed; and

(ii) the people are undergoing immense hardships as a result?

(b) Will he inform this House -

(i) the total amount of money allocated for the construction activities of the aforesaid bridge; and

(ii) the reasons for the delay despite the allocation of money?

(c) Will he state-

(i) whether prompt action will be taken to resume the construction activities of the bridge; and

(ii) if so, the date for the resumption of the construction activities?

(d) If not, why?

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)

ගරු කථානායකතුමනි, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(ආ) (i) රු. 800,000/ -කි.

(ii) වෙන් කළ මුදලට අදාළ වැඩ සියල්ල නිම කර ඇත.

(ඇ) (i) ඔව්.

(ii) ඉදිරි වර්ෂයේ ප්‍රතිපාදන වෙන් කර ගැනීමෙන් අනතුරුව.

(ඈ) පැන නොනඟී.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. බොහෝ විට පළාත් පාලන ආයතන මට්ටමින් ක්‍රියාත්මක කරන මෙවැනි ව්‍යාපෘතිවලදී, කොන්ත්‍රාත්කරුවෝ අතරමඟ දාලා යන ව්‍යාපෘති යම් කාලයක් එක්කෝ ප්‍රමාද වෙනවා; එක්කෝ අතරමඟ ඇන හිටිනවා; ආපසු පටන් ගන්න කොටත් යම් ගැටලු ඇති වෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

කාලයත් එක්කයි ප්‍රශ්න අහන්නේ. ඒ නිසා ඉක්මනින් ප්‍රශ්නය අහන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

මෙවැනි අතරමඟ නවත්වන ව්‍යාපෘති යළි කොන්ත්‍රාත්කරුවන්ට පැවරීම සිදු කරනවාට අමතරව මේ වෙනුවෙන් ක්‍රියාත්මක කළ හැකි මීට වඩා ප්‍රගතිශීලී වැඩ පිළිවෙළක් තිබෙනවා ද ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි?

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)

ගරු කථානායකතුමනි, ඒ වෙන් කළ මුදලට අදාළ සියලු වැඩ කටයුතු නිම කර තිබෙනවා. තවත් අමතර ප්‍රතිපාදනයක් අවශ්‍ය වෙලා තිබෙනවා. ඒ මුදල වෙන් කළායින් පස්සේ ඒ වැඩ කටයුතුත් අවසාන කරන්නට කටයුතු කරනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. මේකත් පාලම් ඉදිකිරීම් සහ මාර්ගවලට අදාළව පළාත් පාලන ආයතනවල ඇති වන තත්ත්වයක්. ගරු කථානායකතුමනි, එක් කොන්ත්‍රාත්කරුවකුට දරා ගත නොහැකි කොන්ත්‍රාත් ප්‍රමාණයක් යම් යම් හේතු නිසා -දේශපාලන හේතු නිසා වේවා, වෙනත් සම්බන්ධකම් නිසා වේවා, මෙවැනි හේතු නිසා- ලබා දෙනවා. ඒ තුළත්, එකක් ප්‍රමිතිය පිළිබඳ ප්‍රශ්නයක් ඇති වනවා, ඒ ලබා දෙන පළාත් පාලන ආයතනවල ඉදි කරන මාර්ග සහ පාලම්, බෝක්කු වාගේ දේවල් සම්බන්ධව. අනෙක් එක ප්‍රමාදයක් සිදු වෙනවා. සමහරවිට ඔවුන්ට කර ගත නොහැකි ධාරිතාව නිසා නැවතත් ඔවුන් මේ කටයුත්ත අතහැර දානවා. එම නිසා යම් කොන්ත්‍රාත්කරුවකුට ඔහුගේ තිබෙන හැකියාව, ධාරිතාව හඳුනා ගෙන ඔහුට පැවරෙන ව්‍යාපෘති සංඛ්‍යාව පිළිබඳව සීමා කර ගැනීමේ ක්‍රම වේදයක් අමාත්‍යාංශයට ඇති කළ හැකි ද?

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)

ගරු කථානායකතුමනි, මේ හැම කොන්ත්‍රාත්තුවක්ම ප්‍රදානය කරන්නේ ටෙන්ඩර් කැඳවා ඒ ක්‍රමවේදයට අනුවයි. ගරු මන්ත්‍රීතුමා කියන ලද ඒ කාරණය පිළිබඳවත් අපි අවධානය යොමු කරන්නම්.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මේකයි. යම් කිසි ව්‍යාපෘතියක් කොන්ත්‍රාත්කරුවෙක් භාර අරගෙන එම ව්‍යාපෘතියේ කටයුතු සිදු කර ගෙන යන අතරතුර ඔහු එය අතර මඟ දාලා ගියොත් දෙවැනි කොන්ත්‍රාත්කරුවකුට පැවරීම සිද්ධ වෙනවා. දෙවැනි කොන්ත්‍රාත්කරුවාට පැවරීමත් එක්කම නැවත වරක් අර දාලා ගිය කොන්ත්‍රාත්කරුවාගේ ප්‍රමිතිය සහ ඒ වාගේ දේවල් සම්බන්ධයෙන් බොහෝ ගැටලු සහගත තත්ත්වයන් ඇති වෙනවා. මේ පිළිබඳව තත්ත්ව නිරීක්ෂණය කිරීම සහ ඒවායේ තත්ත්ව පරීක්ෂණයක් කරලා ප්‍රමිතිය පවත්වා ගන්න යම් කිසි ක්‍රියා මාර්ගයක් ගැනීමේ හැකියාව තිබෙනවාද?

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)

ගරු කථානායකතුමනි, මේක පළාත් පාලන අමාත්‍යාංශයටම අදාළ ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

පළාත් පාලන ආයතනවලට අදාළ ප්‍රශ්නයක්.

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)

නැහැ, මේක පළාත් පාලන ආයතනවලටම අදාළ ප්‍රශ්නයක් නොවෙයි. අනෙකුත් ආයතනවලටත් මේක අදාළයි.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ තමයි වැඩියෙන්ම පළාත් පාලන ආයතන තිබෙන්නේ. පළාත් පාලන ආයතන පිළිබඳව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා මැදිහත් විය යුතු නිසායි මා ඔබතුමාගෙන් අහන්නේ.

## ශ්‍රී ලංකා යුද හමුදාවේ සිවිල් සේවකයන් : අතිකාල ගෙවීම්

## இலங்கை இராணுவத்திலுள்ள சிவில் ஊழியர்கள்: மேலதிகநேரக் கொடுப்பனவு

## CIVIL EMPLOYEES IN SRI LANKA ARMY : OVERTIME PAYMENT

1314/'11

9. **ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) ශ්‍රී ලංකා යුද හමුදාව තුළ සේවය කරනු ලබන ස්ථිර හා අනියම් සිවිල් සේවකයින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම සේවකයින්ට එක් මාසයක් තුළ අතිකාල දීමනා ලෙස ගෙවනු ලබන මුදල කොපමණද;

(iii) 2011 ජනවාරි මස සිට මේ දක්වා එම සේවකයින් වෙනුවෙන් නියමිත පරිදි අතිකාල දීමනා ගෙවා තිබේද;

(iv) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(v) 2011 ජනවාරි සිට මෙතෙක් ගෙවා නොමැති අතිකාල දීමනා ගෙවනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை இராணுவத்தில் பணிபுரிகின்ற நிரந்தர மற்றும் அமய சிவில் ஊழியர்களின் எண்ணிக்கை வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(ii) இவ்வூழியர்களுக்கு ஒரு மாதத்தில் மேலதிக நேரக் கொடுப்பனவாக வழங்கப்படும் பணத் தொகை எவ்வளவு என்பதையும்;

(iii) 2011 சனவரி மாதம் தொடக்கம் இதுவரை இந்த ஊழியர்களுக்கு உரிய முறையில் மேலதிக நேரக் கொடுப்பனவு செலுத்தப்பட்டுள்ளதாக யாதென்ப தையும்;

(iv) இன்றேல் அதற்கான காரணங்கள் யாவையென்ப தையும்;

(v) 2011 சனவரி மாதம் தொடக்கம் இற்றைவரை செலுத்தப்படாதுள்ள மேலதிக நேரக் கொடுப்பனவு செலுத்தப்படும் திகதி யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he inform this House-

(i) separately, the number of permanent and casual civil employees serving in the Sri Lanka Army;

(ii) the amount of money paid to those employees as overtime payments in a month;

[ගරු දයාසිරි ජයසේකර මහතා]

(iii) whether overtime payments have been duly made to those employees from January 2011 to date;

(iv) if not, the reasons for it; and

(v) the date on which the unpaid overtime payments from January 2011 to date, will be paid?

(b) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ස්ථිර සේවකයන් සංඛ්‍යාව 8,299යි.

අනියම් සිවිල් සේවකයන් සංඛ්‍යාව 2,632යි.

(ii) රුපියල් මිලියන 24ක් පමණ.

(iii) 2011 වර්ෂය වෙනුවෙන් ලැබී ඇති අතිකාල වවුචර්පත්වල සම්පූර්ණ වටිනාකම රුපියල් මිලියන 274ක් වන අතර, දැනට රුපියල් මිලියන 193ක් පමණ ගෙවා ඇත. රුපියල් මිලියන 80ක පමණ මුදලක් ගෙවීමට කටයුතු කරමින් පවතී.

(iv) යුද හමුදාව වෙත ලැබෙන වවුචර්පත්වල පිළිවෙළ අනුව හා ලැබෙන ප්‍රතිපාදන ප්‍රමාණයන්හි සීමාවන්ට යටත්ව නොකඩවා ගෙවීම් සිදු කරනු ලැබේ.

(v) මේ වන විට ලබා දී ඇති ප්‍රතිපාදන ප්‍රමාණය ගෙවා අවසන් වී ඇති අතර, අමතර ප්‍රතිපාදන ලබා ගෙන ඉතිරිය කඩිනමින් ගෙවීමට කටයුතු කරනු ලැබේ.

(ආ) අදාළ නොවේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

තවත් රුපියල් මිලියන 80ක් විතර ගෙවන්න තිබෙනවා. එම මුදල ඔබතුමන්ලාට කවදා වන කොට ගෙවන්න පුළුවන්ද කියා මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි. මොකද, ඒ සියලු දෙනාම ජීවත් වෙන්න බැරි තත්ත්වයට පත් වෙලායි ඉන්නේ. ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවලට සහ අනෙකුත් ආයතනවලට වියදම් කර තිබෙන හැටි මීට පෙර අපි දැක්කා. ඒ නිසා ඔබතුමා මේ සම්බන්ධව ඉක්මන් පිළිතුරක් දීලා කොපමණ කාලයක් ඇතුළත ඒක ගෙවන්න පුළුවන් වෙයිද කියලා කියන්න පුළුවන්ද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ඒ කටයුතු ඉතා ඉක්මනින් හමාර කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. ගරු කථානායකතුමනි, මා කලින් පිළිතුරු දුන්නා වාගේ ලැබෙන වවුචර්පත්වල පිළිවෙළ අනුව අපට ලැබෙන ප්‍රතිපාදනයන්ට අනුව තමයි ගෙවීම් කරන්නේ. ඒ නිසා ගරු මන්ත්‍රීතුමාගේ ඉල්ලීම අනුව අපි ඉතා ඉක්මනින් එම කටයුතු හමාර කරන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, අනියම් සේවකයන් 2,632ක් ඉන්නවා. මම අහන්න කැමැතියි, ඔවුන් ස්ථිර කිරීමට යම් ක්‍රියා මාර්ගයක් ගැනීමට ඔබතුමන්ලාගේ බලාපොරොත්තුවක් තිබෙනවාද කියා. මේ අය වෙනත් රැකියාවකට යෑමට නොහැකිව දිගින් දිගටම අවුරුදු ගණනක් මෙම ස්ථානයේම අනියම් සේවකයෝ විධියට සිටිනවා. 2,632ක් සිටිනවා. මම ඔබතුමාගෙන් අහන්නේ ආණ්ඩුව විධියට ඒ අයව ස්ථිර කිරීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවාද කියායි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

කිසිම කෙනකුට වෙනත් රැකියාවලට යෑමට බැරිකමක් නැහැ. සේවක ඇස්තමේන්තු අනුමත කර ගෙන තමයි ප්‍රමාණානුකූලව මේ ස්ථානයේම ස්ථිර කිරීමට පුළුවන් වන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, මෙවර අය වැයෙනුත් වැඩිම මුදලක් වෙන් කර තිබෙන්නේ ආරක්ෂක අමාත්‍යාංශය සඳහායි. ඒ, යුද්ධය අවසන් කරලා අවුරුදු දෙකහමාරක් ගියාට පසුවත්. ඒකෙන් හෝ මේ අය සම්බන්ධයෙන් ඉක්මන් තීන්දුවක් ගන්න කටයුතු කරනවාද කියලා මම අහන්න කැමැතියි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ඒ බව දැනුම් දෙන්නම්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

බොහොම ස්තුතියි.

## ප්‍රවාහන අමාත්‍යවරයා/නියෝජ්‍ය අමාත්‍යවරයා : විදෙස් සංචාර

போக்குவரத்து அமைச்சர்/பிரதி அமைச்சர்: வெளிநாட்டுப் பயணங்கள்

MINISTER/DEPUTY MINISTER OF TRANSPORT : FOREIGN TOURS

1626/'11

10. **ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) 2010 මැයි මාසයේ සිට මේ දක්වා ප්‍රවාහන අමාත්‍යවරයා සහ නියෝජ්‍ය අමාත්‍යවරයා යෙදුණු විදෙස් සංචාර සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංචාර සිදු කළ රටවල් කවරේද;

(iii) එම එක් එක් විදෙස් සංචාරයේ අරමුණු හා ලබා ගන්නා ලද ප්‍රතිඵල කවරේද;

(iv) එක් එක් සංචාරය සඳහා සහභාගි වූ නිලධාරීන්, මාධ්‍යවේදීන් හා පුද්ගලික කාර්ය මණ්ඩලයේ නිලධාරීන් කවුරුන්ද;

(v) එම සහභාගි වූවන් එක් එක් සංචාරය සඳහා ගමන් ගත් ගුවන් යානයේ පන්තිය හා ඒ සඳහා වැය කළ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එම සංචාරයන් සඳහා වියදම් වූ මුළු මුදල කොපමණද;

යන්න එතුමා මේ සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2010 மே மாதத்தில் இருந்து இற்றை வரை போக்குவரத்து அமைச்சர் / பிரதி அமைச்சர் மேற் கொண்ட வெளிநாட்டு பயணங்களின் எண்ணிக்கை யாது;

(ii) மேற்படி பயணங்கள் மேற்கொள்ளப்பட்ட நாடுகள் யாவை;

(iii) மேற்படி ஒவ்வொரு வெளிநாட்டு பயணத்தினதும் நோக்கங்கள் மற்றும் பெற்றுக்கொள்ளப்பட்ட பெறு பேறுகள் யாவை;

(iv) ஒவ்வொரு பயணத்திலும் பங்கேற்ற உத்தியோகத் தர்கள், ஊடகவியலாளர்கள் மற்றும் பிரத்தியேக பதவியணி உத்தியோகத்தர்கள் யாவர்;

(v) இவ்வாறு பங்கேற்றவர்கள் ஒவ்வொரு பயணத்தின் போதும் பயணஞ்செய்த விமான வகுப்பு மற்றும் அதற்காகச் செலவிட்ட பணத்தொகை தனித்தனி யாக எவ்வளவு;

(vi) மேற்படி பயணங்களுக்காகச் செலவாகிய மொத்தப் பணத்தொகை யாது

என்பதை அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport:

(a) Will he inform this House-

(i) the number of foreign tours made by the Hon. Minister/Deputy Minister of Transport from May 2010, up to date ;

(ii) the countries to which such tours were made;

(iii) the purpose of each foreign tour and the benefits received ;

(iv) the officers, journalists and the members of the personal staff who took part in each tour ;

(v) separately, the class of the aeroplane in which the participants of those tours travelled and the cost incurred for that ; and

(vi) the total expenditure of those tours?

(b) If not, why?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

(අ) (i) ගරු ප්‍රවාහන අමාත්‍යවරයා - විදෙස් සංචාර 02

ගරු නියෝජ්‍ය අමාත්‍යවරයා - විදෙස් සංචාර 02

(ii) ගරු ප්‍රවාහන අමාත්‍යවරයා - චීනය සහ දකුණු කොරියාව

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා - තායිලන්තය සහ ඉන්දියාව

(iii) **ගරු ප්‍රවාහන අමාත්‍යවරයා - චීන සංචාරය**

අරමුණු - විදුලි සංඥා හා විදුලි සංදේශ තාක්ෂණ පද්ධති භාවිතය නිරීක්ෂණය කිරීම සහ නවීන තාක්ෂණය ශ්‍රී ලංකා දුම්රිය සේවයේ සංවර්ධනය සඳහා යොදා ගැනීමේ හැකියාව සොයා බැලීම.

ලබා ගන්නා ලද ප්‍රතිඵල -

චීන ජනරජයේ දුම්රිය සේවාවල නවීන විදුලි සංඥා පද්ධති භාවිතය පිළිබඳ නිලධාරීන් සමඟ අධ්‍යයනය කිරීමට හැකි වීම සහ නවීන තාක්ෂණය හුවමාරු කර ගැනීම සම්බන්ධව අදාළ ආයතන සමඟ සාකච්ඡා කිරීමට හැකි වීම.

**ගරු ප්‍රවාහන අමාත්‍යවරයා - දකුණු කොරියා සංචාරය**

අරමුණු - කොරියානු ජනරජයේ ගොඩබිම් හා නාවුක ප්‍රවාහනය පිළිබඳ අමාත්‍යාංශය මඟින් පවත්වනු ලබන ප්‍රවාහනය පිළිබඳ ලෝක සම්මේලනය සඳහා සහභාගී වීම.

ලබා ගන්නා ලද ප්‍රතිඵල -

සම්මේලනය සඳහා සහභාගි වන අනෙකුත් රටවල අමාත්‍යවරුන් සමඟ මේ පිළිබඳව අදහස් හුවමාරු කර ගැනීමට හැකි වීම සහ තාක්ෂණ සහයෝගීතා ඇති කර ගැනීමට හැකි වීම.

**ගරු නියෝජ්‍ය අමාත්‍යවරයා - තායිලන්ත සංචාරය**

අරමුණු - එක්සත් ජාතීන්ගේ කලාපීය සංවර්ධන මධ්‍යස්ථානය මඟින් වාර්ෂිකව පවත්වනු ලබන "පාරිසරික වශයෙන් තිරසාර ප්‍රවාහනය" සමුළුවට සහභාගී වීම.

ලබා ගන්නා ලද ප්‍රතිඵල -

සමුළුවට සඳහා සහභාගී වන අනෙකුත් එක්සත් ජාතීන්ගේ කලාපීය රටවල අමාත්‍යවරුන් සමඟ මේ පිළිබඳව අදහස් හුවමාරු කර ගැනීමට හැකි වීම සහ පාරිසරික වශයෙන් හිතකාමී ප්‍රවාහන ප්‍රතිපත්තියක් ඇති කිරීම පිළිබඳ දැනුවත් භාවයක් ලබා ගැනීමට හැකි වීම.

**ගරු නියෝජ්‍ය අමාත්‍යවරයා - ඉන්දීය සංචාරය**

අරමුණු - ප්‍රවාහන අමාත්‍යවරුන්ගේ තෙවන SAARC සමුළුව සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගී වීම. (3rd Meeting of SAARC Transport Ministers and Preceding Meeting of the Inter - Government Group on Transport, New Delhi)

ලබා ගන්නා ලද ප්‍රතිඵල -

ප්‍රවාහන ක්ෂේත්‍රය පිළිබඳ මනා දැනුමක් හා අදාළ රටවල් සමඟ ප්‍රවාහන ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා අවශ්‍ය කටයුතු කිරීම.

[ගරු කුමාර වෙල්ගම මහතා]

(iv) **ගරු ප්‍රවාහන අමාත්‍යවරයා - චීන සංචාරය**

(01) ඩී. ජී. හේමචන්ද්‍ර මහතා - ප්‍රධාන සංඥා හා විදුලි සංදේශ ඉංජිනේරු (ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව)

(02) එස්. ඒ. ඩී. සී. කේ. සමරනායක මහතා - ගරු ප්‍රවාහන අමාත්‍යවරයාගේ ආරක්ෂක නිලධාරී

**ගරු ප්‍රවාහන අමාත්‍යවරයා - දකුණු කොරියා සංචාරය**

(01) ශාන්ත සිරිමාන්න මහතා - සහකාර ලේකම් (වෘත්තීය සමිති)

(02) එච්. එම්. එස්. වර්ණකුලසූරිය මහතා - ගරු ප්‍රවාහන අමාත්‍යතුමාගේ සම්බන්ධීකරණ ලේකම්

**ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා - තායිලන්ත සංචාරය**

(01) ධම්මිකා අබේසිංහ මිය - ගරු ප්‍රවාහන නියෝජ්‍ය අමාත්‍යතුමාගේ සම්බන්ධීකරණ ලේකම්

**ගරු නියෝජ්‍ය අමාත්‍යවරයා - ඉන්දීය සංචාරය**

(01) සී. එම්. එම්. චන්ද්‍රසේකර මහතා - අතිරේක ලේකම් (සැලසුම්) ප්‍රවාහන අමාත්‍යාංශය

(02) ජී. ජී. මහනාම මහතා - දුම්රිය සාමාන්‍යාධිකාරී, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

(v) **ගරු ප්‍රවාහන අමාත්‍යවරයා - චීන සංචාරය**

චීන රාජ්‍ය සමාගමක් වන China National Macheinery and Equipment Import and export හුබෙයි ආයතනය විසින් ගුවන් ටිකට් පත් වියදම් දරන ලදී.

**ගරු ප්‍රවාහන අමාත්‍යවරයා - දකුණු කොරියා සංචාරය**

කොරියානු ජනරජයේ ගොඩ බිම් හා නාවුක ප්‍රවාහනය පිළිබඳ අමාත්‍යාංශය විසින් ගුවන් ටිකට් පත් වියදම් දරන ලදී.

**ගරු නියෝජ්‍ය අමාත්‍යවරයා - තායිලන්ත සංචාරය**

"United Nations Centre for Regional Development" මඟින් ගරු ප්‍රවාහන නියෝජ්‍ය අමාත්‍යවරයාගේ ගුවන් ටිකට් පත් වියදම් දරන ලදී.

01. ධම්මිකා අබේසිංහ මිය - රු. 31,500.00 (Economy Class) ගරු ප්‍රවාහන නියෝජ්‍ය අමාත්‍යතුමාගේ සම්බන්ධීකරණ ලේකම්

**ගරු නියෝජ්‍ය අමාත්‍යවරයා - ඉන්දීය සංචාරය**

(01) ගරු ප්‍රවාහන නියෝජ්‍ය අමාත්‍යවරයා - රු. 108,500.00 (Business Class)

(02) සී. එම්. එම්. චන්ද්‍රසේකර මහතා - අතිරේක ලේකම් (සැලසුම්) - රු. 38,345.00 (Economy Class)

(03) ජී. ජී. මහනාම මහතා - දුම්රිය සාමාන්‍යාධිකාරී - රු. 38,821.00 (Economy Class)

(vi) US$ 1,450+ රු. 363,298.25

(ආ) අදාළ නොවේ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ප්‍රවාහන අමාත්‍යතුමා වුණාට අඩුවෙන් තමයි ප්‍රවාහනය කරලා තිබෙන්නේ.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

ඒක කොච්චර හොඳද? සංචාර දෙකයි. අතුරු ප්‍රශ්න වැඩක් නැහැ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ඒක තමයි. බස් කොට උඩ නේ?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

හය මාසයකට එක විදේශ සංචාරයයි. ඒක හොඳ ආදර්ශයක්.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ඇත්තටම හොඳ ආදර්ශයක්. උත්තරයටත්, ආදර්ශයටත් දෙකටම ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වනවා.

ප්‍රවාහන අමාත්‍යාංශයට අදාළ නිසා මම මේ ප්‍රශ්නය ගැනත් ගරු ඇමතිතුමාගෙන් දැන ගන්නට කැමැතියි. මේක එතුමා මතු කළ විදුලි සංඥා පද්ධති පිළිබඳ කාරණාවටත් අදාළයි. දුම්රිය මාර්ගවලදී සිදු වන අනතුරුවලදී විදුලි සංඥා පද්ධති පිළිබඳ ප්‍රශ්නය බරපතළ ප්‍රශ්නයක් විධියට දිගින් දිගටම තිබුණා. ඒ වාගේම තමයි ගේට්ටු පිළිබඳ ප්‍රශ්නය. ඔබතුමා කොහේ හරි රටකින් හෝ සොයා ගෙන ගේට්ටුවලට උන බම්බු දමනවාට අමතරව වෙනත් උත්තරයක් නැද්ද කියලා දැන ගන්න කැමැතියි.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

දැන් අපි පළමුවැනි අදියර යටතේ ගේට්ටු 200ක් දමන්න වැඩ කටයුතු කර ගෙන යනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

බොහොම ස්තුතියි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, මම ගරු ඇමතිතුමාගෙන් දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න කැමැතියි. අර මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් දැන් ලබන-

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

ඒක මේ ප්‍රශ්නයට අදාළ නැහැ නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ, මෙහෙමයි -

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ගරු කථානායකතුමනි, එතුමා අදාළ නැති අතුරු ප්‍රශ්නයක් අහන්නේ. මට උත්තර දීමට නොහැකියි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි.

ප්‍රශ්න අංක. 11-0586/'10-(3), ගරු රවි කරුණානායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
I ask Question No.11

**ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
Mr. Speaker, I ask for one month's time to answer this Question.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ශ්‍රී ලංකාවේ විදේශ ආයෝජන : ලැබුණු මුදල
## இலங்கையில் வெளிநாட்டு முதலீடுகள் : கிடைத்த தொகை
FOREIGN INVESTMENTS IN SRI LANKA : MONEY RECEIVED

1026/'10

12. **ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (4) :

(අ) (i) 2008, 2009 සහ 2010 යන වර්ෂවලදී ශ්‍රී ලංකාවට විදේශ ආයෝජන ලෙස ලැබුණු මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් වර්ෂයේදී ප්‍රමාණවත් විදේශ ආයෝජන ශ්‍රී ලංකාවට ලැබී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2008, 2009, 2010 ஆகிய வருடங்களில் இலங்கைக்கு வெளிநாட்டு முதலீடுகளாக கிடைத்த நிதித் தொகை தனித்தனியே எவ்வளவென்பதையும்,

(ii) மேற்படி வருடங்களில் போதுமானளவு வெளிநாட்டு முதலீடுகள் இலங்கைக்கு கிடைத்தனவா என்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Planning:

(a) Will he inform this House-

(i) separately, the amount of money received by Sri Lanka as foreign investments in the years 2008, 2009 and 2010; and

(ii) whether Sri Lanka has received adequate foreign investments in those years ?

(b) If not, why?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ගරු කථානායකතුමනි, මම ගරු මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) 2008, 2009 සහ 2010 යන වර්ෂවලදී ශ්‍රී ලංකාවට ලැබුණු විදේශ අයෝජන ප්‍රමාණයන් පහත වගුවෙහි සඳහන් වේ.

| වසර | ප්‍රමාණයන් (එ. ජ. ඩො. මි.) |
|---|---|
| 2008 | 889 |
| 2009 | 601 |
| 2010 | 516 |

(මූලය - ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව 2008/2009/2010)

(ii) ගෝලීය ආර්ථික අර්බුදය සැලකිල්ලට ගැනීමේදී මෙම කාලය තුළ ශ්‍රී ලංකාවට ලැබුණු විදේශීය ආයෝජන ප්‍රමාණය පිළිබඳව සෑහීමකට පත් විය හැකිය. ගෝලීය ආර්ථික පසුබෑම් හමුවේදී පවා පහත සඳහන් පරිදි ආයෝජන ඉලක්ක සපුරා ගෙන ඇත.

| ආයෝජන | අයෝජන දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස | | |
|---|---|---|---|
| | 2008 | 2009 | 2010 |
| ඉලක්ක ගත අගය | 30 | 24 | 27.8 |
| සත්‍ය අගය | 27.5 | 24.5 | 27.8 |
| පෞද්ගලික (විදේශීය හා දේශීය) | 21.0 | 17.9 | 21.6 |
| රාජ්‍ය | 6.5 | 6.6 | 6.2 |

(මූලය - ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව 2007/2008/2009)

(ආ) පැන නොනඟී.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මට අතුරු ප්‍රශ්න තුනක් තිබෙනවා. මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. වර්තමාන ආණ්ඩුවේ ඉලක්කය වෙලා තිබෙන්නේ සියයට 8ක හෝ ඊට වැඩි ආර්ථික වර්ධන වේගයක් පවත්වා ගෙන යෑමයි. එය එසේ කරන්නට නම් දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 35ක ආයෝජන ප්‍රවර්ධන වේගයක් තිබෙන්නට ඕනෑ. අපේ රටේ තිබෙන ඉතිරි කිරීමේ ප්‍රතිශතය 23යි. එහෙම නම් ආයෝජනයත්, ඉතිරි කිරීමත් අතර බරපතළ පරතරයක් තිබෙනවා. ඉදිරිපත් කළ මේ සංඛ්‍යා ලේඛන අනුව විදේශීය ආයෝජනවල ක්‍රමානුකූල පහළ බැස්මක් තිබෙන තත්ත්වය තුළ, සියයට 8ක හෝ ඊට වැඩි ආර්ථික වර්ධන වේගයක් පවත්වා ගෙන යෑම සඳහා විදේශ ආයෝජන ප්‍රවර්ධනය කිරීමට විදේශ ආයෝජකයන් මේ රටට ගෙන්වා ගැනීම වෙනුවෙන් ආණ්ඩුවෙන් වන මැදිහත් වීම හා මේ ආණ්ඩුව ගන්නා පියවර හා උපාය මාර්ග මොනවාද?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ඔබතුමා අහන ප්‍රශ්නයට පිළිතුර -ඒ සඳහා වූ පැහැදිලි වැඩ පිළිවෙළ- අද ඉදිරිපත් කරන පනත් කෙටුම්පතත් සමඟ ලබන මාසයේ ඉදිරිපත් කරන අය වැය යෝජනා තුළින් අසන්නට ලැබේවි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට දැන් අහන්න ඕනෑ. දැන් උත්තරය දෙන්න. අද තත්ත්වය ගැනයි මම අහන්නේ.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
මන්ත්‍රීතුමා, අශ්වයාට ඉස්සෙල්ලා කරත්තය දමන්නේ නැහැ නේ? අද තිබෙන තත්ත්වය පිළිබඳව ඔබතුමා වැදගත් ප්‍රශ්නයක් ඇහුවා. ආයෝජනය පිළිබඳව මීට පෙරදී මුළු දවසක විවාදයක් තිබුණා. ඒ විවාදයේදී මේ පිළිබඳව අපි කථා කළා; පැහැදිලි කළා. නමුත් ඉතා පැහැදිලිව කියන්නට ඕනෑ, අද මේ ඇති කරලා තිබෙන සාමය තුළ, අපි ඒ සාමය එලෙස පවත්වා ගෙන යෑම තුළ විදේශ ආයෝජකයන් මෙන්ම, සංචාරක කර්මාන්තයත් සමඟ ඇති වන තවත් ආයෝජන ජාලයක් ඒ හා බැඳිලා ගලා එන බව. ඒ වාගේම මෙම රට කලාපීය කේන්ද්‍රීය වෙළෙඳ වාණිජ මධ්‍යස්ථානයක් බවට දියුණු කිරීම තුළත් දේශීයව ඇති කරන මේ මහා සංවර්ධනය තුළත් ඒ ආයෝජන ගලා එයි කියන විශ්වාසය සහ බලාපොරොත්තුව අපට තිබෙනවා. දැනටත් ඒ අවස්ථාව උදා වෙලා තිබෙනවා.

ඒ නිසා මම හිතනවා, ඔබතුමන්ලා අපට තවත් සහයෝගය දෙනවා නම් මේ කාර්ය එකට එකතු වෙලා කර මේ රට දියුණු රටක් බවට පත් කරන්නට අපට පුළුවන් වෙයි කියලා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා, අපිට අශ්වයායි, කරත්තෙයි, ගලා යන පැත්තයි ඔක්කෝම පෙනෙනවා ලංකාවට විදේශ ආයෝජන ලෙස ලැබුණු මුදල් ප්‍රමාණයන් බැලුවාම. 2008 දී එක්සත් ජනපද ඩොලර් මිලියන 889යි. 2009 දී එක්සත් ජනපද ඩොලර් මිලියන 601යි. 2010 දී එක්සත් ජනපද ඩොලර් මිලියන 516යි. මම බොහොම ගෞරවයෙන් ඔබතුමාට කියන්නේ, මම අහපු ප්‍රශ්නයට උත්තර දෙන්න කියලා. මම ඔබතුමාගෙන් ඇහුවේ-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. එතුමා උත්තරයක් දුන්නා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
මම උත්තරයක් දුන්නා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ. ඉතිරි කිරීම සහ ආයෝජනය අතර තිබෙන පරතරය පියවන්නට මොකක්ද ආණ්ඩුව ගන්නා ක්‍රියා මාර්ගය? ඒකයි මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ඒක තමයි මම කිව්වේ ඔබතුමාට ලබන මාසයේ ඒක දැන ගන්නට පුළුවන් කියලා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒ කියන්නේ ලබන මාසය වන තුරු පියවරක් ගන්නේ නැහැ?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා දුන්නු පිළිතුර තමුන්නාන්සේ භාර ගන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
හොඳයි. ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මේකයි. මම අහන්න කැමැතියි අපේ ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් මෙන්න මේ ප්‍රශ්නය. ශ්‍රී ලංකා මහ බැංකුවේ 2010 වාර්ෂික වාර්තාවේ දත්ත අනුව විදේශ සෘජු ආයෝජන සම්බන්ධ නිෂ්පාදන හා සේවා අංශයේ තිබෙන්නේ සියයට 9ක ආයෝජන වේගයක්. ඒ වාගේම කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රයේ තිබෙන්නේ සියයට 1.3ක ආයෝජන වේගයක්.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
විදේශ ආයෝජන?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔව්. විදේශ ආයෝජන. මම කථා කරන්නේ විදේශ ආයෝජන ගැන. ඇත්ත වශයෙන්ම මේ දත්තයන් දිහා බැලුවාම ඒවා සතුටුදායක නැහැ කියන එක මම හිතන්නේ ඔබතුමාත් පිළිගන්නවා ඇති. මේ ක්ෂේත්‍රයන් දෙක තුළ යම් කිසි වැඩි දියුණු කිරීමක්, විදේශ ආයෝජනවල වර්ධනයක් ඇති කරන්න ආණ්ඩුවේ මැදිහත් වීමෙන් මොකක්ද ගන්නා පියවර?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රයේ උතුරු හා නැඟෙනහිර ප්‍රදේශවල ඇති වී තිබෙන අලුත් තත්ත්වයන් තුළ මේ රටේ කෘෂිකර්මයේ වර්ධනයක් වෙලා තිබෙනවා. ඔබතුමාත් දකින්න ඇති, අද අපිට සෝමාලියාවටත් සහන වශයෙන් සහල් ප්‍රමාණයක් යවන්න හැකි වුණු බව. අපේ සහල් නිෂ්පාදනය වැඩි කරන්නට එලෙස මැදිහත් වන අතර විදේශ ආධාර ලබා ගෙන කෘෂිකර්මය දියුණු කිරීම සඳහාත් කෘෂිකර්මය ආශ්‍රිත කර්මාන්ත දියුණු කිරීම සඳහාත් කෘෂිකර්ම අපනයන කර්මාන්ත දියුණු කිරීම සඳහාත් වූ පැහැදිලි කැපවීමක් සහ වැඩ පිළිවෙළක් අප යෝජනා කරලා තිබෙනවා. එය ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනවාය කියන ටික අපි මතක් කරන්නට කැමැතියි. ඒ නිසා මේ ක්ෂේත්‍ර දෙක විශේෂයෙන්ම ඒ සඳහා යොදා ගන්නට තමයි බලාපොරොත්තුව.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මගේ තුන්වැනි සහ අවසාන අතුරු ප්‍රශ්නය මේකයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, දැන් පසු ගිය දවසේ වියට්නාමයේ ජනාධිපතිතුමාත් මේ රටේ සංචාරයක නියැළුණා. දැන් වියට්නාමය ගත්තොත් වාර්ෂිකව ඩොලර් බිලියන 7ත්, 8ත් අතර ප්‍රමාණයක විදේශ ආයෝජන ප්‍රමාණයක් ඒ රටට එනවා.

ඉතින් වියට්නාමයේ විදේශ ආයෝජන ක්ෂේත්‍රයේ මේ වාගේ වර්ධනයක් ක්‍රියාත්මක කරන්න පුළුවන් නම් ඇයි ශ්‍රී ලංකාවේ ඒක ක්‍රියාත්මක කරන්න බැරි? මොකද ශ්‍රී ලංකාවේ සංඛ්‍යා ලේඛන දිහා බැලුවාම අපට පෙනෙන්නේ වාර්ෂිකව අඩු වීමක්; වැඩි වීමක් නොවෙයි.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

ගරු කථානායකතුමනි, වියට්නාමයේ අතිගරු ජනාධිපතිතුමාගේ මුවින් පිට වුණු වචන දිහා බලන කොට මට හැඟී ගියා, එතුමා විශාල විශ්වාසයකින් තමයි ලංකාව ගැන ප්‍රකාශ කළේ කියලා. ලංකාවේ අනාගත විදේශ ආයෝජන සඳහා මේ වාතාවරණය සුදුසු බවත් ඔවුන් ඉතා පැහැදිලිව ප්‍රකාශ කර තිබෙනවා. වියට්නාමය හැටියටත් අතිකූත් කලාපීය රටවල් සමඟ කරන ආයෝජනවලට සම්බන්ධ වෙලා මේ රටේ කර්මාන්ත - විශේෂයෙන්ම කෘෂිකර්මය හා ධීවර කර්මාන්තය- දියුණු කරන්න ඔවුන් කැමැත්ත ප්‍රකාශ කර තිබෙනවා. අද තමුන්නාන්සේලාගේ සමහර අය හිනා වෙනවා. උතුරේ මන්නාරම් ද්‍රෝණියේ කරන ඒ පර්යේෂණ තුළින් අපට ලැබෙන ඒ ගෑස් සහ තෙල් පිළිබඳ සතුටු ලකුණු පහළ වීම තුළ අනිවාර්යයෙන්ම මේ විදේශ ආයෝජන සහ අපේ නිෂ්පාදන දියුණු කරන්න පුළුවන් කේන්ද්‍රීය සංවර්ධිත රටකට ගමන් කරන ඉලක්කයට අපට යන්නට පුළුවන් කියන කාරණය මහින්ද චින්තන ඉදිරි දැක්මේ දෙවැනි අය වැය ලේඛනයෙන් ඔබට දැන ගන්නට පුළුවන් වේවි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රශ්න අංක 13-1300/'11-(1), ගරු බුද්ධික පතිරණ මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා ( අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா - கல்வி பிரதி அமைச்சர்)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa - Deputy Minister of Education)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා. එතුමාගේ ප්‍රශ්නයට නම් ක්ෂණික උත්තරයක් තිබෙනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## විදේශ කටයුතු අමාත්‍යවරයා/නියෝජ්‍ය අමාත්‍යවරයා : විදෙස් සංචාර
## வெளிநாட்டு அலுவல்கள் அமைச்சர்/பிரதி அமைச்சர்: வெளிநாட்டுப் பயணங்கள்
MINISTER/ DEPUTY MINISTER OF EXTERNAL AFFAIRS : FOREIGN TOURS

1627/'11

15. **ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) 2010 දෙසැම්බර් මාසයේ සිට මේ දක්වා විදේශ කටයුතු අමාත්‍යවරයා / නියෝජ්‍ය අමාත්‍යවරයා යෙදුණු විදෙස් සංචාර සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංචාර සිදු කළ රටවල් කවරේද;

(iii) එම එක් එක් විදෙස් සංචාරයේ අරමුණු හා ලබා ගන්නා ලද ප්‍රතිඵල කවරේද;

(iv) එක් එක් සංචාරය සඳහා සහභාගි වූ නිලධාරින්, මාධ්‍යවේදීන් හා පුද්ගලික කාර්ය මණ්ඩලයේ නිලධාරින් කවුරුන්ද;

(v) එම සහභාගි වූවන් එක් එක් සංචාරය සඳහා ගමන් ගත් ගුවන් යානයේ පන්තිය හා ඒ සඳහා වැය කළ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එම සංචාරයන් සඳහා වියදම් වූ මුළු මුදල කොපමණද;

යන්න එතුමා මේ සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டு அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2010 டிசம்பர் மாதம் தொடக்கம் இற்றைவரை வெளிநாட்டு அலுவல்கள் அமைச்சர்/ பிரதி அமைச்சர் மேற்கொண்ட வெளிநாட்டுப் பயணங்களின் எண்ணிக்கை எத்தனையென்பதை யும்;

(ii) மேற்படி பயணங்கள் மேற்கொள்ளப்பட்ட நாடுகள் யாவை என்பதையும்;

(iii) மேற்படி ஒவ்வொரு வெளிநாட்டுப் பயணத்தினதும் நோக்கம் மற்றும் பெறப்பட்ட பெறுபேறுகள் யாவை என்பதையும்;

There is one instance which I must place on record about the Hon. Denzil Fernando. We had a Group Meeting in July 1987, and there was an outstanding problem regarding the Ceylon Tyre Corporation. There was a difference in views between him and our District Minister, the Hon. Ariyaratna Jayatilleke. At that time, I was a Minister and represented the adjoining area overlooking Kelaniya. Just before the meeting, the Hon. Denzil Fernando told me that he wanted to discuss the issue. So, the Hon. Denzil Fernando, the Hon. Jayatilleke and I, went and sat outside and had a discussion. We were trying to sort out the issue about the Chairman and the recruitment of some people from Kelaniya whom the Hon. Jayatilleke wanted to take into the Corporation.

When we were seated, we saw President Jayewardene and Prime Minister Premadasa walking in. So, as they were walking in, I rushed back - I used to sit quite close to where the President and Prime Minister sat - and found that my seat was taken by some other Minister. So, I went and sat at the back. Mr. Speaker, within 40 minutes, a grenade exploded inside that hall. If not for the fact that the Hon. Denzil Fernando had called me out, I may have been seated there. Amongst the others who were there on that day - some of them are on the both sides of the House today - were the Hon. John Amaratunga and Hon. Gamini Lokuge, the Hon. Minister of Labour and Labour Relations. Fortunately, since the Hon. Denzil Fernando called me out, I was certainly far away from where the incident took place.

Before, I conclude, Mr. Speaker, I must also mention about the Hon. Denzil Fernando's honesty. Much could be said about it. He did not earn a cent from his Ministry. But, in today's politics, when corruption is on the rise, when allegations are made against the Members of the Cabinet and when corruption is the order of the day, it is unfortunate that we have lost the services of people like the Hon. Denzil Fernando. At this moment, I would like to join the others in conveying my condolences to his children and to say, as a Christian and a devout Catholic, "May his soul rest in peace".

Thank you.

[අ. භා. 2.28]

**ගරු දි.මු. ජයරත්න මහතා (අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு டீ.எம்.ஜயரத்ன - பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சரும்)
(The Hon. D.M. Jayaratne - Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs)

ගරු කථානායකතුමනි, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාත්, විරුද්ධ පාර්ශ්වයේ නායකතුමාත් කරන ලද කථාව මා සම්පූර්ණයෙන්ම අනුමත කරනවා. ගරු ඩෙන්සිල් ප්‍රනාන්දු මැතිතුමා මීගමුව නගර සභාවේ නගරාධිපතිවරයා හැටියට ඒ ප්‍රදේශයට විශාල සේවයක් කරමින් නගරය දියුණු තත්ත්වයට පත් කිරීමට ක්‍රියා කරන අවස්ථාවේ තමයි අතුරු මැතිවරණයකින් එතුමාට පාර්ලිමේන්තුවට එන්න පුළුවන් වුණේ. එතුමා පළමුව කර්මාන්ත හා විද්‍යා කටයුතු නියෝජ්‍ය අමාත්‍යවරයා හැටියටත් පසුව කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යතුමා හැටියටත් කටයුතු කළා. තමන් බලාපොරොත්තු වුණු වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කරන්න ඒ අමාත්‍යාංශය එතුමාට බොහොම උපකාරී වුණා. තමන් ඉටු කිරීමට බලාපොරොත්තු වුණු සේවාවන්, යුතුකම්, වගකීම් ඒ අමාත්‍යාංශය තුළ බොහොම උත්කර්ෂවත් අන්දමින් ක්‍රියාත්මක කරන්න එතුමාට පුළුවන් වුණා.

ගරු කථානායකතුමනි, ඒ කාල සීමාවේ ඒ ප්‍රදේශ වෙන් කරලා තිබුණේ ආසන වශයෙනුයි. එතුමා තමාගේ ආසනයේ පමණක් නොවෙයි, මුළු ගම්පහ දිස්ත්‍රික්කය තුළමත් ඉතාම ගෞරවාදරයට පාත්‍ර වුණු දේශපාලනඥයෙක්. එතුමා එක්සත් ජාතික පක්ෂයේ ප්‍රබල සාමාජිකයෙක් හැටියටයි ඒ කාල පරිච්ඡේදය තුළ ක්‍රියාත්මක වුණේ. එහෙම වුණත් අනෙක් දේශපාලන පක්ෂ එක්කත්, ජනතාව එක්කත්, දේශපාලකයන් එක්කත් බොහොම මිත්‍රශීලීව කටයුතු කළ නිසා එතුමාට තමන්ගේ වැඩ කටයුතු සාර්ථක අන්දමින් ක්‍රියාත්මක කර ගන්න පුළුවන් වුණා.

ගරු කථානායකතුමනි, එතුමා දරුවන් හතර දෙනකුගේ පියෙක්. තම ජනතාවටත්, තම ප්‍රදේශයටත්, තම පක්ෂයටත් තම දේශපාලන දර්ශනය අනුව ප්‍රශස්ත සේවාවක් ඉටු කර ජනතාව අතර ඉතාමත් ගෞරවාදරයට පාත්‍ර වුණා. අභාවප්‍රාප්ත ගරු ඩෙන්සිල් ප්‍රනාන්දු මැතිතුමාව ඉතාමත් ශ්‍රේෂ්ඨ විධියට අප මේ අවස්ථාවේදී අනුස්මරණය කරන අතර, එතුමාගේ අභාවය වෙනුවෙන් අපගේ බලවත් කනගාටුව එතුමාගේ ආදරණීය දරුවන්ටත්, ඥාතීන්ටත්, ඒ ප්‍රදේශයේ ජනතාවටත් මේ අවස්ථාවේදී පුද කරනවා. එතුමා ඒ සේවාව කර ගෙන ගිය ආකාරය අපත් අවබෝධ කර ගෙන එතුමාගේ ජීවිතයෙන් ගන්න තිබෙන ආදර්ශයන් හිතට අරගෙන අපත් දේශපාලනඥයන් වශයෙන් ක්‍රියා කරන්න උත්සාහ කරමුය කියන එක ප්‍රකාශ කරමින් අපේ බලවත් කනාගටුව එම පවුලේ සියලු දෙනාට දන්වා යවන ලෙස ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මීළඟට ගරු කරු ජයසූරිය මන්ත්‍රීතුමා.

Order, please! මේ අවස්ථාවේදී කවුරු හෝ ගරු මන්ත්‍රීවරයකු ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, "ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. SPEAKER *left the Chair, and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

[අ. භා. 2.31]

**ගරු කරු ජයසූරිය මහතා**
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතිගරු අග්‍රාමාත්‍යතුමා, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා සහ ගරු විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා දිවංගත ගරු ඩෙන්සිල් ප්‍රනාන්දු හිටපු අමාත්‍යතුමා සම්බන්ධයෙන් දීර්ඝ විවරණයක් කළා. ඒ නිසා කාලානුරූපව එතුමන්ලා සඳහන් කළ කරුණු පුන පුනා නොකීවත් අප ඒ කරුණු සියල්ලම අනුමත කරමින් අපේ දිවංගත ගරු ඩෙන්සිල් ප්‍රනාන්දු මැතිතුමා දුර්ලභ ගණයේ දේශපාලනඥයකු වශයෙන් හඳුන්වන්න කැමැතියි.

මීගමුව මාරිස්ටෙලා විදුහලෙන් මූලික අධ්‍යාපනය ලබලා, ඊට පසුව උසස් අධ්‍යාපන කටයුතු සඳහා එතුමා නීති විද්‍යාලයට

[ගරු කරු ජයසූරිය මහතා]

ඇතුළත් වුණා. නීතිය හදාරා නීතිඥයකු වශයෙන් දිවුරුම් දී එතුමා තම වෘත්තීයමය ජීවිතය ආරම්භ කළා. නීතිඥයකු වශයෙන් තම ජීවිතයේ ලැබූ විවිධ අත් දැකීම් ද සමඟ තමන් උපන් දේශයට වඩාත් ඉහළ සේවයක් ලබා දීමට තමා තුළ තිබූ විශේෂ ඕනෑකම නිසාම එතුමා දේශපාලන ක්ෂේත්‍රයට ප්‍රවිෂ්ටව මීගමුව මහ නගර සභාවට තරග වැදී නාගරික මන්ත්‍රීවරයකු වශයෙන් තේරී පත් වුණා. පසුව නගරාධිපතිවරයා වශයෙන් කටයුතු කළා.

නාගරික මන්ත්‍රීවරයකු වශයෙනුත් ඒ වාගේම නගරාධිපතිවරයා වශයෙනුත් එතුමා මීගමුව පුරවරයට විශිෂ්ට සේවාවක් කළ බව මම මේ අවස්ථාවේදී ගෞරව පූර්වකව සඳහන් කරනවා. තමා තුළ වූ දක්ෂතාව හේතු කොට ගෙන මීගමුව නගරාධිපතිවරයා ලෙස ලැබූ ජනප්‍රියතාව නිසාම එතුමා 1967 වසරේ පැවැති අතුරු මැතිවරණයෙන් එක්සත් ජාතික පක්ෂ අපේක්ෂකයකු ලෙස ජයග්‍රහණය ලබා පාර්ලිමේන්තුවට තේරී පත් වී එක්සත් ජාතික පක්ෂ රජයේ කර්මාන්ත හා විද්‍යා කටයුතු නියෝජ්‍ය ඇමතිවරයා වශයෙන් දිවුරුම් දුන්නා. පසු කාලීනව කැබිනට් අමාත්‍යවරයකු ලෙස දිවුරුම් දීමට තරම් එතුමා වාසනාවන්ත වුණා. එම යුගයේදී කර්මාන්ත දියුණු කිරීමට ගරු ඩෙන්සිල් ප්‍රනාන්දු මැතිතුමා විශේෂ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ බවත් මා සඳහන් කරන්න කැමැතියි. ඒ වාගේම එතුමා වෙළඳ කලාප අධීක්ෂණය කළා. ආසියාවේ වැඩිම කර්මාන්ත සංවර්ධනයක් සිදු වුයේ එතුමාගේ යුගයේදීය යන්න විශේෂයෙන්ම මෙතැනදී සඳහන් කළ යුතුයි.

දේශීය කර්මාන්ත දියුණු කිරීමටත්, ආර්ථික සංවර්ධනය සඳහාත් එතුමා නිතර ක්‍රියා කළා. ඒ සඳහා විශාල කැප කිරීමක් කළා. රට කෙරෙහි ආදරයෙන්, භක්තියෙන් හා කැප වීමෙන් මෙන්ම මහන්සි වී වැඩ කළ එතුමා දේශීය වශයෙන් රට ශක්තිමත් කිරීමට උදවු කරන්නැයි ජනතාවගෙන් නිතර ඉල්ලා සිටියා. පරිණත දේශපාලනඥයකු ලෙස තම යුතුකම් රට වෙනුවෙන් නොපිරිහෙළා ඉටු කරනු ලැබූ ගරු ඩෙන්සිල් ප්‍රනාන්දු මැතිතුමා 2010 ජූලි 24 වැනි දින මීගමුව පොදු සුසාන භූමියේදී අපගෙන් සමු ගෙන ගියත් එතුමා අප පක්ෂයටත්, රටටත් කරන ලද සේවය අප සදා ඇගයීමට ලක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා හොඳ පවුල් ජීවිතයක් ගත කළා; අවංක, වාසනාවන්ත දරුවන් මේ රටට බිහි කළා. නිහතමානී චාම් ගති පැවතුම්වලින් යුත් මනුස්සකම, හැදිච්චකම, ශීලාචාරකම ආදි උතුම් ගති පැවතුම් තුළින් පිරි එතුමා මහත්මා දේශපාලනයේ ප්‍රතිමූර්තියක් වශයෙන් හඳුන්වන්න මා කැමැතියි.

ගරු ඩෙන්සිල් ප්‍රනාන්දු හිටපු අමාත්‍යතුමා මිය යෑම අපට විශාල පාඩුවක්. කෙසේ වුවත් එතුමාගේ අභාවය සම්බන්ධයෙන් අප පක්ෂයේත්, පක්ෂයේ සියලුම සාමාජිකයන්ගේත්, ඒ වාගේම පෞද්ගලිකව මගේත් බලවත් ශෝකය මේ අවස්ථාවේදී එතුමාගේ ආදරණීය දූ දරුවන් ඇතුළු පවුලේ සියලු දෙනාට පුද කරමින් එතුමාට මොක් සුව ප්‍රාර්ථනා කරනවා.

[අ. භා. 2.36]

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ඩෙන්සිල් ප්‍රනාන්දු මැතිතුමා නීතිඥයෙක්, අධිනීතිඥයෙක් සහ අමාත්‍යවරයෙක් වුණා. එතුමාත් අපත් ගම්පහ දිස්ත්‍රික්කයේ සහෝදර මන්ත්‍රීවරුන් හැටියට බොහොම සුහදව ඒ යුගයේ කටයුතු කළා. ගරු ඩෙන්සිල් ප්‍රනාන්දු මැතිතුමා සමඟ මීගමුව උසාවියේ නීතිඥවරයකු හැටියට කටයුතු කරන්න මට අවස්ථාව ලැබුණා. එතුමා දක්ෂ නීතිඥවරයකු හැටියට ඒ කාලයේ මීගමුව ජනතාවට සේවය කළා. එතුමා ගෞරව සම්මාන ඇතිව තමයි ඒ විභාග සියල්ලක්ම සමත් වුණේ. ඉන් අනතුරුව දේශපාලන ක්ෂේත්‍රයේදී අප එතුමා දුටුවා.

මුලින්ම නාගරික මන්ත්‍රීවරයකු හැටියටත්, දෙවනුව නියෝජ්‍ය නගරාධිපති හැටියටත්, ඉන් අනතුරුව නගරාධිපති හැටියටත් තමයි එතුමාගේ දේශපාලන ජීවිතය ආරම්භ වුණේ. ක්වින්ටින් ප්‍රනාන්දු මැතිතුමාගේ අභාවයෙන් පසුව පැවැති මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂයේ මීගමුව මන්ත්‍රීවරයා හැටියට ගරු ඩෙන්සිල් ප්‍රනාන්දු මැතිතුමා පාර්ලිමේන්තුවට තේරී පත් වුණා. ඉන් අනතුරුව එතුමා 1972 දීත් ජයග්‍රහණය කළා. එතුමා 1977 දීත් එක්සත් ජාතික පක්ෂයේ මීගමුව ආසනයේ මන්ත්‍රීවරයා හැටියට වැඩි ඡන්ද 15,000කින් ජයග්‍රහණය කළා. ඒ වාගේම එතුමා බොහොම ජනප්‍රිය මන්ත්‍රීවරයෙක් වුණා.

එතුමා කෙරෙහි ධීවර ජනතාවගේ සුවිශේෂ කැමැත්තක් ඇති වුණා. එහෙම නැත්නම් ඒ ජනතාව තුළ එතුමා ජනප්‍රිය වුණා. විශේෂයෙන්ම එතුමාගේ අවංකභාවය නිසායි එතුමා ප්‍රසිද්ධියක් දැරුවේ. තමන්ගේ පවුලේ අයට වුවත් එතුමා හැම වෙලාවේම ප්‍රකාශ කළේ, සියලු දෙනාටම නීතිය එකාකාරව ඉෂ්ට විය යුතුයි කියලායි. මට මතකයි, එක් අවස්ථාවකදී එතුමාගේ -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! Will an Hon. Member propose the Hon. Ajith P. Perera to take the Chair?

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன )
(The Hon. S.M. Chandrasena)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී "ගරු අජිත් පී. පෙරේරා මහතා මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු අජිත් පී. පෙරේරා මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அஜித் பீ. பெரேரா அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. ALHAJ A.H.M. AZWER *left the Chair and* THE HON. AJITH P. PERERA *took the Chair.*

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඩෙන්සිල් ප්‍රනාන්දු හිටපු ඇමතිතුමාගේ සුවිශේෂ ලක්ෂණ ගැනයි මා කථා කළේ. අපේ නායකතුමාත් බොහොම පැහැදිලිව සඳහන් කළේ එතුමාගේ අවංකභාවය පිළිබඳවයි. මොනම හේතුවකටවත් තමන්ගේ තනතුර තුළින් එතුමා යම් කිසි විශේෂත්වයක් ලැබුවේ නැහැ. එහෙම නැත්නම් ඒ පිළිබඳව එතුමා ප්‍රශ්නයක්වත් ඉදිරිපත් කළේ නැහැ. සියලු දෙනාටම එකාකාරව සැලකීම තමයි එතුමාගේ ප්‍රතිපත්තිය වුණේ.

මීගමුව නගරය දියුණු කරන්න එතුමා පියවර රාශියක් ගෙන තිබෙනවා.

එකක් තමයි, එතුමාට වුවමනාව තිබුණා, මීගමුවේ දූ දරුවන්ට අධ්‍යාපන අතින් අවස්ථාවක් ලබා දෙන්න. එතුමා මීගමුව නගර සභා සීමාව තුළ මහා විද්‍යාල කිහිපයක්ම ඇති කළා. මීගමුව නාගරික මන්ත්‍රී කොට්ඨාසයක් නිසා ඒ දූ දරුවන්ට යහපත් අධ්‍යාපනයක් ලබා ගෙන සමාජයේ ඉහළට යන්නට අවස්ථාවක් ලැබුණා.

ඩෙන්සිල් ප්‍රනාන්දු මැතිතුමාගේ නම අමතක නොවන්න කරපු දෙයක් හැටියට මට අහන්න ලැබුණු දෙයක් තමයි, එතුමා ඒ යුගයේ මීගමුවේ විශාල භූමි තීරයක් අත් පත් කර ගෙන, කොළඹ-මීගමුව මහාමාර්ගයේ සිට මීගමුව නගරයට කඩොල්කැලේ හරහා යන්න කිලෝමීටර් 2ක්, 3ක් පමණ දිග අලුත් පාරක්, රේල් පාරට සමාන්තරව හැදුව බව. ඒක විශාල සංවර්ධනයක්. එම නිසාම මීගමුව නගරයට ඇතුළු වන ජනතාවට තදබදයක් නැතුව, බොහොම පහසුවෙන් ගමන් කිරීමට අවස්ථාව ලැබුණා. මීගමුවට යන කොට අදත් අපි පාවිච්චි කරන්නේ ඒ මාර්ගයයි. ඩෙන්සිල් ප්‍රනාන්දු මැතිතුමා කරපු ඒ මහා විශාල සංවර්ධනය අදත් අපට සිහිපත් වනවා.

ඒ විතරක් නොවෙයි. කර්මාන්ත හා විද්‍යා කටයුතු ඇමතිවරයා හැටියටත්, කර්මාන්ත හා විද්‍යා කටයුතු නියෝජ්‍ය ඇමතිවරයා හැටියටත් කටයුතු කළ එතුමාගේ මහ පෙන්වීම කර්මාන්ත ක්ෂේත්‍රයේ කර්මාන්තකරුවන්ටත්, ඒ වාගේම සංස්ථාවලටත් ලබා ගන්න පුළුවන් වුණා. මීගමුවේ පමණක් නොවෙයි, දිස්ත්‍රික් මැතිවරණ ක්‍රමය ආපු අවස්ථාවේදී රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ නායකත්වය යටතේ මන්ත්‍රීවරුන් සියලු දෙනාම සුහදව, එකමුතුව දිස්ත්‍රික්කයේ දේශපාලන කටයුතු කළා. එතුමා කිසි කෙනකුට වෛරයක්, ඊර්ෂ්‍යාවක් කළ මන්ත්‍රීවරයෙක්, ඇමතිවරයෙක් නොවෙයි. එතුමා එතුමාගේ පාඩුවේ, එතුමාගේ වැඩ කර ගෙන, එතුමාගේ වගකීම් කොටස ඉෂ්ට කළා මිසක් වෙන කාගේවත් අඩු පාඩු, වැරැදි සොයන්න ගියේ නැහැ. අනික් අය කෙරෙහි ඊර්ෂ්‍යාවක්, විරුද්ධතාවක් එතුමා තුළ තිබුණේ නැහැ. එම නිසා එතුමාගේ අභාවය පිළිබඳව එම අවස්ථාවේදී අපි සියලු දෙනාම කනගාටුවට පත් වුණා. අපේ එක්සත් ජාතික පක්ෂයේ හිටපු අවංක දේශපාලනඥයකු අපට නැති වුණාය කියන එක තමයි අපි කල්පනා කළේ. අපි එතුමාට මෝක්ෂ සුව සම්පත ප්‍රාර්ථනා කරන අතර එතුමාගේ පවුලේ සියලු දෙනාටම අපේ කනගාටුව මේ අවස්ථාවේදී පිළිගන්වමින් මා නිහඬ වනවා. ස්තුතියි.

[2.41 p.m.]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Mr. Presiding Member, I came to know the Hon. Denzil Fernando particularly at the 1967 by-election that was held for the Negombo seat at that time after the demise of the Hon. Quentin Fernando. Thereafter, we came to associate with him very closely. I must particularly mention in this House that he was very helpful to the Muslims of Kamachchiolai, Poruthota, Palahathurai and the rest of the area. He had a very good friend, Mr. Amir Sheriff who also for sometime served as the Deputy Mayor of Negombo. The Hon. Denzil Fernando carried no ill will. He was not a man of malice or vanity. He liked to live a simple life. He wanted everyone around him to smile and be happy all the time. Even in Parliament, I remember very well he encountered many interesting moments in the House, which are all well recorded in Hansard.

I remember, Sir, Mr. I.L.M. Thassim who hails from Poruthota and was a Member of the Village Committee working with him very closely. He is still living. He recalls very vivid memories of the activities of the Hon. Denzil Fernando. In that election, Sir, we also saw the emergence of a lady politician for the first time, a Muslim lady - Nadia Abdul Gaffoor Sattar. We hired a particular place at Negombo to work for the Hon. Fernando. We stayed there for a full month electioneering. I remember Alhaj M.H.M. Riyal, M.H. Amit who was our former MP, A.M. Nazeer MMC, Senator Mashoor Moulana and lawyer Maharoof from that area, who were together working for him.

The Hon. Denzil Fernando cut a very interesting figure in public life and also in Parliament. He was an advocate by profession. He was born on 24th March, 1923. He was educated at St. Mary's College and St. Maris Stella College, Negombo and at Law College, Colombo. At the Law College, he was the General Secretary of the Law Students' Union from 1950 to 1951 and he was the Vice-President of the All-Ceylon Catholic Students' Federation. He was a very devout Catholic, but he endeared the brethren of other religions like the Buddhists and the Muslims of that area. He was also the Vice-President of the Law Students' Political Society. Before entering the Law College, he was a teacher at Christ the King College, Ja-Ela and worked for sometime at the Food Control Department too. At the Law College, he passed the Proctors Final Examination in 1952 with First Class Honours. After about seven years as a proctor, he passed the Advocates Examination, and was enrolled as an Advocate in December 1959.

Hon. Denzil Fernando began his political career in 1953 when he was elected to the Negombo Municipal Council and served for eight long years. He also had his mentor, the Hon. Wijayapala Mendis who was the senior-most politician in Negombo, in the Gampaha District. He was the elected Mayor of Negombo from 1960 to 1961 and then from 1964 to 1965 and in January 1970. So, all in all, the Hon. Denzil Fernando was an illustrious figure and I should record here that he served as a distinguished Member of this House for 21 years, 01 month and 02 days.

May his soul rest in peace!

Thank you, Sir.

[அ. ஹ. 2.46]

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඩෙන්සිල් ප්‍රනාන්දු මැතිතුමා ගම්පහ දිස්ත්‍රික්කයේ පදිංචිව සිටි අයෙක්. මම කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුගම්පොළ කෙනෙක්. ඒ පැත්තේ එතුමාගේ ඉඩමකුත් තිබෙනවා. මා දුටු දේශපාලන චරිත අතරින් වර්තමාන පාර්ලිමේන්තුවේ ගරුත්වයට, මන්ත්‍රීකම කියන එකට එතුමා හොඳ ආදර්ශවත් චරිතයක් වුණා. අද සමහර වෙලාවට අපට

[ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා]

පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙක් කියලා කියන්නත් ලජ්ජා හිතෙනවා. ඒ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. හරි බේදනීය තත්ත්වයක්.

ඩෙන්සිල් ප්‍රනාන්දු මැතිතුමාව මා දුටුවේ එදා ජේ.ආර්. ජයවර්ධන රජයේ මාත් මන්ත්‍රීවරයෙක් විධියට කටයුතු කළ කාලයේ එතුමා ඉතාමත්ම මහත්මා ගතිගුණ තිබෙන, නිහතමානී, ගාම්භීරත්වයකින් යුතු උදාර පුද්ගලයකු ලෙසයි. සෑම වෙලාවකම එතුමාගේ මුහුණේ සිනහවක් තිබුණා. අයුක්තිය, අධර්මය, අසාධාරණය දැක්ක තැන එතුමා බොහොම දරුණු විධියට නැඟී සිටි කෙනෙක්. ඒ අධර්මය, අසාධාරණය දැක්ක තැන තමාවම පාලනය කර ගත නොහැකි ආකාරයේ ප්‍රකාශ කරපු පුද්ගලයෙක්, එතුමා. අවංකත්වයේ, නිහතමානිත්වයේ උදාර මහා චරිතයක් තිබුණු පුද්ගලයෙක්. එතුමාට ඇඟිල්ල දිගු කරලා කාටවත් කියන්න බැහැ, එතුමාගේ ජීවිතයේ දී මෙන්න මේ දේවල් ගත්තා කියලා. එතුමා අදහපු ආගම තුළ එතුමාව මා දුටුවේ උදාර කතෝලික භක්තිකයකු ලෙසයි; දේශපාලනයත් ආගම විධියට සලකා ක්‍රියා කරපු පුද්ගලයකු හැටියටයි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

කරුණාකර නිශ්ශබ්ද වන්න. මේ අවස්ථාවේ දී ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

**ගරු සී.බී. රත්නායක මහතා (පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சீ. பி. ரத்நாயக்க - தனியார் போக்குவரத்துச் சேவைகள் அமைச்சர்)
(The Hon. C.B. Rathnayake - Minister of Private Transport Services)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු අජිත් පී. පෙරේරා මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, மாண்புமிகு அஜித் பீ. பெரேரா அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. AJITH P. PERERA *left the Chair, and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා එතුමා ගත කළ නිහතමානී ජීවිතය තුළ එතුමාගේ අධ්‍යාපන තත්ත්වයේ උසස්කම නොවෙයි මා දුටුවේ. ගමේ පුංචි බණ්ඩාගේ වාගේ නිහතමානි ගතියක්, හැදිච්චකමක් එතුමා තුළ තිබුණා. කෙනකුගේ වැදගත්කම පෙනෙන්නේ, තනතුරු ලැබෙද්දී අද වාගේ හිස උදුම්මවා ගැනීමෙන් නොවෙයි. සමහර වෙලාවට සරම ඇඳ ගෙන හිටපු මීගමුවේ ඩෙන්සිල් ප්‍රනාන්දු මැතිතුමා ඉතාමත් නිහතමානී කෙනෙක්.

මේ අවස්ථාවේ දී මට මතක් වෙනවා, එතුමා ගැන දිවංගත ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා කිව්ව කථාවක්. ඒකත් මේ අවස්ථාවේදී කිව්වාට වරදක් නැහැ. ඒක අපි මේ ලොබියේ එකට එක්කාසු වෙලා කථා කර කර සිටින වෙලාවක වුණු කථාවක්. එදා අපි කට්ටියක් කථා කරමින් සිටි වෙලාවේ ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා කියනවා, "ඩෙන්සිල් පූදුම කෙනෙක් නේ ජයේ" කියලා. මම ඇහුවා "මොකද?" කියලා. කර්මාන්ත හා විද්‍යා කටයුතු නියෝජ්‍ය ඇමතිවරයා ලෙස කටයුතු කළ ඩෙන්සිල් ප්‍රනාන්දු මැතිතුමාගේ අධිෂ්ඨානයක් තිබුණා, කොහොම හරි කැබිනට් ඇමතිවරයෙක් වෙන්න. එතුමා ලලිත් ඇතුලත්මුදලි මැතිතුමාට, ගාමිණී දිසානායක මැතිතුමාට කියා තිබෙනවා, "මගේ මොනවත් අඩුවක් තිබෙනවාද, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා මාව ඇමතිවරයෙක් ලෙස පත් කරන්නේ නැත්තේ ඇයි?" කියලා. එහෙම කියද්දි ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා කියා තිබෙනවා, "ඩෙන්සිල්, ඔබතුමා හොඳ කතෝලික භක්තිකයෙක් නේ. ඔබතුමාව ඇමතිවරයෙක් කරන්න කියලා පල්ලියට ගිහින් යාච්ඤා කරන්න" කියලා. එහෙම කියලා මාසයක් විතර ගත වෙද්දී එතුමා ලලිත් ඇතුලත්මුදලි මැතිතුමාට ඇවිත් කිව්වාලු, "ඔබතුමා කියපු දේ මම කළා, මට ඇමතිකමක් ලැබුණා." කියලා. දේශපාලනය වාගේම ආගම එක්කත් සම්බන්ධ වෙලා කටයුතු කිරීමේ ප්‍රතිඵලයක් තමයි ඒ. තමා තමාට අවංක වනවා නම් තමාගේ ආගමෙන් නොපෙනෙන විධියේ බලයක් තමාට ලැබෙනවා; ආශිර්වාදය ලැබෙනවා; ආශිංසනය ලැබෙනවා.

මා ගරු කරන ඩෙන්සිල් ප්‍රනාන්දු මැතිතුමා ගැන වචන කිහිපයක් හෝ කථා නොකළොත් එය මේ අවස්ථාවේ මා කරන වරදක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා ශ්‍රේෂ්ඨ මහත්මයෙක්. මේ උත්තරීතර සභාවට දේශපාලනයේ මෙන්න මේ වාගේ මහත්වරුන් බිහිවේවා, අද වැනි බේදනීය දේවල් සිදු නොවේවා කියලා මා ප්‍රාර්ථනා කරනවා. අප අදහන ආගම අනුව එතුමාට අමා මහ නිවන් සුව අත්වේවායි ප්‍රාර්ථනා කරනවා.

[අ. භා. 2.50]

**ගරු සරත් කුමාර ගුණරත්න මහතා (රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சரத் குமார குணரத்ன - அரச வளங்கள், தொழில்முயற்சி அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Sarath Kumara Gunaratne - Deputy Minister of State Resources and Enterprise Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීගමුව ආසනයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධායක මෙන්ම ආණ්ඩු පක්ෂයේ නියෝජිතයා හැටියටත් සිටි නැසී ගිය -එහෙම නැත්නම් අප අදහන කතෝලික ආගමේ හැටියට ස්වර්ගස්ථ වූ- හිටපු ගරු අමාත්‍ය ඩෙන්සිල් ප්‍රනාන්දු මැතිතුමා වෙනුවෙන් මීගමුව ජනතාවගේ ශෝකය මම මේ අවස්ථාවේදී පළ කරනවා.

තරුණයෙක් හැටියට මා දේශපාලන ජීවිතයට ඇතුළු වෙච්ච අවධියේදී මා ඉතාම අගය කළ අමාත්‍යවරයෙක් හැටියට සිටි එතුමාට මගේ ගෞරවනීය ප්‍රසාදය පුද කරනවා. අවංක දේශපාලනඥයෙක් හැටියට කිසිම දවසක දේශපාලන හිත් වේදනාව කියන දෙයක් අප තුළට ඇතුළු නොකරපු, මීගමුව ප්‍රදේශය තුළ ඉතාම සුහදශීලී දේශපාලනයක් කරපු, එක්සත් ජාතික පක්ෂයට ආදර්ශයක් වුණු දේශපාලන නායකයෙක් හැටියට මා එතුමාව හඳුන්වනවා. එතුමාගේ ජීවිත කාලය තුළදී කිසිම කෙනකුගේ හිත් රිදෙන ආකාරයට එතුමා කටයුතු කළේ නැහැ. සමහර අවස්ථාවල මට යම් යම් ප්‍රශ්න ඇති වෙලා උසාවියට යන්න සිදු වුණාම එතුමා මා ළඟට පැමිණ "පක්ෂය නිසා, මම කොහොමද සරත් ඔබ වෙනුවෙන් පෙනී සිටින්නේ? " යනුවෙන් කියපු අවස්ථා තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමාගේ ගෙදර අවශ්‍යතාව සඳහා මාළු ටික ගෙන ඒමට එතුමා කුඩා මල්ලක් රැගෙන මීගමුව, පිටිපන මාළු ලෙල්ලමට ගියා. ඒක එතුමා තුළ අභිමානයක් නැතිකම, ආඩම්බරයක් නැතිකම පෙන්වපු අවස්ථාවක්. තමාගේ පුත්‍රයා දේශපාලනය සම්බන්ධයෙන් ප්‍රශ්නයක් ඇති කර ගත්ත අවස්ථාවක පුතාට විරුද්ධව පවා කතා කරපු නායකයෙක් තමයි අද අප අතර නැති ඩෙන්සිල් ප්‍රනාන්දු නම් වූ ඒ දේශපාලනඥයා. එතුමාගේ අවංකත්වය විදහා දැක්වූ එක් අවස්ථාවක් ගැන මම මෙහිදී කියන්න ඕනෑ.

එතුමා කර්මාන්ත ඇමති වශයෙන් සිටි කාලයේදී වෙළෙඳ කලාපය අයත්ව තිබුණේ එතුමාටයි. ඒ කාලයේ නත්තලට වෙළෙඳ කලාපයේ එක එක කර්මාන්තශාලාවලින් තෑගි පාර්සල් ගෙනෙනවා. මට මතකයි, එතුමාගේ ගෙදර ගේට්ටුව ළඟ හිටපු රොද්‍රිගු නමැති ආරක්ෂක නිලධාරියාට එතුමා කතා කරලා කියා තිබුණා, කිසිම කෙනකුගෙන් ලැබෙන තෑග්ගක් බාර ගන්න එපාය; කරුණාකරලා ඒවා හරවා අරින්නය කියා. මම මේ කියන්න යන්නේ එතුමාගේ චරිතය දේශපාලනඥයන් සියලු දෙනාටම ආදර්ශයට ගත හැකි චරිතයක්ය කියන එකයි. ඒ වාගේම තවත් ටික වෙලාවකින් ගේට්ටුවේ හිටපු ආරක්ෂක නිලධාරියාට කතා කළ එතුමා කියා තිබෙන්නේ, "රොද්‍රිගු, තමුසේත් මොනවා හරි තෑගි පාර්සල් අරගෙන තිබෙනවා නම් ඒවාත් ආපසු යවන්න ඕනෑ" කියායි. එවැනි අවංක දේශපාලනඥයන් සොයා ගැනීමට අමාරු කාලයක් අද උදා වෙලා තිබෙනවා. මම එතුමාට මොක් සුව ප්‍රාර්ථනා කරනවා.

දේශපාලන දිවියේදී එතුමාගෙන් පසුව මට එක්සත් ජාතික පක්ෂයෙන් නොයෙක් අතවර ආවා. ඊට පසුව මනාප ක්‍රමය මත අපේ පක්ෂයේ අයම ගහ ගත්තා. මම මේ කියන්නේ අද තිබෙන දේශපාලන සංස්කෘතිය ගැනයි. අද අප අතර සිටින නායකයන් පවා මෙතුමා ආදර්ශයට ගන්න ඕනෑ. දේශපාලනය කියන්නේ මිනී මරා ගන්නට තරම් දෙයක් නොවෙයි. දේශපාලනය කියන්නේ මුදලට විකුණන දෙයක් නොවෙයි. දේශපාලනය කියන්නේ අසභ්‍ය වචනයෙන් පරිභව කරන දෙයක් නොවෙයි. ජනතාවට සේවය කිරීමේදී අප සියලු දෙනාම මෙවැනි චරිත ආදර්ශයට ගත්තොත් ඒක තමයි අපට කරන්න පුළුවන් ලොකුම සේවය. එතුමාගේ ජීවිත කාලය තුළ එතුමා අපට දුන් ආදර්ශය වෙනුවෙන් මීගමුව ජනතාවගේ ආචාරය පිරිනමමින් අපේ කතෝලික ධර්මයේ හැටියට එතුමාට නැවතත් මොක් සුව ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

I wish to associate myself with the sentiments expressed by both sides of the House on the death of the Hon. N. Denzil Fernando, ex-Member of Parliament. I shall direct the Secretary-General of Parliament to send copies of the Official Report, Hansard relevant to the Meeting, to the members of the bereaved family.

Order, please! Next, we will take up the Vote of Condolence on the death of the Hon. H.G.P. Nelson, ex-Member of Parliament. The Hon. S.M. Chandrasena will begin his speech.

## ශෝක ප්‍රකාශය : ගරු එච්.ජී.පී. නෙල්සන් මහතා

## அனுதாபத் தீர்மானம் : மாண்புமிகு எச்.ஜி.பீ. நெல்சன்

## VOTE OF CONDOLENCE : HON. H.G.P. NELSON

[අ. භා. 2.56]

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා (ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමා)**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன - கமநல சேவைகள், வனசீவராசிகள் அமைச்சர்)
(The Hon. S.M. Chandrasena - Minister of Agrarian Services and Wildlife)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ජනතාව නියෝජනය කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හා අමාත්‍යවරයකු වශයෙන් මෙම උත්තරීතර සභාව ශෝභාවත් කරන ලද ප්‍රවීණ දේශපාලනඥයකු වූ එච්.ජී.පී. නෙල්සන් මැතිතුමාගේ අභාවය පිළිබඳව ශෝකය පළ කිරීමේ යෝජනාව මම මේ අවස්ථාවේදී මේ ගරු සභාවට ඉදිරිපත් කරන්නෙමි.

1930 ඔක්තෝබර් මස පළමුවැනි දින මාතර, තංගල්ල නගරයේදී උපත ලද හේවා ගජමන් පත්තිනිගේ නෙල්සන් මහතාගේ දයාබර පියාණන් වූයේ එච්.ජී.පී. ජේම්ස් අප්පු මහතායි. එතුමා ගොවි නායකයකු වශයෙන් ප්‍රදේශයේ කා අතරත් ජනප්‍රියත්වයට පත්ව සිටි පුද්ගලයෙකි.නෙල්සන් මහතාගේ දයාබර මෑණියන් වූයේ පී.එච්. නෝනාහාමි මහත්මියයි. තංගල්ලේ මෙතෝදිස්ත විද්‍යාලයට ඇතුළත්ව අධ්‍යාපන කටයුතුවල නියැළුණු එතුමා වයස අවුරුදු 18 සම්පූර්ණ වීමෙන් පසුව තමාගේ මාමා විසින් පොළෙන්නරුව ප්‍රදේශයේ පවත්වා ගෙන ගිය "රජරට හෝටල් ව්‍යාපාරයට" හවුල් වෙමින් සිය ජීවිකා වෘත්තිය ආරම්භ කළේය.

කුසුමා නෙල්සන් මහත්මිය සමඟින් යුග දිවිය ගත කළ එතුමා ගාමිණී, කිංස්, ගයාන්, අසංකා, නයනා, සන්ධ්‍යා සහ සුජීවා නමින් දූ පුතුන් හත් දෙනකු මෙලොවට දායාද කළේය. ඔවුන්ගෙන් කිහිප දෙනෙක්ම මේ වන විට ව්‍යාපාර ක්ෂේත්‍රයේ නියැළී සිටින අතර උතුරු මැද පළාත් සභාවේ විපක්ෂයේ ප්‍රධාන සංවිධායක වශයෙන් කිංස් නෙල්සන් මහතා තවත් සුවිශේෂී ජනතා මෙහෙවරක යෙදී සිටියි.

එක්සත් ජාතික පක්ෂයට සම්බන්ධ වෙමින් ක්‍රියාකාරී දේශපාලනයේ නියැළුණු නෙල්සන් මැතිතුමා පොළොන්නරුව ගම් කාර්ය සභාවේ සභිකයකු වශයෙන් මහජන සේවය ආරම්භ කළේය. 1965 වසරේදී පොළොන්නරුව සුළු නගර සභාවේ සභාපති වශයෙන් තේරී පත් වුණු එතුමා ප්‍රදේශයේ දියුණුව වෙනුවෙන් ඇප කැප වෙමින් නගරයට විශාල අඩු පාඩුවක්ව පැවති පානීය ජල යෝජනා ක්‍රමය එවකට පැවැති රජයේ සහයෝගය ඇතිව චීන රජයේ ආධාර ලබා ගනිමින් ක්‍රියාත්මක කළේය. එපමණක් නොව පොළොන්නරුව වැනි දුෂ්කර ප්‍රදේශයක ජීවත් වන ජනතාව අතර ජීවත් වෙමින් ඔවුන්ගේ දුක සැප සොයා බලමින් ඔවුන් සුඛිත මුදිත කරලීමටත් ප්‍රදේශය සංවර්ධනය කරලීමටත් තමන්ට දිය හැකි උපරිම සහයෝගය ලබා දුන්නේය.

1977 වර්ෂයේ පැවති මහ මැතිවරණයේදී පොළොන්නරුව ආසනයට එක්සත් ජාතික පක්ෂය යටතේ තරග වැදෙමින් ජයග්‍රහණය හිමි කර ගත් නෙල්සන් මහතා මෙම පාර්ලිමේන්තුවේ

[ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා]

මන්ත්‍රීවරයකු වශයෙන් ප්‍රථම වතාවට අසුන් ගත්තේය. එතැන් පටන් 1989 වසර දක්වාම ත්‍රිකුණාමලය දිස්ත්‍රික් අමාත්‍යවරයා වශයෙන් කටයුතු කරමින් පොළොන්නරුවට මෙන්ම ත්‍රිකුණාමලයට ද සංවර්ධනය ළඟා කර දීමට පෙරමුණ ගත්තේය. ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාට කරුණු පෙන්වා දෙමින් මාදුරු ඔය මඟින් මහවැලි ව්‍යාපාරය ආරම්භ කිරීමට මූලිකව කටයුතු කළ නෙල්සන් මැතිතුමා එමඟින් පොළොන්නරුව ගොවි ජනතාවගේ දෙවැනි පරම්පරාවට ඉඩම් ලබා දීමට ද පියවර ගත්තේය.

එතුමා දිස්ත්‍රික්ක දෙකේම පිහිටි පෞරාණික වැදගත්කමින් යුතු බෞද්ධ සිද්ධස්ථාන රැසක් වැඩි දියුණු කිරීමට පියවර ගත් අතර බොහෝ අවස්ථාවන්හිදී තම පෞද්ගලික ධනය ද පරිත්‍යාග කළේය. බෞද්ධයකු වශයෙන් භික්ෂූන් වහන්සේලා සහ විහාරස්ථාන සමඟ සමීප සම්බන්ධතා පවත්වමින් ශාසනයේ දියුණුව වෙනුවෙන් ද සහයෝගය ලබා දුන් නෙල්සන් මැතිතුමා අනෙකුත් ආගම්වල දියුණුව මෙන්ම එකී ආගමික ස්ථානයන්හි දියුණුව වෙනුවෙන් ද තමන්ගෙන් විය යුතු කාර්ය භාරය නොපිරිහෙළා ඉටු කළේය.

යළි 1989 දී පැවැති මහ මැතිවරණයේදී ද පොළොන්නරුව දිස්ත්‍රික් මන්ත්‍රීවරයකු වශයෙන් තේරී පත් වූ නෙල්සන් මහතා වාරිමාර්ග රාජ්‍ය අමාත්‍යවරයා ලෙස කටයුතු භාර ගනිමින් රජරට පුරා පැතිරී ඇති වාරි කර්මාන්තය ආරක්ෂා කර ගනිමින් රටට බත සැපයීම සඳහා එම ප්‍රදේශයේ ගොවි ජනතාව නඟා සිටුවීමට අවශ්‍ය පියවර ගත්තේය. එපමණක් නොව එතුමා ප්‍රදේශවාසී ජනතාවගේ නිවාස, සෞඛ්‍ය, අධ්‍යාපන, විදුලිය සහ දුරකථන පහසුකම් ද සපුරා දීමට ඉමහත් ප්‍රයත්නයක යෙදුණේය.

1990 දී ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන රාජ්‍ය ඇමතිවරයා වශයෙන් ද 1991 දී කෘෂිකර්ම සංවර්ධන සහ පර්යේෂණ රාජ්‍ය ඇමතිවරයා වශයෙන් ද පත් කරනු ලැබූ නෙල්සන් මහතා තරුණ තරුණියන්ගේ රැකියා ප්‍රශ්නයට විසඳුම් වශයෙන් ඇඟලුම් කම්හල් ආදී විවිධ ක්ෂේත්‍රයේ කර්මාන්තශාලා බිහි කරලීමට මූලිකව කටයුතු කළේය. 1994 දී පැවැති පාර්ලිමේන්තු මහ මැතිවරණයට ද එක්සත් ජාතික පක්ෂය යටතේ තරග කළ එතුමා එවර ද මහ ජන වරම් ලබා ගනිමින් තුන්වැනි වරටත් මෙම ගරු සභාව වෙත පැමිණි අතර, විපක්ෂ මන්ත්‍රීවරයකු වශයෙන් තමන්ගෙන් විය යුතු කාර්ය භාරය නොඅඩුවම ජනතාව වෙනුවෙන් ඉටු කළේය.

යළිත් 2000 දී පැවැති මැතිවරණයෙන් ද ජය ගත් නෙල්සන් මහතා, වසරකට පසු පවත්වන ලද මහ මැතිවරණයට ද ඉදිරිපත්ව පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ජනතා නියෝජිතයකු වශයෙන් මෙම පාර්ලිමේන්තුව වෙත පිය නැඟීය.

එතුමා එවර බලයට පත් වූ රජයේ වාරිමාර්ග ඇමතිවරයා වශයෙන් ප්‍රදේශයේ දියුණුව වෙනුවෙන් අනූපම දායකත්වයක් සැපයුවේය. චීනය, ඇමරිකාව, ජපානය ආදී විවිධ රටවල චාරිකා කරමින් වැව් බැඳි රාජ්‍යයට පමණක් නොව සමස්ත ශ්‍රී ලංකාවටම එම රටවලින් විශේෂ ආධාර උපකර ලබා දීමට පියවර ගත්තේය. කවර තනතුරක් දැරුවද, තමන් තුළ පැවැති ගැමි ගතිය සහ නිරහංකාරභාවය නිරතුරුවම රැක ගත් මෙම මානව හිතවාදියා දේශපාලනයට පිවිසීමට පෙර සිටම ආගන්තුක සත්කාරයට ඇලුම් කළේය. අතර මඟදී හමු වන ඕනෑම අයෙකුට මෙන්ම තම නිවසට පැමිණෙන කවර පුද්ගලයකුට වුවද දේශපාලන භේදයකින් තොරව උපකාර කළ එතුමා, පවුලේ සියලු දෙනාගෙන්ම ලත් සහයෝගය මධ්‍යයේ හමු වන වේලාව අනුව ඔවුනට ආහාර පානවලින් සංග්‍රහ කිරීම වැනි ආගන්තුක සත්කාරවල ද නියැළුණේය. ගැමි සුවඳ වහනය වන පරිසරයක හැදුණු වැඩුණු එතුමාගේත්, එම පවුලේත් නිර්ව්‍යාජත්වය එම කාර්යයන්හිදී මැනවින් කැපී පෙනුණේය.

වසර 79ක් ආයු වැළඳූ මෙම උදාර යුග පුරුෂයා සුළු අසනීප තත්ත්වයක් මැද කෙටි කාලයක් ගත කොට 2010 සැප්තැම්බර් මස 09 වැනි දින පවුලේ ඥාතීන්ටත්, වැව් බැඳි රාජ්‍යයේ අන්ත අසරණ දුගී ජනතාවටත් දැඩි වේදනාවක් ළඟා කර දෙමින් මෙලොවින් සදහටම සමු ගත්තේය. රජ රට පොළොවට දැඩි සේ ආදරය කළ එතුමා, අවසන් ගමන් ගියේ තමන්ගේ දේහය දවාලමින් පසු ඉතිරි වන අළු ටික පවා පොළොන්නරුවේ පස සරු කිරීමට යොදන ලෙසට දූ පුතුන්ගෙන් ඉල්ලීමක් කරමිනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දේශපාලන මතවාද පසෙක ලා ජනතාව උදෙසා හැම විටම තම සේවය කැප කළ සැබෑ මානව හිතවාදියකු වූ එතුමාගේ අභාවය රජ රට ප්‍රදේශයට පමණක් නොව සමස්ත ශ්‍රී ලංකාවටම දැරිය නොහැකි පාඩුවකි. ගිනියම් වූ මහ පොළොව සමඟ පොර බදමින්, ජීවත්වීම උදෙසා දහඩිය වගුරුවන ජන කොට්ඨාසයක් සුඛිත මුදිත කිරීමේ උදාර මෙහෙවරක යෙදුණු උදාර නායකයකු වූ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු සහ අමාත්‍යවරයකු වශයෙන් මෙම උත්තරීතර සභාව ශෝභාවත් කළ එච්.ජී.පී. නෙල්සන් මැතිතුමන්ට නිවන් සුව ප්‍රාර්ථනා කරන අතර, මෙම පාර්ලිමේන්තුවේ ශෝකය එතුමාණන්ගේ ආදරණීය බිරිඳටත්, දරුවන් ඇතුළු පවුලේ ඥාතීන් සියලු දෙනාටමත් දන්වා යවන ලෙස යෝජනා කර සිටිමි.

විශේෂයෙන්ම රජරට ප්‍රදේශයේ කෘතහස්ත දේශපාලනඥයකු හැටියට කටයුතු කළ නෙල්සන් ඇමතිතුමා සමඟ මටත් කෙටි කාලයක් පාර්ලිමේන්තුවේ ඉන්න පුළුවන් වුණා. අපි දැක්කා, එතුමා පාර්ලිමේන්තුවේ කටයුතු අවසන් වුණු හැම වෙලාවේම පොළොන්නරුවට තමයි යන්නේ කියා. මට මතකයි, එතුමා එක සිංහල අවුරුදු සමයකදී කිව්වා, "මට අපේ කොල්ලෝ බලන්න යන්න තිබෙනවා" කියලා. මම ඇහුවා "ඇමතිතුමා, ඒ කවුද?" කියලා. ත්‍රස්තවාදය පැවැති කාලය තුළ ග්‍රාම ආරක්ෂක නිලධාරින්, සිවිල් ආරක්ෂක නිලධාරින් පොළොන්නරුවේ බංකර් ගහගෙන සිටියා. "බංකර් ගහගෙන ඉන්න ළමයින්ට අවුරුදු කන්න විධියක් නැහැ, කැවුම් ටිකක් හදා ගෙන, කැවිලි ටිකක් හදා ගෙන ගිහිල්ලා දෙන්න ඕනෑ, මම ඒ විධියට හැම අවුරුද්දේම කරනවා" කියලා එතුමා කිව්වා. ඒ නිසා අපි එතුමා හොඳින් තේරුම් ගත්තා. කෙටි කාලයක් තමයි අපි එතුමාව ඇසුරු කළේ. එතුමා රජ රටට ගැළපෙන නායකයෙක්. ඒ වාගේම රජ රට ගොවීන් වෙනුවෙන් නායකත්වය ගත් සැබෑ ගොවි නායකයකු හැටියට නෙල්සන් මැතිතුමා පෙනී සිටියා. ඒ විතරක් නොවෙයි, එතුමා පොළොන්නරුව දිස්ත්‍රික්කය සංවර්ධනය කරන්න කටයුතු කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පක්ෂ විපක්ෂ භේදයකින් තොරව සියලු දෙනා සමඟ ඇසුරු කරන මානව හිතවාදී දේශපාලනයක් තමයි එතුමා තුළ තිබුණේ. එතුමාගේ අවමඟුල් උත්සවය අවස්ථාවේ අපේ මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමා ප්‍රකාශ කරලා තිබුණා, මොන පක්ෂයේ සිටියත් එතුමා දේශපාලන ගුරුවරයකු හැටියට පවා සලකන්න පුළුවන් කියලා. අපි ජීවත් වන රජ රට ප්‍රදේශයේ, උතුරු මැද පළාතේ නායකයකු හැටියට කටයුතු කළ එතුමා වෙනුවෙන් අද එතුමාගේ පුත්‍රරත්නය වන කිංස් නෙල්සන් මැතිතුමා තරුණ නායකයකු හැටියට උතුරු මැද පළාත් සභාවේ කටයුතු කරන හැටි අප දකිනවා. මගේ සහෝදරයෙකුත් එතැන ඉන්නවා. එතුමා ඉතාම දක්ෂ අන්දමින් තමන්ගේ පක්ෂය මෙහෙයවමින් ඒ කටයුතු කරනවා. එතුමාගේ පියා ගිය අඩි පාරේ යන එතුමාට අනාගතයේදී හොඳ නායකත්වයක් දෙන්න පුළුවන් වෙයි කියා අප විශ්වාස කරනවා.

රජ රට පෝෂණය කළ නායකයකු හැටියට එතුමා කළ සේවය, රජ රට ජීවත් වන පුද්ගලයකු හැටියට මාත් අගයමින්, එතුමාට නිවන් සුව අත්පත් වේවා යි ප්‍රාර්ථනය කරන අතර, ඒ පවුලේ සියලු දෙනාටම මේ ගරු සභාවේ ශෝකයත්, විශේෂයෙන් මාගේ ශෝකයත් ප්‍රකාශ කරමින් නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ. භා. 3.06]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**

(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - எதிர்க்கட்சி முதல்வர்)

(The Hon. Ranil Wickremasinghe - Leader of the Opposition)

මූලාසනයෙන් අවසරයි. 1973 දී ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා එක්සත් ජාතික පක්ෂයේ නායකයා හැටියට පත් වුණාට පස්සේ හිඟුරක්ගොඩ රැස්වීමක් තිබුණා. ඒ රැස්වීමේදී තමයි මට එච්.ජී.පී. නෙල්සන් මැතිතුමාව හොඳට දැන හඳුනා ගන්න අවස්ථාව ලැබුණේ.

නෙල්සන් මැතිතුමා පොළොන්නරුවට ගියේ යුද්ධ කාලයේ. ඒ කාලයේ රාජකීය ගුවන් හමුදාවෙන් හිඟුරක්ගොඩ ගුවන් මධ්‍යස්ථානයක් ආරම්භ කළා, විශාල fortress යානා එක්ක ගිහින් බුරුමයේත්, මැලේසියාවේත්, සිංගප්පූරුවේත් තිබුණ ජපන් කඳවුරුවලට බෝම්බ දාන්න. ඒ රාජකීය ගුවන් හමුදා කඳවුරේ විශාල වශයෙන් සේවය කළේ සුදු අය. ඒ අය සඳහා හිඟුරක්ගොඩ තිබුණ හෝටලයක අයිතිකාරයා වුණේ නෙල්සන් මැතිතුමාගේ මාමා. එතැන වැඩ කරන්න තමයි පළමුවෙන්ම නෙල්සන් මැතිතුමා හිඟුරක්ගොඩට පැමිණියේ. හිඟුරක්ගොඩ ආවාට පස්සේ එතුමා පොළොන්නරුවේම පදිංචි වුණා.

ඒ කාලයේ ඩී.එස්. සේනානායක මැතිතුමාගේ වැඩසටහනක් අනුව මින්නේරිය වැව සහ පොළොන්නරුවේ පරාක්‍රම සමුද්‍රය දියුණු කළා. 1954 දී එලිසබත් මහ රැජින ලංකාවට ආව පළමුවෙනි අවස්ථාවේ එක රාත්‍රියක් පොළොන්නරුවේ ගත කළා. පොළොන්නරුවට ඒ වාගේ ප්‍රසිද්ධියක් ලැබිලා තිබුණා. පොළොන්නරුවෙන් තමයි නෙල්සන් මැතිතුමා දේශපාලනයට ඇතුළු වුණේ. දේශපාලනයට ඇතුළු වෙලා එක්සත් ජාතික පක්ෂයේ පොළොන්නරුවේ සංවිධායක හැටියට එතුමා ක්‍රියා කළා. එතුමා ඉතා දක්ෂ සංවිධායකවරයෙක්. එතුමා ඒ ආසනය හොඳට සංවිධානය කළා. විශේෂයෙන්ම ඒ කාලයේ ඒ ප්‍රදේශයෙන් පාර්ලිමේන්තුවට තිබුණේ ආසන දෙකයි. ඒ, මින්නේරියයි, පොළොන්නරුවයි. පස්සේ තමයි මැදිරිගිරිය ආසනය ඇති වුණේ.

මට මතකයි, ඒ.ඩී.බී. ඒකනායක මැතිතුමා මැදිරිගිරිය සංවිධායක හැටියට පත් කරන්න පෙර ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා සාකච්ඡා කළේ නෙල්සන් මැතිතුමා එක්ක කියලා. නෙල්සන් මැතිතුමා එක්ක කථා කරලා තමයි ඒ.ඩී.බී. ඒකනායක මැතිතුමා ඒ සංවිධායක හැටියට පත් කළේ. මම හිතන හැටියට ඒක පුදුමයට කරුණක් නොවෙයි. එදා එච්.ජී.පී. නෙල්සන් මැතිතුමා පොළොන්නරුව ආසනය ඉහළින්ම ජයග්‍රහණය කළා. පොළොන්නරුව ආසනය ජයග්‍රහණය කරලා මේ පාර්ලිමේන්තුවට ආවාම එතුමාට ත්‍රිකුණාමල දිස්ත්‍රික් ඇමතිකම හම්බ වුණා. ඒක ලෙහෙසි පහසු තැනක් නොවෙයි. එතැන ජීවත් වුණ ද්‍රවිඩ, මුස්ලිම් සහ සිංහල සියලු දෙනාම එකට එකතු කර ගෙන, හැම කෙනාගේම සහයෝගය ඇතිව තමයි වැඩ කටයුතු කළේ. මම දන්නවා, විශේෂයෙන් එතුමා සම්පන්දන් මන්ත්‍රීතුමා සමඟ ළඟ සම්බන්ධකමක් තිබුණාය කියලා. නිලාවෙලිවල රජයේ ඉඩම් අරගෙන ඇති කළ තරුණ සේවා සභාවේ මධ්‍යස්ථානයක් තිබුණා. මා හිතන්නේ අක්කර 600ක් විතර තිබුණා කියලායි. එදා ආර්.ජී. සේනානායක මැතිතුමා තමයි ඒ මධ්‍යස්ථානය ඇති කරලා වැඩ කටයුතු ආරම්භ කළේ.

නෙල්සන් මැතිතුමා පොළොන්නරුව අමතක කළේ නැහැ. මට, අධ්‍යාපන ඇමතිවරයා හැටියට එහේ පාසල් දියුණු කරන්න අවස්ථාව ලැබුණා. ඒ හැම දේකටම වඩා මම මෙතැන මතක් කරන්න ඕනෑ දෙයක් තිබෙනවා. අපි මහවැලි ව්‍යාපාරය ආරම්භ කරද්දී විශේෂයෙන් නෙල්සන් මැතිතුමා මැදිහත් වෙලා තමයි ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාත්, ගාමිණී දිසානායක ඇමතිතුමාත් සමඟ පොළොන්නරුවට අයත් ඒ ප්‍රදේශ දියුණු කරන්න ක්‍රියා කළේ. දිඹුලාගල සිට අලුත් නගර ඇති වෙලා, ඒ ප්‍රදේශය දියුණු ප්‍රදේශයක් බවට පත් වෙලා තිබෙන්නේ එතුමා නිසායි.

අනෙක් ප්‍රදේශවලත් ඒ වාගේම දියුණුවක් එතුමා ඇති කළා. එතුමා හැම වෙලාවේම මහවැලිය එක්ක එකතු වෙලා මහවැලි ගම්මාන ව්‍යාප්ත කරන්න, වැලිකන්ද දිඹුලාගල ආදී ඒ ප්‍රදේශ දියුණු කරන්න විශේෂ උනන්දුවක් අර ගත්තා. මගේ ආධාර ඇතිව පොළොන්නරුව රාජකීය විද්‍යාලය ඇතුළු අනෙක් විද්‍යාලත් දියුණු කළා. මම එතුමාට විශේෂයෙන්ම ස්තුතිවන්ත වන්නට ඕනෑ. පළමුවැනි වතාවට පොළොන්නරුවේ යොවුන් පුරයක් පවත්වන්න එතුමා තමයි මට උදවු කළේ. එතුමා ඒ කරපු වැඩ කටයුතුවල ප්‍රතිඵලයක් තමයි අද ඒ ප්‍රදේශයේ තිබෙන දියුණුව.

මින්නේරිය අතුරු මැතිවරණයේදී නැවතත් අප එතුමා සමඟ වැඩ කළා. අපට විරුද්ධව හිටියේ මහජන පක්ෂයෙන් ආපු විජය කුමාරණතුංග මැතිතුමායි. 1989න් පස්සේ එතුමාට ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන රාජ්‍ය ඇමති ධුරය ලැබුණා කියලායි මට මතක. ඒ වාගේම ප්‍රේමදාස ජනාධිපතිතුමාගෙන් කිහිප වතාවක්ම ඉල්ලලා ඒ ප්‍රදේශයට ඇඟලුම් කර්මාන්තශාලා ලබා ගත්තා. එතුමා කිසි විටෙක පොළොන්නරුව අමතක කළේ නැහැ. එතුමා ඉස්සර වෙලා පොළොන්නරුවේ කොට්ඨාසයේ මන්ත්‍රීවරයා හැටියට කටයුතු කළා. ඊට පස්සේ පොළොන්නරුවේ දිස්ත්‍රික් මන්ත්‍රීවරයා හැටියට හැම තැනම ගියා. හොඳ ආදර්ශයක්. විරුද්ධ පක්ෂයට ගියා කියලා නායකත්වය අතහැරියේ නැහැ. 2001 දී එතුමා කැමැති විෂයයක් වන වාරිමාර්ග භාර ඇමතිවරයා හැටියට පත් කරන්න මට අවස්ථාව ලැබුණා.

අද නවීන පොළොන්නරුව දිහා බලනවා නම්, ඒ නවීන පොළොන්නරුව ඇති කරන්නට විශේෂයෙන්ම එච්.ජී.පී. නෙල්සන් මැතිතුමා ක්‍රියා කළා. ඒ කාලයේ පරාක්‍රම සමුද්‍රය කැඩෙන්න ගිය අවස්ථාවේ දී ආණ්ඩුවට කියන්නේත් නැතිව ඉස්සර වෙලාම එතුමා පියවර අර ගෙන තමයි ඒක ආරක්ෂා කරලා දුන්නේ. ඒ වාගේ මන්ත්‍රීවරු අද සොයන්න බැහැ. එතුමා තමාගේ ප්‍රදේශය ගැන හිතලා විශාල ලෙස වැඩ කටයුතු කරමින්, හැම වෙලාවේම පොළොන්නරුවේ ජීවත් වුණා. වෙන කොහේවත් නොවෙයි. එතුමා දේශපාලනයට තරග කරන එක අත්හැරියා. නමුත් දේශපාලනය අත්හැරියේ නැහැ. එතුමා හැම දෙයකටම උදවු කළා. එතුමා අසනීප වන තෙක්ම දේශපාලන කටයුතුවලට ආවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේ දී එච්.ජී.පී. නෙල්සන් මැතිතුමාගේ අභාවය ගැන අපි කනගාටු වෙනවා. එතුමා නැති වුණ එක විශාල පාඩුවක්. ඩී.එස්. සේනානායක මැතිතුමාගේ නමත්, සී.පී. ද සිල්වා මැතිතුමාගේ නමත් සමඟ පොළොන්නරුව දියුණු කිරීම සම්බන්ධයෙන් එච්.ජී.පී. නෙල්සන් මැතිතුමාගේ නමත් සඳහන් වන බව මා කියන්න කැමැතියි.

මගේ කථාව අවසන් කරන්නට පෙර මා මේ කාරණයත් කියන්නට කැමැතියි. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා එතුමාට සැලකූ හැටි මට මතකයි. දෙවැනි එලිසබෙත් රැජින නැවතත් ලංකාවට පැමිණි වෙලාවේ දී එතුමා අනෙක් ඇමතිවරු හඳුන්වා දෙන ගමන්, නෙල්සන් ඇමතිතුමාව රැජිනට හඳුන්වා දුන්නේ "Your Majesty, this is my Lord Nelson" කියලායි. "මේ තමයි මගේ නෙල්සන් සාමි" කියලා නෙල්සන් මැතිතුමාව එතුමියට හඳුන්වා දුන්නා. එදා ඉඳලා අපි නෙල්සන් මැතිතුමාට කිව්වේ "Lord Nelson" කියලායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාගේ අභාවය වෙනුවෙන් අපේ කනගාටුව ප්‍රකාශ කරන ගමන් "Lord Nelson" මැතිතුමාට නිවන් සැප ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා.

[අ. භා. 3.13]

**ගරු දි.මු. ජයරත්න මහතා (අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා)**

(மாண்புமிகு டீ.எம்.ஜயரத்ன - பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சரும்)

(The Hon. D.M. Jayaratne - Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එච්.ජී.පී. නෙල්සන් මැතිතුමා බොහොම හොඳ මිත්‍රයකු හැටියට මාත් සමඟ ක්‍රියා කර තිබෙනවා. එතුමා අපට ඒ දවස්වල ප්‍රකාශ කර තිබුණා, ඩී.එස්. සේනානායක මැතිතුමා පොළොන්නරුවේ සංවර්ධන යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරන කාල පරිච්ඡේදයේදී තරුණයකු හැටියට එතුමා සේනානායක මැතිතුමාත් එක්ක බොහොම ඕනෑකමින්, කැපවීමකින් ක්‍රියා කරපු බව. ඊට පස්සේ තමයි එතුමා දේශපාලන ක්ෂේත්‍රයට ආවේ. විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා කිව්වා වාගේ ඒ ප්‍රදේශය විශාල වශයෙන් දියුණු කිරීමට එතුමා විශාල හැඟීමකින්, ඕනෑකමකින් ක්‍රියා කළා. මා සමඟ සම්බන්ධතාවක් ඇති වීමට හේතු වුණේ මේ විධියටයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහ මැතිවරණය අවසන් වෙලා එක්සත් ජාතික පක්ෂය ජයග්‍රහණය කළාට පස්සේ අපේ ගම්මුන්ට ටිකක් හිරිහැර ඇති වුණා. සාමාන්‍යයෙන් ඉලෙක්ෂන් එකක් ඉවර වුණාම පොඩි හිරිහැර ටිකක් ඇති වෙනවා නේ. අපේ කුරුණෑගල හිටපු මහ ඇමතිතුමා -ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මැතිතුමා- ඒ ගැන දන්නවා. අර වාගේ මිනිස්සුන්ට පොඩි හිරිහැරයක් ඇති වුණා. එච්.ජී.පී. නෙල්සන් මැතිතුමා හඳුනන එක පුද්ගලයෙක් හිටියා. ඒ කාලයේ එතුමාත් එක්ක පොළොන්නරුවේ හිටපු කෙනෙක්. ඊට පස්සේ එතුමා අපේ ගමට ආවා. අපේ ගෙදරටම ආවා. ඒ වෙලාවේ මම එතුමාව දැන ගෙන හිටියේ නැහැ. නමුත් අර සෙනෙවිරත්න කියන අනෙක් පුද්ගලයා කිව්වා, "මේ තමයි නෙල්සන් මැතිතුමා" කියලා. ඊට පස්සේ අපි කථා කළා. එතුමා කිව්වා "මට ආරංචි වුණා මේ හාදයාගේ නෑදැයෝ ටිකට හරි කරදරයි, හිරිහැර කරනවා කියලා, මම ආවේ ඒ ගොල්ලන් එක්ක ගෙන ගිහිල්ලා එහේ නතර කර ගෙන මොනවා හරි උදවු කරන්නයි." කියලා. මම කිව්වා, "මේ ගොල්ලෝ පවුල් කීපයක් නේ" කියලා. එතකොට කිව්වා, "ඔව්, ඔව්. ඒකට ප්‍රශ්නයක් නැහැ, මම දැන් වාහනයක් එවන්නම්, සියලු දෙනාටම එහේ එන්න කියන්න. එතකොට ප්‍රශ්නයක් නැහැ. එහේ වැඩ කර ගෙන ඉන්න පුළුවන්." කියලා. මම ඉතින් කිව්වා, "බොහොම හොඳයි, ඔය ගොල්ලෝ කැමැති නම් යන එක හොඳයි" කියලා. මම නම් වැඩිය කැමැති වුණේ නැහැ. ඒ මොකද, මැතිවරණයක් ආපුවාම මට කතිරයක් ගහන්න ඉන්න අය නේ. ඒ කට්ටිය යනවාට මම කැමැති වෙනවා යැ. ඒ වුණත් ඒ වෙලාවේ හැටියට මම කිව්වා, "එහෙම නම් කමක් නැහැ." කියලා. ඇත්තටම ඒ වෙලාවේ එතුමා වාහනය එව්වා. මගේ ප්‍රදේශයේ පවුල් හතරක්ම ගියා. ඒ පවුල් හතර ගියාට පසුව ඒ ගොල්ලන්ට ඉඩම් හරි ගස්සලා දීලා, ගෙවල් හදලා දීලා, ක්‍රම ක්‍රමයෙන් බොහොම දියුණු තත්ත්වයට පත් කළා.

පසුව අර ගමේ සිටිය සෑහෙන ප්‍රමාණයක් ඒත් එක්ක පොළොන්නරුවට ගියා. ගිහිල්ලා ඒ පොළොන්නරුවේ අයත් එක්ක බොහොම හොඳට ජීවත් වුණා. අපේ ප්‍රදේශයෙන් ගිය, විශාල වශයෙන් දියුණු වුණු පවුල් සංඛ්‍යාවක් අදත් පොළොන්නරුවේ ජීවත් වනවා. මම එහි ගිය වෙලාවල්වලදී ඒ අය මට මුණ ගැහෙනවා.

නෙල්සන් මැතිතුමා මුළු ජීවිත කාලය තුළම ඒ විධියට ඒ ගොල්ලන්ට උදවු උපකාර කළා. මම මේ කියන්න හැදුවේ, මිත්‍රයකු හැටියට තමා සමඟ සිටි එක පුද්ගලයකුට උදවු කරන්න කොයි තරම් හැඟීමකින් එතුමා ආවාද කියන එකයි. හුඟක් දෙනෙක් ඒ වාගේ කරයිද කියන එකයි ප්‍රශ්නය. ඒ මුළු පවුලම පොළොන්නරුවට ගිහිල්ලා අද ඉතාම දියුණු තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ඒ අයට කුඹුරු හරි ගස්සලා දීලා, ඉඩම් හරි ගස්සලා දීලා තිබෙනවා. ඒ වාගේම ඒ අය වාහන කර්මාන්ත වාගේ දේවලුත් කරනවා. මෙන්න මේ වාගේ හොඳ පුද්ගලයෙක් තමයි එච්.ජී.පී. නෙල්සන් මැතිතුමා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විධියට මම එතුමාව බොහොම ළඟින් ආශ්‍රය කළා. පොළොන්නරුවට ගියාමත් මම එතුමාව හමු වනවා. කොළඹ ආවාමත් අපි මුණ ගැහෙනවා. මුණ ගැහිලා කථා කරලා යනවා. අවසාන මොහොතේදී එතුමා අසනීප වෙලා නවලෝක රෝහලේ සිටියා. ඒ වෙලාවේදීත් එතුමාව බලන්න මම කීප වතාවක්ම ගියා. ඒ ගියාමත් අන්තිම මොහොතේදීත් එතුමා බොහොම ආදරයෙන් මට කථා කළා. "මට බොහොම සන්තෝෂයි, මගේ නම් කාලය ඉවරයි, ඒ වුණාට ඔබතුමාට හුඟක් කල් මේ කටයුතු කර ගෙන යන්න පුළුවන්, මට නම් එච්චර හොඳ මදි." කියලා එතුමා කිව්වා. ඒ වෙලාවේත් එතුමා මට මතක් කළා, "ඔබතුමාගේ මිනිස්සු ටික ඔන්න හොඳට ඉන්නවා. ඒකෙන් සන්තෝෂ වන්න පුළුවන් නේද? " කියලා.

එතුමා අන්න ඒ වාගේ බොහොම හොඳ හැඟීමක් ඇති හොඳ ශ්‍රේෂ්ඨ පුද්ගලයෙක්. එතුමාට බොහොම හොඳ හදවතක් තිබුණා. දේශපාලනඥයන්ට එහෙම හොඳ හදවත් තිබෙන්නට ඕනෑ. නැතුවා නොවෙයි තිබෙනවා. දේශපාලනඥයෙක් වුණාම, පොදු ජනතාවට සේවය කරන්න ඕනෑයි කියන චින්තනයක් තවම වැඩි පිරිසකගේ තිබෙනවා. ඒක සාමාන්‍යයෙන් සත්‍ය තත්ත්වයක්. නමුත් මෙතුමා කොයි තරම් දුරට ඒ වාගේ හොඳ හැඟීමකින් ක්‍රියා කළාද කියන එක පිළිබඳව මම වචන කීපයක් ප්‍රකාශ කළේ එතුමාගේ අභ්‍යන්තරයේ ශ්‍රේෂ්ඨත්වය ගැන මතක් කරන්නයි. එච්.ජී.පී. නෙල්සන් මැතිතුමා අන්න ඒ වාගේ ක්‍රියා කළ අයෙක්. ඒ අයට එහෙම කළා නම් තමාට ඡන්දය පාවිච්චි කරපු, තමාගේ මිත්‍රයන්ට, තමාගේ ප්‍රදේශය කියලා කල්පනා කළ ප්‍රදේශයට කොච්චර උසස් හැඟීමකින් කොච්චර උසස් සේවයක් කරන්න ඇතිද කියන එක මේ තත්ත්වය තුළින් අපට හිතා ගන්න පුළුවන්. ඒ නිසා එතුමා දේශපාලන ක්ෂේත්‍රයේත් සාමාන්‍ය ජන සමාජයේත් ඉතා ශ්‍රේෂ්ඨ ආදර්ශවත් පුද්ගලයෙක්ය කියන එක මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්නට ඕනෑ. ඒ වාගේ ශ්‍රේෂ්ඨ පුද්ගලයකු නැති වීම ගැන අපි කනගාටු වනවා.

එතුමා හොඳ බෞද්ධයෙක් බව මම දන්නවා. බෞද්ධයකු හැටියට එතුමා ප්‍රාර්ථනා කළා වූ නිවන් සුව එතුමාට අත් පත් වේවායි කියා මා ප්‍රාර්ථනා කරනවා. ඒ එක්කම ඒ පවුලේ ඥාතීන්, හිතවතුන් සැම සියලු දෙනාටම එතුමාගේ අභාවය සම්බන්ධයේ අපගේ බලවත් කනගාටුව දැනුම් දෙන්න කියා මා ඔබතුමාගෙන් ඉල්ලනවා.

[අ. භා. 3.20]

**ගරු කරු ජයසූරිය මහතා**

(மாண்புமிகு கரு ஜயசூரிய)

(The Hon. Karu Jayasuriya)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දිවංගත එච්.ජී.පී. නෙල්සන් මැතිතුමාගේ කීර්තිමත් චරිතාපදානය විවරණය කරමින් අතිගරු අග්‍රාමාත්‍යතුමාත්, ගරු විරුද්ධ පාර්ශ්වයේ නායකතුමාත්, ඒ වාගේම ගරු චන්ද්‍රසේන ඇමතිතුමාත් කථා කළා. වේලාව සීමිත බැවින් ඒ සියලුම කරුණු අනුමත කරමින්, නෙල්සන් අමාත්‍යතුමා මේ රටේ බිහි වූ ඉතාමත්ම නිහතමානී, අවංක, ජනතාවට ආදරය කළ, හොඳ හදවතක් තිබුණු මහජන සේවකයකු වශයෙන් හඳුන්වන්න මා කැමැතියි.

පොළොන්නරුවේ තම ඥාතියකුගේ ව්‍යාපාරයකට හවුල් වීම සඳහා දකුණේ තම උපන්ගම වූ තංගල්ලේ සිට පොළොන්නරුවට

ගිය නෙල්සන් මැතිතුමා එහිදී ඉතා සාර්ථක ව්‍යාපාරිකයකු ලෙස පොළොන්නරු ජනතාව අතර ඉතා ජනප්‍රියභාවයට පත් වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රබල සමාජ සේවකයකු ලෙස එතුමා ජනතාවගේ දුක සැප බෙදා ගෙන ජනතාව අතරම ජීවත් වෙමින් ඉතා සරල, චාම් ජීවිතයක් ගත කළා. ඒ ජනතාවගෙන් ලැබූ ආදර ගෞරවය නිසාම පොළොන්නරුව සුළු නගර සභාවේ සභාපතිවරයා ලෙස එතුමා ඔසවා තබන්නට තරම් පොළොන්නරුව ජනතාව එතුමාට කෘතඥ වුවා. විශේෂයෙන්ම සුළු නගර සභාවේ සභාපතිවරයා වශයෙන් එතුමා තම ප්‍රදේශයට විශාල සේවාවක් කළ බවත් මම මේ අවස්ථාවේදී සඳහන් කරන්න කැමැතියි.

එතුමා 1953 දී ගම් සභාපති ලෙස පත් වූ දා සිටම පොළොන්නරුව ජනතාවට දැනෙන විශිෂ්ට ජනතා නායකත්වයක් ලබා දෙමින් කටයුතු කරමින් සිටින විට 1970 දී එක්සත් ජාතික පක්ෂයේ සිදු වූ පරාජයත් සමඟ නැවත පක්ෂයේ ජයග්‍රහණය සඳහා ප්‍රදේශයේ ජනප්‍රිය නායකත්වයක් සොයමින් ගරු ඩඩ්ලි සේනානායක මැතිතුමා කරන ලද නිරීක්ෂණයකදී හෙළි වූ ප්‍රතිඵලයක් ලෙස තමයි පොළොන්නරුව ආසනයේ එක්සත් ජාතික පක්ෂ නායකත්වය භාර ගන්නා ලෙස ගරු ඩඩ්ලි සේනානායක මැතිතුමා විසින් එච්.ජී.පී. නෙල්සන් මැතිතුමාට ආරාධනා කරනු ලැබුවේ.

1970-1977 වකවානුවල උග්‍ර ආහාර අර්බුදයකට මේ රට පත් වූ අවස්ථාවේ හාල් සේරු දෙකකට වඩා තමා සන්තකයේ අරගෙන යෑම බරපතළ වරදක් ලෙස සැලකූ යුගයක තමාගේ ජනතාවට ආහාර පානවලින් සංග්‍රහ කිරීම සඳහා තමා සතුව තිබූ ඔස්ටින් කේම්බ්‍රිජ් මෝටර් රථයේ ඩිකියේ විශාල පෙට්ටිවල පිසින ලද ආහාර පුරවා ගෙන -රතු කැකුළු බත් බට පෙට්ටිවල පුරවා ගෙන, ඇඹුල්තියල් මාළු ඇතුළු දකුණේ ක්‍රමයට පිළියෙල කරන ලද ආහාර වර්ග අරගෙන- පුද්ගලයන් දෙතුන් සියයක පමණ ප්‍රමාණයකට දිනකට බෙදා දීමට එතුමා කටයුතු කළ බව වාර්තා වෙලා තිබෙනවා. 1970-1977 කාලයේ හාල් සේරු දෙකකට වඩා ගෙන යාම තහනම් කර තිබූ නීතියෙන් රිංගා ගොස් තම ජනතාවගේ බඩගින්න නිවීමට එතුමා තුළ තිබූ දැඩි කැමැත්ත අපි මේ තුළින් දැක්කා. එතුමාගේ ජීවිත කාලය පුරාවටම මිනිසුන්ට කන්න බොන්න දී එතුමා ලැබුවේ දැඩි සතුටක්.

එතුමා 1977 මැතිවරණයෙන් පොළොන්නරුව ආසනය ජය ගනු ලැබුවේ අපේක්ෂකයෙක් ලබා ගත්ත වැඩිම ඡන්ද ප්‍රමාණයක් ලබා ගනිමින් තම ප්‍රතිවාදී අපේක්ෂකයා ද දැඩි අපහසුතාවකට පත් කරමින්. ඉන් පසු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස පොළොන්නරු ආසනයේ සෑම අංශයකම අවශ්‍යතා සොයා බලමින් තම ජනතාවගේ යටිතල පහසුකම් දියුණු කිරීමටත්, විශේෂයෙන්ම තරුණ තරුණියන්ට රැකියා පහසුකම් සපයා දීමටත්, අධ්‍යාපන අංශයේ තිබූ අඩු පාඩු සපුරාලීමටත්, පොළොන්නරුව ජනතාවට ස්වයංපෝෂිත ආර්ථිකයක් නිර්මාණය කර දීමටත් එතුමා දැඩි උත්සාහයක් ගත්තා. නෙල්සන් මැතිතුමා කරන ලද විශිෂ්ට දේශපාලන මෙහෙවර අගය කිරීමක් වශයෙන් ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා විසින් 1978 ඔක්තෝබර් මාසයේදී නෙල්සන් මැතිතුමාව ත්‍රිකුණාමල දිස්ත්‍රික් අමාත්‍යවරයා වශයෙන් පත් කරනු ලැබුවා.

1989 දී දිස්ත්‍රික්කයේ වැඩිම මනාප ලබා ගෙන නැවත පාර්ලිමේන්තුවට තේරී පත් වුණු නෙල්සන් මැතිතුමා වාරිමාර්ග රාජ්‍ය ඇමති ධුරයට පත් වුණා. ඉන් පසුව එතුමා ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන රාජ්‍ය ඇමති ධුරයට පත් වුණා. 1994 දී එක්සත් ජාතික පක්ෂයට රාජ්‍ය බලය අහිමි වුවත් නෙල්සන් මැතිතුමා පොළොන්නරුව දිස්ත්‍රික්කයෙන් යළි පාර්ලිමේන්තුවට තේරී පත් වුණා. 2000 දී පැවැත් වූ පාර්ලිමේන්තු මැතිවරණයේදී නැවත තේරී පත් වුණ එතුමා 2001 දෙසැම්බර් පැවැති මැතිවරණයෙන් ද නැවත ජයග්‍රහණය කර රනිල් වික්‍රමසිංහ මහතාගේ රජය යටතේ වාරිමාර්ග ඇමති ධුරයට පත් වුණා. මේ අයුරින් අවුරුදු 27ක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වශයෙන් ගෙවුණු දේශපාලන ජීවිතය අවසන් වුවත් ජීවත් වන තුරු තම මව්බිමට බරක් නොවී සම්පතක් ලෙසත් විශේෂයෙන්ම පොළොන්නරුව ජනතාවට විශාල අභිමානයක් වූ එච්.ජී.පී. නෙල්සන් මැතිතුමා වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම යහපත්, රටට වැඩදායී පුරවැසියෙක් වුණා. හොඳ පවුල් ජීවිතයක් ගත කළ පුද්ගලයෙක් වශයෙන්, ඒ වාගේම වාසනාවන්ත දූ පුතුන් මෙරටට බිහි කළ පියෙක් වශයෙන් අපි මේ අවස්ථාවේදී එතුමාට ගරු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ දරුවෝ සියලු දෙනා සිය පියාගේ ගෞරවය ආරක්ෂා කරමින් අද කටයුතු කරනවා. මම විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ එතුමාගේ පුත්‍ර රත්නය වන කිංස් නෙල්සන් මහතාව. එතුමා දැන් උතුරු මැද පළාත් සභාවේ අපේ ආසන සංවිධායක වශයෙන් කටයුතු කරනවා. එතුමා සිය පියා අනුගමනය කරමින්, පියාගේ අඩි පාරේ යමින්, සිය පියාට ආදරය කළ ඒ ජනතාවට සේවය කිරීමට ඉදිරිපත් වීම ගැන අපි සන්තෝෂ වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවස්ථාව ලැබුණා එච්.ජී.පී. නෙල්සන් මැතිතුමාගේ අවසන් කටයුතුවලට සහභාගි වෙන්න. එදා පැමිණ සිටි ජනතාව දැක්කාම අපිට හිතුණා, මෙතුමාට ජනතාව කොයි තරම් ආදරය කළාද කියලා. අන්න ඒ නිසා අපි එදාම එතුමාගේ පුත්‍ර රත්නයට කිව්වා, "ඔබතුමාට දැන් යුතුකමක් තිබෙනවා තමන්ගේ පියාට ආදරය කළ ඒ ජනතාව රැකබලා ගන්න" කියලා. ඒ නිසා මම එතුමාට සුබ ප්‍රාර්ථනා කරනවා.

දීර්ඝ කාලයක් රෝගාතුරව සිටි එච්.ජී.පී. නෙල්සන් මැතිතුමා හදිසියේ අභාවයට පත් වුවත්, මේ රටේ යෝධ සංවර්ධන කටයුතු වෙනුවෙන් විශාල දායකත්වයක් දක්වමින් රටට කළ සේවය අප ඉතා අගය කළ යුතුයි. කෘතහස්ත දේශපාලනඥයකු වූ එතුමාගේ වියෝව සම්බන්ධයෙන් මේ අවස්ථාවේ එක්සත් ජාතික පක්ෂයේත්, සමස්ත ශ්‍රී ලංකාවාසී ජනතාවගේත්, පෞද්ගලිකවම මගේත් බලවත් ශෝකය එතුමාගේ පවුලේ සියලු දෙනාටම පළ කරමින්, දිවංගත එච්.ජී.පී. නෙල්සන් මැතිතුමාට මා නිවන් සුව ප්‍රාර්ථනා කරනවා.

[අ. භා. 3.26]

**ගරු සිරිපාල ගමලත් මහතා (ඉඩම් හා ඉඩම් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு சிறிபால கமலத் - காணி, காணி அபிவிருத்தி பிரதி அமைச்சர்)

(The Hon. Siripala Gamalath - Deputy Minister of Lands and Land Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවුරුදු 26යි දින 8ක් අඛණ්ඩවම පොළොන්නරුව දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුව නියෝජනය කරපු, එක්සත් ජාතික පක්ෂයට විශාල ශක්තියක් දුන්න එච්.ජී.පී. නෙල්සන් මැතිතුමා 1930 දී තංගල්ල ප්‍රදේශයේ තමයි ඉපදුණේ. එතුමා ක්‍රිස්තුරාජ මහා විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලබලා තරුණ වියේදීම තමයි පොළොන්නරුව දිස්ත්‍රික්කයට ආවේ. එතුමා පොළොන්නරුව දිස්ත්‍රික්කයට පැමිණෙන විට ඒ ප්‍රදේශයේ ගොවි ජනපද ආරම්භ වෙලා තිබුණේ නැහැ. ඊටත් කලින්මයි එතුමා එහි පැමිණියේ. එතුමාගේ මාමාත් සමඟ පැමිණිලා ඒ ව්‍යාපාර කටයුතුවලට හවුල් වෙමින් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ජනපද ආරම්භයේදීම එහි ජනතාවට විශාල සේවාවක් කරන්න ඒ තුළින් එතුමා එදා පෙළඹුණා.

[ගරු සිරිපාල ගම්ලත් මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාගේ දේශපාලන ජීවිතය පටන් ගත්තේ 1953 දීයි. එම වසරේ එතුමා ලංකා සම සමාජ පක්ෂයෙන් පොළොන්නරුව ගම් සභාවට පළමුවෙන්ම තේරුණා. ඊ ළඟට එතුමා 1956 දී එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයෙක් වෙලා 1961-1965 කාල සීමාවේ පොළොන්නරුව සුළු නගර සභාවේ සාමාජිකයෙක් විධියට පත් වුණා. ඒ විතරක් නොවෙයි. 1965-1969 කාලයේ එතුමා එහි නගරාධිපතිවරයා විධියට පත් වුණා පමණක් නොවෙයි, පොළොන්නරුව දිස්ත්‍රික්කය -ඒ නගරය - දියුණු කරන්න විශාල කාර්ය භාරයක් ඉෂ්ට කළා. අදටත් එතුමාට අප ඒ වෙනුවෙන් ගෞරවය පුද කරනවා. ඒ විතරක් නොවෙයි 1969-1975 කාලයේ එතුමා නැවතත් ඒ සුළු නගර සභාවේ මන්ත්‍රී ධුරය දරමින් ඒ ප්‍රදේශයට විශාල මෙහෙවරක් කළා. ඒ කාලයේ අපේ මෙරිල් ද සිල්වා හිටපු මන්ත්‍රීතුමා මින්නේරිය ආසනයට පැමිණීමත් එක්ක පොළොන්නරුව ආසනයේ ඇති වුණු පුරප්පාඩුවට ආසන සංවිධායකවරයා විධියට එතුමා පත් වුණා. පසුව 1977 ජූලි 21වැනි දා පැවැත්වුණු මැතිවරණයෙන් එතුමා ජාතික රාජ්‍ය සභාවට තේරී පත් වුණා. ඊ ළඟට 1978-1988 කාලයේ පළමුවෙනි පාර්ලිමේන්තුව නියෝජනය කරන්න එතුමාට වාසනාව ලැබුණා. ඒ අවස්ථාවේ එතුමාට ත්‍රිකුණාමලය දිසා ඇමතිකම ලැබීමෙන් පොළොන්නරුව දිස්ත්‍රික්කයට වාගේම ත්‍රිකුණාමලයටත් විශාල මෙහෙවරක් කරන්න එදා ශක්තිය ලැබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප දන්නවා 1978 දී ඒ ප්‍රදේශයට ඇද හැලුණු වර්ෂාව සහ සුළි සුළඟ පිළිබඳව. මේ සුළි සුළඟින් පොළොන්නරුව දිස්ත්‍රික්කය සම්පූර්ණයෙන්ම විනාශ වුණා. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පරාක්‍රම සමුද්‍රයේ වැව් බැම්ම සම්පූර්ණයෙන්ම විනාශ වීමත් එක්ක ඒ ප්‍රදේශයේ ජන ජීවිතය බිඳ වැටුණා; ඒ ප්‍රදේශවල ජීවත් වුණු ජනතාවගේ ගෙවල් දොරවල්වල වහලවල් කැඩිලා, කඩ සාප්පුවල වහලවල් කැඩිලා පහුවෙනි දා එළි වෙන කොට විශාල විනාශයක් වුණා. ඒ සියල්ලටම රජයේ අවධානය යොමු කරවලා ඒ ප්‍රදේශය ඉතාම ඉක්මනින් යථා තත්ත්වයට පත් කරන්න එච්.ජී.පී. නෙල්සන් දිසා ඇමතිතුමා අතින් ඒ වෙන කොට කටයුතු කෙරුණා. ඒක පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ජනතාවට අමතක නොවන සිද්ධියක්. ඒ නිසා එච්.ජී.පී. නෙල්සන් නාමය අදටත් ඒ අය මතක් කරනවා; කථා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතා කෙටි වෙලාවක් තිබෙන නිසා මම වැඩිපුර කථා කරන්නේ නැහැ. එතුමා පස් වතාවක් පාර්ලිමේන්තු මැතිවරණයට තරග කරලා ඒවායෙන් විශිෂ්ට ලෙස ජයග්‍රහණ ලබලා 2004 වර්ෂය වන තුරු පාර්ලිමේන්තුවේ කටයුතු කළා. දිසා ඇමතිකමෙන් පස්සේ එතුමා දෙවැනි වතාවට 1989 මහ මැතිවරණයෙන් තේරී පත් වෙලා වාරිමාර්ග රාජ්‍ය ඇමතිවරයා විධියටත්, 1990-1991 කාලයේ ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන රාජ්‍ය ඇමතිවරයා ලෙසටත්, 1991-1994 කාලයේ කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ රාජ්‍ය ඇමතිවරයා විධියටත් විශාල කාර්ය භාරයක් ඉෂ්ට කෙරුවා.

ඒ විතරක් නොවෙයි. එතුමා 1994 මහ මැතිවරණයෙනුත් පාර්ලිමේන්තුවට තේරී පත් වුණා; 2000 මහ මැතිවරණයෙන් ඉතා විශිෂ්ට ලෙස ජයග්‍රහණය කර පාර්ලිමේන්තුවට තේරී පත් වුණා. ඒ වාගේම 2001දීත් එතුමා පාර්ලිමේන්තුවට තේරී පත් වුණා. එතුමා අවුරුදු 26ක් දේශපාලන කටයුතු කෙරුවා. මම විශේෂයෙන් කියන්න ඕනෑ පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ එතුමා අතින් සිදු වුණු කාර්ය භාරය ගැන.

හැත්තෑ එකේ වකවානුව ගැන අපි දන්නවා. 1971 සිට 89 දක්වා කාලයේදී එතුමා ප්‍රදේශයේ ජනතාව බේරා ගන්න විශාල මහන්සියක් ගත්තා. එතුමාට තර්ජන තිබුණා. එතුමාගේ ජීවිතය විනාශ කරන්න කටයුතු කළා. එතුමාගේ වාහන ටික, එතුමාගේ කඩ සාප්පු ගිනි තිබ්බා. එතුමා පොළොන්නරුවට දුන්නු නායකත්වයත් එක්ක ඒ සියල්ලම සමනය කරන්න එතුමාට හැකියාව ලැබුණාය කියන එක තමයි මට මේ අවස්ථාවේ කියන්න ඕනෑකම තිබෙන්නේ. [බාධා කිරීමක්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් දෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොළොන්නරුවේ දළදා පෙරහැර ඉතාම ඉහළ විධියට පවත්වන්නත්, මේ රටේ මුළු මහත් ජනතාවටම විශාල මෙහෙවරක් කරපු ඩී.එස්. සේනානායක මැතිතුමා සිහි කරමින් එම දන්සැල වසරක් පාසා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පවත්වා ගෙන යන්නත් නෙල්සන් මැතිතුමා විශාල කාර්ය භාරයක් ඉෂ්ට කළා. ඒ විතරක් නොවෙයි. ගොවි ජනතාවට යල, මහ කන්න දෙකම වගා කරන්න කලට වෙලාවට වතුර නිකුත් කරන්නත්, අවසානයේ කන්න පැහෙන තුරු, විශේෂයෙන්ම වී ටික ගෙට ගන්නා තුරු ඒ ක්ෂේත්‍රය කෙරෙහි තමාගේ අවධානය යොමු කරන්නත් එතුමා කටයුතු කළා. ඒ විතරක් නොවෙයි.

එතුමා තුළ තිබුණු ආගන්තුක සත්කාරය ගැනත් යමක් කියන්න ඕනෑ. ඕනෑම අවස්ථාවකදී ඕනෑම කෙනකුට කෑම බීම දෙන්න එතුමා පසුබට වුණේ නැහැ. ගමනක් බිමනක් යන කොට, ගමකට යන කොට ඒ ගමේ ජනතාවට අවශ්‍ය හාල් ටික, පොල් ටික වාගේ දේවල් අරගෙන ගිහිල්ලා දීලා ඒ දුගී ජනතාවට පිහිට වුණු ඉතාමත් ආදර්ශවත් නායකයෙක් විධියටයි පොළොන්නරු දිස්ත්‍රික් අපේ හිටපු මන්ත්‍රීතුමා, දිසා ඇමතිතුමා කටයුතු කෙරුවේ.

2010 සැප්තැම්බර් 09 වැනි දා සිදු වුණු එතුමාගේ වියෝව පොළොන්නරුව දිස්ත්‍රික්කයට වෙච්ච විශාල පාඩුවක් විධියට තමයි පොළොන්නරුව ජනතාව අද සලකන්නේ. මේ අවස්ථාවේ පොළොන්නරුව ජනතාවගේ ශෝකයත්, අපේ දිස්ත්‍රික් නායක ගරු මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමා සභා ගර්භයේ නොමැති නිසා එතුමාගේ ශෝකයත්, ඒ වාගේම පෞද්ගලිකව මගේ ශෝකයත් නෙල්සන් මැතිතුමාගේ ආදරණීය මැතිනියට, ඒ වාගේම පළාත් සභාවේ ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා ඇතුළු පවුලේ සියලුම දරුවන් වෙත පිරිනමනවා. ඒ වාගේම එතුමා කරපු සියලු සමාජ මෙහෙවර, සියලු කාර්ය භාරය පිං බවට පත් වී නැවතත් මේ රටට සේවය කරන්න, මේ රටේ ජන නායකයකු විධියට කටයුතු කරන්න එතුමාට වාසනාව, ශක්තිය ලැබී අවසානයේ නිර්වාණය අත් පත් වේවායි මා මේ අවස්ථාවේදී ප්‍රාර්ථනා කරනවා.

[අ. භා. 3.34]

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ප්‍රථම කථා කළ සිරිපාල ගම්ලත් ඇමතිතුමා එච්.ජී.පී. නෙල්සන් මැතිතුමා ගැන හදවතින්ම කථා කළා. එතුමා ගැන හදවතින්ම කථා කරන්න පුළුවන්. එතුමා කළ සේවය, එතුමා ළඟ තිබුණු මහත්මා ගතිගුණ නිසා මා එතුමාට සලකන්නේ මහත්මා ගාන්ධි වැනි උත්තමයකුට සලකන ලෙසයි. නෙල්සල් මැතිතුමා, එතුමාගේ ජීවිත කාලයේ කරපු දේවල් ගැන කථා කරනවා නම් අඩුම වශයෙන් පැයක්වත් ඕනෑ. මාත් එක්ක 1977 දී පාර්ලිමේන්තුවට පැමිණි කෙනකු හැටියට එතුමා හඳුන්වා දෙන්න පුළුවන්. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා දිසා ඇමති ක්‍රමයක් ඇති කළ අවස්ථාවේ මා කුරුණෑගල දිස්ත්‍රික්කයේ දිසා ඇමති වෙද්දී එතුමා ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ දිසා ඇමති වුණා.

හිටපු අතිගරු ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා අපට නියම කර තිබුණා, දිසා ඇමතිවරුන් ලෙස මාසයකට වතාවක් තමන්ගේ දිස්ත්‍රික්කයේ ඒ ඒ පළාත්වල තිබෙන ප්‍රශ්න අදාළ

අමාත්‍යාංශවලට යොමු කිරීම සඳහා වේලාසනින්ම ජනාධිපති කාර්යාලයට ඉදිරිපත් කරන්නටය කියලා. ජනාධිපති කාර්යාලයට අපේ යෝජනා, ප්‍රශ්න අප ඉදිරිපත් කළාම, මාසයකට වතාවක් ජනාධිපති කාර්යාලයෙන් ඒවා අදාළ අමාත්‍යවරයාට යොමු කර පිළිතුරු ලබා දීමට එතුමා කටයුතු සලස්වා තිබුණා. එය එතුමාගේ තිබුණු ශ්‍රේෂ්ඨ ගුණාංගයක්. කැබිනට් මණ්ඩලය රැස් වන ආකාරයට ඒ අදාළ ඇමතිවරයා හා ලේකම්වරයා පැමිණ අදාළ ප්‍රශ්නවලට පිළිතුරු දෙනවා. අප එතැනදී සමහර විට ඇමතිවරුන් සමඟ, ලේකම්වරුන් සමඟ ඒ ප්‍රශ්න සම්බන්ධයෙන් වාග් ප්‍රහාරයන් වුණු අවස්ථා තිබෙනවා. එවැනි අවස්ථාවලදී ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ දිසා ඇමතිතුමා ලෙස එච්.ජී.පී. නෙල්සන් මැතිතුමාව මා දුටුවේ ඉතාමත්ම අවංකවත්වයෙන් යුතු, වචන දෙකක් හිතේ තබා ගෙන ක්‍රියා කරන්නේ නැති, මහා උත්තමයෙක් ලෙසයි. සමහර විට ත්‍රිකුණාමලයේ පදිංචිව සිටි දෙමළ ජනතාව වන්නට පුළුවන්; සිංහල ජනතාව වන්නට පුළුවන්; මුස්ලිම් ජනතාව වන්නට පුළුවන්. ඒ අය වෙනුවෙනුත්, සමහර විට පොළොන්නරු දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙනුත් එතුමා මහා සට්ටනවාදී මතවල සිටිමින් සමහර විට ආවේගශීලීව අවංකව කථා කළා. ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා එතුමා අමතන බොහොම ආදර වචනයක් තිබුණා. ඒ ආදර වචනය තමයි "Lord Nelson". එවැනි හැම වෙලාවකම ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා එතුමාට "Lord Nelson" කියලා කථා කරලා හිනා වෙලා එතුමා සමඟ ඒ ප්‍රශ්න සාකච්ඡා කළා. නෙල්සන් මැතිතුමා වචන දෙකක් තිබුණු කෙනෙක් නොවෙයි; හැංගි හොරා දේශපාලනය කළ කෙනෙකුත් නොවෙයි. එතුමා දේශපාලනය තුළින් කළේ අවංක සමාජ සේවයක්. දේශපාලනය ආගමක් විධියට අදහා ගෙන තමයි එතුමා එම සේවය කළේ.

එතුමාගේ ජීවිතයේ දී එතුමා යාපනය දෙමළ ජනතාවත් එක්ක පුදුම සම්බන්ධතාවක් තිබුණා. දෙමළ භාෂාව කථා කිරීමේ පුදුම දක්ෂකමක් එතුමාට තිබුණා. මට කලින් කථා කළ ගරු සිරිපාල ගම්ලත් නියෝජ්‍ය අමාත්‍යතුමාත් කිව්වා වාගේ මා දුටු දෙයක් මා කියන්න කැමැතියි. Summit Flatsවල මාත් තවත් මන්ත්‍රීතුමෙකුත් එක flat එකක සිටියා. ඊට එහා පැත්තේ තමයි නෙල්සන් මැතිතුමා සිටියේ. කිංස් මැතිතුමා ඇතුළු එතුමාගේ දරුවෝ එදා මගේ ළමයිනුත් එක්ක එකට පාසැල් ගියා. එතුමා එම මැතිනියත් සමඟ -පින්බර මැතිනියක්, මේ දරුවන්ගේ අම්මා- කිරි සහ වෙනත් නොයෙකුත් දේවල් පොළොන්නරුවෙන් අරගෙන ඇවිල්ලා හැම තැනකටම බෙදා ගෙන ගියා. ඒක එතුමාගේ පුදුම ගුණාංගයක්. ඒක හැමදාමත් එතුමා කළ දෙයක්. මොනවා හරි හම්බ වුණා නම් ඒක ගෙනල්ලා ඒ නිවාසවල හැමෝටම බෙදා ගෙන ගියා. ඒ විධියට පොළොන්නරුවේ ඉඳලා එද්දි යාළු මිත්‍රයෝ හමු වුණා නම්, ඒ අයටත් බෙදුවා. කුරුණෑගල දිහාවටත් බෙදා ගෙන ගියා. පුදුම පින්වත් කෙනෙක්.

මා දන්නවා, එතුමා පොසොන් පොහොයට පොළොන්නරුවේ දන්සැල් දුන්නු ආකාරය. එතුමා වාගේ අන් අයට කන්න දීපු දානපතියෙක්, පින්බර කෙනෙක් මා දැකලා නැහැ. ඒ බව අවංකව කියන්නට අපට සිදු වෙලා තිබෙනවා. කෙනෙක් ඇවිල්ලා තමන්ගේ වේදනාවක් කිව්වා නම්, අතට අහු වුණු දේ අරගෙන ඔහුට දුන්නා. එවැනි උත්තමයෙක් මේ පාර්ලිමේන්තුවට, දේශපාලනයට නැතිකමයි අද පාඩුව. පාර්ලිමේන්තුව කියන මේ උත්තරීතර සභාවේ එතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් කියලා අපිට ආඩම්බරයෙන්, ගාම්භීරව කියන්නට පුළුවන්කම තිබුණා. අද ඒ උත්තරීතරකම පහළ බැහැලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි කනගාටු වන්නට ඕනෑ. ලංකාවේ පාර්ලිමේන්තුව කිව්වාම, අද අපි ඉන්නේ කොහේද, කරන්නේ මොකක්ද, වෙන්නේ මොකක්ද කියන එක අපේ හදවත්වලින්ම අහන්නට අපට සිදු වෙලා තිබෙනවා.

ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා බිහි කළ නෙල්සන් මැතිතුමාගේ ඒ උදාර සේවය වචනවලින් කියන්න බැහැ. එතුමා පින්බර උත්තමයෙක්. රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාගේ කාලයේදී මා වාරිමාර්ග සහ ජල කළමනාකරණ ඇමති වශයෙන් කටයුතු කරද්දී වාරිමාර්ග රාජ්‍ය ඇමති විධියටත්, වාරිමාර්ග ඇමති විධියටත් පුදුම විධියේ සම්බන්ධයකින් වැඩ කරමින්, මා සමඟ සාකච්ඡා කරමින්, පවතින බාධාවන් ගැන කථා කරමින්, අතීතයේ මගේ ඇස් ඇරීමක් කළ නෙල්සන් මැතිතුමා පුදුම කෙනෙක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. යාපනයේ සාම ගිවිසුමත් එක්ක අපේ අගමැති ලෙස රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඇති කළ -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! The Hon. Deputy Chairman of Committees will now take the Chair.

***අනතුරුව ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார்] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. ALHAJ A.H.M. AZWER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පොළොන්නරුවේ දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීමේදී එතුමා මගෙන් දැඩි ඉල්ලීමක් කළා. ඒ ඉල්ලීම කරද්දි එදා සෝමාවතියේ නායක හාමුදුරුවොත් වැඩ සිටියා. මොකක්ද ඉල්ලීම? "ඇමතිතුමනි, ඔබතුමාට බුදුබව අත් වෙනවා, සෝමාවතී චෛත්‍ය රාජයාණන් වහන්සේ ප්‍රතිසංස්කරණය කරන්න. අවුරුදු 20ක් තිස්සේ පාර කැළේ වෙලා. කරුණාකර, ඒකට මැදිහත් වෙලා සම්පූර්ණ ප්‍රතිසංස්කරණයක් කරන්න පිහිට වෙන්න." කියන ඉල්ලීම කළා. ඒ පින සම්පූර්ණයෙන්ම ඒ උත්තමයාට; ඒ පින්වතාට දෙනවා. ඒ වාගේම එතුමා මහා පුණ්‍ය කටයුතු කළා; දාන දුන්නා.

කාලය ප්‍රශ්නයක් නිසා මගේ කථාව කෙටි කරමින් අති උත්තමයෙක් ලෙස මා ගරු කරපු මගේ හිත මිත්‍ර එච්.ජී.පී. නෙල්සන් මැතිතුමාට අමා මහ නිවන් සුව අත් වේවා කියා ප්‍රාර්ථනා කරනවා. ආඩම්බර විය හැකි එවැනි පියෙකු ලද දරුවන්ටත්, එම මැතිනියටත් මේ අවස්ථාවේදී අපේ ශෝකය පුද කරනවා.

[3.43 p.m.]

**ගරු ආර්. සම්පන්දන් මහතා**
(மாண்புமிகு ஆர். சம்பந்தன்)
(The Hon. R. Sampanthan)
Mr. Deputy Chairman of Committees, it was my good fortune to have known the late Hon. Nelson, Member of Parliament for Polonnaruwa, from the time he entered Parliament in 1977. I too happened to enter Parliament at the same time. The Hon. Nelson was a very simple and a very good-natured individual. He got along well with everyone. Though he represented the Polonnaruwa Constituency in Parliament, I recall his telling me that his origin was in the deep South. He came from the deep

[ගරු ආර්. සම්පන්දන් මහතා]

South, but as a young man he settled down in Polonnaruwa. He became quite popular with the people there. He must have served the people with commitment to be able to win their affection and support and subsequently he was elected to Parliament from the Polonnaruwa Constituency. He was a Member of the ruling party at that point of time.

During his tenure in the First Parliament, he was also appointed the District Minister for Trincomalee. I happened to be a Member of Parliament for Trincomalee. I had the good fortune of interacting with him in my capacity as a Member of Parliament for Trincomalee when he was the District Minister for Trincomalee.

I must say in fairness to him that he made an effort to get along with all the people in the Trincomalee District. I think he was a person who realized the importance of maintaining goodwill amongst the people by doing what was proper, just and fair, which cannot be said of many persons in politics today. But, the Hon. Nelson who had a rural background and who rose to high positions from humble origins, realized that it was important to get along well with everybody and thereby earned the goodwill of everybody and enabled everybody to live and work together amicably.

I have known him quite well, Sir. He had always been kind in his dealings with me and I do sincerely regret that we have lost the Hon. Nelson. He was a person who had a standing of his own wherever he went.

I wish to record my deep regret at the passing away of the Hon. Nelson and I would join the other Members of the House in requesting you that our condolences be conveyed to his widow and his children.

Thank you.

[අ. භා. 3.47]

**ගරු සී.ඒ. සූරියආරච්චි මහතා (සමාජ සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)**

( மாண்புமிகு சீ.ஏ. சூரியஆரச்சி - சமூகசேவைகள் பிரதி அமைச்சர்)

(The Hon. C.A. Suriyaarachchi - Deputy Minister of Social Services)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දිවංගත ගරු එච්.ජී.පී. නෙල්සන් මැතිතුමා වෙනුවෙන් වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලබා දීම ගැන මා පළමුවෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දකුණු පළාතේ තංගල්ල ප්‍රදේශයේ උපත ලබා තරුණ කාලයේම පොළොන්නරුවට පැමිණ එතුමාගේ මාමණ්ඩිය වන රජරට මුදලාලි මහතාගේ ව්‍යාපාර කටයුතු කරමින් ගරු සිරිපාල ගම්ලත් ඇමතිතුමා ප්‍රකාශ කළ පරිදි, සමසමාජ පක්ෂය නියෝජනය කරමින් කඳුරුවෙල නගරයෙන් නිතරගයෙන් ගම් සභාවට ආපු ගරු නෙල්සන් මැතිතුමා පසුව නගර සභිකයෙක් හැටියට, නගරාධිපතිවරයෙක් හැටියට විශාල සේවාවක් කළ බව මා විශේෂයෙන් මතක් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එතුමා පළමුවෙන්ම ගම් සභාවට එන අවස්ථාවේදී මගේ පියා තමයි පළමුවැනි ගම් සභාපතිවරයා හැටියට පත් වුණේ. එතුමාත්, මගේ පියාත් බොහොම සම්බන්ධව කටයුතු කළා. එතුමා මුලින් සමසමාජ පක්ෂය නියෝජනය කළත් පසුව එක්සත් ජාතික පක්ෂයෙනුයි නගර සභිකයෙක් හැටියට, නගරාධිපතිවරයෙක් හැටියට පත් වුණේ. ඒ වාගේම දිවංගත ඩඩ්ලි සේනානායක අගමැතිතුමා එක්දහස් නවසියහැත්තෑ ගණන්වල එතුමා පොළොන්නරුව එක්සත් ජාතික පක්ෂ ප්‍රධාන සංවිධායක හැටියට පත් කරනු ලැබුවා. 1977 පාර්ලිමේන්තු මැතිවරණය අවස්ථාවේදී, -ඒ වන විට මා එතුමාගේ ගෝලයෙක් හැටියට, එතුමා මගේ ගුරුවරයෙක් හැටියට සිටියේ- අරලගංවිල නගරයේ එක්සත් ජාතික පක්ෂයේ රැස්වීමක් තිබුණා. ඒ අවස්ථාවට ගරු ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා පැමිණි අවස්ථාවේදී ගරු නෙල්සන් ඇමතිතුමා ඉල්ලීමක් කළා, පොළොන්නරු දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් මහවැලි කලාපයක් ඇති කරලා මාදුරුඔය ජලාශය හදලා පවුල් පණස්දහසක් පදිංචි කරවන්නය කියලා. ඒ යෝජනාව ඉදිරිපත් කළ සහ එම කාර්යයේ නිර්මාතෘවරයා හැටියට අපට හඳුන්වන්න පුළුවන් එකම නායකයා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ දිවංගත ගරු එච්.ජී.පී. නෙල්සන් මැතිතුමායි කියන එක මා මේ අවස්ථාවේදී විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. 1977 දී ඒ මැතිවරණය වෙලාවේදී වැඩි ඡන්ද පන්දහස් පහළොවකින් පාර්ලිමේන්තුවට පැමිණි ගරු නෙල්සන් මැතිතුමා ගරු ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා විසින් ත්‍රිකුණාමල දිසා ඇමතිවරයා හැටියට පත් කළත් පොළොන්නරු දිස්ත්‍රික්කයෙත්, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයෙත් විශාල සංවර්ධනයක් කරන්න එතුමා වැඩ කටයුතු කළා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 1957 දී ගං වතුර ගලපු අවස්ථාවේදී, එතුමාගේ ලොරි රථවලින් එතුමාගේ බේකරියේ තිබූ පාන්, බනිස් අරගෙන ගිහින්, උස් බිම්වල හිටපු ජනතාව, ගස් උඩ හිටපු ජනතාව බිමට බස්සවලා ඒ ඒ තැන්වලට ගෙන ගිහිල්ලා දවස් ගණනාවක් එතුමාගේ ධන පරිත්‍යාගයෙන් ඒ ජනතාවට සංග්‍රහ කළ බවත් මා මතක් කරන්න ඕනෑ. ඒ වන විට මා පුංචි කොල්ලෙක් වුණත් මගේ තාත්තා මට ඒවා ගැන කියලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ විතරක් නොවෙයි. 1978 පොළොන්නරුවට සුළි සුළං පැමිණි අවස්ථාවේදී රජයෙන් අවශ්‍ය කටයුතු කරන තුරු බලා ගෙන ඉන්නේ නැතිව පරාක්‍රම සමුද්‍රය බේරා ගැනීම සඳහා, පොළොන්නරු නගරය බේරා ගැනීම සඳහා එතුමා විශාල වැඩ කොටසක් කළා වාගේම සෝමාවතිය, දිඹුලාගල සංවර්ධනයේ නිර්මාතෘ හැටියට එතුමා වැඩ කටයුතු කළාය කියන එකත් මා මේ අවස්ථාවේදී විශේෂයෙන් මතක් කරන්න ඕනෑ.

නෙල්සන් ඇමතිතුමා සංවර්ධන කටයුතු කළා වාගේම පොසොන් පෙරහැර, පොසොන් දන්සල සඳහා විශාල වැඩ කොටසක් කළාය කියන එක විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. පොළොන්නරු දිස්ත්‍රික්කයේ එතුමා නොයන මළ ගෙයක් නැහැ. ඒ විතරක් නොවෙයි. එතුමා සෑම රාජ්‍ය උත්සවයකටම සහභාගි වෙලා තිබෙනවා. පොළොන්නරු දිස්ත්‍රික්කයේ ආරෝග්‍යශාලා දියුණු කිරීම ඇතුළු අනෙකුත් සියලු දේ දියුණු කරන්න නෙල්සන් මැතිතුමා විශාල ලෙස දායක වුණා කියන එක මා මේ අවස්ථාවේ විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. ඒ සංවර්ධන කටයුතු කරන අවස්ථාවලදී එතුමාට රාජ්‍ය නිලධාරින් දුන් සහයෝගය අතිවිශාලයි. කොටින්ම කියනවා නම් රාජ්‍ය නිලධාරින් මාරු වෙලා යන විට එතුමාගේ ලොරියක් තමයි ඒ බඩු ටික ගෙන යන්න නොමිලේ ලබා දුන්නේ. ඒ නිසා නෙල්සන් මැතිතුමා පොළොන්නරුවට නැති පාඩුව අද අපට දැනිලා තිබෙනවාය කියන එක මම විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ.

අවුරුදු 28ක් දේශපාලනඥයෙක් හැටියට එතුමා පාර්ලිමේන්තුවේ සිටියා. ත්‍රිකුණාමලය දිසා ඇමතිවරයා හැටියටත්, 1989 දී වාරිමාර්ග රාජ්‍ය ඇමතිවරයා හැටියටත්, 1990 දී ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා හැටියටත්, 1991 දී කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ රාජ්‍ය අමාත්‍යවරයා හැටියටත්, 2000 දී වාරිමාර්ග ඇමතිවරයා හැටියටත් එතුමා විශාල වැඩ කොටසක් කළාය කියන එක මා මේ අවස්ථාවේදී විශේෂයෙන් මතක් කරන්න ඕනෑ.

ලංකාවේ කොහේ ගියත් අප පොළොන්නරුවේ කිව්වාම නෙල්සන් ඇමතිතුමා ඉන්නවාද කියන එක තමයි අපෙන් අහන්නේ. රාජ්‍ය ආයතනවලට ගියාම, අමාත්‍යාංශවලට ගියාම, නෙල්සන් ඇමතිතුමා කොහොමද කියා අපෙන් අහනවා. 2005 ජනාධිපතිවරණයේදී අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රටේ ජනාධිපති වශයෙන් පත් කරන්න එතුමාගේ පළමු පුත්‍රරත්නය වන එච්.ජී.පී. ගාමිණී මැතිතුමා විශාල ශක්තියක් ලබා දුන්නා.

ගරු නෙල්සන් මැතිතුමාට තම දේශපාලන ගමන යන්න පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ජනතාව වාගේම එතුමාගේ මැතිනිය ඇතුළු දූ දරුවන් විශාල ශක්තියක් ලබා දුන්නාය කියන එකත් මා මේ අවස්ථාවේ විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ.

ගරු නෙල්සන් මැතිතුමා අද ජීවතුන් අතර නැති වුණත්, උතුරු මැද පළාත් සභාවේ විපක්ෂයේ ප්‍රධාන සංවිධායක -පළාත් සභා මන්ත්‍රී- එච්.ජී.පී. කිංස් මැතිතුමාත්, ඒ වාගේම එච්.ජී.පී. ගාමිණී මැතිතුමාත්, නෙල්සන් මැතිනියත්, එම පවුලේ සියලු දෙනාත් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් විශාල සේවාවක් කරනවා. විහාරස්ථානවලට උදවු කරමින් නෙල්සන් මැතිතුමා වෙනුවෙන් කරන්න පුළුවන් යමක් තිබෙනවා නම් ඒවා නොපිරිහෙළා ඒ සියලු දෙනාම ඉටු කරනවාය කියන එකත් මා මේ අවස්ථාවේදී විශේෂයෙන් මතක් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා ඉහතදී කිව්වා වාගේම මට පාර්ලිමේන්තුවට එන්න පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ජනතාව ඡන්දය දුන්නා වාගේම, දිවංගත ගරු නෙල්සන් මැතිතුමාත් විශාල ශක්තියක් ලබා දුන්නා කියන එක මා මේ අවස්ථාවේදී විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. මගේ ගුරුවරයා වෙනුවෙන් වචන ස්වල්පයක් කථා කරන්න ලැබීම ගැන ගෝලයකු හැටියට විශාල වශයෙන් ආඩම්බර වෙනවා කියලා මා කිව්වේ ඒකයි. ගරු නෙල්සන් මැතිතුමාගේ නාමය පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ජනතාව අතර කවදත් බැබළෙන නාමයක් කියන එක මා මේ අවස්ථාවේදී විශේෂයෙන්ම කියන්න ඕනෑ.

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ නායක සෞඛ්‍ය අමාත්‍ය ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත් අද මේ ශෝක ප්‍රකාශය වෙනුවෙන් පාර්ලිමේන්තුවේ කථා කරන්නයි හිටියේ. නමුත් එතුමා මේ වන විට දිවයිනෙන් බැහැරවයි ඉන්නේ. එම නිසා එතුමාගේ ශෝකයත්, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ජනතාවගේ ශෝකයත්, ඒ වාගේම මගේ පෞද්ගලික ශෝකයත් ප්‍රකාශ කරමින් අප අතරින් සදහටම වෙන් වී ගිය හිටපු ඇමති ගරු එච්.ජී.පී. නෙල්සන් මැතිතුමාට නිවන් සුව අත් වේවා කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

[අ. භා. 3.56]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පොළොන්නරුව දිස්ත්‍රික්කයට විතරක් නොව අපේ පක්ෂයටත් විශාල සේවයක් කරපු ජන නායකයකු පිළිබඳව වචන ස්වල්පයක් කථා කරන්න ලැබීම විශේෂයෙන්ම භාග්‍යයක් කොට සලකනවා; ගෞරවයක් කොට සලකනවා. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් නැති කාල වකවානුවේ, විශේෂයෙන්ම 1977ට පෙර, පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ තිබිච්ච ප්‍රශ්න ගණනාවක් පිළිබඳව අවධානය යොමු කරපු නායකයකු විධියට තමයි අප ගරු එච්.ජී.පී. නෙල්සන් මැතිතුමා හඳුන්වන්නේ. ඒ කාලයේ පොළොන්නරුව ආසනයේ හිටපු මන්ත්‍රීවරයා වුණේ ගරු ලීලාරත්න විජේසිංහ මැතිතුමායි. ඒ කාලයේ, අවුරුදු 25ක් තිස්සේ පොළොන්නරුව ආසනයේ පැවැති ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ බලය බිඳ දමලා, එක්සත් ජාතික පක්ෂය ජයග්‍රහණය කරා ගෙන ගිය නායකයා ගරු එච්.ජී.පී. නෙල්සන් මැතිතුමාය කියන එක මා මේ අවස්ථාවේදී කියන්න කැමැතියි.

ඒ කාල වකවානුව තුළ එතුමා දිගින් දිගටම කථා කරපු කාරණයක් තිබුණා. විශේෂයෙන්ම පොළොන්නරුව දිස්ත්‍රික්කය කියන්නේ සහල් විශාල ප්‍රමාණයක් නිෂ්පාදනය වන ප්‍රදේශයක්; විශාල වශයෙන් වී නිෂ්පාදනය සිද්ධ කරන ප්‍රදේශයක්. ඒ ප්‍රදේශයේ තිබෙන වී ප්‍රමාණය, සහල් ප්‍රමාණය අර ගෙන අනෙක් ප්‍රදේශවලට බෙදා දෙනවා මිස, ඒ වීවලට හෝ සහල්වලට සරිලන සාධාරණ වටිනාකමක් ඒ අහිංසක දුප්පත් ජනතාවට නොදෙනවාය කියන චෝදනාව තමයි එතුමා තුළ දිගින් දිගටම තිබුණේ. ඒ අරගලය නිසාම තමයි ඒ දිස්ත්‍රික්කයේ අවුරුදු 25ක් තිස්සේ තිබුණු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ බලය බිඳ දමලා 1977 දී පොළොන්නරුව ආසනය ජයග්‍රහණය කරලා පාර්ලිමේන්තුවට ඇවිත් දිසා ඇමතිවරයකු විධියට පත් වෙන්න එතුමාට පුළුවන් වුණේ. ඒ දිස්ත්‍රික්කය පුරා ඩී.එස්. සේනානායක මැතිතුමා ගෙන ගිය වාරි මාර්ග ව්‍යාපෘති ගණනාවක් -අලුත් ව්‍යාපාර විධියට- යථා තත්ත්වයට පත් කරලා, ඒ දිස්ත්‍රික්කය නැවත සහලින් ස්වයංපෝෂිත කළා. එපමණක් නොවෙයි. සහලින් ස්වයංපෝෂිත කළ ඒ දිස්ත්‍රික්කයේ ගොවි ජනතාවට නියම ඵල ප්‍රයෝජන ලබා දෙන්න දැවැන්ත සේවාවක් කරපු නායකයකු විධියට එතුමාව හඳුන්වන්න අපට පුළුවන්.

එතැනින් පස්සේ, විශේෂයෙන් 2001-2004 කාලයේ එතුමා ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ රජය යටතේ වාරිමාර්ග අමාත්‍යවරයා විධියට කටයුතු කළා. එතුමා රටෙහි ජල කළමනාකරණය පිළිබඳව කථා කළා. කථා කළා විතරක් නොවෙයි, එවකට වාරිමාර්ග සහ ජල කළමනාකරණ අමාත්‍යවරයාව සිටි ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මැතිතුමාත් එක්ක එකතු වෙලා රටෙහි පැවැති ජලය පිළිබඳ ප්‍රශ්නය කෙටි කලක් ඇතුළත අවසන් කරන්න නායකත්වය ගත්තා.

විශේෂයෙන්ම මම කියන්න කැමැතියි, එතුමා එක්සත් ජාතික පක්ෂයේ දේශපාලනය කළාය කියලා අධිපති මතවාදයක් දරා ගෙන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අයව හිරිහැරයට ලක් කරලා, ඔවුන්ට පහර දීලා, ඔවුන්ව මරා දමන කාලකණ්ණි දේශපාලනයක් කරපු නායකයෙක් නොවෙයි කියන එක. එතුමා අපට විශාල ආදර්ශයක්. මට ඉතිහාසය මතක් වෙනවා. විශේෂයෙන්ම, අපේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත් එක්ක ප්‍රතිපක්ෂ විධියට එහෙම නැත්නම් විපක්ෂය සහ ආණ්ඩුව විධියට යම් යම් දේශපාලන මතවාද තිබුණත්, කිසිම දවසක මරා ගෙන මැරෙන දේශපාලනයක් කරපු කෙනෙක් නොවෙයි එතුමා. අද මේ රටේ ඇති වෙලා තිබෙන තත්ත්වය යටතේ එකම පක්ෂයේ අය මරා ගන්නා යුගයක අප එච්.ජී.පී. නෙල්සන් මැතිතුමා ආදර්ශයට ගන්න ඕනෑ. පාර්ලිමේන්තුවේදී කතා කරන දේශපාලනය, පාර්ලිමේන්තුවෙන් එළියට ගියාම එතුමා අවසන් කෙරුවා. වේදිකාවේදී දේශපාලනය කතා කරලා, වේදිකාවෙන් බැහැලා ගියාට පසුව එතුමාගේ ඒ දේශපාලනය ඉවරයි. අද තිබෙන්නේ ඒක නොවෙයි. අද වේදිකාවෙන් එළියට ගියාම ඒක වෛරී දේශපාලනයකට හැරිලා වෙඩි තියා ගන්නා, මරා ගන්නා තැනකට තල්ලු වෙලා තිබෙනවා. ඒක නිසා අපට එච්.ජී. පී. නෙල්සන් මැතිතුමාව හඳුන්වන්න පුළුවන් වෙන්නේ, කොයි තරම් ප්‍රතිවිරුද්ධ මත දැරුවත් කිසි දවසක හානිකර දේශපාලනයට යොමු වුණේ නැති කෙනකු විධියටයි. ඒ නිසා අපි එතුමාට ගෞරව කරනවා.

[ගරු දයාසිරි ජයසේකර මහතා]

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ඇමතිවරු දෙදෙනෙක් අද එතුමා වෙනුවෙන් කතා කළා. මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමා ලංකාවේ නැහැ. පසු ගිය කාල වකවානුවේදී අපි දැක්කා එතුමාත් නෙල්සන් මැතිතුමා සමඟ විවිධ අවස්ථාවලට සම්බන්ධ වෙලා කටයුතු කළ බව. එකට දේශපාලනය කරපු අය විධියට, එකට පාර්ලිමේන්තුවේ හිටපු අය විධියට ඉතා වැදගත් මහත්මා ගතිගුණ තිබුණු නායකයකු විධියට, මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමාත් එතුමාට සැලකුවා. අද අපට වුවමනා වෙලා තිබෙන්නේ එච්.ජී.පී. නෙල්සන් මැතිතුමා වාගේ දේශපාලනය කරන්න පුළුවන් ශක්තිමත් නායකයන්ගෙන් හෙබි, අලුත් දේශපාලන යුගයක් නිර්මාණය කරන්නයි. එවැනි වකවානුවක එච්.ජී.පී. නෙල්සන් මැතිතුමා සම්බන්ධයෙන් කතා කරන්න ලැබීම ගැන මම විශේෂයෙන් සන්තෝෂ වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එතුමාගේ දේශපාලන ව්‍යාපාරය අඩපණ නොකර, එතුමාගේ දේශපාලන ව්‍යාපාරය ඉදිරියට ගෙන යන්න එතුමාගේ පුත්‍රයා වන කිංස් නෙල්සන් මැතිතුමා උතුරුමැද පළාත් සභාවේ විපක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා විධියට අද විශාල වැඩ කොටසක් කරනවා. ඒ විතරක් නොවෙයි පසු ගිය කාලවකවානුවේ ගාමිණී නෙල්සන් මැතිතුමාත් එච්.ජී.පී. නෙල්සන් මැතිතුමාගේ දේශපාලනය වෙනුවෙන් විශාල කැප වීමක් කළා. අද යම් යම් ක්‍රියා මාර්ග අරගෙන තිබුණත් අපත් එක්ක කටයුතු කරපු, අමාරු වෙලාවේ එක්සත් ජාතික පක්ෂයට උදව් කරපු සහෝදරයකු විධියට අප එතුමාටත් සලකනවා. ඒ වාගේම නෙල්සන් මැතිතුමාගේ දියණියන් ඉතාම වැදගත් විධියට එතුමාගේ දේශපාලන ක්‍රියාදාමය ආරක්ෂා කර ගෙන කටයුතු කරන අය බවත් මම මේ අවස්ථාවේදී මතක් කරනවා. විශේෂයෙන් එච්.ජී.පී. නෙල්සන් මැතිතුමා පොළොන්නරුව දිස්ත්‍රික්කයට විතරක් නොවෙයි මේ රටට කරපු සේවය නැවතත් ගෞරවයෙන් සිහිපත් කරමින් එතුමාට නිවන් සුවය ලැබේවායි ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම එතුමාගේ අභාවය වෙනුවෙන් අපේ පක්ෂයේ සියලු දෙනාගේ ශෝකය ඒ පවුලේ සියලු දෙනා වෙත පිරිනමමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ. භා. 4.02]

**ගරු සරණ ගුණවර්ධන මහතා (ඛනිජ තෙල් කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு சரண குணவர்தன - பெற்றோலியக் கைத்தொழில்கள் பிரதி அமைச்சர்)

(The Hon. Sarana Gunawardena - Deputy Minister of Petroleum Industries)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද අපි මේ ශෝකය, කනගාටුව ප්‍රකාශ කරන්නේ රටට, ගමට, ජනතාවට ආදරය කරපු නායකයකුගේ අභාවය වෙනුවෙන්. මම මේ ශෝක ප්‍රකාශ කතාව කරනකොට සමහර විට තමුන්නාන්සේලා හිතන්න පුළුවන් එච්.ජී.පී.නෙල්සන් මැතිතුමාගේත් මගේත් සම්බන්ධය මොකක්ද කියලා. එතුමා මට තාත්තා කෙනෙක් වාගෙයි. ජෝන් අමරතුංග මන්ත්‍රීතුමාත් මට තාත්තා කෙනෙක් වාගෙයි.

1970 දී පැවති පාර්ලිමේන්තු මහ මැතිවරණයේදී මින්නේරිය ආසනයට තරග කළේ මගේ ඥාතියෙකු වූ රත්න දේශප්‍රිය සේනානායක මැතිතුමායි. ඒ එක්කම පොළොන්නරුව, මින්නේරිය එහෙම නැත්නම් මැදිරිගිරිය මේ ආදී ප්‍රදේශවලට අපේ සම්බන්ධ වීම ක්‍රමානුකූලව ඇති වුණා. මගේ පියා 1974 වර්ෂයේදී මේ ප්‍රදේශවලට ගියා. බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුව කාලයේ තරුණ ව්‍යාපාරිකයකු වාගේම දේශපාලනයට සම්බන්ධ වෙලා ජනතාව අතර සිටින පුද්ගලයකු හැටියට එච්.ජී.පී. නෙල්සන් හිටපු ඇමතිතුමා ගැන අපට අහන්නට ලැබුණා. ඒ වෙලාවේ මට ලොකු ආශාවක් තිබුණා, එතුමාව දැක ගන්නට. ඒ වාගේම මට ඒ සම්බන්ධතාව ඇති වුණා. ගරු මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමාගේ දේශපාලන ජීවිතයට සම්බන්ධ සිරිසේන මහත්මයා -මගේ මහප්පා- නෙල්සන් මැතිතුමාත් සමඟ සුළු නගර සභාවේ -නෙල්සන් මැතිතුමා සභාපති හැටියටත් මගේ මහප්පා නාගරික මන්ත්‍රීවරයෙක් හැටියටත්- කටයුතු කරද්දී නෙල්සන් මැතිතුමා සමඟ සම්බන්ධතාවක් ගොඩ නැඟුණා. එතුමා තංගල්ල වාගේ ප්‍රදේශයක ඉපදී පොළොන්නරුව වාගේ ප්‍රදේශයකට ඇවිත් අති දුෂ්කර ගමක් නගරයක් බවට පත් කරන්නට විශාල දායකත්වයක් දුන් නායකයෙක්.

නෙල්සන් මැතිතුමා තම ආදරණීය මාමාගේ කුඩා ව්‍යාපාරයේ ව්‍යාපාරික කටයුතුවලට සම්බන්ධ වෙලා, ඒ ව්‍යාපාරය තුළ ඉඳ ගෙන -එතුමා ව්‍යාපාරික කටයුතු විතරක් කළේ නැහැ.- විදේශිකයන් සමඟත් ගනුදෙනු කර, ඒ අයගෙනුත් ඒ ව්‍යාපාරය සම්බන්ධව හොඳ දැනුමක් ලබා ගත්තා. පසුව තමාම ස්වාධීන ව්‍යාපාරයක් ගොඩ නඟා ගෙන කටයුතු කරන්නට ඕනෑය කියන අදහසින් එතුමා සුළු ව්‍යාපාරයක් පටන් ගත්තා. මා හිතන විධියට එච්.ජී.පී නෙල්සන් මැතිතුමාගේ හුරු නාමය තමයි "නෙල්සන් මුදලාලි". ඒක තමයි නියම කථාව. පසුව තමයි දේශපාලනයත් එක්ක මේ කථාව ගොනු වෙලා තිබෙන්නේ.

පොළොන්නරුව දිස්ත්‍රික්කය ගත්තොත් මොකක්ද කියන්න පුළුවන්? සමස්ත ජනතාව අතරට යන්න පුළුවන් ව්‍යාපාරයකට තමයි එතුමා කිට්ටු කළේ. ඛනිජ තෙල් කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍යතුමා හැටියට මා වග කීමකින් කියන්නට ඕනෑ, ඉදිරියේ තෙල් බෙදා හැරීමේ කටයුතු දිහා බලා එතුමා එම ව්‍යාපාරයට සම්බන්ධ වුණාය කියලා. ගමේ ගොවි ජනතාවට කෘෂි රසායනික වර්ග ලබා දෙන්නට එහෙම නැත්නම් කෘෂි කර්මාන්තයට අවශ්‍ය තෙල් බෙහෙත් පොහොර ටික බොහොම හොඳට ලබා දෙන්නට ක්‍රමානුකූලව සැලසුම්ගතව ඒ ව්‍යාපාරික ගමන ගියා. එතුමා ඒ සෑම ව්‍යාපාරයක් තුළම දැක්කේ ලාභයට වඩා මහ ජනතාව එකතු කර ගැනීමේ, ඒකරාශී කර ගැනීමේ වැඩ පිළිවෙළක්.

එතුමා හෝටලයක් පවත්වා ගෙන ගියත් යම් මිල මුදලක් ඇති කෙනෙක් ඒ හෝටලයට ඇවිත් කෑම ටිකක් ගත්තාම ඒ කෑම ටිකට දෙන මුදල ගත්තත්, සමහර වෙලාවට නැති බැරි කෙනෙක් ඇවිත් කෑම ටිකක් ගත්තොත් ඒ මුදල අතහැර දමනවා. එතුමා ඒ වාගේ දුර දක්නා නුවණින් වැඩ කළ කෙනෙක්. එම නිසා තමයි දකුණු පළාතෙන් ඇවිත් එක්සත් ජාතික පක්ෂයේ ඩඩ්ලි සේනානායක ඇමතිතුමන්ලා වැනි දේශපාලනඥයන්ගේ සිත දිනා ගෙන, ජේ.ආර්. ජයවර්ධන, රණසිංහ ප්‍රේමදාස වැනි ජනාධිපතිවරුන්ගේ ආදරයට පත් වෙලා, එක්සත් ජාතික පක්ෂයේ සංවිධායක ධුරය දක්වා ගිහින් සමස්ත දේශපාලන කරළියට ආවේ. ඒ වාගේම ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ඇමතිවරයා හැටියට පත් වෙලා, අනුරාධපුර දිස්ත්‍රික්කයට, පොළොන්නරුව දිස්ත්‍රික්කයට සීමා වී තිබුණු ගම් පළාතෙන් මුළු රටටම දොර විවෘත කරන්න පුළුවන් තත්ත්වයක් එතුමා ක්‍රමානුකූලව ඇති කළා.

එතුමා පුදුමාකාර විධියට ව්‍යාපාරික ලෝකයට සම්බන්ධ වෙලා කටයුතු කළා. එතුමාට බස් රථ තිබුණා. ඒ කාලයේ පොළොන්නරුව වාගේ දිස්ත්‍රික්කයකට ප්‍රවාහන පහසුකම් කියන්නේ අත්‍යවශ්‍ය වූ වැදගත් දෙයක්. අද වාගේ කාපට් කළ පාරවල් එදා තිබුණේ නැහැ. ඒ දවස්වල හොඳ මාර්ග පද්ධති තිබුණේ නැහැ. නමුත් ඒ ප්‍රදේශවල ජනතාවට සමහර වෙලාවට කොළඹට එන්න බස් රථයට ටිකට් එක ගන්නට බැරි නම්, නෙල්සන් මහත්මයා ළඟට ඇවිල්ලා, "ඇමතිතුමා නැත්නම් නෙල්සන් මහත්මයා, මට කොළඹට යන්න බස් ටිකට් එක ගන්න සල්ලි නැහැ" කියලා කිව්වොත් ටිකට් එක දෙනවා. නෙල්සන් ඇමතිතුමා සරමයි බැනියමයි ඇඳ ගෙන පාන්දර පහ මාර විතර වෙනකොට පාරට බැහැලා ඉන්නවා. එතුමා ඒ වාගේ බොහොම

ලෙන්ගතුකමකින්, සහෝදරත්වයෙන් වැඩ කළ නායකයෙක්. ඇත්තටම එතුමා ඉන්න ඕනෑ, එක්සත් ජාතික පක්ෂයේ නොවෙයි, අපේ පක්ෂයේ. මොකද, අප නේ ගොවි කම්කරු පක්ෂය හැදුවේ. එම නිසා අප පුළුවන් තරම් බලන්නේ එවැනි නායකයකුගේ ගුණ සමරන ගමන් රටටම හොඳ ආදර්ශයක් ලබා දෙන්නයි.

එතුමාගේ දේශපාලනය ජීවිතය අවුරුදු විසි හතක්. එතුමා 1977 වර්ෂයේදීයි පාර්ලිමේන්තුවට ආවේ. පොළොන්නරුවේ ලීලාරත්න විජේසිංහ හිටපු මන්ත්‍රීතුමා පරදවනවාය කියන්නේ බොහොම අමාරු කර්තව්‍යයක්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ලීලාරත්න විජේසිංහ හිටපු මන්ත්‍රීතුමා කුඹුරට, ගොයමට, ඇළට නැත්නම් කානුවට බැහැ ගෙන එදා ගමේ තිබුණු දේශපාලනය කළ කෙනෙක්. සරමයි, බැනියමයි නැත්නම් නැෂනල් එක ඇඳ ගෙන ගමේ දේශපාලනය කළ කෙනෙක් වන ලීලාරත්න විජේසිංහ මැතිතුමා තමයි, රත්න දේශප්‍රිය සේනානායක මැතිතුමාට පස්සේ පොළොන්නරුවේ මන්ත්‍රීවරයා වුණේ. ඒ වාගේ බොහොම අමාරු කාලයක ජනතාව අතරට ගිහින් ජනතාවත් සමඟ දුක සැප බෙදා ගෙන වැඩ කළ ජනතාවගේ අවශ්‍යතාවන් නිවැරදිවම හඳුනා ගෙන වැඩ කළ දේශපාලනඥයෙක් ලංකාවේ ඉන්නවා නම් ඒ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී එච්.ජී.පී.නෙල්සන් මැතිතුමාය කිව්වොත් එය නිවැරදියි. මොකද, මම දන්නවා ලීලාරත්න විජේසිංහ මන්ත්‍රීතුමා හොඳ සේවයක් කළ බව. ඒ වාගේ හොඳ සටන්කාමීත්වයක් දීලා තමාගේ ප්‍රතිවාදියා පවා බිමට දාන්න පුළුවන් හොඳ ආත්ම ශක්තියක් නෙල්සන් ඇමතිතුමාට තිබුණා. ඒ නිසා අපි විශ්වාස කරනවා, නෙල්සන් ඇමතිතුමා ජීවත් වුණු කාලය තුළ එතුමා බොහොම හොඳ,-

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Deputy Minister, please wind up. Time is limited.

**ගරු සරණ ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சரண குணவர்தன)
(The Hon. Sarana Gunawardena)
මට තව කාලය තිබෙනවා නේ.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
No, each speaker has been allotted five minutes.

**ගරු සරණ ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சரண குணவர்தன)
(The Hon. Sarana Gunawardena)
මම පැය භාගයක් විතර කථා කරන්නයි ලැහැස්ති වුණේ.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Please wind up. - [*Interruption.*]

**ගරු සරණ ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சரண குணவர்தன)
(The Hon. Sarana Gunawardena)
එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවේ හිටපු ඇමතිවරයකුගේ ගුණ අපි කථා කරනවාට කැමැති නැද්ද? එතුමන්ලා පොඩ්ඩක් ඉවසන්න එපායැ.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
එක් මන්ත්‍රීවරයකුට මිනිත්තු 5ක කාලයක් තමයි කථා කරන්න තිබෙන්නේ. ඒක අපේ ඇඟ පිට පටවන්න එපා. ඒක පක්ෂ නායකයන් ගත්ත තීරණයක්. එක් මන්ත්‍රීවරයකුට මිනිත්තු 5යි කථා කරන්න පුළුවන්.

**ගරු සරණ ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சரண குணவர்தன)
(The Hon. Sarana Gunawardena)
ඔබතුමන්ලා කලබල වෙන්න එපා.

අනෙක මෙන්න මෙයයි. මට මතකයි ගාමිණී දිසානායක ඇමතිතුමායි, රනිල් වික්‍රමසිංහ මහත්මයායි එක්සත් ජාතික පක්ෂයේ නායකත්වයට තරග කරද්දී නෙල්සන් මැතිතුමා කෘත්‍යාධිකාරී මණ්ඩලයේ ඉඳලා හොඳ ප්‍රතිපත්තිමය තීන්දුවක් ගත් කෙනෙක් බව. ඒ වෙලාවේ පක්ෂයට ශක්තිමත් නායකයෙක් ඕනෑය කියපු පක්ෂයට ආදරය කරපු නායකයෙක් හැටියටයි අප එතුමා ගැන කථා කරන්නේ. තමන්ගේ පක්ෂය වෙනුවෙන් ගාමිණී දිසානායක මැතිතුමාව නායකත්වයට පත් කරන්න කැප වෙලා කටයුතු කළා නම් ජීවතුන් අතර නැති වුණත් ඒ, එච්.ජී.පී. නෙල්සන් මැතිතුමාය කියන එක අප වග කීමෙන් යුතුව කියනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, බොහොම ලෙන්ගතුව, පක්ෂයට ආදරය කරන, ඒ වාගේම පක්ෂය වෙනුවෙන් කැප වුණු නායකයෙක් තමයි අපට නැති වුණේ. එතුමාගේ ආදරණීය බිරිඳ, දූ දරුවන් එතුමාගේ සමස්ත වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න අද ගමට යනවා. ඒ වාගේම අනෙකුත් ප්‍රදේශවලට යනවා. අපි දන්නවා, මේ ආණ්ඩුවත් සමඟ අද එම ප්‍රදේශය සංවර්ධනය වෙලා තිබෙන බව. මේ ආණ්ඩුවේ සෑම වැඩකටම නෙල්සන් ඇමතිතුමා ශක්තිය දුන්නා; සම්බන්ධ වුණා.

අරලගන්විල, පිඹුරත්තෑව, දෙහිඅත්තකණ්ඩිය, දියසෙන්පුර, මැදිරිගිරිය, යාය 7 ආදී දුෂ්කර ප්‍රදේශවල මේ රජයෙන් යම් සංවර්ධනයක් කරන කොට හදවතින්ම සතුටු වුණු කෙනෙක් තමයි නෙල්සන් මැතිතුමා. එපමණක් නොවෙයි, 2005 ජනාධිපතිවරණයේදී මහින්ද රාජපක්ෂ මැතිතුමා ජනාධිපති ධුරයට පත්වීම සම්බන්ධව පෞද්ගලිකවම හදවතින් සතුටු වුණු කෙනෙක් තමයි නෙල්සන් මැතිතුමා. එතුමා රටට සාමය පතා ගෙන ආපු නායකයෙක්. මට කාල වේලාව නොමැතිකම නිසා එච්.ජී.පී. නෙල්සන් මැතිතුමාගේ අභාවය පිළිබඳව එතුමාගේ ආදරණීය බිරිඳටත්, දූ දරුවන් සියලු දෙනාටත් ආණ්ඩු පක්ෂයේ සහ විරුද්ධ පාර්ශ්වයේ සියලු දෙනාගේත් පෞද්ගලිකව මාගේත් ශෝකය පළ කරමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
Hon. Deputy Chairman of Committees, there is one correction that I would like to make. ලීලාරත්න විජේසිංහ මැතිතුමා 1965 සිට 1977 වන තෙක් මන්ත්‍රීවරයෙක් හැටියටයි සිටියේ. එතුමා, සේනානායක මැතිතුමාගෙන් පසුව ආවා නොවෙයි. සේනානායක මැතිතුමා නියෝජනය කළේ මින්නේරිය ආසනයයි. මෙතුමා 1965 ඉඳලා 1977 දක්වා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කළා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Okay. The Hon. Sarana Gunawardena agrees with the correction. The next speaker is the Hon. Dilip Wedaarachchi.

[අ. භා. 4.12]

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එච්.ජී.පී. නෙල්සන් මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝකය ප්‍රකාශ කරන මේ අවස්ථාවේදී මාත් එතුමා ගැන සඳහන් කරන්නට ඕනෑ. හම්බන්තොට දිස්ත්‍රික්කයේ තංගල්ල නගරයේ ඉදිපොකුණගොඩ කොට්ඨාසයේ පදිංචි හේවා ගජමන් පත්තිනිගේ ජේම්ස් අප්පු සහ ගජමන් හේවාගමගේ නෝනාහාමි යන දෙමව්පියන්ට දාව ඉපැදුණු දරුවන් පස් දෙනාගෙන් තුන්වැනියා ලෙස හේවා ගජමන් පත්තිනිගේ නෙල්සන් මැතිතුමා උපත ලැබුවා. ඒ වාගේම එතුමා තංගල්ල මෙතෝදිස්ත විද්‍යාලයේ අධ්‍යාපනය ලබලා අවුරුදු 18 සම්පූර්ණ වීමෙන් පසුව රජ රට පිහිටි එතුමාගේ මාමාගේ ව්‍යාපාරයට අත හිත දීලා, තරුණ වියේදී එතුමාගේම ව්‍යාපාරයක් ආරම්භ කරලා ව්‍යාපාරිකයෙක් හැටියට නම් දැරුවා.

මම අද එතුමා ගැන කථා කරන්නේ, එතුමා තංගල්ල නගරයේ, මගේ පියා වන සැම්පාල වෙදආරච්චි මහතා සමඟ කුඩා අවධියේ ඉඳලා එකම පන්තියේ සිටි මගේ පියාගේ මිත්‍රයෙක් හැටියටයි. එතුමා ගැන සියලුම කරුණු පවසන්නය කියලා මගේ පියා මට කිව්වා. නමුත් කාල වේලාව නැති නිසා වැඩි කරුණු කාරණා කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ.

එච්.ජී.පී. නෙල්සන් මැතිතුමා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙක් හැටියට, ඇමතිවරයකු හැටියට කටයුතු කළත්, හම්බන්තොට දිස්ත්‍රික්කයේ තංගල්ල ප්‍රදේශයේ ජනතාවට එම රාජ්‍ය බලය තුළිනුත්, පෞද්ගලික බලය තුළිනුත් විශාල සේවාවක් ඉෂ්ට කළා.

අපට මතකයි, අපි දන්නවා ඒ කාලයේ තංගල්ල ප්‍රදේශයේ ජනතාව නඩ පිටින් වන්දනාවේ ගියාම ඉන්න තැන, කන්න බොන්න, මිල මුදල් පවා දීලා එතුමා සංග්‍රහ කර තිබෙන බව. එතුමා 1970 පොළොන්නරුව නගර සභාවේ නගරාධිපතිවරයා වශයෙන් පත් වන විට එතුමාගේ කුඩා කල යහළුවා වන මගේ පියාත් තංගල්ල නගර සභාවේ නගරාධිපතිවරයා හැටියට පත් වුණා. මට මතකයි මම කුඩා කාලයේ එතුමා ජයග්‍රහණය කරලා, නගරාධිපති වශයෙන් පත් වෙලා තංගල්ලේ විසූ දෙමවුපියන් බලන්නට එන විට මගේ පියාට සුබ පතන්නට මගේ නිවසට ඇවිල්ලා කථා කළා. එතුමා මටත් පියෙක් වාගේ. මම තංගල්ල නගර සභාවේ උප නගරාධිපති හැටියට පත් වෙලා සිටින කාලයේ ගරු හැරී අබේධීර මන්ත්‍රීතුමා සමඟ පළමුවෙනි වතාවට පාර්ලිමේන්තුවට ආවේ ධීවර කටයුතු වගයක් සම්බන්ධ කාරණාවකටයි. එහිදී අපේ ගරු ජෝශප් මයිකල් පෙරේරා ඇමතිතුමා මාව කෑම කන්න එක්ක යන විට, ජෝශප් මයිකල් පෙරේරා මැතිතුමාට නෙල්සන් මැතිතුමා කිව්වා, "මගේ ගමේ කොල්ලාට කන්න දෙන්න ඕනෑ මම" කියලා. එහෙම කියලා මගේ අතින් ඇද ගෙන කන්න දෙන්න එක්කගෙන ගියා. ඒ වාගේම එතුමා, දේශපාලන ක්ෂේත්‍රයට, අපේ නගර සභා මැතිවරණවලට, හම්බන්තොට දිස්ත්‍රික්කයේ මැතිවරණවලට සහ තංගල්ල නගර සභා මැතිවරණවලට සෑම විටම පැමිණිලා අපට කරන්න පුළුවන් සේවාවන්, උදවු උපකාර කළා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එතුමා දෙමවුපියන් බලන්න, හම්බන්තොට දිස්ත්‍රික්කයේ සිටින ඥාතීන් බලන්න එන සෑම විටකදීම කැබ් එකක් පුරවා ගෙන ධීවරයන්ට අවශ්‍ය ඇඳුම් පැළැඳුම් ගෙනැල්ලා තංගල්ල මා දැල් තොටුපළට ඇවිත් ඒවා ලබා දීලා ධීවරයන් සතුටු කරවලා, ධීවරයන්ගෙන් මාළු අර ගෙන පොළොන්නරු දිස්ත්‍රික්කයට අරගෙන යනවා. ඒ වාගේ උතුම්, ශ්‍රේෂ්ඨ නායකයෙක්, ශ්‍රේෂ්ඨ පියෙක් හැටියට නෙල්සන් මැතිතුමාව හඳුන්වන්නට පුළුවන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තංගල්ල නගරයේ ජනතාවගේත්, තංගල්ල නගරයේ පමණක් නොවෙයි හම්බන්තොට දිස්ත්‍රික්කයේ එතුමාගේ ඥාතීන්ගේත්, අපේ ඥාතීන්ගේත්, මගේ පියා වන සැම්පාල වෙදආරච්චි මැතිතුමා ඇතුළු මගේ පවුලේ අයගේත් ශෝකය මේ අවස්ථාවේදී ප්‍රකාශ කරමින් එතුමාට "අමා මහ නිවන් සුව අත් වේවා"යි ප්‍රාර්ථනය කරනවා. ඒ වාගේම එතුමාගේ ගමන, ජනතා සේවය ඉදිරියට ගෙන යෑමට ඉදිරිපත් වී සිටින අපේ කිංස් නෙල්සන් මැතිතුමාට තම පියාගේ නාමය ඉදිරියට ගෙන යෑමට ශක්තිය, ධෛර්ය ලැබේවා කියා ප්‍රාර්ථනය කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ. භා. 4.16]

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 1930 ඔක්තෝබර් මස පළමු වැනි දින රුහුණේ උපත ලබා තංගල්ල ක්‍රිස්තුරාජ විද්‍යාලෙන් මූලික අධ්‍යාපනය ලැබ රජ රට, පොළොන්නරුවට පැමිණ අඩ සිය වසකට අධික කාලයක් පොළොන්නරුව දුගී දුප්පත් ගොවි ජනතාවගේ විමුක්තිය වෙනුවෙන් අප්‍රමාණ කැප වීමෙන් කටයුතු කළ හේවා ගජමන් පත්තිනිගේ නෙල්සන් නොහොත් එච්.ජී.පී. නෙල්සන් මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ශෝකය පළ කිරීමට ලැබූ අවස්ථාව මා ලද ගෞරවයක් ලෙස සලකනවා.

1956 දී එක්සත් ජාතික පක්ෂයට එක් වී පසුව පොළොන්නරුව නගරාධිපති වශයෙන් පත්ව කටයුතු කර අවසන් මොහොත දක්වා ගෞරවණීය එක්සත් ජාතික පාක්ෂිකයකු ලෙස ක්‍රියා කළ එතුමා එක්සත් ජාතික පක්ෂයේ ආදර්ශවත් නායකයෙක්. දීර්ඝ කාලයක් එක්සත් ජාතික පක්ෂයට ජය ගත නොහැකිව තිබූ පොළොන්නරුව මැතිවරණ කොට්ඨාසය, එවකට ප්‍රකට දේශපාලන නායකයකු වූ ලීලානන්ද විජේසිංහ මහතා පරදවා ජය ගෙන 1977 වර්ෂයේදී නෙල්සන් මැතිතුමා මෙම උත්තරීතර සභාවට ප්‍රථම වරට තේරී පත් වුණා. එතැන් සිට 2004 දක්වා වසර 26ක ඉතා දීර්ඝ කාලයක් රජ රට ජනතාව නියෝජනය කරමින් මෙම උත්තරීතර සභාවේ ගෞරවය ගෞරවණීය ලෙස සුරක්ෂිත කරමින් උත්තරීතර පාර්ලිමේන්තුව නියෝජනය කිරීමට රජ රට ජනතා ආශිර්වාදයෙන් වරම් ලැබුවා.

ත්‍රිකුණාමල දිස්ත්‍රික් අමාත්‍යවරයා ලෙසද, ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා ලෙසද, වාරිමාර්ග රාජ්‍ය අමාත්‍යවරයා ලෙසද එතුමන් සිය දේශපාලන ගමන් මඟ දී පිදුම් ලැබුවා. තමා වෙත පිරිනැමුණු තනතුරු තම ගෞරවය වෙනුවෙන් නොව, රජ රට පොළොන්නරුවේ අසරණ, අහිංසක, දුගී දුප්පත් ගොවි ජනතාවගේ දුක්, කඳුළු, වේදනා නිවීමට, වියළි රජ රට ස්වයං පෝෂිත කිරීමට, දුෂ්කර පොළොන්නරුවේ ගොවි ජනතාවගේ දූ පුතුන් නූතන සමාජයේ ඉහළට ඔසවා තැබීමට, අධ්‍යාපන පහසුකම් නැංවීමට, නිලධාරිවාදයෙන් පීඩාවට පත් ගොවියාට සහන සැලසීමට සහ රජ රට ගොවියා සෞඛ්‍ය සම්පන්න කිරීමට පක්ෂ, පාට භේදයෙන් තොරව තමා වෙත පැවරුණු මැති ඇමතිකම් ජනතාවගේ යහපත සඳහා ඇප කැප කළ පරමාදර්ශී දේශපාලන නායකයෙකු ලෙස එච්.ජී.පී. නෙල්සන් මැතිතුමන් පිළිබඳ ඉතිහාසය රන් අකුරෙන් සටහන් වනවා ඇති.

මහාමාන්‍ය ඩී.එස්. සේනානායක මැතිතුමන් රජ රට ආරම්භ කළ ගොවි සංවර්ධන ක්‍රියාදාමයන් තුළින් බිහි වූ දේශපාලන නායකයකු වන එතුමා සැබෑ මානව හිතවාදියෙක්. මහාමාන්‍ය ඩී.එස්. සේනානායක මැතිතුමන්, සී.පී. ද සිල්වා මැතිතුමන් වැනි රජ රටට මහා මෙහෙවරක් කළ ජන නායකයන් අනුව යමින් රජ

රට ජනතා හදවත් ආලෝකවත් කිරීම එතුමාගේ දේශපාලනයේ අරමුණ විය. එතුමා ප්‍රතිවිරුද්ධ දේශපාලන මත දරන්නන්ගේද ගෞරවය දිනා ගත්තේ මහා හිතවාදී අරගල විනා වෛර දේශපාලනය තමාගේ දේශපාලන ගමන් මඟේ නොවූ හෙයිනි. කුසුමා නෙල්සන් මැතිනිය හා විවාහයට පත් එතුමා දූ පුතුන් හත් දෙනකුගේ පියාණන් ලෙස ආදර්ශවත් යුග ජීවිතයක් ගත කළා.

නෙල්සන් මැතිතුමාගේ පුත් කිංස් නෙල්සන් මැතිතුමා උතුරු මැද පළාත් සභාවේ වත්මන් මන්ත්‍රීවරයකු ලෙස, පියා ගෙන ගිය වැඩ පිළිවෙළ අඛණ්ඩව ගෙන යෑමට ඉදිරිපත් වී සිටීම සතුටට කරුණක්. මාගේ පියාණන් වන හිටපු අමාත්‍ය ෆෙස්ටස් පෙරේරා මැතිතුමාගේ දීර්ඝ කාලීන දේශපාලන හා පෞද්ගලික මිත්‍රයකු වූ නෙල්සන් මැතිතුමාගේ සහ මගේ පියාණන්ගේ මිත්‍රත්වය මෙහිදී සිහිපත් කරනවා. රජ රට ජනතාවගේ කඳුළු, සුසුම්, දුක, වේදනාව මෙන්ම සිනහව, සතුට හා සොම්නසද එක සේ වටහා ගත් රජ රට ජනතාවගේ, විශේෂයෙන්ම පොළොන්නරුව දිස්ත්‍රික් ජනතාවගේ ජීවිතය වඩාත් යහපත් කිරීම සඳහා සිය ජීවිතය කැප කළ අභාවප්‍රාප්ත එච්.ජී.පී. නෙල්සන් මැතිතුමා වෙත එතුමා ප්‍රාර්ථනා කළ පරිදිම උතුම් වූ නිවන් සැප ලැබේවායි ප්‍රාර්ථනා කරන අතර, අපේ පවුලේ සියලු දෙනාගේම සංවේගය කුසුමා නෙල්සන් මැතිනිය ඇතුළු දූ පුතුන් හා පවුලේ සැම වෙත ප්‍රකාශ කරමින් මාගේ කථාව අවසන් කරනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The Hon. Sajith Premadasa please.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
Sir, Hon. Dunesh Gankanda wishes to speak before the Hon. Sajith Premadasa.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Okay. Hon. Dunesh Gankanda, you have only three minutes.

[අ. භා. 4.21]

**ගරු දුනේෂ් ගන්කන්ද මහතා**
(மாண்புமிகு துனேஷ் கங்கந்த)
(The Hon. Dunesh Gankanda)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු හේවා ගජමන් පත්තිනිගේ නෙල්සන් -ගරු එච්.ජී.පී. නෙල්සන්- මැතිතුමා 1930 ඔක්තෝබර් මස 01 වන දා උපත ලැබ, දකුණේ සිට පොළොන්නරුවට ඇවිත්, 1956 දී එක්සත් ජාතික පක්ෂයේ ප්‍රථම සාමාජිකත්වය ලබා ගත්තාය කියන එක ගැන දැනුවත් වුණා. එතැන් පටන් එතුමාගේ දේශපාලන ජීවිතය පොළොන්නරුව සුළු නගර සභාවේ සභාපතිවරයා හැටියට පටන් ගෙන, 1977 දී මුල් වරට පොළොන්නරුව නියෝජනය කරමින් අතිගරු ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ ආණ්ඩුව යටතේ පාර්ලිමේන්තුවට පත් වුණා. ඊට පසුව 1978 දී එතුමා ත්‍රිකුණාමලය දිසා ඇමතිවරයා හැටියට කටයුතු කළා. එතුමා 1989 දී වාරිමාර්ග රාජ්‍ය අමාත්‍යවරයා හැටියටත්, 1990 දී ග්‍රාමීය කර්මාන්ත සංවර්ධනය සඳහා රාජ්‍ය අමාත්‍යවරයා හැටියටත්, 1991 දී කෘෂිකර්ම, සංවර්ධන හා පර්යේෂණ සඳහා රාජ්‍ය ඇමතිවරයා හැටියටත්, 2001 දී වාරිමාර්ග අමාත්‍යවරයා හැටියටත් කටයුතු කළා. එතුමා එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් දීර්ඝ කාලයක් මේ රටට, පොළොන්නරුව ප්‍රදේශයට හා සමාජයට සේවයක් කරපු ජන නායකයෙක්.

එච්.ජී.පී. නෙල්සන් මැතිතුමා පිළිබඳව වචන කිහිපයක් අද මේ ගරු සභාවේ ඔබ අතරට ගෙනෙන්න ලැබීම ගෞරවයක් කොට මා සලකනවා. විශේෂයෙන්ම මාත් ඒ පවුලට ඉතා සමීප කෙනෙක්. මා කුඩා දරුවකු වශයෙන් පාසල් යන වයසේ සිට එතුමා පියකු හැටියට දැන හඳුනා ගන්න ලැබීම ගෞරවයක් හැටියට සලකනවා.

විශේෂයෙන්ම එතුමාගේ පුත් කිංස් නෙල්සන් සහෝදරයා අද උතුරු මැද පළාත් සභාවේ මන්ත්‍රීවරයකු වශයෙන් කටයුතු කරනවා. මම රාජකීය විද්‍යාලයට යන කාලයේ සිටම දැන අඳුනන කිංස් නෙල්සන් මැතිතුමා මගේ තරුණ යාළුවෙක්. එතුමා අද මින්නේරිය ආසන සංවිධායකවරයා හැටියට කටයුතු කරන්නටත් මුල් වුණේ එතුමාගේ පියාගෙන් ලැබුණු ආභාසය නිසයි. ඒ වාගේම එච්.ජී.පී. නෙල්සන් මැතිතුමා මට පියකු වාගේ කිව්වොත් එය නිවැරදියි. මගේ මිත්‍රයාගේ පියා, අපටත් පියකු හැටියට හිටපු දීර්ඝ කාලයක මතක සටහන් මට මේ අවස්ථාවේ මතක් වනවා.

එතුමා අවුරුදු පණහක පමණ දීර්ඝ කාලයක් තුළ ගොවි ජනපද පිහිටුවීම, ගොවි පවුල් ශක්තිමත් කිරීම ආදී වශයෙන් සමාජයට කරපු මෙහෙවර සම්බන්ධයෙන් විස්තර අද මන්ත්‍රීවරුන් ගණනාවක් මේ අවස්ථාවේ අපට ඉදිරිපත් කළා. එතුමා ආගමික කටයුතු සම්බන්ධයෙන්ද ඇඩි උනන්දුවකින් කටයුතු කළා. එතුමා ගෙන ගිය සමාජ සේවාව ඉදිරියට ගෙන යෑමට එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් බිහි වෙලා සිටින ඒ තරුණ පුරුක අප ඉතාමත් අගය කරනවා. නෙල්සන් මැතිමාගේ අභාවය සම්බන්ධයෙන් ඒ පියතුමා බිහි කරපු දූ දරුවන් සියලු දෙනාට මගේ හෘදයාංගම ශෝකය ප්‍රකාශ කරමින් එතුමාට නිවන් සුව අත්වේවායි කියන ප්‍රාර්ථනය ඇතුව මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ. භා. 4.25]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හිටපු අමාත්‍ය එච්.ජී.පී. නෙල්සන් මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ශෝකය පළ කරන මේ අවස්ථාවට සහභාගි වන්නට ලැබීම මාගේ භාග්‍යයක් කොට සලකනවා.

විශේෂයෙන්ම නෙල්සන් ඇමතිතුමා කෘතහස්ත දේශපාලනඥයකු විධියට දේශපාලනය වනාහි කුමක්ද යන්න ගැන අර්ථාන්විතව පැහැදිලි අවබෝධයකින් ඒ ගමන ක්‍රියාත්මක කළ පුද්ගලයෙක්. එතුමා විශ්වාස කරපු දේශපාලනය වුයේ, තුන්සිය හැටපස් දවසේ විසිහතර පැයම පොදු ජනතාවට නිරන්තරයෙන්ම සේවය කරමින් දුකෙන් පෙළෙන ජනයා සැපතට පත් කරන වාතාවරණයක් බිහි කිරීමයි. විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂ පාලන කාල වකවානුවන් තුළදී පොළොන්නරුව දිස්ත්‍රික්කය පුරාවට දියත් වුණු දැවැන්ත සංවර්ධන ව්‍යාපෘතිවල පෙර ගමන්කරුවකු හැටියට එතුමා කටයුතු කළා. පොල් අතු පැලේ ජීවත් වන ජනතාවට උළු වහලක් ලබා දීලා, ඒ අයට තිරසාර සෙවණක් ලබා දීමේ වැඩසටහනට එතුමා නායකත්වය ලබා දුන්නා. දැවැන්ත වාරි යෝජනා ක්‍රම දියත් කෙරුණු අවස්ථාවන්වලදී ගොවි ජනතාවගේ අයිතිවාසිකම් වෙනුවෙන් නිරන්තර සටනක යෙදුණු එතුමා හැම විටම ගොවි පරපුරේ අයිතීන් සුරක්ෂා කරන්නට ඇප කැප වුණා. එතුමාගේ ගමන් මාර්ගය තුළදී එතුමා හැම විටම උත්සාහ කළේ ජනතාවට සේවාවක් ඉෂ්ට කරන්නයි.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

නිරහංකාර පිවිතුරු දේශපාලන රටාවක් හරහා පොළොන්නරු පුරවරයට අනභිභවනීය සේවාවක් ඉටු කරන්නට එතුමාට හැකියාව ලැබුණා. එච්.ජී.පී.නෙල්සන් චරිතය දේශපාලන ක්ෂේත්‍රයේ අප සියලු දෙනාටම හොඳ ආදර්ශයක්. ජනතාවට සමීප වෙලා, ජනතාවගේ දුක හඳුනා ගෙන, ජන විඥානය අවබෝධ කර ගෙන, පොළොන්නරු දිස්ත්‍රික්කයේ ජන සමාජය තුළ ඒ ඒ තලයන්වල ජීවත් වුණු ජනතාවගේ ඕනෑ එපාකම් වෙනුවෙන් අතිවිශාල වූ දැවැන්ත ජනතා සේවාවක් ඉටු කරමින් එතුමාගේ දේශපාලන ගමන එතුමා ක්‍රියාත්මක කළා.

ඒ නිසා එතුමාගේ නම මේ අවස්ථාවේ ඉතාමත්ම ගෞරවයෙන් මම සිහිපත් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම පොළොන්නරු පුරවරයට අභීත සෙන්පතිවරයකු හැටියට ශක්තිමත් ජනතා සේවාවක් දියත් කරන්නට කටයුතු කරපු එතුමාව ගෞරවයෙන් සිහිපත් කරමින්, එතුමාගේ අඩි පාරේ යන කිංස් නෙල්සන් මැතිතුමාත් පොළොන්නරු දිස්ත්‍රික්කයට පියා ඉෂ්ට කරපු ඒ අමිල ජන මෙහෙවර ඉදිරියට ගෙන යන්නට උත්සාහ කිරීම සම්බන්ධව එතුමාටත් මගේ ශුභාශිංසනය මේ අවස්ථාවේදී පුද කරමින් එච්.ජී.පී. නෙල්සන් මැතිතුමාට නිවන් සුව පතමින් මම මගේ කථාව අවසන් කරනවා.

[අ. භා. 4.30]

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා එච්.ජී.පී. නෙල්සන් මැතිතුමා සමඟ බොහොම කිට්ටුවෙන් ආශ්‍රය කළා. මා එතුමාව දැන ගෙන හිටියේ පොළොන්නරුව, අනුරාධපුර යන රජ රට ප්‍රදේශයේ එක්සත් ජාතික පක්ෂයේ පතාක යෝධයෙක් හැටියටයි. එතුමා නියම නායකත්වයක් අපේ පක්ෂය වෙනුවෙන් ඒ දිස්ත්‍රික්ක දෙකටම ලබා දුන්නාය කිව්වොත් නිවැරදියි. එතුමා ගරු ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගේ කාලයේ ඇමතිවරයකු හැටියටත්, ගරු ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ කාලයේ ඇමතිවරයකු හැටියටත්, ගරු ඩී.බී. විජේතුංග ජනාධිපතිතුමාගේ කාලයේ ඇමතිවරයකු හැටියටත්, ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ නායකත්වය යටතේ ඇමතිවරයකු හැටියටත් කටයුතු කරමින්, අපේ පක්ෂයේ ගරුත්වය ආරක්ෂා කර ගනිමින් රටට ඉමහත් සේවයක් කළා. ගොවි ජනතාවගේ ගැලවුම්කාරයෙක් හැටියට තමයි ඒ පළාත්වල ජනතාව එතුමාව සැලකුවේ.

අනෙක් කාරණය, පක්ෂයේ කොයි තරම් ප්‍රශ්න තිබුණත් එතුමා පක්ෂයේ විනය ආරක්ෂා කරපු ඇමතිවරයෙක්. ආදර්ශවත් විධියට ඒ වකවානුවේදී එතුමා කටයුතු කළා. මා දන්නවා යම් කෙනෙක් ඒ දිස්ත්‍රික්කයට පැමිණියාද එතුමා ඒ පුද්ගලයාට ආහාර පාන සපයා සියලු ආගන්තුක සත්කාර සැලසූ බව. එතුමාගේ විශේෂ ලක්ෂණයක් තමයි ඒක. උදේ හෝ දවල් හෝ රාත්‍රියේදී හෝ කවුරු හරි ආවොත් ඔහුට කන්න දීලා යවන එක තමයි එතුමාගේ කැමැත්ත. ඉතින් මම මීට වඩා කථා කරන්න යන්නේ නැහැ. මොකද, අද එතුමා ගැන හැමෝම වග විස්තර කළා. එතුමාගේ ලක්ෂණ ගැන කථා කළා. එතුමාගෙන් පක්ෂයට වුණු සේවය, රටට වුණු සේවය ගැන කථා කළා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ අතරම අපි දකිනවා එතුමාගේ පුත්‍ර රත්නය තම පියා ආරම්භ කරපු වැඩ කොටස ඉදිරියට ගෙන යන්න පියාගේ අඩි පාරේ ගමන් කරන ආකාරය. අපි ඒ ගැන ආඩම්බර වෙනවා. අපි ප්‍රාර්ථනා කරනවා පියා දැරුවා වූ තනතුරු දරන්න එතුමාටත් වාසනාව ලැබේවා කියා. අවසාන වශයෙන් එච්.ජී.පී.නෙල්සන් මැතිතුමාගේ අභාවය වෙනුවෙන් අපේ නෙල්සන් මැතිනියටත්, ඒ දූ දරුවන් සියලු දෙනාටමත් අපේ පක්ෂයේ කනගාටුව පිළිගන්වමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

I wish to associate myself with the sentiments expressed by both sides of the House on the death of the Hon. H.G.P. Nelson, ex-Member of Parliament. I shall direct the Secretary-General of Parliament to make a Minute of the Proceedings of today's Meeting and send a copy thereof to the members of the bereaved family.

Now, we will take up the Vote of Condolence on the late Hon. Mervyn J. Cooray, ex-Member of Parliament.

## ශෝක ප්‍රකාශය : ගරු මර්වින් ජේ. කුරේ මහතා
## அனுதாபத் தீர்மானம் : மாண்புமிகு மேர்வின் ஜே. குறே
## VOTE OF CONDOLENCE: HON. MERVYN J. COORAY

[අ. භා. 4.33]

**ගරු රෙජිනෝල්ඩ් කුරේ මහතා (සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு றெஜினோல்ட் குரே - சிறு ஏற்றுமதிப் பயிர்கள் ஊக்குவிப்பு அமைச்சர்)
(The Hon. Reginold Cooray -MINISTER OF MINOR EXPORT CROP PROMOTION))

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පානදුර මැතිවරණ කොට්ඨාසයේ ජනතාව නියෝජනය කරමින්ද තවත් වරෙක කළුතර දිස්ත්‍රික් ජනතාව නියෝජනය කරමින්ද පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හා අමාත්‍යවරයකු වශයෙන් මෙම උත්තරීතර සභාව ශෝභාවත් කරන ලද ප්‍රවීණ දේශපාලනඥයකු වූ මර්වින් ජේ. කුරේ මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝකය පළ කිරීමේ යෝජනාව මම මේ අවස්ථාවේදී ගරු සභාවට ඉදිරිපත් කරන්නෙමි.

මාන්න මරක්කලගේ ජුවන් කුරේ මහතාගේත්, මහබදුගේ ඇග්නස් පෙරේරා මහත්මියගේත් දයාබර පුත්‍ර රත්නයක් ලෙස 1938 ජූලි 16 වැනි දින කොළඹදී මෙලොව එළිය දුටු මාන්න මරක්කලගේ මර්වින් ජෝශප් කුරේ මහතා වාද්දුව ශාන්ත මරියා විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලැබීය. ඉන් අනතුරුව පානදුර ශාන්ත අන්තෝනි විදුහල, මොරටුව ශාන්ත සෙබස්තියන් විදුහල හා කළුතර සිරි කුරුස විදුහලට පිළිවෙළින් ඇතුළත්ව ද්විතීයික හා උසස් අධ්‍යාපනය ද ලබා ගත්තේය.

පාසල් අධ්‍යාපනයෙන් පසු සිය ජීවන වෘත්තිය වශයෙන් වැවිලි කර්මාන්තය කෙරෙහි යොමු වුණු එතුමා සිංහපුලි ආරච්චිගේ චාලට් මෙනෙවිය සමඟින් යුග දිවි ගමන් ඇරඹුවේය. එම විවාහය තුළින් මේරියන් කුමාරි ලංකා කුරේ, ජගත් කුරේ, සුජිත් කුරේ, අජිත් කුරේ සහ විජිත් කුරේ යනුවෙන් දූ පුතුන් පස් දෙනෙකු මෙලොවට දායාද කළේය. මේ දරු පිරිස අතුරින් සුජිත් කුරේ මහතා පියාගේ අඩි පාරේ ගමන් කරමින් බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරයකු වශයෙන් ප්‍රදේශය වෙනුවෙන් සුවිශේෂී මෙහෙවරක නිරත විය. කුරේ මහතාගේ අභාවය සිදු වී සති දෙකක් වැනි කාලයක් තුළදී චාලට් මහත්මිය ඉතා කනගාටුදායක අයුරින් මෙලොව හැර ගිය අතර, මේරියන් කුමාරි ලංකා කුරේ දියණියද කලකට පෙර මොලොවින් සමු ගත්තාය.

එක්සත් ජාතික පක්ෂය හා සම්බන්ධ වෙමින් ක්‍රියාකාරි දේශපාලනයේ නියැළුණු කුරේ මහතා හැටේ දශකයේදී වාද්දුව බටහිර නියෝජිතයා ලෙස, වාද්දුව සුළු නගර සභාවට තේරී පත් වුණු අතර, 1972 දී එහි උප සභාපති වශයෙන්ද කටයුතු භාර ගත්තේය. ප්‍රදේශයේ අභිවෘද්ධිය වෙනුවෙන් එම කාල වකවානුව තුළ විශාල දායකත්වයක් සැපයූ එතුමා කවර පුද්ගලයකු සමඟ වුවද ඉතා කිට්ටු ඇසුරක් පවත්වමින්, පොදු ජන මෙහෙවරෙහි නියැළුණු දේශපාලනඥයකු විය. පානදුර එක්සත් ජාතික පක්ෂ බල මණ්ඩලයේ උප සභාපති තනතුර පවා හිමි කර ගත් එතුමා පක්ෂ ක්‍රියාකාරකම් හේතුවෙන් වරෙක අත් අඩංගුවට පවා පත් විය.

ධීවර වරාය නීතිගත සංස්ථාවේ ක්‍රියාකාරි අධ්‍යක්ෂවරයා වශයෙන් ද, බෘෂක්බොන්ඩ් ආයතනයේ ක්‍රියාකාරි අධ්‍යක්ෂවරයා වශයෙන් ද කාලයක් කටයුතු කළ එතුමා 1981 සිට කළුතර දිස්ත්‍රික් සංවර්ධන සභා මන්ත්‍රීවරයකු වශයෙන්ද පොදුජන මෙහෙවරෙහි නිරත විය. පානදුර මැතිවරණ කොට්ඨාසයේ සිදු වූ මන්ත්‍රී පුරප්පාඩුවක් සඳහා 1983 මාර්තු මස සිට මර්වින් ජේ. කුරේ මහතා පත් කළ අතර, එතැන් පටන් ප්‍රදේශයේ නවෝදය වෙනුවෙන් විශාල කාර්ය භාරයක් ඉටු කළේය.

1989 වසරේදී පැවති පාර්ලිමේන්තු මහ මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂය යටතේ කළුතර දිස්ත්‍රික්කයෙන් තරග වැදුණු එතුමා ජයග්‍රහණය අත් පත් කර ගනිමින් දෙවැනි වරටත් මෙම සභාවේ අසුන් ගත් අතර, එවර බලයට පත් රණසිංහ ප්‍රේමදාස රජයේ විදුලිබල හා බල ශක්ති රාජ්‍ය අමාත්‍යවරයා වශයෙන් තවත් විශාල වග කීමක් භාර ගත්තේය. එම අවස්ථාවේදී කළුතර දිස්ත්‍රික්කයේ දුෂ්කර ගම්මාන රැසකට විදුලිබල පහසුකම් ලබාදීම සඳහා දැඩි ප්‍රයත්නයක යෙදුණු එතුමා පානදුර මැතිවරණ බල ප්‍රදේශය තුළ පිහිටි පාසල් සංවර්ධනයට අවශ්‍ය භෞතික සම්පත් ලබා දීටමද පියවර ගත්තේය.

පානදුර රෝහල සංවර්ධනය කිරීම සඳහා විශාල දායකත්වයක් සැපයූ කුරේ මහතා ප්‍රදේශයේ රැකියා විරහිත තරුණ තරුණියන්ගේ රැකියා ප්‍රශ්නය විසඳාලීම සඳහා මෝදරවිල කර්මාන්ත පුරයේ විවිධ කර්මාන්ත අරඹමින් රැකියා අවස්ථා දස දහසක් පමණ නිර්මාණය කළේය. ඉඩකඩම් හා නිවාස නොමැති ජනතාව වෙනුවෙන්ද තම අවධානය යොමු කළ එතුමා උදා කළ ගම්මාන වැඩසටහන යටතේ රිව්දෙව් ගම, මහකිත් ගම, දම්පිය ගම, දියෙස් ගම, වේරගම වැනි ගම්මාන ඉදි කර ජනතා අයිතියට පැවරුවේය.

වාද්දුව ප්‍රජා මණ්ඩලයේ සභාපති ලෙසත්, පානදුර හා වාද්දුව ධීවර කාර්මිකයන්ගේ සමුපකාර සමිතියේ හා වාද්දුව බටහිර ග්‍රාම සංවර්ධන සමිතියේ සභාපති ලෙසත් උදාර සමාජ මෙහෙවරෙක නියැළුණු එතුමා ක්‍රීඩා ක්ෂේත්‍රය කෙරෙහි දැක්වූයේ දැඩි ඇල්මකි. වාද්දුව ශාන්ත මරියා ක්‍රීඩා සමාජයේ සභාපති තනතුර භාර ගනිමින් එහි දියුණුව සලසාලූ කුරේ මහතා ජාතික වොලිබෝල් සංගමයේ උප සභාපති තනතුර කාලයක් තිස්සේ හෙබ වූ අතර, 1992 දී එහි සභාපති තනතුරට ද පත් විය. ආසියානු වොලිබෝල් සංගමයේ අධ්‍යක්ෂ වශයෙන්ද කටයුතු කරමින් වොලිබෝල් ක්‍රීඩාවේ අභිවෘද්ධිය වෙනුවෙන් තම දායකත්වය නොඅඩුවම සැපයුවේය. ඒ ජාත්‍යන්තර වශයෙන් වොලිබෝල් ක්‍රීඩාව සඳහා තනතුරක් දැරූ ප්‍රථම ශ්‍රී ලාංකිකයා වශයෙන් වාර්තාවක්ද පිහිටුවමිනි. සමාජමය කටයුතු උදෙසාත්, රාජ්‍ය තාන්ත්‍රික කටයුතු උදෙසාත් වරින් වර විදෙස් ගත වූ එතුමා ඒ සෑම චාරිකාවකින්ම පාහේ තම රටටත්, ක්‍රීඩා ක්ෂේත්‍රයටත් යමක් ලබා දීමට පියවර ගත්තේය.

උපතින් කතෝලික බැතිමතෙකු වූ කුරේ මහතා තම ආගමේ සියලු කටයුතු සඳහා අවශ්‍ය සහාය ලබා දුන් අතර, ප්‍රදේශයේ බෞද්ධ භික්ෂූන් වහන්සේලා සමඟ ඉතා සමීප සම්බන්ධතාවක් පවත්වාගෙන යමින් එකී විහාරස්ථාන සඳහා තම ප්‍රතිපාදන ලබා දෙමින් තවත් උදාර සේවාවක් ආගමික වශයෙන්ද සිදු කළේය.

පක්ෂය වෙනුවෙනුත්, පොදු ජනතාව වෙනුවෙනුත් සුවිශේෂී මෙහෙවරක යෙදෙමින් නිරතුරුවම ජනතාව අතරේ ගැවසුණු මානව හිතවාදී දේශපාලනඥයකු වූ මර්වින් ජේ. කුරේ මහතා වසර හැත්තෑතුනක් පමණ ආයු වළඳා 2011 ජනවාරි මස 15වැනි දින සමාදානයේ සැතපුණි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පොදු මහ ජනතාවගේ හිත සුව පිණිස සුවිශේෂී මෙහෙවරක් ඉටු කළ කළුතර දිස්ත්‍රික් හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී සහ හිටපු අමාත්‍ය මාන්න මරක්කලගේ මර්වින් ජෝශප් කුරේ මැතිතුමන්ට මොක් සුව ප්‍රාර්ථනා කරන අතර, මෙම පාර්ලිමේන්තුවේ ශෝකය සොවින් තැවෙන එතුමාණන්ගේ දයාබර පුතුන් සිවු දෙනා ඇතුළු පවුලේ ඥාතීන් වෙත දන්වා යවන ලෙස යෝජනා කර සිටිමි.

[අ. භා. 4.40]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**

(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - எதிர்க்கட்சி முதல்வர்)

(The Hon. Ranil Wickremasinghe - Leader of the Opposition)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මර්වින් ජේ. කුරේ මන්ත්‍රීතුමාට 1983 දී මේ ගරු සභාව නියෝජනය කරන්න ලැබුණත්, ඊට පෙර අවුරුදු 20ක් විතර එතුමා ක්‍රියාකාරී දේශපාලනයේ යෙදිලා තිබුණා. එක්සත් ජාතික පක්ෂයට ඇතුළු වෙලා එතුමා ඒ ක්‍රියාකාරී දේශපාලනයේ යෙදුණා විතරක් නොවෙයි ඒ කාලයේ කොළඹ සිරිකොතදී පැවැත්වුණු ඒ පුහුණුවීම් කඳවුරුවලටත් සහභාගී වෙලාත් තිබෙනවා.

මම එතුමාව දැන ගත්තේ ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා සත්‍යග්‍රහ ව්‍යාපාර, සංවිධාන ආරම්භ කරද්දී එතුමා සමඟ එකට එකතු වෙලා වැඩ කළ කාලයේදීයි. විශේෂයෙන්ම කළුතර දිස්ත්‍රික්කයේ එදා අපට එකම මන්ත්‍රී ධුරයක්වත් තිබුණේ නැහැ. ඊට ඉස්සර කාලවලදීත් ඒ දිස්ත්‍රික්කයේ අපට තිබුණේ මන්ත්‍රී ධුර ස්වල්ප ප්‍රමාණයයි. විශේෂයෙන්ම බේරුවල ප්‍රදේශයේ අපට මන්ත්‍රීවරු ලැබුණා. ඒ වාගේම අගලවත්ත, නැත්නම් අනික් ප්‍රදේශවල මන්ත්‍රීවරයෙක් ලැබෙන එක එදා ඉතා අමාරු කාර්යයක් හැටියට තමයි සැලකුවේ. ඉතින් එවැනි ප්‍රදේශයක් සංවිධානය කිරීම ලෙහෙසි පහසු වැඩක් නොවෙයි. මම කොළඹත්, කැලණියත් සංවිධානය කරන අවස්ථාවේදී එතුමා ක්‍රියාකාරීව හිටියා. ඕනෑම උද්ඝෝෂණයක් තිබුණා නම් එහි ඉදිරියෙන් සිටියේ මර්වින් ජේ. කුරේ මැතිතුමායි. එතුමා තමන්ගේ දහඩිය මහන්සියෙන්, එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් තිබුණු කැපවීමෙන්, ඒ වාගේම ඒ ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් තිබුණු කැපවීම නිසා ඉදිරියට ආව පුද්ගලයෙක්. පළමුවෙන්ම නගර සභාවේත්, ඊට පස්සේ සංවර්ධන සභාවේත් ක්‍රියා කරන්නට එතුමාට පුළුවන් වුණා. එතුමා සංවර්ධන සභාවේ ඉතාම ක්‍රියාකාරී සාමාජිකයෙක් හැටියට හිටියේ. 1983 දී තමයි එතුමා මේ ගරු සභාවට පැමිණියේ. එදා ඉඳන් එතුමා මේ ගරු සභාවේ හැම වැඩ කටයුත්තකටම සහභාගි වුණා. අයින් වුණේ නැහැ; නිශ්ශබ්ද වෙලා හිටියේ නැහැ. ඒ වාගේම එතුමා එක්සත් ජාතික පක්ෂයේ වැඩ කටයුතුත් භාර අරගෙන ක්‍රියා කළා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍යවරයා හැටියට ප්‍රේමදාස ජනාධිපතිතුමා යටතේ ඒ වැඩ කටයුතු කරන්න එතුමා හැම තැනම ගියා. මට මර්වින් ජේ. කුරේ මැතිතුමා පක්ෂයේ වැඩ කටයුතු කරද්දී මුණ ගැහුණා පමණක් නොවෙයි, ඊට පස්සේ එතුමා නෙවිල් ප්‍රනාන්දු මහත්මයා

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

මන්ත්‍රීවරයා වෙලා ඉන්දෙද්දිත් අපේ වැඩ කටයුතුවලට සම්බන්ධ වුණා; උදවු කළා. විශේෂයෙන්ම එතුමා මන්ත්‍රී වුණාට පස්සේ අධ්‍යාපන වැඩ කටයුතුවලට මාව මුණ ගැහුණා. මම කර්මාන්ත ඇමතිවරයා වෙලා ඉන්දෙද්දි මෝදරවිල කර්මාන්ත පුරය දියුණු කරන්න එතුමා ඇවිල්ලා උදවු උපකාර ගත්තා. එතැන කර්මාන්ත ගණනාවක් දියුණු කරන්න එතුමා පියවර ගත්තා. පානදුරේ තරුණ තරුණියන් විශාල පිරිසකට එහි රැකියා ලැබුණා. මට විශේෂයෙන්ම මතකයි IE කර්මාන්තායතනය -විදුලි කර්මාන්තායතනය- වාගේ කර්මාන්තායතන කීපයකට එදා අප උදවු කළාය කියන එක. ඒත් මර්වින් ජේ. කුරේ ඇමතිතුමා අමතක කළේ නැහැ මේ කාරණා ගැන හොයලා බලන්න; ඒවා ගැන කියන්න. එතුමාට කොහොම හරි ඕනෑ වුණේ ඒ ප්‍රදේශයේ ජනතාවට, තරුණ තරුණියන්ට රැකියා ලබලා දෙන්නයි.

පානදුර කියන්නේ කෘෂිකර්මයේ යෙදෙන ප්‍රදේශයකුත් නොවෙයි. ඒ ප්‍රදේශයේ අද කර්මාන්ත සංඛ්‍යාව වැඩි වුණාට එදා එච්චර කර්මාන්ත තිබුණේ නැහැ. එතුමා ගත්ත උනන්දුවෙන් තමයි එදා පානදුර ප්‍රදේශයට කර්මාන්ත ලබලා දෙන්න අපට පුළුවන් වුණේ. හුඟක් අමාරු කාලයකදී -1989 දී- මේ පාර්ලිමේන්තුවේත් තර්ජන තියෙද්දි පානදුරේ ඉඳලා මෙහාට එන්න මර්වින් ජේ. කුරේ මැතිතුමා තුළ කිසිම බයක් තිබුණේ නැහැ.

මට මතකයි, මා සභානායකවරයා හැටියට මන්ත්‍රීවරුන්ට කිව්වා පාර්ලිමේන්තුවට එන්න, අපට පාර්ලිමේන්තුවේ ගණපූරණය තබා ගන්න ඕනෑ කියලා. ඒ අනුව එතුමා පාර්ලිමේන්තුවට ආවා. එක දවසක් වෙනත් කොහේදෝ ප්‍රදේශයක ඉඳලා කොහොම හරි වෙලාවට එතුමා පාර්ලිමේන්තුවට ආවා. එදා උදේ වරුවේ පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු ආරම්භ කරද්දී එතුමා ඇවිල්ලා ඒ කටයුතුවලට සම්බන්ධ වුණා. එම වර්ෂයේ අමාරුම කාලයේ, අගෝස්තු, සැප්තැම්බර් මාසවල හැම දිනකදීම ප්‍රශ්නයක් නැතිව එතුමාගේ ප්‍රදේශයේ සිට මේ ගරු සභාවට ආවා. අන්න එහෙම කැප වෙලා වැඩ කරන මන්ත්‍රීවරු සොයන එක ලේසි පහසු දෙයක් නොවෙයි.

එතුමා 1994 ඉඳලා පක්ෂයේ සංවිධාන වැඩ කටයුතුවල යෙදුණා; ඒවාට උදවු කළා. මැතිවරණවලදී තරග කළා. එතුමාගේ සෞඛ්‍ය තත්ත්වය නිසා තරග කිරීමේ දේශපාලනයෙන් ඉවත් වුණා. නමුත් කොච්චර අසනීප තිබුණත් කළුතර දිස්ත්‍රික්කයේ, පානදුරේ එක්සත් ජාතික පක්ෂයේ රැස්වීමක් තිබුණා නම් අමාරුවෙන් හරි ඇවිල්ලා එතුමා ඒ රැස්වීමේ වාඩි වුණා. ඒ විධියට තමයි එදා අපේ සාමාජිකයන් සියලු දෙනාම අප පුහුණු කරලා තිබුණේ. එතුමාත් ඒ අනුව ක්‍රියා කළා. අපේ මිත්‍රයකු හැටියටත්, අපට සහයෝගය දුන් පුද්ගලයකු හැටියටත්, එතුමාගේ මරණය අප හැම කෙනකුටම පාඩුවක්. අද මේ ගරු සභාවේ ගැලරියේ පානදුරෙන් ඇවිල්ලා සිටින පිරිස දිහා බැලුවාම, ඒ අය එතුමා පිළිබඳව වටහා ගෙන තිබෙන්නේ කොහොමද කියලා මට තේරුම් ගන්න පුළුවන්.

මේ අවස්ථාවේදී එතුමාගේ මරණය පිළිබඳව ඒ පවුලේ අයට අපගේ කනගාටුව ප්‍රකාශ කරමින්, එතුමාට මොක් සුව ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය මා අවසන් කරනවා.

[4.45 p.m.]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Hon. Deputy Chairman of Committees, I rise today in this House to pay my respect and tribute to the late Hon. Mervyn J. Cooray. He was a very dear and close Friend of mine. I came to know him when I was the Private Secretary to the former Speaker, Deshamanya Alhaj M.A. Bakeer Markar. The Hon. Mervyn J. Cooray was an endearing personality. He lived a very happy life. He had an open heart and lived happily with his friends, kith and kin. He never encountered any problem in his life, be it social or political. In the political field, he happily faced his adversaries and carried forward his mission of serving the people. I should mention that he came very close to the hearts of the Muslims of the Kalutara District, particularly Panadura and Beruwala. There is an annual feast held at the Kechchimala Mosque in Beruwala. We always found the Hon Mervyn J. Cooray visiting that place and attending that feast. A host of young friends of the Muslim community would surround him because he liked to have a very fascinating dialogue with them.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Order, please! The Hon. Speaker will now take the Chair.

***අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, කථානායකතුමා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* MR. SPEAKER *took the Chair.*

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

The Hon. Mervyn J. Cooray was a great sportsman. He excelled in volleyball rising not only to national fame but also to international fame. He was for a long time the President of the National Federation of Volleyball and gave the correct leadership to the youth. He also became the Vice-President of the Asian Federation of Volleyball, and as the Hon. Reginold Cooray said, he was the first Sri Lankan to hold that post.

At the later stages, he was overtaken by ill-health and I very well remember that he underwent a heart surgery. Funds were released from the President's Fund. I remember well the request made by the Hon. Karu Jayasuriya at that time saying that the money given was not enough and I had to take that massage to His Excellency President Mahinda Rajapaksa, who readily agreed to grant more funds. It was a very rare occasion because he grants funds equally to all.

When he was the Minister of Power and Energy, together with Mr. M.I.B. Hafi, of Puttalam, another good friend of mine, a Provincial Council Member, I used to take Mervyn to the Puttalam area.

He gave electricity to many villages in the Puttalam District, and he also joined the Muslim community in breaking fast - *Iftar* - in the Mosque. We knew his

children very well. When they were tiny tots we had even carried and petted on them. His daughter Marian Kumari unfortunately had a tragic death over which grieve even today. Jagath, Ajith, Vijith and Sujith, who was a Member of Provincial Council. All in all, Sir, we have lost a genius personality, a good hearted man and a friend of all. I pay my respect to his memory. May his soul rest in peace.

Thank you.

[අ. භා. 4.50]

**ගරු කරු ජයසූරිය මහතා**
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)

ගරු කථානායකතුමනි, දිවංගත හිටපු අමාත්‍ය මර්වින් ජේ. කුරේ මැතිතුමා සම්බන්ධයෙන් ආණ්ඩු පක්ෂයෙනුත් විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා විසිනුත් දීර්ඝ විවරණයක් කරමින් එතුමාගේ උතුම් ගුණාංග සම්බන්ධයෙන් පැහැදිලි කළ නිසාත්, අපට කාලය සම්බන්ධයෙන් යම් සම්බාධක පැනවී ඇති නිසාත් මම දීර්ඝ ලෙස කථා කරන්නේ නැහැ. ඒ සියලුම කරුණු අප අනුමත කරන ගමන් මර්වින් ජේ. කුරේ මැතිතුමා මහ ජනතාවට ආදරය කළ, ජනතාව සමඟ ජීවත් වූ, ජනතාවට සේවය කිරීමට කැප වූ නියම අවංක මහ ජන නියෝජිතයකු බව මා සඳහන් කරන්න කැමැතියි. ඒ වාගේම එතුමා තුළ තිබූ, සෑම විටම අප දුටු තවත් ලක්ෂණයක් තමයි බලය ඇති විටත්, බලය නැති විටත් සම ජීවිතයක් ගත කළ එක. එතුමා විශේෂයෙන්ම තමාට විරුද්ධ දේශපාලන මත දරන අය සමඟ උරණ නොවී, ඒ අය සමඟ සහයෝගයෙන් කටයුතු කළා. සමාජ සේවා කටයුතුවලදීත්, ආගමික කටයුතුවලදීත් දේශපාලන භේදයෙන් තොරව ඉතාම ආදර්ශවත් ලෙස එතුමා කටයුතු කළා.

එතුමා 1969 දේශපාලන ජීවිතය ආරම්භ කරලා වාද්දුව සුළු නගර සභාවට තරග කර ඉතා විශිෂ්ට ජයග්‍රහණයක් ලබා ගෙන එහි උප සභාපති ධුරයට පත් වී, ඉන් පසුව ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ ආරාධනයෙන් ජාතික දේශපාලනයට පිවිස මිය යන තුරුම පක්ෂයටත්, තම ජනතාවත්, රටටත් විශාල සේවයක් කළා.

ගරු කථානායකතුමනි, මා මේ අවස්ථාවේ ගෞරවයෙන් සඳහන් කරන්නට කැමැතියි, එතුමාගේ අවසාන කාලයේ ආරෝග්‍ය ශාලාවේ සිටියදී පවා පක්ෂයේ කටයුතු ගැන, ආගමික කටයුතු ගැන, සමාජ සේවා කටයුතු ගැන සොයා බැලූ බව. අඩු ගණනේ මාසයකට තුන් හතර වතාවක් අපට කථා කරලා, ඒ කටයුතු කරන ලෙස ඉල්ලූ බොහෝ අවස්ථා මට මතක් කරන්න පුළුවන්. නෙවිල් ප්‍රනාන්දු සහ පද්මින් ෆොන්සේකා මන්ත්‍රීවරුන්ට පසුව එතුමා මහජන මන්ත්‍රීවරයකු ලෙස පත් වුණා. 1989 සිට 1994 දක්වාම එතුමා පාර්ලිමේන්තුව නියෝජනය කළා.

විශේෂයෙන්ම ධීවර ජනතාවට ආදරය කළ එතුමා ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් මට්ටමට ගෙන ඒම සඳහා දැඩි කැපවීමකින් කටයුතු කළා. පානදුර ධීවර නිවාස යෝජනා ක්‍රමය ආරම්භ කරමින් ධීවර ජනතාවට හිසට වහලක් ලබා දීමට එතුමා කටයුතු කළ ආකාරයත් මේ අවස්ථාවේ දී අප සිහිපත් කරනවා.

ගරු කථානායකතුමනි, විදුලිබල අමාත්‍යවරයා වශයෙන් එතුමා විශාල සේවාවක් කළා. ලංකාවේ සෑම තැනකම සංචාරය කරමින් විදුලිය නොමැති ප්‍රදේශවලට විදුලිය ලබා දීම සඳහා එතුමා විශාල ලෙස කැප වූ බව, මා විදුලිබල අමාත්‍යවරයා වශයෙන් හිටපු කාලයේ නිලධාරින් බොහෝ අවස්ථාවල සඳහන් කළ ආකාරය මට මතක් වෙනවා.

ගරු කථානායකතුමනි, එතුමා ක්‍රීඩාවට විශේෂ කැප වීමක් කළ මන්ත්‍රීවරයෙක්. කුඩා කාලයේ පටන් වොලිබෝල් ක්‍රීඩාවටත්, ක්‍රිකට් ක්‍රීඩාවටත් විශේෂ ඇල්මක් තිබුණා. වොලිබෝල් ක්‍රීඩාවේදී විශේෂ දක්ෂයෙක් වුණා. වොලිබෝල් ක්‍රීඩාවට එතුමා තුළ තිබුණ බලවත් කැමැත්ත නිසාම, ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනයේ සභාපති වශයෙන් ලංකාවේ වොලිබෝල් ක්‍රීඩාව ජාත්‍යන්තරයට ගෙන යෑමට කරන ලද උදාර සේවය අපට කිසිදා අමතක කළ නොහැකියි. ආසියානු වොලිබෝල් සම්මේලනයේ විධායක කමිටු සාමාජිකයකු ලෙසත් එතුමා පසු කාලීනව ක්‍රියා කළා.

උත්පත්තියෙන්ම ක්‍රිස්තියානි භක්තිකයකු වුණත් එතුමාගේ දිස්ත්‍රික්කය තුළ වූ බෞද්ධ සිද්ධස්ථානවල වැඩ කටයුතුවලදී මහා සංඝරත්නය සමඟ විශාල කුළුපග බවකින් කටයුතු කළ බවත් මා මේ අවස්ථාවේ සඳහන් කළ යුතුයි. එතුමා දේශපාලනයෙන් සමු ගත්තත් එම දිස්ත්‍රික්කයේ, විශේෂයෙන්ම එතුමා නියෝජනය කළ ආසනයේ පැවැති ආගමික උත්සවවලට සෑම අවස්ථාවකම එතුමාගේ සහභාගිත්වය ලබා දුන්නා.

අති උතුම් මැල්කම් රංජිත් කාදිනල්තුමා සමඟත්, ඒ වාගේම ක්‍රිස්තියානි සභාව සමඟත් එතුමා ඉතාම කිට්ටුවෙන් ආශ්‍රය කළ බව මා මේ අවස්ථාවේ සඳහන් කරන්න කැමැතියි. එතුමා හොඳ පවුල් ජීවිතයක් ගත කළා. එතුමා ආදරණීය දූ දරුවන් පිරිසක් බිහි කර දැන් ඒ දරුවනුත් සමාජයට විශාල සේවාවක් කරන බවත් මා මේ අවස්ථාවේදී සඳහන් කරන්න කැමැතියි.

අවුරුදු 73ක් ආයු වළඳා, සමාජයට විශාල සේවාවක් කළ, දේශපාලන ක්ෂේත්‍රයේ බොහොම දුර්ලභ ගණයේ දේශපාලනඥයකු වශයෙන් තමයි මා එතුමා ගැන සඳහන් කරන්නේ. එතුමා දේශපාලනය තුළදී දෑත කිළිටි කර ගත්තේ නැහැ. එතුමා දේශපාලනයට ඇතුළත් වන විටත් ඉන් පිට වන විටත් එතුමාගේ සම ජීවිකාව තුළින් අවංක දේශපාලන ජීවිතයක් ගත කළ ආකාරය අප දැක්කා. ගරු කථානායකතුමනි, ඒ නිසා තමයි එතුමා ආදරය කළ, එතුමා සේවය කළ, එතුමාගේ ආසනයේ ජනතාව විශාල සංඛ්‍යාවක් අද පානදුරේ සිට මෙතැනට පැමිණ සිටින්නේ. මේක අපි දකින බොහොම දුර්ලභ දර්ශනයක්. මෙවැනි අවස්ථා අපි දකින්නේත් බොහොම කලාතුරකින් පමණයි. මේ අවස්ථාවේදී මෙහි පැමිණ සිටින එතුමාගේ පවුලේ සියලු දෙනාටම එක්සත් ජාතික පක්ෂයේ අපගේ බලවත් ශෝකයත් පෞද්ගලිකව මාගේ බලවත් ශෝකයත් පළ කර සිටිනවා. ඒ වාගේම එතුමා සේවය කළ, එතුමාට ආදරය කළ එතුමාගේ ජනතාවටත් අපේ ශෝකය පළ කරන අතරම එතුමාට මොක් සුව ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා.

[අ. භා. 4.56]

**ගරු පාලිත තෙවරප්පෙරුම මහතා**
(மாண்புமிகு பாலித தெவரப்பெரும)
(The Hon. Palitha Tewarapperuma)

ගරු කථානායකතුමනි, මර්වින් ජේ. කුරේ මැතිතුමාගේ අභාවය වෙනුවෙන් පාර්ලිමේන්තුව ශෝක වන මේ අවස්ථාවේදී ඊට සම්බන්ධවීමට මා හට ඉඩකඩ ලබා දීම පිළිබඳව මා ප්‍රථමයෙන්ම ඔබතුමාට මාගේ ස්තූතිය පුද කරනවා.

ශ්‍රීමත් හෙන්රි පීරිස්, ඩී.සී.ඩබ්ලිව්. කන්නන්ගර, ලෙස්ලි ගුණවර්ධන, නෙවිල් ප්‍රනාන්දු වැනි වැදගත් දේශපාලනඥයන් නියෝජනය කළ පානදුර ආසනය නියෝජනය කරමිනුයි මර්වින් ජේ. කුරේ මැතිතුමා ජාතික දේශපාලනයට පිවිසුණේ. ප්‍රදේශයේ ඉතාම වැදගත් පවුලකට දාව මෙලොව එළිය දුටු මර්වින් ජේ. කුරේ මැතිතුමා ඒ යුගයේ පැවැති ප්‍රකට සමාගමක් වූ "බෲක්බොන්ඩ්" සමාගම හරහා සිය වෘත්තීයමය දිවිය ඇරඹුවෙක්. එලෙස ඉතාම සුවපහසු, වැදගත් රැකියාවක් කරමින් සිටි එතුමා

[ගරු පාලිත තෙවරප්පෙරුම මහතා]

1966 වසරේදී ක්‍රියාකාරී දේශපාලනයට අවතීර්ණවීමට තීරණය කළා. ඒ, තමා උගත් දැනුමෙන් සමාජයට සේවය කිරීමේ පැහැදිලි අභිලාෂයෙන්. ක්‍රියාකාරී දේශපාලනයට පිවිසීමේදී එතුමාගේ තෝරා ගැන්ම වුණේ එක්සත් ජාතික පක්ෂයයි. ඒ වන විට පානදුර ප්‍රදේශයේ දේශපාලන "කොඩිය" ඔසවා සිටි ලංකා සමසමාජ පක්ෂයේ බලයට සැබෑ අභියෝගයක් එල්ල කිරීමේ අරමුණින් එතුමා එජාපය හා සම්බන්ධ වුණා.

පළාත් පාලන දේශපාලනය හරහා තම දේශපාලන දිවිය අරඹද්දී අපේක්ෂා කළ ආකාරයටම එතුමාගේ එම තීරණය සුවපහසු එකක් වුණේ නැහැ. අභියෝග රැසකට මුහුණ දීමට එතුමාට සිද්ධ වුණා. නමුත් ඒ සියලු අභියෝගයනට මුහුණ දෙමින් පක්ෂය ජයග්‍රහණය කරා ගෙන යැමට එතුමා හැම විටම නොසැලී කටයුතු කළා. මහ මැතිවරණවලදී පමණක් නොවෙයි, 60 දශකයේ, 70 දශකයේතිබුණු සෑම අතුරු මැතිවරණයකදීම එතුමා පක්ෂය වෙනුවෙන් තම උපරිම දායකත්වය ලබා දුන්නා. වැලිමඩ, අගලවත්ත, බණ්ඩාරගම, දැදිගම ආදී ඒ කාලයේ පැවැති සෑම අතුරු මැතිවරණයකදීම එතුමා තම සංවිධාන ශක්තිය, තරුණ ජවය එකතු කළා.

දීර්ඝ කාලයක් රතු බල කොටුවක්ව පැවැති පානදුර ආසනය 1977 මහ මැතිවරණයේදී එජාපයට දිනා දීමට එතුමා දොස්තර නෙවිල් ප්‍රනාන්දු මහතා සමඟ උරෙන් උර ගැටී කටයුතු කළා. 1983 දී නෙවිල් ප්‍රනාන්දු මහතා පක්ෂයෙන් ඉවත් වෙද්දී පානදුර ආසනයේ මන්ත්‍රී ධුරයට පත් වූ එතුමා එතැන් සිට පුරා වසර 11ක් කළුතර දිස්ත්‍රික් මන්ත්‍රීවරයකු ලෙස කටයුතු කළා. ඒ කාලය තුළ තමා නියෝජනය කළ ජනතාව වෙනුවෙන් එතුමා ඉටු කළ සේවය අමරණීය යයි කියා පැවසුවහොත් ඒක අතිශයෝක්තියක් නොවෙයි.

කිසිදු ප්‍රයෝජනයක් නොගත් වගුරු බිමක්ව පැවැති මෝදරවිල ප්‍රදේශයේ කර්මාන්ත පුරයක් ඉදි කිරීමට එතුමා කටයුතු කළා. ඒ ඔස්සේ රටේ ආර්ථිකයට විශාල ශක්තියක් ලැබුණා වාගේම ප්‍රදේශයේ තරුණ තරුණියන් විශාල පිරිසකට, දහස් ගණනකට රැකීරක්ෂාත් හිමි වුණා. ඒ නිසාවෙන් එම ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ යද්දී මේ කර්මාන්ත පුරයට සමගාමීව ප්‍රදේශයේ යටිතල පහසුකම් ව්‍යුහය උපරිමයෙන් දියුණු වුණා. පානදුර නගරය ජනාකීර්ණ වීමට පටන් ගැනුණා. පටුව පැවැති ගාලුපාර පානදුරේ සිට වාද්දුව දක්වා පුළුල් කිරීමේ කටයුත්ත සිදු වුණේත් මර්වින් ජේ. කුරේ මැතිතුමාගේ මූලිකත්වයෙන්. ඒ නිසා මාර්ග තදබදය විශාල වශයෙන් අඩු වුණා. විදුලිබල හා බලශක්ති ඇමතිවරයා ලෙස පත්වීමත් සමඟ එතුවක් කල් පානදුරයට පමණක් සීමා වී පැවැති එතුමාගේ සේවය කළුතර දිස්ත්‍රික්කය පුරා, මුළු රට පුරා ව්‍යාප්ත වුණා.

විදුලි බලය නොතිබුණු කළුතර දිස්ත්‍රික්කයේ ඈත ගම් දනවු කිහිපයකටම විදුලිය ලබා දීමට එතුමා මේ කාලයේ කටයුතු කළා. අගලවත්ත, මතුගම, බුලත්සිංහල ආදී දිස්ත්‍රික්කයේ දුෂ්කර ගම්මාන රැසකට විදුලිබල පහසුකම් ලැබුණේ මෙතුමාගේ ඒ මැදිහත් වීම නිසා බව ඒ දුෂ්කර ගම්මානවල වැසියන් අදටත් කෘතවේදීව ගෞරවයෙන් සිහිපත් කරනවා. විදුලි බිල වැඩි කරනවා වෙනුවට සියල්ලන්ටම විදුලිය ලබා දීමට එතුමා කටයුතු කළා.

ක්‍රීඩාව පිළිබඳවත් මෙතුමාට තිබුණේ අසීමාන්තික දැනුමක්. විශේෂයෙන්ම මෙරට වොලිබෝල් ක්‍රීඩාවේ තත්ත්වය ඉහළ නැංවීමට, එය ජාත්‍යන්තර මට්ටම කරා රැගෙන යාමට එතුමාට ලොකු අධිෂ්ඨානයක් තිබුණා. ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනයේ සභාපති තනතුරට තේරී පත් වීමෙන් අනතුරුව එතුමා ඒ වෙනුවෙන් ඉතාමත් වෙහෙසව වැඩ කළා. ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනයේ සභාපති තනතුරේ දිගු කාලයක් කටයුතු කළ මෙතුමා ඉන් නොනැවතී ආසියානු වොලිබෝල් සම්මේලනයේ විධායක සභිකයකු ලෙසද වසර ගණනාවක් කටයුතු කළා. ඒ හරහා මෙරට වොලිබෝල් ක්‍රීඩාවේ තත්ත්වය ඉහළ නැංවීමට එතුමා කටයුතු කළා. වැඩි වැඩියෙන් විදේශ තරග, සංචාර, පුහුණුවීම් අපේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ලබා දෙමින්, පුහුණුකරුවන්ට එතෙර පුහුණුවීම් ලබා දෙමින් එතුමා මේ කාලයේ කටයුතු කළ ආකාරය ක්‍රීඩා ක්ෂේත්‍රයේ ඉන්න අය අදත් සිහිපත් කරනවා.

ක්‍රියාකාරී දේශපාලනයෙන් සමුගත් පසුත් තරුණ දේශපාලනඥයන්ට නිවැරදි මාර්ගය පෙන්වා දෙමින් අවශ්‍ය උපදෙස් ලබා දෙමින් එතුමා සෑම විටම කටයුතු කළා.

විශේෂයෙන්ම ආධුනික දේශපාලනඥයෙක් ලෙසට එතුමාගෙන් ලැබුණු ඒ උපදෙස් අපේ දේශපාලන ගමන ඉදිරියට ගෙන යාමේදී සෑහෙන ප්‍රයෝජනවත් වුණා.

කතෝලික ජනතාව වෙතින් බිහි වූ නායකයකු වුවත් ජාති, ආගම් භේදවලින් තොරව සියලු දෙනාටම එකසේ සේවාව සැපයීමට මර්වින් ජේ. කුරේ මැතිතුමා කටයුතු කළා. විශේෂයෙන්ම කළුතර දිස්ත්‍රික්කයේ සෑම බෞද්ධ විහාරස්ථානයකටම විදුලිබල පහසුකම් සැපයීමට එතුමා උනන්දු වුණා. එතුමා ඒ විධියේ උතුම් මනුෂ්‍ය ගුණාංග සහිත පුද්ගලයෙක්.

ඒ එක්කම එතුමා ප්‍රතිපත්තිගරුක දේශපාලනඥයෙක්. එජාපයෙන් තම දේශපාලන ගමන ඇරඹූ එතුමා අප අතරින් සමුගන්නා තෙක්ම එජාපයේ ක්‍රියාකාරී සාමාජිකයකු ලෙස කටයුතු කළා. දුෂ්කර අවස්ථාවලදී පවා එතුමා තමාගේ ප්‍රතිපත්තිගරුක බව රැක ගැනීමට කටයුතු කළා. එතුමා එවැනි ආදර්ශවත් ප්‍රතිපත්තිගරුක දේශපාලනඥයෙක්.

මීට වඩා කථා කරන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ. මර්වින් ජේ.කුරේ මහතාගේ අභාවය පිළිබඳ මෙම උත්තරීතර සභාවේ ශෝකය පළ කරන මේ අවස්ථාවේ දී එතුමාගේ ආදරණීය පුත් හිටපු පළාත් සභා මන්ත්‍රී සුජිත් කුරේ මැතිතුමා ඇතුළු පවුලේ සියලු දෙනා වෙත අපගේ ශෝකය දන්වා යවන්නය කියා ඉල්ලමින් මා නිහඬ වනවා.

[අ. භා. 5.02]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, සමස්තයක් වශයෙන් කළුතර දිස්ත්‍රික්කයටත්, විශේෂයෙන්ම පානදුර සහ බණ්ඩාරගම ප්‍රදේශවලටත් අති විශාල සේවයක් ඉටු කළ අවංක, නිහතමානී දේශපාලනඥයකුගේ අභාවය වෙනුවෙන් මේ ගෞරවනීය පාර්ලිමේන්තුවේ ශෝකය ප්‍රකාශ කරන මොහොතේ ගරු කථානායකතුමා මුලසුනේ සිටීම ඉතාම වටිනා ශ්‍රේෂ්ඨ දෙයක්.

ගරු මර්වින් ජේ. කුරේ මැතිතුමා ගැන අපට මතක තිබෙන්නේ නළුවෙක් වැනි අගනා රූප සම්පත්තියකින් පිරි, චතුර කථිකත්වයකින් යුතු, මනා පෞරුෂයකින් යුතු දැවැන්ත යුග පුරුෂයකු හැටියටයි. එතුමා ඉතාම දුප්පත්, අහිංසක මුහුදුබඩ ජනතාව වාගේම දැන උගත්කම් ඇති, ශක්තිවන්තකම් ඇති සියලු දෙනාත් එක ලෙස ඇසුරු කරපු, එක ලෙස ඒ අය කෙරෙහි ආදරය, ලෙංගතුකම දක්වපු ශ්‍රේෂ්ඨ නායකයෙක්. 1983 මේ ගෞරවණීය පාර්ලිමේන්තුවට පිවිසුණු ගරු මර්වින් ජේ. කුරේ මැතිතුමා 1994 වන තෙක්ම පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරය දැරුවා. එතුමා විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍ය ධුරය දරන කාලයේ මුළු රටටමත් විශේෂයෙන් කළුතර දිස්ත්‍රික්කයේ අතිදුෂ්කර ප්‍රදේශවලටත් විදුලිබලය ලබා දෙන්නට විශේෂ උනන්දුවකින්

ක්‍රියා කළා. බණ්ඩාරගම ආසනයේ මුංවත්ත නැඟෙනහිර කලාපයේ උඩුවර, පාතකඩ, තලහිටිය, බෙලගමුව, පනාගොඩ වාගේ ඒ වන විට විදුලිබලය නොලැබිලා තිබුණු ඉතාම දුෂ්කර ප්‍රදේශ රාශියකට සම්පූර්ණයෙන්ම විදුලිබලය ලබා දීලා ඒ ප්‍රදේශවල අඳුර දුරු කළේ එතුමායි. අද ඒ ප්‍රදේශවල ජනතාව මේ ගෞරවණීය සභාවට, මේ අවස්ථාවට පැමිණීමෙන් ඒ ජනතාව තවමත් එතුමාට දක්වන ගෞරවය පිළිබිඹු වනවා.

එතුමා උපතින් කතෝලිකයකු වුණත් බෞද්ධ වාගේම ඉස්ලාම් ආගම පිළිබඳවත් මනා අවබෝධයක් එතුමාට තිබුණා; ඒ සංස්කෘතික වටිනාකම් පිළිබඳව, සංස්කෘතික හැසිරීම් පිළිබඳව ඉහළ අවබෝධයක් තිබුණා. ඒ නිසා එතුමාට ආගම්, ජාති භේද තිබුණේ නැහැ. එක අතකින් ඒක පක්ෂයට මහත් ශක්තියක් වුණා. අනෙක් අතට ශ්‍රී ලාංකික ජාතියක් විධියට මේ රට ඉදිරියට යන ගමනට එතුමා ආදර්ශයක් සැපයුවා.

ඒ විතරක් නොවෙයි. එතුමාගේ ජීවිතයේ ඉතා වටිනා දෙයක් එතුමා ඉතිරි කර ගත්තා. ඒ තමයි ජනතාවගේ ආදරය. මට මතකයි, ගරු කථානායකතුමනි, මා දේශපාලනයට පිවිසෙන මොහොතේ එතුමාගෙන් අවවාද ලබා ගැනීමට වාද්දුවේ පිහිටි එතුමාගේ නිවසට ගිය අවස්ථාවේදී එතුමා මට කිව්වා,"අජිත්, ජනතාවගේ ආදරය තරම් දෙයක් වෙන ඇත්තේ නැහැ. මා ජීවිතයේ ඉතිරි කර ගෙන තිබෙන්නේ ජනතාවගේ ඒ ආදරය පමණයි. දේශපාලනය තුළ තනතුරු ඇතත්, නැතත් ජනතාවගේ ආදරය දිනා ගන්නා ලෙසට දේශපාලනය කරන්න" කියලා. ඇත්ත වශයෙන්ම වසර 73ක් වූ එතුමාගේ ජීවිත කාලය ඉතාම දුෂ්කර පුංචි තැනක ඉඳලා පටන් අරගෙන අමාත්‍ය ධුරයක් දක්වා ගමන් කරලාත් පුංචි මිනිස්සුන්ගේ, අහිංසක මිනිස්සුන්ගේ, වේදනාවෙන් පෙළෙන ඒ දුප්පත් මිනිස්සුන්ගේ වේදනාවන් සමඟ ජීවත් වුණා. ඒ වාගේම එතුමා එක්සත් ජාතික පක්ෂය, මේ රටේ දුක් විඳින අහිංසක ජනතාවට, මේ රටේ ගොවියාට, කාර්මිකයාට, ධීවරයාට සැබෑවටම වැඩ කළ මේ පක්ෂය තම ජීවිතයේ අවසාන කාලය තෙක්ම එක ලෙස ආරක්ෂා කළා.

ගරු කථානායකතුමනි, සමහර අය පුදුමයට පත් වේවි, එතුමා මිය යන්න වසරකට පෙරත් පානදුර නගරයේ ගාලු පාරට බැහැලා රජයේ වැරදි වැඩ පිළිවෙළට විරුද්ධව උද්ඝෝෂණ කළා කිව්වාම. එතුමා අත් අඩංගුවට පත් වුණා. එතුමා මිය යන මොහොත වන විටත් රජයට විරුද්ධව උද්ඝෝෂණ කිරීම පිළිබඳ නඩුවක් තිබුණා. එතුමා එවැනි ක්‍රියාකාරී ජීවිතයක් ගත කළා. රෝගී තත්ත්වයන් අපි කාටත් පොදුයි. අපි කවුරුත් යම් දවසක මේ ජීවන ගමන අවසන් කළ යුතුයි. හැබැයි ගරු මර්වින් ජේ. කුරේ මැතිතුමාට හැකි අවසාන දිනය දක්වා මේ රටේ ජනතාවගේ අයිතිවාසිකම් වෙනුවෙන්, ජනතාවගේ ප්‍රශ්න වෙනුවෙන් විශේෂයෙන්ම පානදුර, බණ්ඩාරගම, කළුතර ප්‍රදේශවල ජනතාව වෙනුවෙන් පෙනී සිටියා; කථා කළා. ඒ වාගේම ක්‍රීඩාව පිළිබඳව එතුමා තුළ තිබුණේ විශාල ඇල්මක්. එතුමා දක්ෂ වොලි බෝල් ක්‍රීඩකයෙක් වුණා පමණක් නොවෙයි, එතුමා ශ්‍රී ලංකා වොලි බෝල් සම්මේලනයේ සභාපතිවරයා හැටියට වාගේම ආසියානු වොලි බෝල් සම්මේලනයේ විධායක සභිකයෙක් හැටියටත් ජාත්‍යන්තර හා ජාතික මට්ටමෙන් වොලි බෝල් ක්‍රීඩාව දියුණු කරන්න කටයුතු කළා. මොකද, එතුමා දැන ගෙන සිටියා, මේ රටේ දුප්පත් මිනිහාගේ ක්‍රීඩාව වොලි බෝල් ක්‍රීඩාව බව; ඒ වාගේම මේ රටට ගැළපෙන ක්‍රීඩාව වොලි බෝල් ක්‍රීඩාව බව. ඒ වෙනුවෙන් එතුමා කැප වුණා; මහන්සි වුණා.

ගරු කථානායකතුමනි, එතුමාගේ සේවය එතුමා නියෝජනය කළ ප්‍රදේශයට පමණක් සීමා වුණේ නැහැ. එතුමාගේ ඉතිහාසය ගැන කථා කරන මේ මොහොතේ මට කාරණයක් මතක් වෙනවා. දිඹුලාගල විහාරස්ථානය සහ ඒ අවට ප්‍රදේශවලට විදුලි බලය සපයන්න මූලික වුණේ එතුමායි. "අපි කළුතර දිස්ත්‍රික්කයේ" කියා කිව්වාම ඒ ප්‍රදේශවල ගෞරවණීය ස්වාමීන් වහන්සේලා ගරු මර්වින් ජේ. කුරේ මැතිතුමා ගැන අදටත් මතක් කරනවා. කතෝලිකයකු වුණත් එතුමා තුළ බෞද්ධකම තිබුණා; සැබෑ ඉස්ලාම් ගතිය තිබුණා. එතුමා සැබෑ කතෝලිකයකු ලෙස ජීවත් වුණා. ගරු කථානායකතුමනි, අපේ රටට අවශ්‍ය වන්නේ ජාති ආගම් භේද වපුරන අය නොවෙයි. ජාති ආගම් භේද අමතක කරලා ශ්‍රී ලාංකික ජාතියක් විධියට එකම රටක් හැටියට, එකම ජාතියක් විධියට ඉදිරියට යන්න පුළුවන් කියා හිතන පුළුල් දැනුමක් තිබෙන ගරු මර්වින් ජේ. කුරේ මැතිතුමා වැනි ශ්‍රේෂ්ඨ යුග පුරුෂයන්.

ගරු මර්වින් ජේ. කුරේ මැතිතුමා ඉතා සෞම්‍ය, ඉතා විනෝදකාමී පුද්ගලයකු වාගේම ඉතා නිර්භීත පුද්ගලයෙකුද වුණා. 1988-1989 කාලයේ, එනම් ජනතා විමුක්ති පෙරමුණ විසින් මේ රටේ ඇති කරන ලද භීෂණය ඉතාම දරුණුවට තිබුණු කාලයේ එතුමා මරා දමන්න තුවක්කුකරුවෝ පැමිණියා. ඒ අවස්ථාවේදී තමාගේ ජීවිතයත් බේරා ගෙන තවත් ජීවිත ගණනාවක් බේරා ගෙන ඒ ත්‍රස්තවාදී කණ්ඩායමට මුහුණ දෙන්නට ගරු මර්වින් ජේ. කුරේ මැතිතුමා උපක්‍රමශීලිව නිර්භීතව කටයුතු කළ බව පානදුරේ දේශපාලනයේ නියැළී සිටින සියලු දෙනාටම මතක තිබෙනවා. ඒ නිර්භීතකම සෑම දේශපාලන ක්‍රියාවලියකදීම එතුමා තුළ දකින්න තිබුණා. ඒ නිසා තමයි ගරු විපක්ෂ නායකතුමා සඳහන් කළේ ලංකාවේ කොතැනක උද්ඝෝෂණයක් තිබුණත්, ලංකාවේ කොතැනක සත්‍යාග්‍රහයක් තිබුණත් ගරු මර්වින් ජේ. කුරේ මැතිතුමා ඒ උද්ඝෝෂණයට, ඒ සත්‍යාග්‍රහයට සම්බන්ධ වුණා කියා. ඒ ගතිය, ඒ පුරුද්ද එතුමාගේ ජීවිතයේ අවසාන භාගය වන තෙක්ම තිබුණා. එතුමා ජීවිතයේ කවදාවත් දේශපාලනයෙන් විශ්‍රාම ගියේ නැහැ. ශාරීරිකව සහ මානසිකව එතුමාට හැකියාව තිබුණු අන්තිම දවස දක්වා එතුමා දේශපාලනය කළා.

එතුමා අගනා දරුවන් පස්දෙනකු මේ ලොවට බිහි කළා. ඒ අතරින් සුජිත් කුරේ මැතිතුමා පළාත් සභාවේ ළා බාල මන්ත්‍රීවරයකු හැටියට පානදුරේටත්, විශේෂයෙන්ම කළුතර දිස්ත්‍රික්කයේ ජනතාවටත් ඉතා විශාල සේවයක් කරපු තරුණ මහත්මයෙක්. එතුමාගේ සේවය අගය කරන්නත් මේ අවස්ථාව උපයෝගි කර ගන්නට මා කැමැතියි.

ගරු කථානායකතුමනි, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඩෙන්සිල් ප්‍රනාන්දු මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝකය ප්‍රකාශ කරන අවස්ථාවේ මා මුලසුනේයි සිටියේ. එතුමා ගැන ශෝකය ප්‍රකාශ කරන්නට ඒ අවස්ථාවේ නොලැබීම ගැන මම කනගාටු වෙනවා. එතුමාගේ නිහතමානී එඩිතර දේශපාලනය ගැන සිහිපත් කරමින් මම එතුමාගේ අභාවය පිළිබඳවත් මගේ ශෝකය ප්‍රකාශ කරනවා.

අද මීගමුව ප්‍රදේශයේ ඇති වෙලා තිබෙන සුවිශේෂ තත්ත්වය ගැන අවධානය යොමු කරවන්න මා කැමැතියි. ගරු කථානායකතුමනි, අද ලන්සා මැතිතුමා මුහුණ දී තිබෙන තත්ත්වය බලන්න. ඊයේ එතුමාගේ නිවසට විශේෂ කාර්ය බලකාය ගිහින් තිබෙනවා. අද ජනාධිපතිතුමා යනවා. ගිහිල්ලා එතුමා සනසනවා. හෙට කවුරු යයිද කියා අපි දන්නේ නැහැ. ආයුධ සොයන, ආයුධ භාවිත කරන තත්ත්වයෙන් මිදිලා යුක්තිය සාමය අගය කරන සමාජයක් ප්‍රාර්ථනා කළ යුතු කාලයකුයි අද උදා වෙලා තිබෙන්නේ. ඒ නිසා එවැනි සමාජයක් පිළිබඳව අප තුළ තිබෙන කැපවීම ප්‍රකාශ කරමින් සාමකාමී සහජීවන දේශපාලනයක් වෙනුවෙන් පෙනී සිටි ගරු මර්වින් ජේ. කුරේ මැතිතුමාගේ අභාවය වෙනුවෙන් අපගේ ශෝකය ප්‍රකාශ කරමින් එතුමාගේ ගුණය ගැන වසර ගණනාවකට පසුවත් මතක් කරමින් මේ අවස්ථාවට සහභාගි වන්නට මේ ශ්‍රේෂ්ඨ පාර්ලිමේන්තුවට අද දින පැමිණි, එතුමාගෙන් සේවය ලබපු පානදුර, බණ්ඩාරගම ප්‍රමුඛ කළුතර දිස්ත්‍රික්කයේ විශාල ජනකායටත් මගේ ස්තුතිය පුද කරමින් මම නතර වෙනවා. බොහොම ස්තුතියි.

[අ. භා. 5.13]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මර්වින් ජේ. කුරේ මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ශෝක යෝජනාව ඉදිරිපත් වන මෙම අවස්ථාවේදී මගේත් අදහස් කිහිපයක් එකතු කරන්නට ලැබීම ගෞරවයක් කොට මා සලකනවා. මර්වින් ජේ. කුරේ මැතිතුමා දිවංගත රණසිංහ ප්‍රේමදාස මැතිතුමාත් සමඟ ඉතාමත්ම සමීප සම්බන්ධතාවක් ඇති කර ගෙන පොදු ජනතාවට යුග මෙහෙවරක් ඉටු කරපු අමරණීය, නිර්මල ජන නායකයකු හැටියට මා දකිනවා.

විශේෂයෙන්ම පානදුර මැතිවරණ කොට්ඨාසය කේන්ද්‍ර කර ගෙන කළුතර දිස්ත්‍රික්කයේ සියලුම උපදිසාපති කොට්ඨාසවල ගම් නියම් ගම් සිසාරා දැවැන්ත විදුලි යෝජනා ක්‍රම දියත් කරමින්, අන්ධකාරයේ ජීවත් වුණු ජනතාවට නව දීප්තියක්, ආලෝකයක් උදා කරන්නට එතුමා නායකත්වය ලබා දුන්නා. නිවාස සංකල්පය දියත් කිරීමේදී, දුප්පත්කම තුරන් කිරීමේ වැඩසටහන දියත් කිරීමේදී, ගම හදා රට හදන වැඩසටහන දියත් කිරීමේදී -ජනතාවට බලපාපු සෑම ප්‍රශ්නයකදීම- ජනතාව සුඛිත මුදිත කරවන්නට එතුමා හැම විටම කටයුතු කළා.

එතුමා සතුව ලොකු ආත්මාභිමානයක් තිබුණා; ආත්ම ශක්තියක් තිබුණා. හැම විටම පක්ෂයේ වැඩ කටයුතුවලට සක්‍රියව දායක වුණු එතුමා රෝගාතුර වී හිටපු කාල වකවානුව තුළදීත් එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් ලොකු කැක්කුමකින් සිටියා. එතුමා පක්ෂයේ උන්නතිය තකා ප්‍රායෝගිකව යුග මෙහෙවරක් ඉෂ්ට කළා. එතුමාගේ වියෝව පිළිබඳව අප සියලු දෙනාගේම කනගාටුව පළ කර සිටිනවා. ඒ වාගේම එතුමාට මොක් සුව පතමින් මගේ වචන කිහිපය මෙයින් අවසන් කරනවා.

[අ. භා. 5.15 ]

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු කථානායකතුමනි, අපේ හිත මිත්‍ර, අපි ළඟින් ආශ්‍රය කරපු දේශපාලනඥයකු හැටියට පමණක් නොවෙයි, හොඳ පුරවැසියකු හැටියටත් කටයුතු කළ මර්වින් ජේ. කුරේ මහත්මයාගේ අභාවය පිළිබඳ ආරංචිය අපට ලැබුණාම අපි කනගාටුවට පත් වුණා. මර්වින් ජේ. කුරේ මැතිතුමා අපේ පක්ෂය වෙනුවෙන් විශාල පරිත්‍යාගයක් කළා. එතුමා පක්ෂය වෙනුවෙන් තමන්ගේ ගම් ප්‍රදේශයේ ජනතාවට ඉමහත් සේවයක් කළා. විශේෂයෙන්ම ධීවර ජනතාවට අවශ්‍ය දේවල් ලබා දෙන්න වෙහෙස මහන්සි වුණා. ඒකට උපකාර වන්න වරාය නීතිගත සංස්ථාවේ සභාපති හැටියට තනතුරකුත් එතුමාට ලැබුණා. එතුමා ඒ තනතුර තුළින් පෞද්ගලික ලාභ ප්‍රයෝජන ලැබුවේ නැහැ. එතුමා ජනතාව වෙනුවෙන් වැඩ කළා.

විපක්ෂයේ විශාල පිරිසක් අද මේ සභාවේ කථා කළේ එතුමාගේ ගුණ යහපත්කම ගැනයි; එතුමා මන්ත්‍රීවරයකු හැටියට, ඇමතිවරයකු හැටියට මේ රටට කරපු සේවයත්, ඒ වාගේම තමන්ගේ පළාතට, දිස්ත්‍රික්කයට, ආසනයට කරපු සේවාවත් පිළිබඳවයි. ඒවා නැවත වරක් මා මෙහි සඳහන් කරන්න යන්නේ නැහැ.

මා දන්නවා, ආණ්ඩු පක්ෂයේ කිහිප දෙනකුත් එතුමා පිළිබඳව කථා කරන්න සූදානමින් සිටියත්, කාල වේලාවේ ප්‍රශ්නයකුත් පැන නැඟුණු නිසා අද විශේෂයෙන් ම රජයේ කථාවන් සීමා කරන්න සිද්ධ වුණු බව. එම නිසාම විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් මේ පිළිබඳව කෙටියෙන් කථා කරන්න අපි යෝජනා කළා. කිව යුතු දේවල් රාශියක් තිබෙනවා. ක්‍රීඩා පිළිබඳව මර්වින් ජේ. කුරේ මැතිතුමාගේ ඇල්ම සහ දක්ෂකම් පිළිබඳවත්, ඒ වාගේම මන්ත්‍රීවරයකු හැටියටත්, ඇමතිවරයකු හැටියටත් එතුමා කරපු සේවය පිළිබඳවත් නැවත නැවතත් මා මතක් කරන්න යන්නේ නැහැ.

මේ අවස්ථාවේදී අපේ පක්ෂය වෙනුවෙන් අපේ කනගාටුව ඒ මැතිනියටත්, දූ දරුවන්ටත් පිළිගන්වනවා. හොඳ කතෝලික බැතිමතකු හැටියට කතෝලික පරිසරයක අධ්‍යාපනය ලබා මේ සමාජයට බිහි වෙච්ච පුද්ගලයකු හැටියට එතුමාට මොක් සුව ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ. භා. 5.18 ]

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

ගරු කථානායකතුමනි, ඉතාම කෙටි වේලාවකදී අපේ හිතවත් හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී අභාවප්‍රාප්ත මර්වින් ජේ. කුරේ මැතිතුමා පිළිබඳව කතාවක් කරන්නට සිදු වීම ඉතාමත් කනගාටුදායකයි. සහෝදර මන්ත්‍රීවරයකු හැටියටත්, හොඳ දේශපාලනඥයකු හැටියටත් එතුමා අපට හඳුන්වන්න පුළුවන්.

විනාඩි දෙක, තුනක් පමණයි මට එතුමා ගැන කතා කරන්නට තිබෙන්නේ. බෞද්ධ ජනතාවත්, වෙනත් ආගම්වල ජනතාවත් ඉතා ඉහළින් සම්බන්ධීකරණය කරපු, ඒ සියලු ජනතාව තමන්ගේ විධියට හිතපු එතුමා ඉතාමත් හොඳ කතෝලික මන්ත්‍රීවරයකු වුණා. අපේ අනිකුත් මන්ත්‍රීතුමන්ලා පැහැදිලි කළා වාගේම පානදුර ප්‍රදේශයටත්, කළුතර දිස්ත්‍රික්කයටත් එතුමා ඉතාම හොඳ සේවයක් ඉටු කර තිබෙනවා. ජනතාව ඉතිහාසයේ එතුමාට දැක් වූ සැලකීම අදත් තිබෙනවා. එතුමා ක්‍රීඩාවට ඉතාම උසස් සේවයක් කළා. එතුමා අසනීප වෙලා ඉතාම අමාරුවෙන් සිටි කාලයේදීත් සිනහමුසු මුහුණින් සිටියා. ඒ වාගේම මේ පාර්ලිමේන්තුව තුළදී ආදර්ශවත් මන්ත්‍රීතුමෙකු හැටියට එතුමා කටයුතු කර තිබෙනවා. එතුමා සියලුම පක්ෂවල සියලුම මන්ත්‍රීවරුන්ගේ ආදරය, ගෞරවය දිනා ගත්තා. එවැනි කෙනෙක් අපට අහිමි වීම ඉතාම කනගාටුදායක කාරණයක්.

කාල වේලාව නොමැති වීම නිසා මීට වැඩිය කතා කරන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ. එතුමා අගය කරපු, එතුමා සමඟ ජීවත් වෙච්ච ජනතාවත් වාසනාවන්තයි කියන එක මම මෙහිදී කියන්න ඕනෑ. ඒ වාගේම එතුමා මේ රටට උරුම කර දුන් දූ දරුවන්ට එතුමා වෙනුවෙන් මේ රටටත්, ජනතාවටත් වටිනා ආදර්ශයක් දෙන්න පුළුවන් වේවායි මම සුබ පතනවා. දෙවියන්ගේ ආශිර්වාදයෙන් එතුමාට දෙවියන් දර්ශනය කරන්නට වාසනාව ලැබේවායි ප්‍රාර්ථනා කරමින්, එතුමාගේ අභාවය පිළිබඳව එතුමාගේ හිතවතුන්ට හා ඒ දරු පවුලේ සියලු දෙනාටම මගේත්, මගේ පවුලේත් ශෝකය ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී මර්වින් ජේ. කුරේ මහතාගේ අභාවය පිළිබඳව පාර්ලිමේන්තුවේ දෙපාර්ශ්වයෙන්ම කරන ලද ශෝක යෝජනාවන් අනුමත කරමින් මම ඒ සමඟ එකතු වීමට කැමැත්තෙමි. රැස්වීමට අදාළ නිල වාර්තාවේ පිටපත් ශෝකයට පත් පවුලේ අය වෙත යවන මෙන් පාර්ලිමේන්තුවේ මහලේකම්වරයාට මම නියෝග කරමි.

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම
### சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
### BILLS PRESENTED

### විසර්ජන පනත් කෙටුම්පත, 2012
### ஒதுக்கீட்டுச் சட்டமூலம், 2012
### APPROPRIATION BILL, 2012

"2012 මුදල් වර්ෂයේ සේවා වියදම් සඳහා විධිවිධාන සැලසීම සඳහා ද; ඒ සේවා කාර්ය සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර හෝ ණය ලබා ගැනීමට බලය දීම සඳහා ද; ඒ මුදල් වර්ෂය තුළ ආණ්ඩුවේ ඇතැම් කටයුතු වෙනුවෙන් මූල්‍ය ප්‍රතිපාදන සැපයීම සඳහා ද; එම කටයුතු වෙනුවෙන් ඒ මුදල් වර්ෂය තුළ වියදම් සඳහා අවශ්‍ය වන මුදල් ඒකාබද්ධ අරමුදලින් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් යම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවීමට ඉඩ සැලසීම සඳහා ද; ඒකාබද්ධ අරමුදලට ඒ මුදල් ආපසු ගෙවීමට විධිවිධාන සැලසීම සහ ඉහත කී කරුණු හා සම්බන්ධ හෝ එයට ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලසීම සඳහා ද වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය ගරු දි.මු. ජයරත්න මහතා විසිනි.***

***2011 නොවැම්බර් 21 වන සඳුදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமான மாண்புமிகு டி.எம். ஜயரத்ன அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

***2011 நவம்பர் 21,** திங்கட்கிழமை இரண்டாம்முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கட்டளையிடப் பட்டது.*

*Presented by the Hon. D.M. Jayaratne, Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs; to be read a Second time upon*

*Monday, 21st November, 2011 and to be printed.*

### රාජ්‍ය ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය (සංශෝධන) පනත් කෙටුම්පත
### பாதுகாப்புச் சேவைகள் ஏவல் மற்றும் பணியாட்தொகுதி கல்லூரி (திருத்தம்) சட்டமூலம்
### DEFENCE SERVICES COMMAND AND STAFF COLLEGE (AMENDMENT) BILL

"2008 අංක 5 දරන රාජ්‍ය ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය ගරු දි.මු. ජයරත්න මහතා විසිනි.***

***2011 නොවැම්බර් 08 වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமான மாண்புமிகு டி.எம். ஜயரத்ன அவர்களால் சமர்ப்பிக்கப் பட்டது.*

*2011 நவம்பர் 8, செவ்வாய்க்கிழமை இரண்டாம்முறை மதிப்பிடப் பட வேண்டுமெனவும் அச்சிடப்படவேண்டுமெனவும் கட்டளையிடப் பட்டது.*

*Presented by the Hon. D.M. Jayaratne, Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs; to be read a Second time upon Tuesday, 08th November, 2011 and to be printed.*

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
### பாராளுமன்ற அமர்வு
### SITTINGS OF THE PARLIAMENT

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ සභානායකතුමා වෙනුවෙන් පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා :

"ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2010.07.09 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.00 සිට අ. භා. 6.30 දක්වා විය යුතු ය. අ. භා. 6.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
### தனி உறுப்பினர் சட்டமூலங்கள்
### PRIVATE MEMBERS' BILLS

### මිනුවන්ගොඩ සිංහ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
### மினுவாங்கொட சிங்க மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
### MINUWANGODA SINHA FOUNDATION (INCORPORATION) BILL

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

ගරු කථානායකතුමනි, පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

" මිනුවන්ගොඩ සිංහ පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය."

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***

***පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.***

***වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත සමාජ සේවා අමාත්‍යතුමා වෙත පවරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.*

*இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*

*சட்டமூலம் நிலைக் கட்டளை இல. 47(5) இன்படி சமூக சேவைகள் அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read the First time, and ordered to be printed.*
*The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of Social Services for report.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ශ්‍රී ලංකා ප්‍රජා ඖෂධවේදීන්ගේ සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම, ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා - පැමිණ නැත.

රොෂාන් රණසිංහ ජනසහන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම, ගරු රුවන් රණතුංග මහතා - පැමිණ නැත.

මෙත් සේවා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම, ගරු තිලංග සුමතිපාල මහතා - පැමිණ නැත.

සිත් සෙවන මන්ද මානසික ළමා සංවර්ධන සංවිධානය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම, ගරු තිලංග සුමතිපාල මහතා - පැමිණ නැත.

දිනට නියමිත නියමිත කටයුතු අංක 1- වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනත් කෙටුම්පත දෙවනවර කියවීම - ගරු ෆීලික්ස් පෙරේරා අමාත්‍යතුමා.

## වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනත් කෙටුම්පත
## கரையோரம் பேணல் (திருத்தம்) சட்டமூலம்
## COAST CONSERVATION (AMENDMENT) BILL

***දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

[අ. භා. 5.26]

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා (සමාජ සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா - சமூக சேவைகள் அமைச்சர்)
(The Hon. Felix Perera - Minister of Social Services)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන්, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු කථානායකතුමනි, 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ පනත 1988 අංක 68 දරන පනතින් සංශෝධනය කර තිබුණු අතර, එම සංශෝධනය ප්‍රමාණවත් නොවන බැව් පනතේ නීතිරීති ක්‍රියාත්මක කිරීමේදී පෙනී යන ලදී. ගරු ජනාධිපතිතුමා ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යවරයා වශයෙන් කටයුතු කරමින් සිටි අවධියේදී ශ්‍රී ලංකා වෙරළ සංරක්ෂණය කිරීම සඳහා වූ උත්සාහය ශක්තිමත් කළ යුතු බැවින් වෙරළ දූෂණය, හිරිගල් කැඩීම, වැලි ඉවත් කිරීම මෙන්ම අනවසර ඉදි කිරීම් නැවැත්වීම වැනි අංශ සඳහා පනතේ විධි විධාන තවත් ශක්තිමත් කළ යුතු බැවින් වෙරළ සංරක්ෂණ පනත නැවත සංශෝධනය කළ යුතු බවට තීරණය කරන ලදී.

මෙම සංශෝධනය මඟින් වෙරළ සංරක්ෂණ පනත ක්‍රියාත්මක කිරීම සඳහා විශාල පිටුවහලක් වන බවත් පනතේ තිබෙන අඩු පාඩු පිරිමැසෙන පරිදි වෙරළ සංරක්ෂණ පනත සංශෝධනය කළ යුතු බවත් එතුමාගේ අදහස විය. ඒ අනුව වෙරළ සංරක්ෂණ පනත සංශෝධනය කිරීමට පියවර ගන්නා ලදී. මා එම විෂය භාර අමාත්‍යවරයා වශයෙන් ඉන්න කාලයේ ඒ සංශෝධනය කළා. නව සංවර්ධන කටයුතු සඳහා සංචාරක ව්‍යාපාරය දියුණු කිරීමේදී ද ධීවර ක්ෂේත්‍රයට අදාළ සංවර්ධන කටයුතුවලදී වෙරළ සංරක්ෂණය සහ වෙරළ සම්පත් කළමනාකරණය විශේෂිත වූ අංගයක් බැවින් මෙම සංශෝධනය ඉතා කාලෝචිත බව අවධාරණය කරමි. මෙහිදී වෙරළ සංරක්ෂණය සහ වෙරළ සම්පත් කළමනාකරණය කෙරෙහි දැඩි අවධානයක් යොමු කළ අතර එවන් අවධියකදී වෙරළ සංරක්ෂණ පනත සංශෝධනය කිරීම කාලෝචිත බැව් නැවත වරක් අවධාරණය කරන අතර එම විෂය භාරව හිටපු ඇමතිවරයා වශයෙන් පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

- "වෙරළ සංරක්ෂණ පනත" යන නාමය "වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනත" යනුවෙන් නම් කිරීම.
- "වෙරළ සංරක්ෂණ අධ්‍යක්ෂ" යන නාමය "වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ අධ්‍යක්ෂ ජනරාල්" ලෙස නම් කිරීම.
- "අධ්‍යක්ෂ" යන්න "අධ්‍යක්ෂ ජනරාල්" ලෙස නම් කිරීම.
- "වෙරළ සංරක්ෂණ" යන වචනය "වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණය" ලෙස නම් කිරීම.
- අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහාය වීම සඳහා අධ්‍යක්ෂවරුන්, නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් හා සහකාර අධ්‍යක්ෂවරුන් පත් කිරීමේ හැකියාව ලැබීම.
- අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කාර්යයන් හා කර්තව්‍යය වැඩි කිරීම.
- අධ්‍යක්ෂ ජනරාල්වරයා සතු පනතේ IIIවන කොටසේ ඇති බලතල නොවන අනිකුත් බලතල ප්‍රාදේශීය ලේකම්වරුන්ට හා වෙනත් රජයේ නිලධාරින්ට පැවරීමේ හැකියාව ඇති කිරීම.
- වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ උපදේශක සභාවක් ඇති කිරීම.
- 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත යටතේ වෙරළ කලාපය තුළ බලපත්‍ර ලබා දීමට පෙර ඒ සඳහා වෙරළ සංරක්ෂණ අධ්‍යක්ෂ ජනරාල්වරයාට දන්වා ඔහුගේ අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය බවට නීති ප්‍රතිපාදන ඇතුළත් කිරීම.

  දැනට වෙරළ කලාපය තුළ පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත යටතේ බලපත්‍ර නිකුත් කිරීමේදී වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා නොගෙන සිදු කිරීම නිසා විවිධ පාරිසරික ගැටලු මතු වී ඇති බැවින් මෙම සංශෝධන සිදු කරන ලදී.
- අමාත්‍යවරයාට වෙරළ කලාපයේ හෝ ඊට ආසන්න ප්‍රදේශයක් "බලපෑමට ලක් වූ" ප්‍රදේශ ලෙස නියමයන් ගැසට් කිරීමේ හැකියාව හා එම ප්‍රදේශයේ කිසිදු තහනම් කාර්යයක් නොකළ යුතු බවට ප්‍රතිපාදන ඇතුළත් කිරීම.
- අමාත්‍යවරයා විසින් "වෙරළ උද්‍යාන" හා "සංරක්ෂිත ප්‍රදේශ" නම් කර අදාළ නියමයන් ගැසට් පත්‍රයේ පළ කර ඒ සඳහා අවශ්‍ය රෙගුලාසි සැකසීමේ නීති ප්‍රතිපාදන ඇති කිරීම.

  අමාත්‍යවරයාට යම් වෙරළ උද්‍යානයක් සඳහා අවශ්‍ය රෙගුලාසි සැකසීමේ හැකියාව සංශෝධන මඟින් ලැබේ.

  සංරක්ෂිත ප්‍රදේශයක් ලෙස නියම කරන, විශේෂයෙන් ආරක්ෂා කළ යුතු වෙරළබඩ හෝ ජෛවීය පරිසර පද්ධති තුළ කිසිදු සංවර්ධන කාර්යයක් සිදු කළ නොහැකි අතර, මේ සඳහා ද රෙගුලාසි සැකසීමේ හැකියාව අමාත්‍යවරයාට ඇත.

- අමාත්‍යවරයා විසින් "විශේෂ කළමනාකරණ ප්‍රදේශ" නම් කර නියමයන් ගැසට් පත්‍රයේ පළ කිරීම හා ඒ සඳහා රෙගුලාසි පැනවීමේ හැකියාව.

  මෙහිදී වෙරළ කලාපයට ඇතුළත් ප්‍රදේශයක් හෝ ඊට යාබදව පිහිටි ප්‍රදේශයක් විශේෂ කළමනාකරණ ප්‍රදේශයක් නියම කළ හැකිය. එමගින් මීගමුව, මාදූ ගඟ වැනි විශේෂ පාරිසරික වැදගත්කමක් ඇති ප්‍රදේශ විශේෂ කළමනාකරණ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීමේ හැකියාව ලැබේ.

- "වෙරළ ප්‍රවේශ සැලසුමක්" සකස් කිරීම හා මුහුදට ප්‍රවේශ වීම සඳහා ඇති පාරවල්, පටු මාවත් ආදිය මැන වාර්තාවක් සකස් කිරීමටත්, -සමහර වෙලාවට එම පාරවල් වහලා ඒවා සකස් කිරීමටත්,- පසුව අදාළ සැලසුමට කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු ඒ සඳහා රෙගුලාසි පැනවීමේ හැකියාව ලැබීම.

  දැනට වෙරළ ප්‍රවේශ වීමට ඇති මාර්ග අවහිර කර ඉදි කිරීම් සිදු කර ඇති අතර, මෙමඟින් වෙරළට පිවිසීමට ඇති මාර්ගයන් වැසී ඇත. එබැවින් වෙරළට පිවිසීමට ඇති සියලු මාර්ග පිළිබඳ සමීක්ෂණයක් සිදු කොට අදාළ සැලැස්ම සකස් කිරීම සුදුසුය.

- දැනට පවතින දඩ මුදල වැඩි කිරීම. ඒ අනුව මුල් වරට කරන වරදක් සඳහා අවම දඩ මුදල රුපියල් 5,000ක් හා උපරිමය රුපියල් විසිපන්දහසක් ලෙස සංශෝධනය කිරීම. දෙවන වරට කරන හෝ ඊට පසුව කරන සෑම වරදක් සඳහාම අවම දඩ මුදල් රුපියල් 50,000ක් හා උපරිමය රුපියල් 100,000 දක්වා වැඩි කිරීම.

- "වෙරළ ආරක්ෂණ අරමුදලක්" ඇති කිරීම. අදාළ දඩ මුදල් හා රාජ සන්තක කරන භාණ්ඩවලින් ලැබෙන මුදල් එම අරමුදලට බැර කිරීම.

  මෙම අරමුදලින් අදාළ වැටලීම් සිදු කරන පොලිස් නිලධාරින්ට හා අනිකුත් නිලධාරින්ට ත්‍යාග මුදල් පිරිනැමීමේ හැකියාව ලැබේ.

- වෙරළ කලාපයට අයත් ඉඩම් හෝ ජල ප්‍රදේශ බලපත්‍රයක් නොමැතිව පිරවීම සිදු කළ විට අදාළ පිරවීම් ඉවත් කිරීම සඳහා අලුතින් නීති ප්‍රතිපාදන ඇතුළත් කිරීම.

  දැනට කලපු හෝ වෙනත් ජල තීරයක් පිරවීමක් සිදු කර ඇති විට අදාළ වරද සඳහා දඩ මුදලක් අය කිරීමට පමණක් නීති ප්‍රතිපාදන පවතින බැවින් අදාළ පිරවීම එලෙසම පවතී. මෙම සංශෝධන මඟින් අදාළ පිරවීම් ඉවත් කිරීමේ හැකියාව වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ඇත.

- පොලිස් නිලධාරින්ට වරෙන්තු නොමැතිව වරදකරුවන් අත් අඩංගුවට ගැනීමේ බලය මෙම සංශෝධනය මඟින් ලබා දෙනවා.

  දැනට පොලිස් නිලධාරින් වරෙන්තු නොමැතිව අත් අඩංගුවට ගත හැක්කේ අදාළ වරදකරු ඔහුගේ නම, ලිපිනය ආදිය සැඟවීමක් සිදු කරනවා නම් පමණි. නමුත් එම සංශෝධන මඟින් ඕනෑම වරදකරුවකු වරෙන්තු නොමැතිව අත් අඩංගුවට ගත හැක.

* "වෙරළ කලාපය" ලෙස හැඳින්වෙන බල ප්‍රදේශය වැඩි කිරීම. ඒ අනුව කළපු, ගංගා වැනි ජලය සහිත වෙරළ කලාපයට අයත් ප්‍රදේශයේ භූමිය ගොඩ බිම දෙසට මීටර් 100ක් දක්වා වෙරළ කලාපයට ඇතුළත් කිරීම.

දැනට කලපු, ගංගා වැනි ජලය සහිත ප්‍රදේශයේ කිලෝමීටර් 02ක ප්‍රමාණයක් පමණක් වෙරළ කලාපයට අයත් වේ.

එම ජල ප්‍රදේශ ආසන්න ගොඩ බිමේ සිදු කරන ඉදි කිරීම් වැනි සංවර්ධන කාර්යයන් සඳහා වෙරළ සංරක්ෂණ නීති ආදාළ නොවේ. මෙම සංශෝධන මඟින් ජලය සහිත ප්‍රදේශයේ සිට ගොඩ බිම දෙසට මීටර් 100ක ප්‍රදේශයක්ද වෙරළ කලාපයට අයත් වේ.

අද අපි මේ සංශෝධන ටික අතිගරු ජනාධිපතිතුමා වෙනුවෙන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා.

අපි දන්නවා මුළු ඉඩම් ප්‍රමාණයෙන් සියයට 24ක්, මුළු ජනගහනයෙන් සියයට 32ක්, මුළු නාගරික ඉඩම් ප්‍රමාණයෙන් සියයට 65ක්, සංචාරක හෝටල්වලින් සියයට 80ක් වෙරළ කලාපයට අයත් වන බව. පොදු ජනතාවගේ ආහාරවල අඩංගු විය යුතු ඉතා වැදගත්ම සත්ව ප්‍රෝටීන් අවශ්‍යතාවෙන් සියයට 30ක් ධීවර කර්මාන්තයෙන් සැපයෙනවා. ධීවර කර්මාන්තයේ තිර නිෂ්පාදනය මනාව පවත්වා ගෙන යෑම සඳහා මෙන්ම, රට වැසියන් සහ විදේශ සංචාරකයන් සඳහාද වැදගත් වන දර්ශනීය පරිසරයක් ද අපේ මුහුදු කලාපයේ තිබෙනවා. හිරිගල් පර සහ කඩොලාන අයත් වන්නා වූ පොහොසත් ජීව විවිධත්වයක් ද අයත් වන්නේ වෙරළ කලාපයටයි.

ඉතින් මේ කරුණු බොහොම වැදගත්. මේ ගැන කරුණු රාශියක් කියන්න තිබෙනවා. පක්ෂ නායකයන් අද මේ පනත් කෙටුම්පත සම්මත කරන්න එකඟතාවකට පත් වෙලා තිබෙනවා. විපක්ෂය මේ පනත් කෙටුම්පතට එකඟ වෙලා තිබෙනවා. ඒක මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

මුහුද පිළිබඳව අපි වඩාත්ම සැලකිලිමත් වන්න ඕනෑ. මුහුදු නැති රටවල් රැසක් තිබෙනවා. නමුත් අපට මුහුදක් තිබෙනවා. ප්‍රවාහනය කිරීමේදී අද විශේෂයෙන්ම වැදගත් වන්නේ මුහුදෙන් කරන ප්‍රවාහනයයි. අද පිරිමැසුම්දායක ප්‍රවාහන ක්‍රමය බවට පත් වෙලා තිබෙන්නේ එයයි. මෙවැනි කරුණු කාරණා සලකා බලද්දී අපේ රට වටේම මුහුදක් තිබීම නිසා අපි වාසනාවන්ත වෙලා තිබෙනවා.

මට මතකයි, මම ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය භාරව ඉන්න කාලයේ අපි කියලා, මුහුද මැනලා මඩ තට්ටුවේ -අවසාදිත තට්ටුව- කිලෝමීටරයක් දක්වා අයිතිය ලබා ගත්තා. එය ලංකාව මෙන් හත් ගුණයක් තිබෙන මුහුද තව දහසය ගුණයකින් වැඩි කර ගන්න උදවු වෙලා තිබෙනවා. තෙල් සම්පත සහ ගෑස් සම්පත අපට හිමි වෙන බව අතිගරු ජනාධිපතිතුමා ප්‍රකාශ කළා. ඒක සන්තෝෂදායක ආරංචියක්. ඒ නිසා මුහුද අපට වැදගත් වනවා. මුහුද පිළිබඳව කියන් බොහෝ දේවල් තිබෙනවා.

මේ අනුව කල්පනා කරද්දී මෙම සංශෝධන ඉතාම වැදගත් බව මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න ඕනෑ. ඒ වාගේම අපි දන්නවා පසු ගිය කාලයේ උතුරු සහ නැඟෙනහිර මුහුදෙන් තුනෙන් දෙකකම අයිතියක් අපට තිබුණේ නැති බව. නමුත් අද ඒ මුහුද අපට තිබෙනවා. සංචාරකයන්ගේ පැමිණීම විශාල ලෙස සිදු වන්නේ අපට මුහුද ආශ්‍රිතව තිබෙන නිසා. අපට සුන්දර මුහුදක් තිබෙනවා.

හිරි ගල් ආශ්‍රිතව තිබෙන සුන්දරත්වය නිසා අද මාලදිවයිනට ලොකු ආර්ථික ආදායමක් ලැබෙනවා. අපටත් ඒ ආර්ථික ආදායම ලබා ගන්න පුළුවන් ස්ථාන රැසක් තිබෙනවා. මෙතෙක් ඒවා නොලැබීමට ප්‍රධාන හේතුව පසු ගිය කාලයේ තිබුණ යුද්ධයයි. ඒ නිසා ලංකාව වාගේ රටක් ගැන අපි සංතෝෂ වන්නට ඕනෑ. අද අතිගරු ජනාධිපතිතුමා මුදා ගත්තේ භූමිය පමණක් නොවෙයි. ඒ අනුව ලංකාව වාගේ හත් ගුණයක මුහුදක් ලබා ගන්නත් අපට හැකියාව ලැබුණා. ඒ නිසා අද මේ ගෙනෙන ලද සංශෝධනය ඉතාම වැදගත් සංශෝධනයක් බව මගේ පෞද්ගලික මතයයි. ඒ පිළිබඳව කරුණු කාරණා රැසක් කියන්න පුළුවන්.

[ගරු ෆීලික්ස් පෙරේරා මහතා]

මුහුදේ විපර්යාස ඇති වනවා. අපට සුනාමිය ආවා. අද ඝන අපද්‍රව්‍ය මුහුදට යවනවා. අද අපද්‍රව්‍ය කළමනාකරණය ලෝකයේ නගරවලට ප්‍රධාන අභියෝගයක් වෙලා තිබෙනවා. පෘථිවි ගෝලයට වාර්ෂිකව එකතු වන අපද්‍රව්‍ය ප්‍රමාණය ටොන් මිලියන 400ක් කියලා තමයි කියන්නේ. කාර්යක්ෂමතාව සහ කාර්යසාධනය මඟින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය නිසි ලෙස සිදු නොවීම නිසා පාරිසරික ප්‍රශ්න, දුර්ලභ සතුන් මිය යෑම, රෝග බෝ වීම ඇත්ත වශයෙන්ම සිදු වෙනවා. ඝන අපද්‍රව්‍ය පිළිබඳ කළමනාකරණය සඳහා දිගු කාලීන මූලෝපාය සැකසීම පිළිබඳව අඩු මට්ටමක සැලකීමක් තිබෙන්නේ දකුණු ආසියානු රටවලයි. නමුත් අපි ඒ කටයුත්තත් කර ගෙන යන්න ඕනෑ.

මම මේ කාරණය මතක් කරන්න ඕනෑ. ආසියාවේ ප්‍රධාන නගර ආශ්‍රිතව ඝන අපද්‍රව්‍ය උත්පාදනය 2007 වර්ෂයේ කෙසේ සිද්ධ වුණාද කියන එක ප්‍රකාශ කර තිබෙනවා. ඉන්දියාවේ දිල්ලියේ දිනක ඝන අපද්‍රව්‍ය උත්පාදනයට පුද්ගලයකුගේ දායකත්වය දශම 47යි. බංගලාදේශයේ දශම 50යි. නේපාලයේ කත්මණ්ඩුවල දශම 30යි. සිංගප්පූරුව දශම 64යි. කොළඹ දශම 62යි. ඒක පැහැදිලි වෙනවා නේ. ඒ නිසා තමයි ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා, ඒ වාගේම අපේ ආණ්ඩුව, අතිගරු ජනාධිපතිතුමා මේ අපද්‍රව්‍ය කළමනාකරණය ගැන සැලකිල්ලක් දැක්වුවේ. පසු ගිය කාලයේ මේ විධියට සැලකිල්ලක් දැක්වුවේ නැහැ. කොළඹ කුණු කඳු ගොඩ ගහලා තිබුණා. ඒ වාගේම මළ අපද්‍රව්‍ය මුහුදට යැව්වා. කාන්දුවන තෙල්වලින් අපේ මුහුද ආරක්ෂා කර ගන්න සිද්ධ වුණා. දකුණු ආසියානු කලාපය තුළ ටොන් මිලියන එකක පමණ කැළි කසළ උත්පාදනය වෙනවා.

විශේෂයෙන්ම 2007 වර්ෂයේ දී ශ්‍රී ලංකාව ඇතුළු සෑම රටක්ම Asian Productivity Organization මඟින් පැවැත් වූ සමුළුවලට සහභාගි වූ අතර, එහි දී එම රටවල ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා එකඟතාවකටත් පැමිණ තිබෙනවා.

මුහුද අපට ගොඩක් වැදගත් වෙනවා. ජනතාව මුහුද ආශ්‍රිතව ඉන්න විශේෂයෙන් කැමැතියි. මුහුද ධීවර ප්‍රජාවගේ ජීවනෝපාය සලසනවා. ඒ වාගේම අනෙක් පැත්තෙන් මුහුද සංචාරක කර්මාන්තයේ එක පැතිකඩක්. ඒ වාගේම ස්වාභාවික සම්පත්වලින්, ජෛව විවිධත්වයෙන් අනූන සුවිශේෂ කලාපයක්. ඒ නිසා වෙරළ සංරක්ෂණයේ වටිනාකම තේරෙනවා ඇති.

ඊළඟට වෙරළ ඛාදනය ගැන කියන්න ඕනෑ. වෙරළ ඛාදනය සිද්ධ වනවා. ඊසාන දිග මෝසම් සුළංවලිනුත්, නිරිතදිග මෝසම් සුළංවලිනුත් වෙරළ ඛාදනය වනවා. ජනවාරි -පෙබරවාරි කාලයේ මීගමුව පැත්තේ ඉඳලා මේ පැත්තට වැලි එනවා. අනෙක් කාලයේ අනෙක් පැත්තට යනවා. ධීවර වරායක් හැදීමේ මූලික ක්‍රමවේදයට අනුව අපි සාමාන්‍යයෙන් ඒ ප්‍රදේශවල හදන්නේ ජනවාරි-පෙබරවාරි මාසවලයි. එහෙම හදද්දී මීගමුව පැත්තෙන් එන වැලි ටික ගොඩ ගැහෙනවා. ඒවා ඉවත් කරන්න සිද්ධ වනවා.

ගරු ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමා ඊයේ පෙරේදා කැපුන්ගොඩ දියකඩනය ගැන කථා කළා මට මතකයි. ධීවරයන්ගේ ඉල්ලීම පිට අපි ඒක වරායක් කළා. වරක් වැලි ඉවත් කළාට පස්සේ අවුරුදු දෙක තුනකින් තමයි නැවත වරක් පිරෙන්නේ. අනෙක් පැත්තෙන්, ගංගා ආශ්‍රිතව තිබෙන වැලි ඇවිල්ලා, ඒ වැලිවලින් මුහුද ඛාදනය වීම සිද්ධ වෙනවා. අපේ කාලයේ නම් tyre retaining walls දමලා ඉතාම අඩු පිරිවැයකින් මුහුදු ඛාදනය අඩු කර ගන්න පුළුවන් වුණා. ඒ එක පැත්තක්. අනෙක් පැත්තෙන් ස්වභාව ධර්මයට අනුකූලතාවක් දක්වන සැලසුම්වලින් අපට මුහුද ඛාදනය නතර කර ගන්න පුළුවන් වුණා. අපට මේ වැලි අවශ්‍යයි. නමුත් ඒ වැලි නිසා ඇති වන ප්‍රශ්නය ඉතාම භයානක තත්ත්වයකට පත් වනවා.

මම තවත් කාරණයක් කියන්න ඕනෑ. කවුරු මොනවා කිව්වත් සාමාන්‍ය බෝට්ටුවක් සඳහා අවශ්‍ය draught එක මීටර් 3.5යි. හම්බන්තොට වරාය ගැන කවුරුත් කථා කළා. මටත් ඒ ගැන පුංචි අවබෝධයක් හරි තිබෙනවා. ඒකේ මීටර් 17ක් ගැඹුර තිබෙනවා. එක තැනක හැර අනෙක් තැන්වල මීටර් 17ක් තිබෙනවා. කාටවත් ඒක නැහැ කියන්න බැහැ. මීටර් 3.5ට වැඩි නම් අඩි 100ක නැවක් ගන්න පුළුවන්. ධීවර යාත්‍රාවක් පැමිණෙන්න නම්, විශේෂයෙන්ම ජාත්‍යන්තරයෙන් එන විශාල ධීවර යාත්‍රාවලට අවකාශය සලසනවා නම් මීටර් 5ක් අවශ්‍යයි. ඒක තමයි ඇත්ත. මට මතකයි නිල්වැල්ල වරායේ මීටර් අටක් තිබුණා. සුනාමියෙන් ධීවර වරායවල් 13ක් විනාශ වුණා. අපි ඒවා හැදුවා. ඒක කළමනාකරණය කරලා තිබෙනවා. එක පැත්තකට යන්න බැරි වුණාට මේ පැත්තෙන් ඒ කටයුතු කළමනාකරණය කළා. ඒ වාගේම ග්‍රීසියට කථා කරලා මීගමුව ධීවර වරායට රුපියල් ලක්ෂ 2,600ක් අර ගෙන දුන්නා. ඔබතුමා දන්නවා ඇති එවකට හිටපු අමාත්‍යතුමාගේ ඉල්ලීම පිට අතිගරු ජනාධිපතිතුමා බේරුවලට, රුපියල් බිලියනයක් දුන්නු බව. වෙරළ ආරක්ෂා කරන්න එවැනි කාරණා රැසක් අපි ඉෂ්ට කරලා තිබෙනවා.

වෙරළ සුන්දරයි. වෙරළ උද්‍යාන ඇති කරන්න පුළුවන්. ඒ නිසා අපි වෙරළට ආදරය කරන්න ඕනෑ. නටබුන් බලන්න එන සංචාරකයන් ප්‍රමාණයයි, මුහුදු වෙරළට එන සංචාරකයන් ප්‍රමාණයයි අතර ලොකු පරතරයක් තිබෙනවා. බටහිර රටවලට මුහුදක් නැහැ, තිබුණත් පාවිච්චි කරන්නට බැහැ, වෙරළේ සැරිසරන්න බැහැ. ඒ නිසා මුහුදු වෙරළ ආශ්‍රිත කටයුතුවලට තමයි සංචාරකයන් වැඩි ප්‍රමාණයක් මෙහාට එන්නේ.

ඊයේ පෙරේදා පැවැති ආසියානු වෙරළ ක්‍රීඩා උළෙල පළමු වරට අපි පැවැත් වූවා. බලන්න, ආසියාවේ පළමුවන වරටයි අපි එය පැවැත් වූයේ. වෙරළ අපට සම්පතක්. අපි වෙරළ රැක ගන්න ඕනෑ; සංරක්ෂණය කරන්න ඕනෑ. එසේ සංරක්ෂණය කරද්දී මේ සංශෝධන අවශ්‍ය වනවා.

අපි අද සන්තෝෂ වනවා, මුහුද පිළිබඳ විශේෂඥ දැනීමක් තිබෙන නායකයෙක් අපේ ජනාධිපතිතුමා වෙලා සිටින එක ගැන. අපේ චමල් රාජපක්ෂ මැතිතුමාටත් මුහුද පිළිබඳව විශාල දැනීමක් තිබෙනවා.

මට මතකයි, කිරින්ද වරාය ගැන මොන චෝදනා කළත්, කිරින්ද වරාය සාදද්දී ජපානය වරද්දා ගත්තා. පුංචියට හදන්න ගියා, වරද්දා ගත්තා, ආපහු ලොකු වරායක් බවට පරිවර්තනය කළා. ඒකත් වැරදුණාට පස්සේ අපට තෑග්ගක් දීලා ගියා. මොකද, එතැනට නිතරම වැලි පිරෙන බව දන්නවා. ඒ නිසා යන්ත්‍රයක් දීලා ගියා, ඒක ශුද්ධ කර ගන්නය කියලා. ඒක තමයි ඇත්ත කතන්දරය. ඒ වාගේමයි පානදුර වරායත්. චීනයෙන් අගමැතිතුමා ඇවිත් ප්‍රදානයක් කරලා හැදුවා; වැරදුණා. චීනයට කථා කරලා ලක්ෂ තුන්දාහක් අරගෙන දුන්නා. ඉතින් සතයක්වත් වියදම් වන්නේ නැතුව ඒ කාර්යය කර ගත්තා. දැන් දිය කඩනයක් දාලා අපි එය ප්‍රතිසංස්කරණය කරලා තිබෙනවා. ඒ සේරම කරන්න අපට ශක්තිය ලැබුණේ ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේයි. මොකද, එතුමා මේ විෂයය දන්න නිසා එතුමාට යමක් කියපුවාම සවන් දීලා,"ඔව්, ඒක හරි, වහාම ක්‍රියාත්මක කරන්න" කියලා එතුමා ඒ කටයුත්ත කළා.

මම මේ ගැන සන්තෝෂ වනවා. මුහුද ආරක්ෂා කරන්න ඒ රාජපක්ෂ නායකත්වය අවශ්‍යයි. නැත්නම් මුහුද කාටවත් ආරක්ෂා කරන්න බැහැ. මුහුදෙන් තමයි සියලු දේවල් සිද්ධ වන්නේ. කුඩු ටික එන්නේ, ත්‍රස්තවාදය එන්නේ මුහුදෙන්. මෙහෙන් හොරකම් කරලා රට පනින්නේ මුහුදෙන්.

ඔබතුමන්ලාට මතක ඇති ඉස්සර මන්නාරම පැත්තේ අය, යාපනය පැත්තේ අය ෆිල්ම් එකක් බලන්න ඉන්දියාවට ගිහිල්ලා එනවා. ඒ කාලයේ අපේ ලංකාව ඉන්දියාවට වඩා පොහොසත්. මෙහාට ඇවිල්ලා තමයි මොනවා හෝ අරගෙන යන්නේ. දැන් එහෙම නොවෙයි. ඉස්සර අපට මෙහේ හාල් පොලු දමන්න වුණේ ඉන්දියාවට හාල් ටික පටවපු නිසා. ඉන්දියාවේ දුප්පත්කම වැඩි වුණා. අපි ත්‍රස්තවාදයෙන් බැට කාලා තමයි මේ තත්ත්වයට ආවේ.

මාලදිවයින මිනිස්සු අපට බොන්ඩි අළුවා විකුණපු අය; මුහුද තියා ගෙන ජීවත් වුණු අය. ඒ නායකයෝ ඉගෙන ගත්තේ මෙහේ. නමුත් මොකක්ද වුණේ? ත්‍රස්තවාදය නිසා අපට මුහුදත් නැතිව ගියා; මුහුදෙන් තුනෙන් දෙකක් නැතිව ගියා. අද ඒ නැති වුණ මුහුද අපට ලැබිලා තිබෙනවා. එය කළමනාකරණය කරන්න ජනාධිපතිතුමා ගන්න උත්සාහය ගැන අපි එතුමාට ප්‍රශංසා කරන්න ඕනෑ. ඊ ළඟට, මම කියන්න ඕනෑ, මොන චෝදනා කළත් අද අපි මුහුද ආරක්ෂා කරන්න ඕනෑ බව.

හම්බන්තොට ගැන නොයෙකුත් කතන්දර කියනවා. මා එදාත් කිව්වා මේ ගැන ඇත්ත කතන්දරය. අද බංග්ලාදේශයේ ඇඟලුම් කර්මාන්තවල සියයට 48ක වර්ධනයක් තිබෙනවා. නමුත් වරායක් නැහැ. ඒ ගොල්ලෝ ලොකු නැව්වල ගෙනැල්ලා, feeder shipsවලින් ගිහින් තමයි ඒ බඩු බා ගන්නේ. අපට ඒ කටයුත්ත කරන්න පුළුවන්. ඒ අය සිංගප්පූරුවට ගිහින් එතැනින් feeder shipsවලින් ගෙනත් බා ගන්නවා. නමුත් අපට හම්බන්තොට වරාය පාවිච්චි කරන්න පුළුවන් වුණොත් ඒ සඳහා ඕනෑ තරම් අවකාශය තිබෙනවා; ලොකු ආර්ථික ප්‍රගතියක් අපට ලබා ගන්න පුළුවන්. එකවරට වරායවල් පහක් හදන්න ජනාධිපතිතුමා තීරණය කර තිබෙනවා.

වෙරළ කියන එක අපට වැදගත් වනවා. ඒ වෙරළ ඛාදනය වන්නට දෙන්නේ නැතුව බලා ගත යුතු ගමන්ම, වෙරළ සංරක්ෂණය කරන්න සහ වෙරළ සුපරීක්ෂාකාරීව බලා තියා ගන්නත් අපි කැමැති වන්න ඕනෑ. වෙරළ ආරක්ෂක බල කායත් අද රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය යටතේ තිබෙනවා. මේ වෙරළ ආරක්ෂා කරන්න හොඳ රේඩාර් පද්ධතියක් අපට අවශ්‍ය වෙලා තිබෙනවා. මොකද, විදේශ නැව් ඇවිල්ලා, තෙල් ටික මෙහේ හළලා ගියොත් මත්ස්‍ය සම්පත හීන වන්නට පුළුවන්.

අපි දන්නවා, අපේ ලංකාවේ මුහුදු පැළෑටි වවන්න පුළුවන් බව. මුහුදු පැළෑටි ඕනෑ තරම් වවන්න පුළුවන්. ජපානයේ හැම ආහාරයකටම මුහුදු පැළෑටියක් ඔතලා තමයි දෙන්නේ. මොකද, ඒ ගොල්ලන්ගේ සෞඛ්‍ය තත්ත්වය රැක ගන්න. ඒ පැළෑටි anti-ageing. වයසට යාම වළක්වන ද්‍රව්‍යයක් විධියට seaweeds අද හඳුනා ගෙන තිබෙනවා. ඒ කියන්නේ seaweeds පාවිච්චි කරන අයකුගේ වයස පෙනෙන්නේ නැහැ. අඩු වයසක් පෙන්නුම් කරනවා කියලා තමයි කියන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි, ඔබතුමා වාගේ.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
අපේ ගරු කථානායකතුමාත් seaweeds ගන්නවා, සමහර වෙලාවට. අපේ නායකතුමා-

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
හම්බන්තොට නේ.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
ඒක තමයි ලස්සනට ඉන්නේ. මුහුද ආශ්‍රිත සියලු දේ දන්න හින්දා.

මම කියන්න කැමැතියි, අනාගතයේදී මුහුද ආරක්ෂා කර ගන්න, ආරක්ෂක අමාත්‍යාංශයේ මැදිහත් වීමක් අවශ්‍ය බව. මුහුදින් අපට ලොකු භයානක තත්ත්වයක් උද්ගත වන්නට පුළුවන්.

අපට තෙල් තිබුණා නම් ගඩාපිට වෙච්ච දේ තමයි අපටත් වෙන්නේ. ඇත්තම කියනවා නම් පරක්කු වෙලා තෙල් හම්බ වෙන එක හොඳයි. නැත්නම් ගඩාපිට වෙච්ච දේ අපටත් වෙනවා. ඇයි අපට බටහිර ලෝකයේ බලපෑම් ඇති වෙන්නේ? මේ තෙල් සම්පත ගැන ඒ ගොල්ලන්ට ඉවක් තිබෙනවා. එම නිසා ශක්තිමත්, ප්‍රභාව තිබෙන නායකයකුට පමණයි, නැමෙන්නේ නැති නායකයකුට පමණයි මේ රට රැක ගන්න පුළුවන්. එහෙම නම් අපේ ජනාධිපතිතුමාට මුහුද පිළිබඳව අවබෝධයක් තිබීම ගැනත් අප ආඩම්බර වෙනවා. ඉදිරි අනාගතයේදී අපේ ආර්ථික ශක්තිය ගොඩබිමටත් වඩා මුහුදෙන් ලබා ගන්න පුළුවන්. අපේ කාලයේ අප බොහෝ දේවල් කළා. ටූනා මසුන් අප export කළා. එය කරන ගමන් අප logo එකක් හැදුවා, "Sri Lanka Tuna" කියලා. ඒ, "ශ්‍රී ලංකා තේ" වාගේ. ඩොලර් එකක් වැඩිපුර ලැබෙනවා, ඒ logo එකට. මෙවැනි කාරණා ගැන අවධානය යොමු කරන්න නම් අපට හොඳ මුහුදක් ඕනෑ; හොඳ වෙළෙඳ ප්‍රතිපත්තියක් ඕනෑ. ඒ හැම එකක්ම කරන්න සිද්ධ වන්නේ අපට මුහුද කළමනාකරණය කරමින් තමයි.

ගරු කථානායකතුමනි, මට තව කාලය තිබෙනවාද?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් අවසන් කළොත් හොඳයි.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
කවුරුත් නැහැ නේද කථා කරන්න?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඉන්නවා.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
එහෙම නම් මා ඔබතුමාට කීකරු වෙලා මගේ කථාව අවසන් කරන්නම්. ඔබතුමාට කීකරු වෙන්න එපායැ. මොකද, අපේ ගරු ජනාධිපතිතුමාත් සිංහල අලුත් අවුරුද්ද දවසේදී ඔබතුමාට නැමිලා වැඳලා නේ අවුරුද්ද පටන් ගන්නේ. එම නිසා ඔබතුමාට කීකරු වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

***ප්‍රශ්නය සභාහිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මී ළඟට ගරු ජෝශප් මයිකල් පෙරේරා මහතා.

[අ. භා. 5.49]

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

ගරු කථානායකතුමනි, මගේ හිතවත් ෆීලික්ස් පෙරේරා මැතිතුමා අද බොහොම සන්තෝෂයෙන් කථා කළා. [බාධා කිරීමක්] නැහැ, අද විශේෂයි. මම දන්නේ නැහැ, මොකකක්ද හේතුව කියලා. එතුමා දන්නවා ඇති නේ. [බාධා කිරීමක්] ඒ කොහොම වුණත් අද එතුමා දෙවන වර කියැවීම සඳහා ඉදිරිපත් කරපු ජනාධිපතිතුමාගේ අමාත්‍යාංශය යටතේ තිබෙන වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව අපේ විරුද්ධත්වයක් නැහැ. ඒ කාරණය පළමුවෙන්ම ප්‍රකාශ කරන්නට ඕනෑ. නමුත් මේ සංශෝධන ගැන බැලුවාම මට හිතෙන විධියට මේ කාල වේලාවත් මදි මේ පනත ගැන අපට කතා කරන්න. ගරු ෆීලික්ස් පෙරේරා අමාත්‍යතුමා කිව්වා වාගේ මේක පුළුල් විෂයයක්. මුළු රටම වැලඳ ගන්න, මුළු රටේම සංවර්ධනය සහ සමාජයීය වැඩසටහන්වල කොටස්කාරයන් වන වැඩ පිළිවෙළක අයිතිය තමයි මේ සංශෝධනවලින් ලබා ගන්න යන්නේ.

ගරු කථානායකතුමනි, මේ වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනත් කෙටුම්පත දිහා බැලුවාම අපට මේ පනත් කෙටුම්පත තුළ තිබෙන ඇතුළාන්තය කුමක්ද කියලා තේරුම් ගන්නට පුළුවන්. එහෙම තේරුම් ගන්න පුළුවන් වන්නේ විශේෂයෙන්ම මේ ඉදිරිපත් කරලා තිබෙන පනත් කෙටුම්පත, 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ පනත සංශෝධනය කිරීම සඳහා ද 1968 අංක 15 දරන ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව පනතේ සහ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ ඇතැම් විධිවිධාන සංශෝධනය කිරීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහා ද වූ පනත් කෙටුම්පතක් වීම නිසායි. මේක වෙරළ සංරක්ෂණයට විතරක් නොවෙයි ඊට එහායින් ගිය පනත් කෙටුම්පතක්. මේ කාරණා සියල්ලම දැන් සංශෝධනය කිරීමෙන් සහ මේ විධිවිධාන සැලැස්වීමෙන් බලාපොරොත්තු වන්නේ වෙරළ සංරක්ෂණ වැඩ පිළිවෙළ යටතට මේ කාරණා ගෙන ඒමයි.

එතුමා කිව්වා වාගේ අද මුහුදට සම්බන්ධ විශාලතම කර්මාන්තය වෙලා තිබෙන්නේ ධීවර කර්මාන්තයයි. ඊට එහායින් මුහුද හා සම්බන්ධව බලන කොට මුහුදේ තිබෙන සම්පත් සමීක්ෂණය කිරීම සඳහා ඒවා ප්‍රයෝජනයට ගැනීම සඳහා අතිවිශාල වැඩ කොටසක් කරන්නට සිද්ධ වෙනවා. ඒවා සොයා බැලීමට තිබෙනවා, නාරා ආයතනය. ඒ යටතේම තවත් ආයතන කිහිපයක් පිහිටුවලා තිබෙනවා, වෙරළ සංරක්ෂණය පිළිබඳව, වෙරළේ හැසිරීම් පිළිබඳව, වෙරළේ තිබෙන විවිධ සම්පත් සොයා ගැනීම පිළිබඳව. ඒ අනුව තමයි ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ කාලයේදී නාරා ආයතනය ඇති කළේ. ඒ කාල පරිච්ඡේදය තුළ ඒ ගත්ත ක්‍රියා මාර්ගවල තවත් ඉදිරියට යාමක් හැටියට තමයි අප මේ කටයුත්ත දකින්නේ. ඒ ඉදිරියට යාමේදී ඒකට සම්බන්ධ වෙනවා මුහුද ආශ්‍රිතව ගොඩබිමේ ඇති වෙන වෙනත් කර්මාන්ත. නිවාස සෑදීම, සංචාරක ව්‍යාපාරය, වෙරළ උද්‍යානය පිළිබඳව, ඒ වාගේම කර්මාන්තශාලාවලින් අපද්‍රව්‍ය වෙරළට ගලා යාම පිළිබඳව ආදී විශාල වැඩ කොටසක් මේ කටයුත්ත යටතේ සම්බන්ධ වෙනවා. මා මෙතැනදී පක්ෂය වෙනුවෙන් මේ පනත් කෙටුම්පත පිළිබඳව අපේ විරුද්ධත්වයක් නැහැයි කියන ගමන්, මෙය ක්‍රියාත්මක කරන ස්වභාවය පිළිබඳව අපට ප්‍රශ්න තිබෙන බව කියන්න ඕනෑ. ඉදිරියේදීත් ඒවා ඇති වෙනවා. දැනුත් ඇති වෙලා තිබෙනවා. [බාධා කිරීමක්] ඔබතුමා මතක් කළා, කැපුන්ගොඩ නැංගුරම් පොළ පිළිබඳව. [බාධා කිරීමක්] හොඳයි.

ගරු ෆීලික්ස් පෙරේරා ඇමතිතුමනි, දැන් තමුන්නාන්සේ කථා කරලා ඉවරයි නේ. මට දැන් අවස්ථාව දෙන්න. [බාධා කිරීමක්] සන්තෝෂයෙන් ඉන්නවා කියලා මා කිව්වේ මේ අලුත් සංශෝධනය සම්මත වෙලා එන කොට -

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
මේක අපේ ජනාධිපතිතුමා යටතේ නේ තිබෙන්නේ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

ජනාධිපතිතුමා යටතේ තිබෙන මේ අමාත්‍යාංශයට ගරු අමාත්‍යතුමනි, තමුන්නාන්සේ පත් කරයිද කියන අදහසකුත් තිබෙනවා. මොකද ඔබතුමා තමයි අද මේ පනත් කෙටුම්පත දෙවන වර කියැවීම සඳහා ඉදිරිපත් කළේ. ඒක මා හිතන හැටියට ඔබතුමාට දැනට තිබෙන අමාත්‍යාංශයටත් -සමාජ සේවා අමාත්‍යාංශයටත්- වැඩිය හුඟක් හොඳයි. මේ අමාත්‍යාංශය දුන්නොත් තමුන්නාන්සේ ගන්නේ නැති වුණාට, තමුන්නාන්සේ මුහුද පිළිබඳව, ධීවර කටයුතු පිළිබඳව, වෙනත් කටයුතු පිළිබඳව හොඳට වැටහීමක් තිබෙන කෙනෙක්. ඒ නිසා මේ අමාත්‍යාංශය දුන්නාට වරදක් නැහැ; ගත්තාට වරදකුත් නැහැ. අපේ පළාතටත් බොහොම ප්‍රයෝජනයි. මම ඒකයි කිව්වේ ඔබතුමා බොහොම සන්තෝෂෙන් ඉන්නවා කියලා. නමුත් මෙතැනදී අර පළාත් සභාවේ අයත් එක්ක හැප්පෙන්න යන්න එපා. ඒක තමයි අපට තිබෙන ප්‍රශ්නය.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
කාත් එක්කද?

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
තමුන්නාන්සේ දන්නවා නේ?

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
මාත් එක්ක හැප්පෙන්න බැහැ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
අන්න ඒක තමයි මාත් කිව්වේ. ඔබතුමා එක්ක කාටවත් හැප්පෙන්න බැහැ.

දැන් මෙතැනදී මම පැහැදිලිව කිව්වේ අපේ ප්‍රදේශයේ තිබෙන කාරණා දෙකක් ගැනයි. එකක් තමයි තමුන්නාන්සේ මැදිහත් වෙලා හදපු දික්ඕවිට වරාය. මේ වරාය තවම ක්‍රියාත්මක වන්නේ නැහැ. මේ වරාය ක්‍රියාත්මක නොවෙන නිසා, ධීවරයන්ට දික්ඕවිට වරායට යන්න බැරි නිසා වෙනත් නැංගුරම් පොළවල් ඇති කරලා ඒ අයට ඒ පහසුකම් දෙන්න හැදුවත් ඒවා අසාර්ථක වෙලා තිබෙනවා. ඒ වාගේම කැපුන්ගොඩ ඒ නැංගුරම් පොළ - දියකඩනය කිව්වා. ඊට පස්සේ නැංගුරම් පොළ කිව්වා. දැන් මොකක්ද දන්නේ නැහැ එතැන තිබෙන්නේ.- දැන් වැලිවලින් පිරිලා.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
විස්තර මම දෙන්නද?

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
අනේ එපා. දැන් ඇති නේ ඔය කිව්වා.

බේරුවල ගැනත් කිව්වා. විවිධ කතන්දර කිව්වා. දැන් මේ හැම දෙයක්ම ගොඩ වෙනවාය කියන කථාවක් තමයි කියන්නේ. හදපු හැම වරායක්ම වාගේ -නැංගුරම් පොළවල් හැටියට අලුතින් හදපුවා- ගොඩ වෙනවා. ගරු කථානායකතුමනි, මේවා හුඟක් හදලා තිබෙන්නේ දේශපාලන වුවමනාවන් උඩයි. එක්කෝ ඡන්දයක් මුල් කරගෙන. එහෙම නැත්නම් මැති ඇමතිවරුන්ගේ හිතුවක්කාරකමට. මොකද මේ ගැන මම අහද්දී එතුමා කිව්වා, "මෙහෙමයි කරන්න ඕනෑ, මෙහෙමයි කරන්න ඕනෑ, මේක කරලා තිබෙනවා හරි නැහැ" කියලා. එහෙම කිව්වා කැපුන්ගොඩ ගැන.

හැබැයි, අද නම් ඒක වෙන විධියකටයි එතුමා කිව්වේ. ඇත්ත කතන්දරය මේකයි. අද මේවායින් ඇති වන යහපත තමයි මේවා පිරිව්වාම අර හාරන ඒවා දමලා වැලි අරගෙන ගිහිල්ලා වෙනත් තැන්වලට දමන එක. අපට පැහැදිලි කරලා කියන්න පුළුවන් ඒ යන ගමන් වැලි විකුණා ගන්න තැනුත් ගැන. විශාල වශයෙන් වැලි විකුණනවා.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
මම පැහැදිලි කරන්නද?

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
අනේ එපා. ඇති. දැන් ඔබතුමා කිව්වා නේ. ආයෙත් මට කරදර කරන්න එපා.

ගරු කථානායකතුමනි, අප දන්නවා කිරින්දේ වරායේත් වැලි විකුණන ක්‍රමය. මේ රටේ ජනතාවටවත්, ධීවරයන්ටවත් ඒක රහසක් නොවෙයි. අප දන්නවා කැපුන්ගොඩ නැංගුරම් පොළෙත් ඒ වැලි විකුණන ක්‍රමය. මේක ගැන මිනිස්සු කෑ ගහන්න පටන් ගත්තාට පස්සේ දැන් වෙනත් ක්‍රම හදලා තිබෙනවා. වැලි විකුණන එක හොඳ රස්සාවක් කිව්වා. ඇත්ත. දැන් මේ වැලි කොහෙන්ද එන්නේ? මුහුදින්.

**ගරු සරත් කුමාර ගුණරත්න මහතා**
(மாண்புமிகு சரத் குமார குணரத்ன)
(The Hon. Sarath Kumara Gunaratne)
ගරු මන්ත්‍රීතුමනි, ඔය ප්‍රකාශයට මම සම්පූර්ණයෙන්ම විරුද්ධයි. ඔය විධියට කොහේවත් වැලි විකුණන්නේ නැහැ. ඔය වාගේ අසත්‍ය ප්‍රකාශ කරලා මේ ගරු සභාව නොමඟ යවන්න එපා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු කථානායකතුමනි, වෙලාව අඩුවෙනුයි තිබෙන්නේ.[බාධා කිරීම්] තමුන්නාන්සේ අසත්‍ය ප්‍රකාශ කරන්න එපා. අසත්‍ය නොවෙයි මේ ඇත්ත කියන්නේ. [බාධා කිරීමක්] අන්න හරි. ඔය එන්නේ. කැපුන්ගොඩ පිරෙන වැලි උස්වැටකෙයියාවට අරගෙන යනවා. ඇයි ඒ? [බාධා කිරීමක්] ඇයි කැපුන්ගොඩ තිබෙන වැලි ටික අරගෙන ගිහිල්ලා උස්වැටකෙයියාවට දාන්නේ? එතැන ගොඩ වෙන නිසයි; කරපු වැරැද්ද නිසයි. ඒක පැහැදිලි කරන්න එපා යැ. [බාධා කිරීමක්] තොප්පිය දා ගන්න හදනවා නම් මට කරන්න දෙයක් නැහැ. [බාධා කිරීමක්] තමුන්නාන්සේ වැලි විකුණුවාය කියලා මම කිව්වේ නැහැ නේ. [බාධා කිරීමක්] තමුන්නාන්සේ එහේ ඉන්න ඇමතිවරුන්ට පෙන්වන චන්ඩිකම් මට පෙන්වන්න එපා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමාට එතුමාගේ අදහස් ප්‍රකාශ කරන්න ඉඩ හරින්න. [බාධා කිරීමක්]

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
තමුන්නාන්සේ එහේ කරපු ඒවා එහේදි කරන්න. ලාන්සාට කරපු ඒවා මට කරන්න එන්න එපා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
වරදක් තිබෙනවා නම්, ගරු ඇමතිතුමාට පුළුවන් ඊ ළඟට පිළිතුරු දෙන්න.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු කථානායකතුමනි, මම කිව්වද එතුමා වැලි විකුණුවාය කියලා?

**ගරු සරත් කුමාර ගුණරත්න මහතා**
(மாண்புமிகு சரத் குமார குணரத்ன)
(The Hon. Sarath Kumara Gunaratne)
මම විකුණුවාය කියලා කිව්වේ නැහැ. හැබැයි, කවුරු හරි විකුණුවාය කියලා කිව්වා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මම දැනුත් කියනවා.

**ගරු සරත් කුමාර ගුණරත්න මහතා**
(மாண்புமிகு சரத் குமார குணரத்ன)
(The Hon. Sarath Kumara Gunaratne)
ගරු කථානායකතුමනි, මේ ප්‍රකාශය සටහන් කරලා කරුණාකරලා පරීක්ෂණයක් පවත්වන්න.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
තිබෙන නීතියට අනුව පාර්ලිමේන්තුවට පරීක්ෂණ පවත්වන්න බැහැ නේ. ඒ ගැන තමුන්නාන්සේ දන්නවා නේ. ඒක අමාත්‍යාංශයෙන් කරන්න ඕනෑ. එහෙන් කරන්න ඕනෑ. මම කියනවා, විකුණුවාය කියලා. දික්ඕවිට ධීවරයන්ට අද ඒ ප්‍රශ්නය තිබෙනවා. ෆීලික්ස් පෙරේරා ඇමතිතුමා විශේෂ උනන්දුවක් අරගෙන ඒක කරන්න උත්සාහ කළා. තවම සාර්ථක වෙලා නැහැ. කිරින්දෙ වැලි විකුණන්නේ නැද්ද? වැලි විකුණනවා. ඒක මේ රටේ ජනතාව දන්නා කාරණයක්. මම මේ කිව්වේ එක කාරණයක් විතරයි.

අපි දන්නවා, අද මුළු මුහුදු තීරයටම -කල්පිටිය දක්වාම- මොකක්ද වෙලා තිබෙන්නේ කියා. ඒ ප්‍රදේශ කඩා ගෙන යනවා.

[ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා]

එක තැනකින් ගොඩ කරනවා. තව තැනකින් කඩා ගෙන යනවා. ගල් දානවා, ටයර් දානවා. ගරු ෆීලික්ස් පෙරේරා ඇමතිතුමනි, තමුන්නාන්සේත් ඒක කරන්න උත්සාහ කළා නේ. මේ හැම දේකටම ආරක්ෂණයක් විධියට තමයි මේ පනත් කෙටුම්පත ගෙන එන්නේ. මට ඒ පිළිබඳව කිසිම ප්‍රශ්නයක් නැහැ. [බාධා කිරීමක්] මම අහලා තිබෙනවා. මේකේ මාත් හිටියා නේ; තමුන්නාන්සේත් හිටියා නේ. ඒක නිසා අපට කියලා දෙන්න ඕනෑ නැහැ. අපි දන්නවා මොකක්ද මේකේ සිද්ධ වෙන්නේ කියලා. මේ දේ මේ රට තුළ සිද්ධ වනවා. ඒක රහසක් නොවෙයි. මුළු රට තුළම මේ දේ සිද්ධ වනවා. ඒකට ආරක්ෂණයක් සැලසීම සඳහා මේ පනත උපයෝගී වනවාය කියන එකයි මම මේ කියන්නේ. ඒක පිළිබඳව ප්‍රශ්නයක් නැහැ. මම ඒකයි කිව්වේ, හොඳ දෙයක්ය, ඒකට අපි සහයෝගය දෙනවාය කියලා. නමුත් මේක ක්‍රියාත්මක කරද්දි අපි දැක්කා විවිධ දේවල්.

මීගමුව දූව කළපුවේ කොටසක් බලහත්කාරයෙන් අල්ලා ගත්තා. අද ගෙවල් හදලා. ඉතින් කොහොමද ධීවර කර්මාන්තය දියුණු වන්නේ? ඒ කළපුවේ කොටස්වල තමයි ඒ ධීවරයන් තමුන්ගේ ජීවිකාව කර ගත්තේ. ඒ ධීවරයන් තමන්ගේ වැඩ කටයුතු කරන කොට ඒ කඩොලාන ආරක්ෂා වුණේ ඒ කාර්යයටයි. ඒ ඔක්කෝම විනාශ වුණා. ඒ විනාශ වෙච්ච තත්ත්වය අදත් තමුන්නාන්සේට බලන්න පුළුවන්. නමුත් මේවා පාලනය කරන්න මේ පනත මඟින් කොයි තරම් දුරට ඒ බලතල නිලධාරීන්ට ලැබෙනවාද කියලා අපි කල්පනා කරන්න ඕනෑ. ඒක අපට වැදගත් වනවා. මේ පනත තමුන්නාන්සේ බලන්න, අද මෙය අතිවිශාල සංශෝධන ප්‍රමාණයක් ඇතුළත් වුණ පනතක්. මේ වැඩ කටයුතු කරද්දි තමුන්නාන්සේට බොහොම පැහැදිලිව මතක් කරන්න ඕනෑ, ඉඩම් ගොඩ කිරීමේ පනත සංශෝධනය කිරීම පිළිබඳව. සෙනසුරාදා, ඉරිදා කොච්චර ඉඩම් ගොඩ කරනවාද? එක මනුස්සයකුට ඉඩමක් කපා ගන්න බැහැ. ඒ බොරළු ටික ගෙන යන්න බැහැ. පොලිසියෙන් අල්ලනවා. තව මිනිහෙක් ඒක කරද්දී එහෙම නැහැ. පොලිසියෙන් අවසර දෙනවා. මේක තමයි අද ඇති වෙලා තිබෙන තත්ත්වය. මේ වාගේ සිද්ධීන් රාශියක් සිද්ධ වෙන කාලයක තමයි අපි මේ වෙරළ සංරක්ෂණ පනතට සංශෝධන ගේන්නේ. තමුන්නාන්සේ දන්නවා, පසු ගිය කාලය තුළ ඒ ප්‍රදේශය ජලයෙන් යට වුණු බව. හුඟක් දුරට අනවසර ගොඩ කිරීම් නිසා ඒ ප්‍රදේශවල ජල ගැල්මවල් ඇති වුණා. නමුත් මම කියන්නේ නැහැ, ඉඩම් ගොඩ කිරීම නරකයි, එහෙම පාවිච්චි කරන්න බැහැය කියලා.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
බැසිල් රාජපක්ෂ මැතිතුමා සම්පූර්ණයෙන්ම ජල ගැල්ම පාලනය කරලා තිබෙනවා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
තවම වැස්සේ නැහැ නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඊට පස්සේ තවම වැස්සක් වැස්සේ නැද්ද?

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු කථානායකතුමනි, වහින කොටයි ඒවා යට වන්නේ, පායන කොට නොවෙයි. වහින කොටත් මේක යට වුණා. එතුමා ගිහිල්ලා ඇලවල්, බැම් කැපුවා. ඒක හරි. බැම් කැපුවා. අපි නැහැයි කියන්නේ නැහැ. පායන කොට ගං වතුර තිබෙනව යැ. පායන කොට ගං වතුර නැහැ. දැන් කවුරුවත් බැසිල් රාජපක්ෂ ඇමතිතුමා පිළිබඳව ගහ ගන්න යන්න ඕනෑ නැහැ. ගරු කථානායකතුමනි, එතැන ප්‍රශ්නයක් තිබෙනවා. එක්කෙනෙක් බැසිල් රාජපක්ෂ, එක්කෙනෙක් ගෝඨාභය රාජපක්ෂ, එක්කෙනෙක් නාමල් රාජපක්ෂ කියලා කොටස්වලට කැඩිලා ආණ්ඩුව ඇතුළේ නොයෙක් ප්‍රශ්න ඇති කර ගන්නවා. මේ ඔක්කෝම කට්ටිය මෙතැන ඉන්නවා. [බාධා කිරීමක්]

මේ ඔක්කොම දැන් මෙතැන ඉන්නවා, බෙදා ගත්තු කට්ටිය. මේ නිසා විවිධ ප්‍රශ්න ඇති වනවා. මේ පනත් කෙටුම්පතට ඒවා සම්බන්ධ කරන්න එපා. මා කථා කරන්නේ -[බාධා කිරීමක්] මේ වලිගය පැගිලා. ඒක නේ වැඩේ වෙලා තිබෙන්නේ. මෙහි තිබෙනවා, ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව පනතට සංශෝධන. මම මේ කියන්නේ ඇති වෙච්ච දේවල් ගැන. අපි මේ දේවල් හරියට කරන්නට ඕනෑ. ඒවා අපි කරන්නේ කොහොමද කියලා සාකච්ඡා කරමු. ඉතින් මේ කුලප්පු වෙලා, එක එක්කෙනාව බෙදා ගන්නට යනවා. ඒකට මම මොකක්ද කරන්නේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි? මේ එක එක්කෙනාව බෙදා ගන්නට යනවා. ඉතින් මේක අපට ලොකු ප්‍රශ්නයක්. [බාධා කිරීමක්] තිබෙනවා, තිබෙනවා. බලා ගෙන ඉන්න.

මේ පනත් කෙටුම්පත පිළිබඳව අප කථා කරන කොට, ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව පනතේ සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ ඇතැම් විධිවිධානත් මේකට සම්බන්ධ වන බව කියන්නට ඕනෑ. ආයෝජන මණ්ඩලයේ තිබෙන විවිධ කටයුතු මේ පනත් කෙටුම්පතට සම්බන්ධ වනවා.

අප දන්නවා, එදා කටුනායක නිදහස් වෙළෙඳ කලාපය හදද්දී, බියගම නිදහස් වෙළෙඳ කලාපය හදද්දී ඒවා ඔක්කොම නිර්මාණය කළේ එක්සත් ජාතික පක්ෂ රජයයි කියා. ඒ, වෙන කවුරුවත් නොවෙයි. ඒ හදිසි වැඩ පිළිවෙළේදී අප ද්‍රව්‍ය ඉවත් කිරීම සම්බන්ධයෙන් විශාල ප්‍රශ්න ඇති වුණා. ඒක අපි නැහැ කියලා කියන්නේ නැහැ. සමහර අවස්ථාවලදී මීගමුව කළපුවට මේ අප ද්‍රව්‍ය ඉවත් වුණා. සමහර factoriesවලින් මුහුදට, කළපුවට හානිදායක, ධීවර කර්මාන්තයට හානිදායක අප ද්‍රව්‍ය ඉවත් වුණා. ඒ අප ද්‍රව්‍ය ඉවත් කිරීම පිළිබඳව අප මෙතැනදී කථා කළා. ඒ නිසා තමයි මෙතැන බොහොම පැහැදිලිව ආයෝජන මණ්ඩලය ඒ සඳහා කටයුතු සකස් කර තිබෙන්නේ. ඒක බොහොම හොඳයි.

මේ සම්බන්ධයෙන් අලුතෙන් පිහිටුවන කොමිටියක් ගැන සඳහන් කර තිබෙනවා. ඒක ඉතාමත්ම හොඳයි. පුළුල් වැඩ පිළිවෙළක් යටතේ ක්‍රියා කරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ උපදේශක සභාව කියලා එකක් ගැන මේ පනත් කෙටුම්පතේ සඳහන් කර තිබෙනවා. ඒක ඉතාම වැදගත්. ඒක හුඟක් හොඳයි. මෙයට සම්බන්ධ නොයෙක් කටයුතු කිරීමේ දී ඒ අයට දේශපාලන බලපෑම්වලින් තොරව නිදහසේ වැඩ කිරීමට පරිසරය නිර්මාණය කිරීම තමයි වැදගත් වන්නේ. අප මේ පනත් කෙටුම්පත යටතේ මොන නීතිය ගෙනාවත්, මන්ත්‍රීවරුන් ගිහිල්ලා මන්ත්‍රීවරුන්ට ඕනෑ දේ කරනවා නම්, ඇමතිවරුන් ගිහිල්ලා ඒ අයට ඕනෑ දේ කරනවා නම්, මේ පනත්වලින් ඇති වැඩක් නැහැ. [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි, හොඳයි. සිදු වන දේවල් දැකලා වෙන්න ඇති කියන්නේ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
කිරි පණුගාය. ඒකයි වැඩේ වෙලා තිබෙන්නේ. වයසට ගිහිල්ලත් කිරි පණුගාය.

මේ පනත් කෙටුම්පත පිළිබඳව කථා කරන කොට අප මෙතැනදී සඳහන් කරන්නට ඕනෑ, මුළු රටම වැළඳ ගත් කෘෂිකර්මාන්තය පිළිබඳව, ධීවර කර්මාන්තය පිළිබඳව, ඒ වාගේම ආයෝජන කලාපය පිළිබඳව, වෙරළ උද්‍යාන පිළිබඳව, මුහුදේ තිබෙන සම්පත් පිළිබඳව, ඒ වාගේම මුහුද සහ අපේ ධීවරයන්ව ආරක්ෂා කිරීම පිළිබඳව, ඉන්දියන් ධීවරයෝ මේ රටට හොරෙන් ඇවිල්ලා මාළු ඇල්ලීම පිළිබඳව විශාල වශයෙන් සංවිධානය වෙච්ච වැඩ පිළිවෙළක් සඳහා තමයි අද මේ සංශෝධන පනත් කෙටුම්පත ඉදිරිපත් කර තිබෙන්නේ කියන එක. ඒකයි මා කිව්වේ, මේ පනත් කෙටුම්පත පිළිබඳව අපේ කිසිම විරුද්ධත්වයක් නැහැ කියලා. නමුත් මේවා ක්‍රියාත්මක කරන කොට ඒක අප හරියට කරන්නේ කොහොමද කියලා සාකච්ඡා කරලා ගත යුතු ක්‍රියා මාර්ග තිබෙනවා.

මෙම සංශෝධන පනත් කෙටුම්පතේ හත්වන වගන්තිය යටතේ ප්‍රධාන ප්‍රඥප්තියේ 6වන වගන්තිය සංශෝධනය කර වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ උපදේශක සභාවක් පිහිටුවීම ගැන සඳහන් කර තිබෙනවා. ඒ යටතේ කාරණා අතිවිශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ හැම දෙයකටම අප සම්බන්ධ වන කොට ඒ ඒ ප්‍රදේශවල මහ ජනතාවගේ සම්බන්ධතාව මේ සඳහා කොයි ආකාරයෙන් ඇති වනවාද කියන එකත් අප සැලකිල්ලට ගත යුතුව තිබෙනවා. එම උපදේශක සභාවට සියලුම අමාත්‍යාංශවල අය අයත්ව සිටිනවා. නොයෙක් ආයතනවල අය අයත්ව සිටිනවා. නමුත් සාමාන්‍ය ධීවර සංවිධානවලින් සාමාජිකයෙක්, ඒ වාගේම පරිසර සංවිධානවලින් සාමාජිකයෙක් මේ උපදේශක සභාවට පත් කර තිබෙනවා මා දැක්කේ නැහැ. අපේ පරිසර අමාත්‍යතුමා දැන් මෙතැන ඉන්නවා. එම සංවිධානවලිනුත් මහජන නියෝජිතයන් මේ උපදේශක සභාවට පත් කර ගන්නවා නම් තමයි වැදගත් වන්නේ.

එහෙම කොටසක් මේ උපදේශක සභාවට ඇතුළත් වනවාය කියා මා දකින්නේ නැහැ. මට මෙය ඉතාම හදිසියෙන් ලැබුණේ. විනාඩි 15යි අපට කථා කරන්න අවස්ථාව තිබුණේත්. දැන් වෙලාව වැඩි කර ගත්තා. මහා විශාල වැඩ කොටසක් අපට මෙතැනින් සාකච්ඡා කර බේරුම් කර ගන්න තිබෙනවා. මහ ජන නියෝජිතයෝ මෙතැනට සම්බන්ධ කර ගන්න ඕනෑ; දේශපාලනඥයෝ නොවෙයි. අද විවිධ සංවිධාන තිබෙනවා. පරිසර සංවිධාන තිබෙනවා. පාසල්වල නොයෙකුත් සංවිධාන තිබෙනවා. ඒ ඒ ප්‍රදේශවල හැටියට ආගමික සංවිධාන තිබෙනවා. මේ පනත අනුව මේ අයට සම්බන්ධ වෙන්න තිබෙන ඉඩකඩ- [බාධා කිරීමක්] පොඩ්ඩක් කට වහ ගෙන ඉන්න. කව කව ගානවා නේ. ඒක නේ වැඩේ වෙලා තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, මහ ජන සම්බන්ධතාවක් නැත්නම් මේ කිසිම දෙයක් ක්‍රියාත්මක කරන්න ලැබෙන්නේ නැහැ. නොයෙක් ආකාරයේ තාක්ෂණ පැත්ත ගැන අප දන්නේ නැහැ. යම් යම් ප්‍රදේශවලට ගියාම ඒ ප්‍රදේශවල භූමියේ පිහිටීම පිළිබඳව විවිධ ප්‍රශ්න තිබෙනවා. ඒ ප්‍රදේශවල ඉන්න ජනතාව තමයි ඒක හොඳට දන්නේ. වෙන කවුරුවත් නොවෙයි. විශේෂ දැනුම තිබෙන තාක්ෂණික නිලධාරින් ඒ ස්ථානවල ඉන්නවා. ඒ අය මේකට ඇතුළත් වුණාට කිසි වරදක් නැහැ, හොඳයි. කවුරු මේක කළත් අපට මේක කරන්න හම්බ වන්නේ නැහැ, මේකට අවශ්‍ය වන, ඒ ප්‍රදේශයට සම්බන්ධ ජනතාව මේකට සම්බන්ධ වන්නේ නැත්නම්. ඒකයි, මා කියන්නේ. මේ පනත සම්පූර්ණ වෙන්න නම්, සංශෝධනය සම්පූර්ණ වෙන්න නම්, ඒ ප්‍රදේශවල ජනතාව මේකට සම්බන්ධ කිරීම ඉතාම වැදගත් කාරණයක් බවට පත් වෙනවා.

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම මේ සංශෝධන ගැන කථා කරන විට ගරු ෆීලික්ස් පෙරේරා ඇමතිතුමා විස්තර කළ පිළිවෙළට මුහුද ආශ්‍රිතව අපට දැනට තිබෙන විශාලතම කර්මාන්තය තමයි ධීවර කර්මාන්තය. ධීවර කර්මාන්තය පිළිබඳව කථා කරන විට ධීවර ඇමතිතුමා අද මෙතැන නැහැ. අද ධීවරයන්ට විශේෂ ආරක්ෂණයක් සැලසීම සඳහා ධීවර අමාත්‍යාංශය හරහා, ධීවර දෙපාර්තමේන්තුව හරහා කළ යුතු විශාල වැඩ කොටසක් තිබෙනවා. ධීවර කාර්මිකයෙක් හැටියට, බෝට්ටු හිමියෙක් හැටියට එතුමා මටත් වැඩිය හොඳට ඒ ගැන දන්නවා. ඒ බෝට්ටුවලින් පිට වන අපද්‍රව්‍ය -මුහුදට යන තෙල් වාගේ අපද්‍රව්‍ය- ආපහු වෙරළට ඇවිත් මුළු වෙරළ තීරයම අපවිත්‍ර වනවා. මේ තත්ත්වය අප හුඟක් දුරට හලාවතදී දැක්කා. මාළු ඇල්ලුවාම මාළුන්ගෙත් තෙල් ගඳ එනවා. ඒ නිසා වෙනම අංශ, වෙනම ආයතන පිහිටුවා ගත යුතුව තිබෙනවා. පනතක් ගෙනාවාට, උපදේශක මණ්ඩලයක් පත් කළාට ඒ ආයතනය ශක්තිමත් වන්නේ නැත්නම් මේ පනත ක්‍රියාත්මක වන්නේ නැහැ. ඒ නිසා ඉතාම වැදගත් දේ මේකයි. ඒ අමාත්‍යාංශ හා ඒ ආයතන මේකට සම්බන්ධ වෙන කොට ඒවා උපදේශක මණ්ඩලයට සම්බන්ධ වෙනවා. එහෙම නැත්නම් මේ පනත ක්‍රියාත්මක වන්නේ නැහැ, මේක තවත් පනතක් විතරයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් අවසාන කළොත් හොඳයි.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
හොඳයි, ගරු කථානායකතුමනි.

විශේෂයෙන්ම මේ වෙලාවේදී අපට තිබෙන ප්‍රධානම දේ මේකයි. තවත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු කිහිපයක් සම්බන්ධ කරලා අති බලවත් විධියට, බලගතු විධියට මේ සංශෝධන පනත් කෙටුම්පත ගෙනෙන වෙලාවේ එය ක්‍රියාත්මක කරන්න සම්බන්ධ වන අනෙක් ආයතන විධිමත් කරන්නේ කොහොමද, ශක්තිමත් කරන්නේ කොහොමද, ඒ ආයතනවලට විශේෂඥ දැනුම ලබා දෙන්නේ කොහොමද කියන එකත්, ඒ ප්‍රදේශය අනුව කමිටු පිහිටුවලා මහ ජනතාවගේ සම්බන්ධය මේ වැඩ පිළිවෙළට ඇති කර ගන්නේ කොහොමද කියන එකත් පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන්න. අපට දෙන්න පුළුවන් සහයෝගයක් දෙනවා. කරන්න පුළුවන් විවේචනත් කරනවා. තරහ වෙන්න එපා. අපි වැරදි වෙන්න පුළුවන්. තමුන්නාන්සේලා වැරදි වෙන්න පුළුවන්. ඒවා කථා කරලා බේරා ගන්න පුළුවන් තැනක් තමයි මහ ජන නියෝජිතයෝ ඉන්න තැන. එහෙම කථා කරලා බේරා ගනිමු. මේ මුහුද අපේ. මේ ධීවරයෝ අපේ. මේ ධීවරයෝ බෙදා ගන්න හදන්න එපා. මේ ඔක්කොම අපේ. එහෙම නම් ඒ වැඩ පිළිවෙළේදී එක්සත් ජාතික පක්ෂයේ සම්පූර්ණ සහයෝගය මේ පිළිබඳව ලැබෙනවා කියා ප්‍රකාශ කරන අතර ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
බොහොම ස්තුතියි.

මී ළඟට ගරු රෝහිත අබේගුණවර්ධන මහතා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ. භා. 6.12 ]

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා (වරාය හා මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன - துறைமுகங்கள், நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)
(The Hon. Rohitha Abeygunawardana - Deputy Minister of Ports and Highways)

ගරු කථානායකතුමනි, අපේ ගරු ෆීලික්ස් පෙරේරා අමාත්‍යතුමා අද වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනත් කෙටුම්පත දෙවන වර කියැවීම සඳහා ඉදිරිපත් කරමින් ඒ සම්බන්ධයෙන්

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

පැහැදිලි කිරීමක් කළා. ඊට අමතරව ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමා ඒ සම්බන්ධයෙන් එතුමන්ලාගේ මතය ඉදිරිපත් කළා.

ගරු කථානායකතුමනි, අපි බොහොම පැහැදිලිව දන්නවා, මෙම වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව පසු ගිය කාලයේම ධීවර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වුණු බව. ඉන් අනතුරුව වරාය අමාත්‍යාංශය යටතේ මෙම දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වුණා. අද මෙය ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වීම එදා පනතේ විග්‍රහ කරපු ආකාරයට වෙරළ සහ මුහුද පොදු ජනතාවගේ භාවිතයට අනිවාර්යයෙන්ම ඉඩ තැබිය යුතුයි කියන දේ ඒ ආකාරයෙන් ඉටු කරන්න පුළුවන්කමක් තිබෙනවාය කියන එක මා මතක් කරනවා ගරු කථානායකතුමනි. මේ දෙපාර්තමේන්තුව ආරක්ෂක අමාත්‍යාංශය යටතේම තිබිය යුතුයි කියන එකයි මා මේ අවස්ථාවේ බොහොම පැහැදිලිව මතක් කරන්නේ.

ගරු කථානායකතුමනි, මුහුදෙන් වට වුණු දූපතක් වන අපේ රටට වෙරළ, මුහුද කියන එක ගහට පොත්ත වාගේ බැඳුණු දෙයක්. එවැනි තත්ත්වයක් තිබෙන රටක පොදු ජනතාවගේ භාවිතයට තිබෙන මේ වෙරළ ඉතිහාසයේ නොයෙක් ආණ්ඩු, නොයෙක් පක්ෂ වාගේම මේ රටේ ජීවත් වුණු සමහර ව්‍යාපාරිකයෝ, පුරවැසියෝ අනවශ්‍ය විධියට පාවිච්චි කරපු ආකාරය අපි දැකලා තිබෙනවා. ඒ තුළ රටට ඇති වුණු නොයෙකුත් අනතුරුදායක තත්ත්වයන්, අහිතකර සිදුවීම් අපේ ඇස් ඉදිරිපිට අපට දකින්න සිද්ධ වුණා.

ගරු කථානායකතුමනි, පසු ගිය කාලයේ ඇති වෙච්ච සුනාමි ඛේදවාචකය වෙලාවේදී විද්‍යුත් මාධ්‍ය තුළින් හික්කඩුව මුහුදු තීරයේ තත්ත්වය විශේෂයෙන් අපට දකින්න ලැබුණා. හික්කඩුව මුහුදු තීරයේ වෙරළ ආසන්නයේම එක නිවාඩු නිකේතනයකට යාබදවම තවත් නිවාඩු නිකේතනයක අනවසර ලෙස තාප්ප ඉදි කිරීම තුළ ඇති වුණු තත්ත්වය අප දැක්කා. එකම පවුලේ අම්මයි, තාත්තයි, දරුවෝ දෙන්නායි මේ ඛේදවාචකයට මුහුණ දුන්නු අවස්ථාවේදී දරුවෝ දෙන්නා දමලා අම්මයි, තාත්තයි තාප්පයෙන් පැනලා ජීවිතය බේරා ගත්තා. නමුත් අහිංසක දරුවෝ දෙන්නාට ජීවිත බේරා ගන්න බැරි වුණා. තමාගේ ජීවිතයට තමා ආදරය කිරීම තුළ දෙමාපියෝ දෙන්නා බේරුණා. අර අහිංසක දරුවන්ට ඒ තාප්පයෙන් පනින්න බැහැ. ඒ නිසා ඒ දරුවෝ මිය ගියා. එදා එවැනි තත්ත්වයක් උදා වෙලා තිබුණා.

ගරු කථානායකතුමනි, අන්න ඒ නිසා මේ ආකාරයෙන් වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනත් කෙටුම්පතක් ගෙන ඒම ඉතාම සුබවාදී කටයුත්තක්. වෙරළ අනවසර ලෙස තමන්ගේ පෞද්ගලික භාවිතයට ගන්නා අයට, අනවශ්‍ය විධියට පාවිච්චි කරන අයට, පොදු භාවිතයෙන් ඉවත් කරන්න කටයුතු කරන අයට නීති මඟින් කටයුතු කරන්න මෙම සංශෝධන පනත් කෙටුම්පත ගෙන ඒම ඉතාම කාලෝචිත අවශ්‍යතාවක්ය කියන එක මා මතක් කරනවා ගරු කථානායකතුමනි.

විශේෂයෙන්ම මේ අවස්ථාව වන විට රටේ තිබුණු ත්‍රස්තවාදය අවසන් වෙලා අපට එදා නොතිබුණු තුනෙන් දෙකක මුහුද, වෙරළ අද අපට හිමි වෙලා තිබෙනවා. ඒ තුළ සංචාරක ව්‍යාපාරයත් ගොඩ නැඟෙන වෙලාවක මේ සංශෝධන පනත් කෙටුම්පත තුළින් ඒ වග කීම දරන දෙපාර්තමේන්තුවේ නාමයන් පවා වෙනස් වීම, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පටන් සෙසු නිලධාරින්ට ඔවුන්ගේ වග කීම හරියට ඉටු කරන්න ලබා දෙන ශක්තියක් හැටියටයි අපි දකින්නේ.

ගරු කථානායකතුමනි, පසු ගිය දවස්වල මේ කොළඹ විතරක් නොවෙයි, තදාසන්න නගරවලත් ප්‍රශ්නයක් තිබුණු බව අපි දන්නවා. මොකද, හැම තැනම කුණු ගෙනැවිත් දමනවා. නගර සභාවට කුණු ටික එකතු කර ගන්න බැහැ; කුණු දමන මිනිස්සුන්ව අල්ලා ගන්න බැහැ. උදේ අවදි වන මිනිස්සු දකින්නේ කුණු වෙච්ච නගරයක්. මේකට විසඳුම් නැතිව තිබුණා. නමුත් අතිගරු ජනාධිපතිතුමා යටතේ ක්‍රියාත්මක වන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්තුමා ඉතාම පැහැදිලිව, ඇස් පනා පිට අද අපට ඔප්පු කරලා පෙන්වා තිබෙනවා සුන්දර නගරයක් නිර්මාණය කරන්න ක්‍රියාත්මක වන ක්‍රමවේදය.

ගරු කථානායකතුමනි, සුන්දර වෙරළ පරිසරයක් ඇති කිරීම, වෙරළ අලංකරණය, වෙරළ පොදු භාවිතයට ලබා දීම ආදි මේ සියලු කටයුතුවලට මේ සංශෝධන පනත බොහෝ පිටුවහල් වෙනවා. එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීතුමන්ලා සමහර වෙලාවට අර්ථ කථනය කරන්න හදනවා වෙරළ සංරක්ෂණ පනතට ගෙන ආ මේ සංශෝධනය අපට ඕනෑ වෙලාවට හදා ගෙන ආ සංශෝධනයක් ලෙස. නැහැ ගරු කථානායකතුමනි. මේක තමයි සිදු විය යුත්තේ. රටේ සංචාරක ව්‍යාපාරයට, එහෙම නැත්නම් රටේ අනෙකුත් කටයුතුවලට බාධාවක් වන විධියට වෙරළ සංරක්ෂණ පනත සංශෝධනය වන්නේ නැහැ. ඒ පනත සංශෝධනය වන්නේ එක පැත්තකින් රටේ වෙරළ ආරක්ෂා කර ගැනීම සඳහායි. අනෙක් පැත්තෙන්, සංචාරක ව්‍යාපාරයටත් මේ සංශෝධන පනත බලපානවා ගරු කථානායකතුමනි. සංචාරක ව්‍යාපාරය අද අපේ රටේ ආර්ථිකය ශක්තිමත් කරන ප්‍රබල සන්ධිස්ථානයක්.

ගරු කථානායකතුමනි, අපි දන්නවා මේ වන විට වෙරළ ආශ්‍රිතව, විශේෂයෙන්ම මඩකලපුව, ත්‍රිකුණාමලය, පාසිකුඩා, කල්කුඩා ආදි පැතිවල සංචාරක නිවාඩු නිකේතන ඉදි වන බව. ඒ ඉදි වන නිවාඩු නිකේතන අයිති සමාගම්වලට යම් නිර්ණායකයක් අවශ්‍යයි. තමන්ට ඕනෑ ඕනෑ පරිදි වෙරළ භාවිත කරන්නේ නැතිව සුන්දරත්වය රැකෙන සේ වෙරළ පාවිච්චි කරමින් එය සිත් ඇද ගන්නාසුලු විධියට ඔවුන්ගේ සංචාරක ව්‍යාපාරයට යොදා ගන්න පුළුවන් තත්ත්වයක් ඇති කිරීම සඳහා ඔවුන් දිරි ගන්වමින් ඉදිරියට ගෙන යන්න පුළුවන් ක්‍රමයක් තමයි මේ සංශෝධන පනත මඟින් ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වන්නේ, ගරු කථානායකතුමනි.

කැපුන්ගොඩ නැංගුරම් පොළ හැරීමේදී ඉවත් කරන වැලි සම්බන්ධයෙන් ගරු ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමා මෙතැනදී වැරැදි ප්‍රකාශයක් කළා. අප එතුමාට වග කීමකින් කාරණයක් මතක් කරන්න ඕනෑ. මේ රටේ යම් තැනක වැලි ගොඩ වීමක් සිදු වෙනවා නම් ඒ ගොඩ වෙන වැලි තවත් තැනක ඛාදනය වීමක් වළක්වන්න අවශ්‍ය වෙනවා ගරු කථානායකතුමනි. එවැනි අවස්ථාවලදී වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වගකීම තමයි වැලි ගොඩ වන ස්ථානයෙන් ඒ වැලි අරගෙන ගිහින් ඛාදනය වන ස්ථානය රැක ගැනීම. ඒ නිසා කැපුම්ගොඩ නැංගුරම් පොළ හැරීමේදී ඉවත් කළ වැලි සියල්ල උස්වැටකෙයියාවේ වෙරළ ඛාදනය වන ස්ථානයට ගෙන ගිහින් වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව තම වගකීම එදා ඉටු කළා. ඒ තත්ත්වය මීගමුවේ විතරක් නොවෙයි තිබෙන්නේ ගරු කථානායකතුමනි. මේ වන විට අපේ ඔලුවිල් වරායේ කෙරෙන සංවර්ධනයත් එක්ක එතැනත් යම් ඛාදනයක් ඇති වෙනවා. උතුරු පැත්ත ඛාදනය වෙනවා. දකුණු පැත්තෙහි සම්පූර්ණයෙන්ම පිරීමක් සිදු වෙනවා. එවැනි අවස්ථාවකදී වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ යුතුකම සහ වගකීම වන්නේ තම කාර්යය හරියාකාරව ඉටු කිරීමයි.

ගරු කථානායකතුමනි, වෙරළ සංරක්ෂණ පනත සම්බන්ධයෙන් අද කෙරෙන මේ සංශෝධනය ඉතාම සුභවාදී කටයුත්තකටයි ආරම්භයක් වන්නේ. ඒ ආරම්භයත් එක්ක ඒ

වගකීම ඉටු කරන රාජ්‍ය නිලධාරින්ගෙන් අප විශේෂයෙන්ම බලාපොරොත්තු වන දෙයක් තිබෙනවා. මේ රට වටා තිබෙන අපේ වෙරළ, ඒ වාගේම ඒ වෙරළ හා සම්බන්ධව ආර්ථික වශයෙන් ගොඩ නැඟෙන සංචාරක ව්‍යාපාරය, ධීවර කර්මාන්තය, මෝය කට ආශ්‍රිත ප්‍රදේශ සහ මේ රටේ එක් එක් ස්ථානවල, එනම් පුත්තලම, කළුතර, බෙන්තර වැනි ස්ථානවල පිහිටි වෙරළේ තිබෙන ඉතිරි වූ දූපත් ආදි සියල්ල රැක ගන්නා විධියට මෙම පනත පාවිච්චි කරන්න කියා එම නිලධාරින්ගෙන් අප ඉල්ලා සිටිනවා. යම් පුද්ගලයකු වෙන්න පුළුවන්, යම් ආයතනයක් වෙන්න පුළුවන් මේ පනතට පටහැනිව යම් ක්‍රියා මාර්ගයක යෙදෙනවා නම් රටේ ජීවත් වන පුරවැසියාගේ යහපත වෙනුවෙන් අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්න කටයුතු කරන්න කියා අප ඉල්ලා සිටිනවා. ඒ වාගේම රජය හෝ යම් නිලධාරියකු හෝ ආර්ථිකය ශක්තිමත් කරන යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමේදී මේ සංශෝධන පනත පාවිච්චි කර ගෙන, මේ සංශෝධන පනතම සම්පූර්ණයෙන් ඉදිරියට තියලා එකී කටයුත්ත කඩාකප්පල් කරලා අපේ ආර්ථිකය කඩා දමන වැඩ පිළිවෙළකට නොයා යුතුය කියන එකත් මා මේ අවස්ථාවේ මතක් කරනවා.

ගරු කථානායකතුමනි, රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ නම අද වෙන කොට රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය හැටියට වෙනස් වෙලා තිබෙනවා.

අර කරන්න බැරි වුණු දේවල් එම අමාත්‍යාංශය යටතේ කළා වාගේම මේ වෙරළ රැක ගැනීමේ වග කීමත් ඉටු කරන්න අතිගරු ජනාධිපතිතුමාටත්, ආරක්ෂක ලේකම්තුමාටත්, ඒ නිලධාරින් සියලු දෙනාටත් ශක්තිය, ධෛර්යය ලැබේවායි කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*

***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.*

*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*

*Question put, and agreed to.*

*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය.:***

***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය."-[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]***

*தீர்மானிக்கப்பட்டது.*

*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப் படுமாக" [மாண்புமிகு தினேஷ் குணவர்தன]*

*Resolved:*

*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Dinesh Gunawardena]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***

***[කථානායකතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் ஆராயப்பட்டது.*

*[சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered in Committee.*

*[MR. SPEAKER in the Chair.]*

***1 සිට 29 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*1 ஆம் வாசகத்திலிருந்து 29 ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 1 to 29 ordered to stand part of the Bill.*

## 30 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 31ඊ වන වගන්තිය ප්‍රතිශෝධය කිරීම.)

## வாசகம் 30.- (முதன்மைச் சட்டவாக்கத்தின் 31உ என்னும் பிரிவை மாற்றீடு செய்தல்.)

CLAUSE 30. - (*Replacement of section 31F of the principal enactment*)

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**

(மாண்புமிகு தினேஷ் குணவர்தன)

(The Hon. Dinesh Gunawardena)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"29 වන පිටුවේ, 5 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න:

'වන්නේය. එකී ප්‍රවාහනය හෝ ගබඩා කිරීම නීත්‍යානුකූල බවට සාධක ඉදිරිපත් කිරීමට අපොහොසත් වන යම් තැනැත්තකු වරදකට වරදකරු වන්නේ ය.' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendment put, and agreed to.*

***30 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*30 ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 30 , as amended, ordered to stand part of the Bill.*

***31 සිට 37 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*31 ஆம் வாசகத்திலிருந்து 37 ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 31 to 37 ordered to stand part of the Bill.*

***උප ලේඛනය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*அட்டவணை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Schedule ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

***පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.***

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*

*Bill reported with Amendments.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**

(மாண்புமிகு தினேஷ் குணவர்தன)

(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம் முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*

*Bill, as amended, accordingly read the Third time, and passed.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 6.25ට, 2011 ඔක්තෝබර් 19 වන බදාදා අ. භා. 1.00 වන තෙක් කල් ගියේය.***
*அதன்படி பி. ப. 6.25மணிக்கு பாராளுமன்றம், 2011 ஒக்ரோபர் 19, புதன்கிழமை பி. ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*
*Adjourned accordingly at 6.25 p.m. until 1.00 p.m. on Wednesday, 19th October, 2011.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.

**சந்தா** ; ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year . Late applications for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.